දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | තිනමිණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් අව තියවක ලත් සඳු දින | කාණ්ඩය 111 | පත්‍රය 249 | පිටු 36 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 05 සඳුදා

කොවිඩ් ව්‍යාප්තිය



කාලතුයේ ඩිජිටල් දොරටුව අද පත්‍රය සමග

රිෂාඩ් සමඟ කිසිදු දේශපාලන ගනුදෙනුවක් නෑ

ජනපති අවධාරණය කරයි

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් සමග කිසිදු දේශපාලන ගනුදෙනුවක් තම ආණ්ඩුව විසින් ඇති කරගෙන නොමැති බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

ජාතික ආරක්ෂාව තහවුරු කිරීම රජයේ පළමු සහ ප්‍රධාන වගකීමක් බව පෙන්වා දෙන ඒ මහතා එය සාක්ෂාත් කිරීම සඳහා දැනටමත් නිසි පියවර ක්‍රියාත්මක කර ඇති බවද පසුගිය කාලයේ සිදු වූ ආකාරයෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හෝ අත්තනෝමතිකව නිදහස් කිරීමේ බලය දේශපාලනඥයන් අතට පත් කිරීමට තමා සූදානම් නොමැති බවද ප්‍රකාශ කරයි.

සිය මුහුණු පොතේ සටහනක් තබමින් ජනාධිපතිවරයා මේ බව සඳහන් කරයි.

එහිදී වැඩිදුරටත් ගෝඨාභය රාජපක්ෂ මහතා මෙසේ කියා සිටී. ආරක්ෂාව තහවුරු කිරීම මාගේ රජයේ පළමු සහ ප්‍රධාන වගකීමයි. එය සාක්ෂාත් කිරීම සඳහා දැනටමත් නිසි පියවර ක්‍රියාත්මක කර ඇත. මේ භූමිය මත ජනවාර්ගික, ආගමික හෝ වෙනත් කවර ආකාරයකවත් ත්‍රස්තවාදයකට හෝ අන්තවාදයකට ඉඩ නොතබන අතර, සෑම පුරවැසියකුටම බියෙන් සහ සැකයෙන් තොරව ජීවත්වීම සඳහා ඇති අයිතිය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන බව සහතික වන්නෙමි."

පිට 06

දිවුලපිටියේ මවකට සහ දියණියට කොරෝනා

ආශ්‍රිතයන් පීසීආර් පරීක්ෂාවට

චන්ද්‍රිකා පෙරේරා, සන්ධ්‍යා කරුණාරත්න, මිනුවන්ගොඩ විශේෂ

ගම්පහ, දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචිව සිටින 39 හැවිරිදි කාන්තාවකට සහ ඇයගේ දියණියට කොවිඩ් -19 වයිරසය ආසාදනය වී ඇති බවට හඳුනා ගැනීමත් සමග ප්‍රතිකාර සඳහා ඔවුන් අංගොඩ උණ රෝහලට ඇතුළත් කර තිබේ.

පිට 06

මිනුවන්ගොඩට දිවුලපිටියට වේයන්ගොඩට ඇඳිරි නීතිය

නිව් ඩයමන්ඩ් තෙල් නැව මැදපෙරදිගට ඇදගෙන යෑම නීතිවිරෝධියි

නීතිපතිගේ සම්බන්ධීකරණ නිලධාරිනි රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න

කුමුදු හෙට්ටිආරච්චි

ගිනි ගැනීමට ලක් වූ එම්.ටී. නිව් ඩයමන්ඩ් නෞකාව මැදපෙරදිග මුහුදු කලාපයට ඇදගෙන යනු ලබන්නේ නීතිපති දෙපාර්තමේන්තුවේ හා සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ උපදෙස්වලට පටහැණිව බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනි රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය පැවසුවාය.

පිට 06

මිනුවන්ගොඩ, යකහටුව ප්‍රදේශයේ පිහිටි ඇඟලුම් කර්මාන්තශාලාවේ සේවිකාවකට කොවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු වීමත් සමගම එම සේවකයන් නිවෙස් වෙත යැවීමට ප්‍රථමයෙන් සෞඛ්‍ය අංශ විසින් ඔවුන්ට සෞඛ්‍ය උපදෙස් ලබාදීමට පියවර ගත් අයුරු.
ඡායාරූපය - සමන්ත වීරසිරි

අනුරාධපුර, පූජා භූමියේ ඉදිවන සඳහිරු සෑයේ වත්මන් ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය සඳහා ගිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනතාව විසින් උණුසුම් අයුරින් පිළිගත් අවස්ථාව.
ඡායාරූපය - චිත්‍රාරත්න කළුආරච්චි

පාස්කු ප්‍රහාර පරීක්ෂණ විනිවිදභාවයෙන් හා අපක්ෂපාතීව සිදු කිරීම ඉතා වැදගත්



චන්දිමා කරුණාරත්න

පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිදු කරන පරීක්ෂණ ක්‍රියාදාමය විනිවිදභාවයෙන් හා අපක්ෂපාතීව සිදු කිරීම ඉතා වැදගත් යැයි කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කරති.

පිට 06

මෛත්‍රී අද පාස්කු කොමිසමට

සුභාෂිණී සේනානායක

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අද (05) පාස්කු කොමිසම හමුවේ පෙනී සිටීමට නියමිතය.

ඉකුත් වසරේ අප්‍රේල් මස 21 පාස්කු ඉරිදා සිදු මුස්ලිම් අන්තවාදීන්ගේ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කළ ජනාධිපති කොමිසම හිටපු ජනාධිපතිවරයා සාක්ෂි විමසීම සඳහා කැඳවා ඇත.

පිට 06

20 ගැන ජානිපෙ මතය අගමැතිට ලියයි

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට කාරක සභා අවස්ථාවේ දී ඇතුළත් කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් අගමැති මහින්ද රාජපක්ෂ මහතා දැනුම්වත් කිරීමට ජාතික නිදහස් පෙරමුණ පියවර ගෙන තිබේ.

පිට 06

ඉදිරි පැය 48 ඩොනල්ඩ් ට්‍රම්ප්ට තීරණාත්මකයි

මහින්ද අලුත්ගෙදර

කොරෝනා වයිරසය ආසාදනය වී රෝහල්ගත කර සිටින අමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතාගේ සෞඛ්‍ය තත්ත්වය ඉදිරි පැය 48ක කාලයේ දී තීරණාත්මක බවට එරට වෛද්‍යවරුන් ප්‍රකාශ කර තිබේ.

පිට 06

බස් රියේ දුම්රියේ මුඛ ආවරණ අනිවාර්යයි
පිට 08

රාජ්‍ය ආයතනවල අද මහජන දිනය නැහැ
පිට 08

දෙවැනි වාරයේ පාසල් නිවාඩුව අද සිට
පිට 06

ආණමඩුවේ තරුණයකුට තෙවැනි වරටත් කොරෝනා
පිට 08

ආණ්ඩුව ඒකාධිපති පැසිස්ට් රාජ්‍යයක් හදමින් ඉන්නවා

ශිරෝමි අබයසිංහ

ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම සහ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම වැනි ප්‍රමුඛ අරමුණු බැහැර කරමින් ආණ්ඩුව තම දේශපාලන බලය වර්ධනය කර ගනිමින් ඒකාධිපති පැසිස්ට් රාජ්‍යයක් බිහි කිරීම ප්‍රමුඛ කාර්යය ලෙස සලකන බව පෙනෙන්නට ඇතැයි එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සඳහන් කරයි.

පිට 06

රියාජ් බදියුදීන් නිදහස් කිරීමට විරෝධය පා උද්ඝෝෂණයක්

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාගේ සහෝදරයා වන රියාජ් බදියුදීන් මහතා චෝදනා නැතැයි කියමින් නිදහස් කිරීමට විරෝධය පා පාස්කු ත්‍රස්ත ප්‍රහාරය එල්ල වූ කටුවපිටිය දේවස්ථානය ඉදිරිපිටදී එම බෝම්බ ප්‍රහාරයේ ඉලක්කයක් වූවන් සහ ගොදුරු වූවන්ගේ පවුල්වල ඥාතීහු ඊයේ (04) උද්ඝෝෂණයක නිරත වූහ.

පිට 06

සීඅයිඩීය භාර ඩීඅයිජී වෙදසිංහ ඉවතට
පිට 08

සජිත් පිලේ 20ට එරෙහි වැඩ සීමා වෙයි

ශිවන්ති ප්‍රනාන්දු

කොවිඩ් 19 වසංගත තත්ත්වය යළි සමාජය තුළ පැතිරීමේ අවදානම හේතුවෙන් 20 වැනි සංශෝධනයට එරෙහි සමගි ජන බලවේගයේ වැඩසටහන් පැවැත්වීමද සීමා වන ලකුණු පෙන්නුම් කරයි.

පිට 06

දිවුලපිටිය ඥානවිමල විදුහලේ ගුරුවරුන් - සේවකයන් සහ සිසුහු 1500ක් නිරෝධායනයට

පිට 08

කොවිඩ් සෞඛ්‍ය මාර්ගෝපදේශන පිළිපදින්නේ ද යන්න දැඩිව සොයා බලනවා

ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි

සන්ධ්‍යා කරුණාරත්න

කොවිඩ් - 19 වයිරසය වළක්වා ගැනීමේ සෞඛ්‍ය මාර්ගෝපදේශන පිළිපදින්නේ ද යන්න සෞඛ්‍ය අංශ මඟින් දැඩි ලෙස සොයා බැලීමට කටයුතු කරන බව සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය පැවැසුවාය.

මෙම වයිරසය වළක්වා ගැනීමට ජනතාව ලබා දුන් සහාය නැවත ලබාදෙන ලෙසත්, වයිරසය වළක්වා ගැනීමට අදාළ සෞඛ්‍ය උපදෙස් නිරන්තරයෙන් පිළිපදින ලෙසත් ඇමැතිවරිය ජනතාවගෙන් ඉල්ලීමක් කරන්නීය.

කොවිඩ්-19 වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඇමැතිවරිය මේ බව ඊයේ (4) ප්‍රකාශ කළාය.

මාස දෙකකට පසුව මේ වන විට සමාජයෙන් රෝගියකු වාර්තා වී ඇති බවත් වයිරසය මර්දනය කිරීම සඳහා ජනාධිපතිවරයා ඇතුළු රජය ගත් ක්‍රියාමාර්ගත්, ජනතාව ලබා දුන් සහයෝගයත් නිසා පසුගිය කාලයේ වයිරසය මර්දනය කිරීමට හැකි වූ බවත් ඇමැතිවරිය පැවැසුවාය. මීටරයක දුරක් පවත්වා ගැනීම, මුඛ ආවරණ පැලඳීම, අත් සේදීම වැනි සෞඛ්‍ය පුරුදුවලට මහජනතාව අනුගත විය යුතු යැයි ද ඇමැතිවරයා පැවැසුවාය. ලෝකයේ සෙසු රටවලට සාපේක්ෂව ශ්‍රී ලාංකීය ජනතාව සෞඛ්‍ය අංශ ලබා දුන් උපදෙස් පිළිපැදීම සිදු කළ බවත් රට පැවැති තත්ත්වයෙන් මුදවා ගැනීමට එය විශාල සහයෝගයක් සහ ශක්තියක් වූ බවත් ඇමැතිවරිය කියා සිටියාය.

වයිරසය ව්‍යාප්ත වීම වැළැක්වීමේ අරමුණෙන් සංගීත සංදර්ශන, ප්‍රියසම්භාෂන වැනි උත්සව කිසියම් කාලසීමාවක් සඳහා නැවැත්විය යුතු බවත් රටේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි මාර්ගෝපදේශන 56 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති අතර, එම මාර්ගෝපදේශන www.health.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි බවත් ඇමැතිවරයා පැවැසුවාය.

ඇමැති කෙහෙලිය වන්නි මාධ්‍යවේදීන්ගේ ගැටලු සොයා බලයි

බන්දුල සෙනෙවිරත්න
වවුනියාව උතුර සමූහ

උතුරේ සංචාරයක නිරත වූ ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පෙරේදා (3) වවුනියාවේදී වන්නි මාධ්‍යවේදීන් ද හමු වී ඔවුනගේ ගැටලු හා අවශ්‍යතා විමසා බැලුවේය. වවුනියාව, මුලතිව් හා මන්නාරම දිස්ත්‍රික්කවල මාධ්‍යවේදීන් මෙලෙස හමු වූයේ වවුනියාව දිසාපති කාර්යාල භූමියේ පිහිටි රංග ශාලාවේදීය.

මෙම හමුවෙන් අනතුරුව වවුනියාව දිසාපති කාර්යාල මාධ්‍ය ඒකකය කලකට ඉහත පවත්වාගෙන ගිය මුද්‍රණාලය ද අමාත්‍යවරයාගේ නිරීක්ෂණයට ලක් විය. රාජ්‍ය අමාත්‍ය වියාලේන්ද්‍රන් මහතා ද අමාත්‍යාංශ ලේකම්වරුන් ද මෙම අවස්ථාවට එක් වූහ.

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථවත් කරමින් ජනමාධ්‍ය අමාත්‍යාංශය දිස්ත්‍රික්ක මට්ටමින් කෙරෙන නිරීක්ෂණ චාරිකාවේ පළමුවැන්න උතුරේ දිස්ත්‍රික්ක ඉලක්ක කරගනිමින් පසුගිය දෙදින තුළ සිදු විය.

ජනමාධ්‍ය අමාත්‍යාංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එක්ව සංවිධාන කළ මෙම වැඩපිළිවෙළේ පළමුවැන්න ලේක්හවුස් ආයතනයේ 'තිනකරන්' පුවත්පත නව මුහුණුවරකින් එළිදැක්වීම "කුට්ටි චුට්ටි" පුවත්පත එළිදැක්වීම සිදුවිය.

අනතුරුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී යාපනය දිස්ත්‍රික් ජනමාධ්‍ය අධ්‍යයන පාසල් දරුවන්ගේ මාධ්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමේ අරමුණින් මාධ්‍ය අධ්‍යයන වැඩමුළුවක් පැවැත්විණි.

එහිදී දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන මෙවැනි පාසල් අධ්‍යයන වැඩමුළු මාලාවේ පළමුවැන්න මෙය වේ. ඉන් අනතුරුව යාපනය දිස්ත්‍රික් මාධ්‍යවේදීන් ජනමාධ්‍ය ඇමැතිවරයා හා අමාත්‍යාංශ නිලධාරීන් හමු වී ඔවුන්ගේ ගැටලු පිළිබඳ සාකච්ඡා කළේය.

උතුරේ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවක් වන 'යාළ් FM' ගුවන්විදුලි නාලිකාව ද ඇමැතිවරයාගේ නිරීක්ෂණයට ලක් විය. පසුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 25 වැනි දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී විවෘත කෙරිණි. ඒ අනුව රට පුරා ආවරණය වන පරිදි ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් දිස්ත්‍රික් මාධ්‍ය ඒකක සියල්ල ස්ථාපිත කර අවසන් විණි.

පසුව කිළිනොච්චි මාධ්‍යවේදීන් හමු වූ ඇමැතිවරයා ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කළේය. වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී වවුනියාව, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි මාධ්‍යවේදීන් සමඟ සාකච්ඡා කරමින් ඔවුන්ගේ ගැටලුවලට අවධානය යොමු කළේය.

විස්සට බදියුදීන්ගේ සහාය කිසිවිටකත් ලබා ගන්නේ නෑ

ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ

අසේල කුරුළුවංශ

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගැනීමට රිෂාඩ් බදියුදීන්ගේ සහාය කිසිවිටකත් ලබා නොගන්නා බව කෘෂිකර්ම අමාත්‍යය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

මහින්දානන්ද අලුත්ගමගේ මහතා මේ බව පැවසුවේ ඊයේ (4) දින නාවලපිටිය මහින්දානන්ද පදනම් කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය.

විස්ස සම්මත කරගැනීමට සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට රිෂාඩ් බදුද්දීන්ගේ සහෝදරයා නිදහස් කිරීමට ආණ්ඩුව ක්‍රියා කළ බවට විපක්ෂය බොරු චෝදනා නඟන බවත්, එවැනි සහායක් ඔහුගෙන් ලබා ගැනීමට ආණ්ඩුවට කිසිදු අවශ්‍යතාවක් නොමැති බවත් හෙතෙම කීය. රිෂාඩ් බදියුදීන් කියන්නේ අන්තවාදයට සහයෝගය ලබා දුන් දූෂිත ගනුදෙනුවලට සහය දුන්න ඇමැතිවරයෙක් බවත්, ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව යටතේ කිසිසේත් රිෂාඩ් බදියුදීන්ව හෝ ඔහුගේ සගයකු ආණ්ඩුවට එක්කර නොගන්නා බවත් හෙතෙම පැවසුවේය.

රිෂාඩ් බදියුදීන්ව ආණ්ඩුවට ගන්නවා කියලා මත ප්‍රකාශ කරන්නේ සජිත් ප්‍රේමදාස හා සමඟි ජන බලවේගයේ කණ්ඩායමක් බවත් ඔහු පාර්ලිමේන්තුවේ සිටින්නේත් එම කණ්ඩායම සමඟ බවත් ඒ මහතා කීය. පසුගිය රජය මෙන් වත්මන් රජය අරලියගහ මන්දිරයේ රැස්වීම් කියා පුද්ගලයන් අත්අඩංගුවට නොගන්නා බවද හෙතෙම පැවසුවේය.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

42 වන ඔබ්සවර් - මොබිටෙල්
වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**
ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**
ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : .....
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: .....
(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)
පාසල : .....
ඔබේ නම : .....
ලිපිනය : .....
ජංගම දුරකථන අංකය : .....

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

කූපන්පත් එවා සතිපතා තෑග දිනාගන්න.
ප්‍රථම තෑගය : Mobitel 4G Wi-Fi router **දෙවන තෑගය** : රු. 2,500/-
තෙවන තෑගය : රු. 1,500/- **හතරවන තෑගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

කොන්දේසි :
1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

දිනය 2020-10-10 **අංකය** 31

UNLIMITED YouTube HD quality up to 25GB*
මාසෙටම රු.249+බදු #170# අමතන්න
4G LTE Sri Lanka Telecom Mobitel

මිනුවන්ගොඩ - දිවුලපිටිය ජනතාවගේ ආරක්ෂාවට සියලු පියවර ගන්න
ඇමැති ප්‍රසන්නගෙන් බලධාරීන්ට උපදෙස්

ධනුෂ්ක ගොඩකුඹුර

කොවිඩ් ආසාදිත කාන්තාවක හමුවීමෙන් පසු පොලිස් ඇඳිරි නීතිය පනවා ඇති මිනුවන්ගොඩ සහ දිවුලපිටිය පොලිස් බල ප්‍රදේශවල ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා ලෙස සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා අදාළ බලධාරීන් වෙත ඊයේ (4) නියෝග කළේය.

කොවිඩ් ආසාදිත කාන්තාවක් සම්බන්ධයෙන් වාර්තා වීමත් සමඟ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන් සමඟ විශේෂ දුරකතන සාකච්ඡාවක් ඊයේ (4) උදෑසන පැවති අතර එහිදී ගත් තීන්දු අනුව ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවීමට තීරණය කළ බවත් රණතුංග මහතා පැවසීය.

මෙම පොලිස් බල ප්‍රදේශවල ජීවත් වන ජනතාව රෝගයෙන් ආරක්ෂා කිරීමට මෙන්ම ඔවුන්ට අවශ්‍ය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා නොපමාව කටයුතු කළ යුතු බවට තමන් උපදෙස් දුන් බව ප්‍රසන්න රණතුංග මහතා දිනමිණට ප්‍රකාශ කළේය.

ඒ අනුව මිනුවන්ගොඩ සහ දිවුලපිටිය පොලිස් බල ප්‍රදේශවල ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ වැඩපිළිවෙළක් සතොස සහ සමූපකාර ආයතන හරහා අද (5) උදෑසන සිට ක්‍රියාවට නැංවීමට නියමිතය.

මෙම කාන්තාව හා සම්බන්ධතා පැවැත්වූ බවට ආශ්‍රිතයන් සියලුදෙනා මේ වන විට හඳුනාගනිමින් තිබෙන අතර, හඳුනාගෙන ඇති පිරිස් මේ වන විටත් නිරෝධායනයට යොමු කර ඇති බවත් තවත් 650කට පමණ පී. සී. ආර් පරීක්ෂණ අද (5) සිදුකිරීමට නියමිත බවත් රණතුංග මහතා ප්‍රකාශ කළේය.

ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන සිකුරාදා තෙක් වසා දැමීමට පියවර ගෙන ඇති බවත්, දෙවන වාරයේ පාසල් නිවාඩුව හෙට සිට ක්‍රියාවට නැංවීමට තීරණය කළ බවත් පැවසූ රණතුංග මහතා කොවිඩ් ආසාදිත කාන්තාව හා ආශ්‍රිතයන් පී. සී. ආර්. පරීක්ෂණයට ලක්කිරීමට තීරණය කළ බවත් පැවසීය.

එක්සත් රාජධානියෙන් ශ්‍රී ලාංකිකයන්ට අලුත් ශිෂ්‍ය වීසා ක්‍රමයක්

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලාංකිකයන් සඳහා නව ශිෂ්‍ය වීසා ක්‍රමයක් හඳුන්වාදීමට එක්සත් රාජධානිය පියවර ගෙන තිබේ.

ඒ අනුව එක්සත් රාජධානියේ ශිෂ්‍ය සහ ළමා වීසා ඉල්ලුම් කරන්නන්ට මේ මස 5දා සිට නව ක්‍රමවේදය ක්‍රියාත්මක බව ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය පවසයි.

මෙය එක්සත් රාජධානියේ අධ්‍යාපන වරම් ලැබීම සඳහා ශ්‍රී ලාංකික සිසුනට හොඳ අවස්ථාවක් වන අතර ලොව හොඳම විශ්වවිද්‍යාල හතරක් ඇතුළුව විශ්ව විද්‍යාල 150කට අධික සංඛ්‍යාවක් තෝරා ගැනීම සඳහා අවස්ථාව සැලසෙන බව ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් සාරා හුල්ටන් මහත්මිය පවසයි.

කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් එක්සත් රාජධානියේ ඇතැම් විශ්වවිද්‍යාල විදේශීය සිසුන් සඳහා අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම 2021 වසර දක්වා කල්දමා තිබෙන අතර, මෙම නව වීසා මාර්ග හඳුන්වා දීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන්ට විධිමත් ක්‍රියාවලියෙන් ප්‍රතිලාභ ලබාදීමයි.

2019 මාර්තු මාසයේ දී ප්‍රකාශයට පත් කළ අන්තර්ජාතික අධ්‍යාපන ක්‍රමෝපායේ දක්වා ඇති පරිදි 2030 වනවිට උසස් අධ්‍යාපනයට එක්සත් රාජධානිය තෝරා ගන්නා මුළු අන්තර්ජාතික සිසුන් සංඛ්‍යාව 600,000 දක්වා වැඩි කිරීමට මෙය උපකාරී වන බවද ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය කියා සිටී.

මහවැලියේ හෙක්ටයාර් 10,000ක බඩඉරිඟු වවයි

මහවැලි කලාප, ඉඩම් හෙක්ටයාර් 10,000 ක බඩඉරිඟු වගා කිරීමේ වැඩසටහනේ සමාරම්භය වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ මෙහෙයවීම යටතේ, මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදුයටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගමලත් මහතා ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා (02) ආරම්භ කෙරිණි.

මහවැලි L කලාපයට අයත් වැලිඔය, ඇතාවැටුණවැව, නිකවැව ප්‍රදේශයේ දී අක්කර තුන්දහසක බඩඉරිඟු වගා කිරීම මෙලෙස සංකේතාත්මකව ආරම්භ කෙරිණි.

මෙම ඔක්තෝබර් මාසය තුළ පමණක් මහවැලි කලාපයන්හි අක්කර 15,000ක බඩඉරිඟු වගා කෙරේ.

මෙරට වාර්ෂික බඩඉරිඟු අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 500,000ක්, පමණ වේ. එම අවශ්‍යතාවයෙන් අඩක් එනම් මෙට්‍රික් ටොන් 250,000 රට තුළ නිෂ්පාදනය කෙරේ. තවත් මෙට්‍රික් ටොන් 250,000 ආනයනය කෙරෙන අතර ඒ සඳහා වැය කරන මුදල රුපියල් මිලියන 4000ක් පමණ වේ. මීට විකල්පයක් ලෙස මෙරටට අවශ්‍ය බඩඉරිඟු රට තුළම නිෂ්පාදනය කර ගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී තිබේ.

මහවැලි අධිකාරියට අයත්, කෘෂි ඉඩම් ගොවි ජනතාව සඳහා සහන බදු පදනමක් යටතේ බෙදා හැර මෙරට බඩඉරිඟු අවශ්‍යතාව, රට තුළම නිෂ්පාදනය කර ගැනීම ජනාධිපතිවරයාගේ අපේක්ෂාව වී තිබේ.

මේ සඳහා අවශ්‍ය බීජ වෙනුවෙන් වැයවන මුදලින් අඩක්, මහවැලි අධිකාරිය විසින් දරනු ලැබේ.

ජාතික මහජන සම්පත් ලොතරැයි

දිනුම් වාරය 630
නිල ප්‍රතිඵල
දිනය: 2020.10.02

ඉංග්‍රීසි අකුර	සුපිරි අංකය	ජයග්‍රාහී අංක				
E		05	37	38	56	58

	තෑග රටාව	තෑග මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෑගය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	-
2 වන තෑගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	05
3 වන තෑගය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	123
4 වන තෑගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	312
5 වන තෑගය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	7,401
6 වන තෑගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	4,851
7 වන තෑගය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	121,582
8 වන තෑගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	22,048

මීළඟ මෙගා සුපිරි තෑගය රු. 51,756,214.40
මීළඟ පවර් සුපිරි තෑගය රු. 11,026,654.00
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෑගය රු. 18,487,775.60
දිනා ඇති මුළු මුදල රු. 4,585,740.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- තෑග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.පේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

ජාතික මහජන සම්පත් ලොතරැයි

දිනුම් වාරය 631
නිල ප්‍රතිඵල
දිනය: 2020.10.03

ඉංග්‍රීසි අකුර	සුපිරි අංකය	ජයග්‍රාහී අංක				
Q		08	46	63	72	77

	තෑග රටාව	තෑග මුදල රු.	ජයග්‍රාහකයන් සංඛ්‍යාව
1 වන තෑගය	අංක 4 ක් පමණක් ගැළපේ නම්	1,000,000.00	01
2 වන තෑගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	100,000.00	08
3 වන තෑගය	අංක 3 ක් පමණක් ගැළපේ නම්	1,000.00	125
4 වන තෑගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	500.00	280
5 වන තෑගය	අංක 2 ක් පමණක් ගැළපේ නම්	100.00	6,986
6 වන තෑගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	40.00	4,556
7 වන තෑගය	අංක 1 ක් පමණක් ගැළපේ නම්	20.00	116,192
8 වන තෑගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	20.00	21,194

මීළඟ මෙගා සුපිරි තෑගය රු. 51,837,181.60
මීළඟ පවර් සුපිරි තෑගය රු. 11,107,621.20
මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි තෑගය රු. 18,568,742.80
දිනා ඇති මුළු මුදල රු. 5,693,560.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි තෑග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- තෑග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.පේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

මීගමුව මෝය කටේ දිය නෑමට ගොස් අතුරුදන් වූ තරුණයන් සොයා මෙහෙයුම්

අසේල කුරුළුවංශ

මිගමුව කම්මල්තොට මෝය කට ප්‍රදේශයෙන් මුහුදේ දිය නෑමට ගොස් අතුරුදන් වූ තරුණයන් තිදෙනාගෙන් දෙදෙනකු තලවකැලේ අල්පාකන්ද වත්තේ පදිංචිකරුවන් බව තලවකැලේ පොලීසිය පැවසීය.

මෙම තරුණයන් තිදෙනා පෙරේදා (3) පස්වරු 3.30ට පමණ තවත් තරුණයන් පිරිසක් සමඟ මුහුදේ දිය නෑමට ගොස් රළ පහරට හසු වී මුහුදට ගසාගෙන ගොස් ඇත. දියේ ගිලී අතුරුදන් වූ තරුණයන් තිදෙනා සොයා නාවික හමුදාව ඊයේ (4) දිනයේ මෙහෙයුමක් අරඹා තිබිණි.

මෙලෙස දියේ ගිලී අතුරුදන්ව ඇත්තේ තලවකැලේ අල්පාකන්ද වත්තේ පදිංචි මුත්තුකුමාර් සිදුජන් (22) සහ මනෝහරන් ශෂිකුමාර් (23) සහ බදුල්ල ප්‍රදේශයේ පදිංචි ප්‍රදිපන් නැමති තරුණයන් තිදෙනායි.

මිගමුව දංකොටුව ප්‍රදේශයේ පාපිසි නිෂ්පාදනය කරන පෞද්ගලික ආයතනයක සේවය කර තිබෙන මෙම තරුණයන්, එම පෞද්ගලික ආයතනයේ සේවය කරන තලවකැලේ අල්පාකන්ද වත්තේම පදිංචි තරුණයකුගේ උපන් දිනය නිමිත්තෙන් පැවැති උත්සවයකට සහභාගී වී තිබේ. දිවා ආහාරයට ප්‍රථම මෙම පිරිස මුහුදේ දිය නෑමට ගොස් ඇති අතර, එම අවස්ථාවේ එක් තරුණයකු රැල්ලට අසු වී ගසාගෙන ගොස් තිබේ. එම තරුණයා බේරා ගැනීමට ගිය අවස්ථාවේ අනෙක් තරුණයන් දෙදෙනාද දිය රළට අසුව ගසාගෙන ගොස් ඇත.

මුහුදු රැල්ලට හසුව ගසාගෙන ගිය එක් තරුණයකු කොච්චිකඩේ පොලීසිය බේරාගෙන ඇත. අතුරුදන්ව ඇති තලවකැලේ ප්‍රදේශයේ තරුණයන් දෙදෙනා මීට මාස හයකට කට ප්‍රථම එම පෞද්ගලික ආයතනයේ සේවයට එක්ව තිබෙන බව එම තරුණයන්ගේ ඥාතීහු පවසති.

වගා ළිඳට වැටුණු ඇතින්න හා පැටියාගේ දිවි ප්‍රදේශවාසීහු ගලවා ගනිති

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

ගලෙන්බිඳුණුවැව දුටුවැව 12 කොටස ප්‍රදේශයේ කුඹුරු යායක තිබූ අනාරක්ෂිත වගා ළිඳකට වැටී සිටි ඇතින්නක සහ කුඩා පැටියකු ගොඩට ගැනීමට ප්‍රදේශවාසීන් ඉකුත් දා කටයුතු කර තිබේ.

මෙම ඇතින්න හා පැටියා වගා ළිඳට වැටී සිටිනු දුටු ප්‍රදේශවාසීන් ගලෙන්බිඳුණුවැව පොලිස් ස්ථානයට දැනුම් දී ඇති අතර, ගලෙන්බිඳුණු වැව පොලීසිය මොරගොඩ වනජීවී නිලධාරී කාර්යාලට දැන්වා තිබේ.

ඉකුත්දා (2) රාත්‍රී කාලයේ මෙලෙස ගම් වැදුණු වනඅලි රංචුවක සිටි ඇතින්නක හා පැටියකු මෙම අනාරක්ෂිත ළිඳට වැටී ඇති බව ප්‍රදේශවාසීහු පවසති. අනාරක්ෂිත ළිඳෙහි රාත්‍රියක් ම ගත කළ ඇතින්න හා පැටියා උදෑසන කාලයේ ගොඩ ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරීමට ගම්වාසීන්ට සිදු විය.

ගීතිකාව

සරු අස්වැන්නකට ගොවියෝ යොදවති — ජවය
තුරු වැල් වැඩෙන්නේ අරගෙන ඒ — බලය
දරුවන් සරු කරන්නට දෙන නැණ — ගුණය
ගුරු දෙව්වරුන් වෙනුවෙන්මයි ගුරු — දිනය

ෆේස්බුක් සාදයට ගෙන ගිය ලක්ෂ දහයක ගංජා-අයිස් සමඟ සැක 12ක් දැලේ

නිමල් රාජපක්ෂ

ගාල්ල ප්‍රදේශයේ සුපිරි හෝටලයක පැවත්වීමට තිබූ ෆේස්බුක් සාදයක් සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ මෝටර් රථ දෙකකින් ප්‍රවාහනය කළ රුපියල් ලක්ෂ දහයක් වටිනා ගංජා හා අයිස් මත්ද්‍රව්‍ය තොගයක් සමඟින් සැකකරුවන් 12දෙනකු දකුණු පළාත් සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකකය පසුගිය දා අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය තොගයේ ගංජා මිලි ග්‍රෑම් 183000ක් ද, අයිස් මිලි ග්‍රෑම් 4160ක් ද තිබුණු බව දකුණු පළාත් සුරාබදු විශේෂමෙහෙයුම් ඒකකයේ ස්ථානාධිපති, ප්‍රධාන සුරාබදු පරීක්ෂක, ධීර ගුණසේකර මහතා පැවසීය.

දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ සුපිරි වාහන දෙකක මත්ද්‍රව්‍ය රැගෙන එන බවට ලැබුණු තොරතුරක් මත මෙම මෙහෙයුම කර ඇත. ඒ අනුව අදාළ මෝටර් රථය පසුපස හබා ගොස් පින්නදුව පිවිසුමේදී මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කළ මෝටර් රථ දෙකක් හා සැකකරුවන් 6 දෙනකු ඒ මොහොතේම අත්අඩංගුවට ගෙන ඇත. පසුව ඔවුන්ගෙන් කළ ප්‍රශ්න කිරීම්වලදී මත්ද්‍රව්‍ය රැගෙන යන්නේ ගාල්ල ප්‍රදේශයේ සුපිරි හෝටලයක පැවැත්වෙන ෆේස්බුක් සාදයක් සඳහා බවට තොරතුරු අනාවරණය වී තිබේ.

ඒ අනුව අදාළ හෝටලයේ පැවැත්වෙන ෆේස්බුක් සාදය වටලා ගංජා හා අයිස් මත්ද්‍රව්‍ය සමඟින් එම ස්ථානයෙන් ද සැකකරුවන් හයදෙනකු කොටු කර ගැනීමට සුරාබදු නිලධාරීන් සමත් වී තිබේ.

අත්අඩංගුවට පත් සැකකරුවන් අවුරුදු 18ත් - 30ත් වන කොළඹ, වැල්ලම්පිටිය, බොරැල්ල, කැලණිය, වත්තල, කොළඹ, 12 යන ප්‍රදේශවල පදිංචි කරුවන් බව සුරාබදු නිලධාරීහු පැවසූහ.

සැකකරුවන් 2දා ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව වරද පිළිගත් බැවින් එක් අයෙකුට රුපියල් 5000 බැගින් සැකකරුවන් 12දෙනාට රුපියල් 60,000ක දඩමුදලක් ගෙවන ලෙස නියම කෙරිණි.

වැලි කැණීම පිටුපස ඉල්ලම් ජාවාරම සොයන්න ගිය මාධ්‍යවේදියාට මැර ප්‍රහාරයක්

වැල්ලවාය විශේෂ පී. අයි. ආර්. ගරුසිංහ

මොනරාගල වැල්ලවාය ප්‍රධාන මාර්ගය ආසන්නයේ කුඹුක්කන පාලම දෙපස මහාපරිමාණයෙන් සිදු කරන වැලි කැණීමක් පිටුපස සිදුවන ඉල්ලම් ජාවාරම සම්බන්ධයෙන් ප්‍රවෘත්තියක් ආවරණය කිරීමට ගිය මොනරාගල දෙරණ හා මව්බිම ප්‍රාදේශීය මාධ්‍යවේදි ඉඳුනිල් සිසිර විජේනායක මහතා මැර ප්‍රහාරයකට ලක් වීමන් තුවාල ලබා මොනරාගල මහා රෝහලට පෙරේදා (3) රාත්‍රී ඇතුළත් කර තිබේ.

මෙම අනවසර ඉල්ලම් ජාවාරම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්, රජයේ නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් පිරිසක් ලබාදුන් තොරතුරුවලට අනුව මාධ්‍යවේදියා ජාවාරම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් සමඟ තොරතුරු විමසමින් සිටින අතරතුර පිටුපසින් පැමිණි පුද්ගලයන් කිහිපදෙනකු බෙල්ලෙන් අල්ලා කැමරාව උදුරාගෙන පහරදී තිබේ. ඔහු සතු ජංගම දුරකථන දෙක ද උදුරා ගැනීමට උත්සහ දරා ඇති අතර, ග්‍රහණයෙන් මිදී ඒ ආසන්නයේ තිබූ කුඹුක්කන පොලිස් මුරපොළ වෙත දිවගොස් තම ජීවිතය බේරාගෙන තිබේ.

එම සිද්ධිය විස්තර කරන ඉඳුනිල් විජේනායක මහතා මෙසේ කියා සිටියේය.

කුඹුක්කන් ඔයේ පාලම යට මහාපරිමාණයෙන් වැලි ඉවත්කිරීම සිදු කරනවා. බෝට්ටු දාලා ජේසිබී දාලා මැණික් ඉල්ලම් හාරනවා කියා ගමේ ජනතාව කීවා. ප්‍රාදේශීය සභාවේ අයත් කතා කළා. මා සියැසින්ම ඒ ව්‍යසනය දැක්කා. ගමේ අයගෙන් විස්තර ගන්න අතරතුර පිටිපස්සෙන් හිටපු කෙනෙක් ඔලුවට ගැහුවා. ක්ලාන්තක් වගේ අවා. ඔලුවට තුන හතරක් ගැහුවා. කැමරාව ඇදලා ගත්තා. කැමරාවෙන් මට ගැහුවා ඇඟිල්ලට වැදිලා ඇඟිල්ල පැලුණා. කැමරාව පොළොවේ ගහන්න හැදුවා. ඒ එක්කම මට පයින් දෙක තුනක් ගැහුවා. එ අතර එක්කෙනක් කිව්වා මූ උස්සලා පාලමෙන් පහළට දාමු කියා කීවා.

මේවන විට මාධ්‍යවේදී ඉඳුනිල් විජේනායක මහතා නේවාසිකව ප්‍රතිකාර ලබන අතර, සිද්ධිය සම්බන්ධ සැකකරුවකු පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ. තවත් පුද්ගලයන් දෙදෙනකු පලාගොස් ඇති අතර, මොනරාගල මූලස්ථාන පොලිස් පරීක්ෂක ඉන්දික ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ සිදු කරයි .

අද නැත්ත

ජාතිය මෙන්ම ආගම මුල් තැනක — තියා
සමහර පිරිස් දෙස්පාලන ගමන — ගියා
මතකයි රවට එදවස දොස් පැවරූ — නියා
කොහොමද ? හොඳ වෙන්නෙ නරකයි කියපු — එයා

තලගොයි මසට දඩයම් කොට කබර — ගොයා
රසකර කෑම නරකයි කන බඳුනෙ — තියා
සුළු වාසියට කිසි විටෙකත් නොමග — නොයා
යායුතු නොවෙද? ලද බහුතර මතය — සොයා

රටේමුල්ලේ මුදන්නායක

පන්සල්වල සංවර්ධන වැඩට යැයි කියා මුදල් ගැරෑ චීවරධාරියකු ඇතුළු සැක හතරක් අත්අඩංගුවට

අසේල කුරුළුවංශ

මහනුවර නෙල්ලිගල අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානය ඇතුළු විවිධ බෞද්ධ සිද්ධස්ථානවල සංවර්ධන කටයුතු සඳහා යැයි කියමින් ව්‍යාජ ලිපි ශීර්ෂ සකස්කර මුදල් එකතු කිරීමේ මහ පරිමාණ ජවාරමක නිරතව සිටි චීවරධාරියකු ඇතුළු පුද්ගලයන් සිව්දෙනකු පේරාදෙනිය පොලීසිය පෙරේදා (3) අත්අඩංගුවට ගෙන තිබේ.

වාහනයකින් දිනපතා පැමිණ චීවරධාරියකු සහ තවත් තිදෙනකු නෙල්ලිගල බෞද්ධ මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා යැයි කියමින් මුදල් එකතු කරන බවට එම විහාරාධිපති වතුරකුඹුරේ ධම්මරතන හිමි වෙත පැමිණිලි රැසක් ලැබී ඇත. ඒ සම්බන්ධයෙන් විමසිල්ලෙන් සිට අදාළ කණ්ඩායම යටිනුවර ප්‍රදේශයේදී ප්‍රදේශවාසීන්ගේද සහය ඇතිව අල්ලා ගැනීමට උන්වහන්සේ සමත්ව තිබේ.

එම තිදෙනා නෙල්ලිගල විහාරස්ථානයට ගෙනවිත් පරීක්ෂා කිරීමේදී මොවුන් නෙල්ලිගල පමණක් නොව වෙනත් වෙහෙර විහාරස්ථාන රැසක නමින් ව්‍යාජ ආධාර පත්‍රිකා සහිත ටිකට් පොත් මුද්‍රණය කර එමඟින් ලක්ෂ ගණනින් මුදල් උපයා ඇති බව හෙළි විණි.

චීවරධාරියකු ලෙස පෙනී සිටි තැනැත්තා සාමාන්‍ය ඇඳුමින් සැරසී කාන්තාවන් සමඟ එක්ව ගත් ඡායාරූප හා විවිධ හෝටල්වල මත්පැන් සාද පැවැත් වූ බිල් රැසක් ද සොයාගෙන තිබේ.

මුදල් එකතු කළ ලේඛන රැසක් ද චීවරධාරියා භාවිත කළ ඇඳුම් පැලඳුම් තොගයක් ද හමු වූ බව ධම්මරතන හිමියෝ කීහ.

පේරාදෙනිය පොලීසියේ නිලධාරීන් කැඳවා සැකකරුවන් තිදෙනා පොලීසියට බාරදීමට පියවර ගත් බවත්, මොවුන් දින තුනකදී රුපියල් ලක්ෂ 8ක පමණ මුදලක් එකතුකර තිබෙන බවත් විහාරාධිපති හිමියෝ පැවසූහ.

චීවරධාරියකු ලෙස පෙනී සිටි පුද්ගලයා මහනුවර ප්‍රදේශයේම පදිංචි නම් කිහිපයකින් පෙනී සිටි අයකු බව පොලිස් පරීක්ෂණවලින් අනාවරණය වී තිබේ. අත්අඩංගුවට ගත් අනිත් දෙදෙනා ගලේවෙල හා මාතර ප්‍රදේශවල පදිංචිකරුවන් බව පොලීසිය පවසයි.

මීගොඩට මත්ද්‍රව්‍ය බෙදාහැරි ජාවාරම්කරුට - ගෝලයාට වැඩ වරදී

මංජුල හිරිපිටිය - හෝමාගම සංවාරක

මීගොඩ සහ ඒ අවට ප්‍රදේශවල මත් ද්‍රව්‍ය බෙදාහරින ප්‍රධාන ජාවාරම්කරු සමඟ ඔහුට සහාය දුන් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රධාන ජාවරම්කරු රඳවාගැනීමේ නියෝග යටතේ ප්‍රශ්න කිරීමටත් සහාය දුන් පුද්ගලයා රක්ෂිත බන්ධනාගාර කිරීමට හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කළ බව මීගොඩ පොලීසිය පැවසීය.

ප්‍රධාන ජාවරම්කරු කාන්තාවක් සමඟ මෝටර් රථයක ගමන් කරමින් සිටි බවට පොලීසියට ලද තොරතුරක් මත මීගොඩ බටවල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

මීගොඩ බටවල ප්‍රදේශයේ පදිංචි අශාන් මදුශංක සේදනායක නමැති ප්‍රධාන ජාවරම්කරු ගමන් ගත් මෝටර් රථය පරීක්ෂා කිරීමේ දී මෙතෙක් හඳුනාගෙන නොමැති අමෙරිකාවේ නිෂ්පාදිත බවට සැකකරන කුඩා ගිනි අවියක් පතුරම්ගැබක් හෙරෝයින් ග්‍රෑම් තිහක්, "මැන්ඩි" නමින් හඳුන්වන මත් කුඩු ග්‍රෑම් පනහක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත. මූලික ප්‍රශ්න කිරීමේ දී ගිනි අවිය හෝමාගම නියදගල ප්‍රදේශයේ ජාවරම්කරු සිය අනියම් බිරිය සමඟ සිටීමට කුලී පදනමට ගත් දෙමහල් නිවෙසේ සඟවා ඇති බවට වූ සැකය මත පොලීසිය ජාවරම්කරු එම නිවෙසට රැගෙන ගොස් ඇත. නිවෙස පරීක්ෂා කිරීමේ ජාවරම්කරු එකවර දෙමහල් නිවෙසින් බිමට පැණීමෙන් තුවාල ලබා හෝමාගම රෝහලට ඇතුළත් කර තිබේත.

අනතුරුව ප්‍රධාන ජාවරම්කරු සමඟ සහාදුන් පුද්ගලයන් අධිකරණය ඉදිරිපත් කළ බව පොලීසිය පැවසීය. සහාය දුන් පුද්ලයා ළග තිබි "කැම්පා" නමැති මත් කුඩු ග්‍රෑම් දහයක් සහ ගමන් ගත් යතුරු පැදිය සහ ප්‍රධාන ජාවාරම්කරු ගමන් කළ මෝටර් රථය පොලිස් භාරයට ගෙන ඇත.

ක්‍රිස්වස්ෆාම් වත්තට කොටි බියක්

අසේල කුරුළුවංශ

හැටන් දිඹුල පොලිස් වසමට අයත් ක්‍රිස්වස්ෆාම් තේ වත්තේ සැරිසරන කඳුකර කොටියකු රාත්‍රී කාලයේ තම නිවාස ආසන්නයට පැමිණ සුනඛයන් ඇතුළු සුරතලයට ඇති කරන සතුන් ගොදුරු කරගැනීම හේතුවෙන් එම වතුයායේ පදිංචිකරුවෝ දැඩි භීතියට පත්ව සිටිති.

වත්තේ නිවාසවල ඇතිකරන සතුන් හිටි හැටියේ අතුරුදන් වීමට පටන් ගැනීම නිසා වතුකම්කරුවන් සියලුදෙනා එකතු වී ඊට හේතුව සොයා ගැනීම සඳහා නිවාස කිහිපයක සී.සී.ටී.වී කැමරා සවිකර ඇත.

රාත්‍රී කාලයේ තම නිවාස අසලට පැමිණෙන හොඳින් වැඩුණු කොටියකු සුරතලේට ඇති කරන සුනඛයකු ගොදුරු කරගෙන යන අයුරු සටහන්ව තිබීමත් සමඟ වතුකම්කරුවන් දැඩි නොසන්සුන්තාවට පත්ව තිබේ.

සිංහිමලේ රක්ෂිතයේ සහ කොටගල අවට තේ වතුවල සැරිසරන කොටි මීට ප්‍රථම අවස්ථා කිහිපයකදී ම තම නිවාස අසල සැරිසරමින් කුකුළන් සහ සුනඛයන් ගොදුරු කරගත් බව වතුකම්කරුවෝ පවසති.

පවත්නා තත්ත්වය මත රාත්‍රී කාලයේ කිසිදු අවශ්‍යතාවකට නිවසින් පිටතට ඒමට පවා නොහැකි වී තිබෙන බවත්, තම දරුවන්ගේ ජීවිතවලට ද මේ නිසා දැඩි අවදානමක් ඇතිව තිබෙන බවත් ඔවුහු පැවසූහ.

කොටියා සුනඛයකු ගොදුරු කරගැනීමෙන් පසු සිරුර රැගෙන යන අයුරු තවත් සුනඛයකු බලා සිටින ආකාරය ආරක්ෂිත කැමරාවේ පැහැදිලිව සටහන්ව තිබේ. හැටන් කොටගල ක්‍රිස්වස්ෆාම් වතුයායේ පදිංචිකරුවන්ට එල්ල වී තිබෙන කොටි තර්ජනය සම්බන්ධයෙන් ඔවුන් නල්ලතන්නිය වනජීවී කාර්යයාලයේ නිලධාරීන්ට ද දැනුම් දී ඇත.

මේ සම්බන්ධයෙන් අප නල්ලතන්නිය වනජීවී කාර්යයාලයේ වන සත්ව අඩවි ආරක්ෂක ප්‍රභාෂ් කරුණාතිලක මහතාගෙන් විමසූ විට ඔහු පැවසුවේ සුනඛයන් කඳුකර කොටියාගේ ප්‍රියතම ගොදුරක් බවත්, නිවෙස්වල සුරතලේට ඇති කරන සුනඛයන් දැඩි ආරක්ෂිත කුඩුවල රාත්‍රී කාලයේ ගැට ගසා තැබීම මෙයට පිළියම බවයි.

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 05 සඳුදා

යාපනේ සිට ගැඹුරු හුස්මක්

යුද්ධයෙන් හා ත්‍රස්තවාදයෙන් බිමට සමතලා වූ යාපනයේ අද තත්ත්වය සියැසින්ම දැක ගැනීමේ අවස්ථාව අපට ලැබිණි. විනාශයෙන් වසර එකොළහකට පසු උතුරේ ජන මනසට එබී බලන්නට ලැබුණු අගනා අවකාශයක් හැටියට ද එය සැලැකිය හැකිය. මේ ඉඩ හසර උදා වූයේ අපගේ සහෝදර 'තිනකරන්' පුවත්පතෙහි ප්‍රවර්ධන වැඩසටහනකට සහභාගී වන අතරතුරය. අපි යාපනය සරසවියට ගියෙමු. එය ඉතා සාමකාමීය. බුද්ධිමතුන්ගේ ක්ෂේම භූමියක් ලෙස එය පවතී. අපි නගරය පුරා ඇවිද්දෙමු. අලුත් හෝටල් බිහි වී ඇත. මංමාවත් කොළඹට වඩා පුළුල්ය; පිරිසුදුය; විධිමත්ය. අපි වෙළෙඳ පොළ නිරීක්ෂණය කළෙමු. කිසි අඩුවක් නැත. වෙළෙඳාම ජයට සිදු වෙයි. යාපනය සන්සුන්ය; එහෙත් ගැඹුරුය.

යාපනය යනු ශ්‍රී ලංකාවේ ඓතිහාසික නගරයකි. හින්දු සංස්කෘතියේ දේශීය කේන්ද්‍රස්ථානය ලෙස ද උතුරේ ආර්ථික මර්මස්ථානයක් ලෙස ද, දෙමළ බුද්ධිමතුන්ගේ නිජබිම ලෙස ද එය හඳුන්වනු ලැබේ. මේ සියල්ල ගත් කල යාපනය අපේ ගමන් මගෙහි තීරණාත්මක සාධකයකි. එය අතහැර රටේ අනාගතය ගැන කතා කිරීම අපහසු ය. සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මේ තත්ත්වය වටහා ගෙන ක්‍රියා කර ඇත්තේ කාලයක සිටය. 'තිනකරන්' ඇතුළු අපේ දෙමළ පුවත්පත් ඊට සාධකයක් ලෙස පවතී. සමබර තොරතුරු සම්පාදනය හා බුද්ධිමය සංවාදවලට ප්‍රමුඛ තැන දීම අපගේ සන්නිවේදන ඉලක්කය වෙයි. යාපනය සරසවියේදී ලද ප්‍රතිචාරවලින් පෙනී යන්නේ උතුරේ බුද්ධිමත් සමාජය අපගේ ක්‍රියාවලිය අනුමත කරන බවය.

ජනමාධ්‍ය අමාත්‍යවරයා, ධීවර අමාත්‍යවරයා ඇතුළු අමාත්‍යවරු, මන්ත්‍රීවරු කීපපොළක් ද, ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ඇතුළු නිලධාරීහු කීපපොළක් ද මෙම චාරිකාවට එක් වූහ. වැඩමුළු, සම්මන්ත්‍රණ හා සාකච්ඡාවලට ද ඔවුහු සහභාගී වූහ. එක්තරා සාකච්ඡාවකදී මතු වූ ප්‍රශ්නයකට අපූරු පිළිතුරක් දීමට ද ජනමාධ්‍ය අමාත්‍යවරයා අමතක නොකළේය. ප්‍රශ්නය යොමු වූයේ තිලීපන් සැමරුම ගැනය. උත්තරය සෘජුය; ඉතා පැහැදිලිය. ඕනෑම කෙනකුට පෞද්ගලික සැමරුම් කළ හැකිය. එය පුද්ගල නිදහසට අයත් කාරණයකි. එහෙත් ත්‍රස්තවාදය හෝ බෙදුම්වාදය හෝ අන්තවාදය හෝ ප්‍රවර්ධනය කරන වැඩසටහන්වලට නීතියෙන් ඉඩක් නැත. එබඳු අදහස් හා මතවාද සමාජගත කිරීම ද වැරැද්දකි. ඒවාට නීතිය අනුව ක්‍රියා කිරීම සිදු වේ. මෙයට පෙර වතාවක තිලීපන් සැමරුම් උත්සවයක් පැවැත්වීමට ගිය සිවාජිලිංගම් අත්අඩංගුවට පත් වන්නේ ඒ අනුවය. රජය ඉදිරියට ද නොපැකිළව නීතිය ක්‍රියාත්මක කරන බව ද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

දේශපාලකයන් දකුණේදී එක කතාවක් ද, උතුරේදී තව කතාවක් ද ඉන්දියාවේදී තවත් කතාවක් ද කියනු අප දැක තිබේ. එහෙත් ජනමාධ්‍ය අමාත්‍යවරයා උතුරට ගොස් කියා සිටියේ ද දකුණේදී කියන කතාවමය.

පසුගියදා පැවැති සාකච්ඡාවකදී අගමැතිවරයාගෙන් ද තිලීපන් සැමරුම ගැන විමසන ලදී. අගමැතිවරයාගේ පිළිතුර වූයේ ද ත්‍රස්තවාදී නායකයන් ප්‍රසිද්ධියේ සැමරීම ත්‍රස්තවාදයට අනුබල දීමක් බවය. ඒ අනුව තරාතිරම නොබලා එබඳු පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වන බව අගමැතිවරයා පෙන්වා දුන්නේය. අගමැති මෝදි සමඟ මහින්ද මහතා කළ සාකච්ඡාවෙන් ද පැහැදිලි වන්නේ රටේ ඒකීයභාවය හා ස්වාධිපත්‍යය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය නොවෙනස්වනසුලු නිවැරැදි එකක් බවය. වැදගත් දේශපාලකයන් ක්‍රියා කළ යුත්තේ එබඳු ප්‍රතිපත්තියක පිහිටා යැයි කිව යුතුය.

රාසයියා පාර්දිපන් හෙවත් ත්‍යාගදීපන් තිලීපන් යනු කොටි සංවිධානයේ කර්නල්වරයෙකි. ඔහු යාපන සරසවියේ වෛද්‍ය ශිෂ්‍යයකු ලෙස ක්‍රියා කරන කාලයේ කොටි සංවිධානයට සම්බන්ධ වී ඇත. පසුව අධ්‍යාපනය අත්හරින ඔහු ප්‍රභාකරන්ගේ සම්පතමයකු ලෙස ඊළාම් සටනේ දැවැන්තයකු බවට පත් වෙයි. 1987 දී ඊළාම් සටනට සහයෝගය දක්වමින් උපවාසයක් ආරම්භ කරන ඔහු දින දොළහක ඇවෑමෙන් මරණයට පත් වෙයි. පසුව හෙළිදරව් වී ඇත්තේ තිලීපන් සුව කළ නොහැකි පිළිකා රෝගයකින් පෙළුණු බවය. කුමක් වුව තිලීපන් යන සාධකය අදටත් දේශපාලන වශයෙන් භාවිත වෙයි. ඊට වැඩි උනන්දුවක් දක්වන්නේ දෙමළ ඩයස්පෝරාව යැයි කිව හැකිය. උතුරේදී පැවැත්වීමට ගිය තිලීපන් සැමරුම් කිහිපයක්ම තහනම් කරන ලදී.

උතුරේ ඇතැම් දේශපාලකයන් ඊළම නමැති සංකල්පය අලෙවි කරන බව ඉතා පැහැදිලිය. එය යුද්ධයෙන් පසුව භාවිත වන දේශපාලන උපායමාර්ගයක් ලෙස පවතී. මහවිරු සැමරුම්, ප්‍රභාකරන් සැමරුම්, කොටි නායක සැමරුම් හා තවත් අන්තවාදී උත්සව පසුපස ප්‍රධාන බලවේග දෙකක් පවතී. පළමු බලවේගය වන්නේ දෙමළ ඩයස්පෝරාවය. දෙවන බලවේගය වන්නේ උතුරේ අන්තවාදී දේශපාලකයෝය. එහෙත් මහජනයාගේ පොදු මතය ගත හොත් එය පවතින්නේ වෙනත් තැනකය. නැවත යුද්ධයකට ජනතාවගේ කිසිදු කැමැත්තක් නැත. ත්‍රස්තවාදයට හෝ අන්තවාදයට ඔවුන් ළඟ කිසිදු ඉඩක් නැත. පවතින සාමය හා නිදහස් පරිසරය ශක්තිමත් කරගැනීම ඔවුන්ගේ ඉලක්කය බවට පත් වී තිබේ. අප එය අනුමත කළ යුතු සේම ඊට ශක්තියක් ලෙස ක්‍රියා කළ යුතු ද වෙයි.

යුද්ධයෙන් පසු යාපනය ලබා ඇති දියුණුව ගැන පුදුම විය හැකිය. 2009න් පසු ක්‍රියාත්මක වූ උතුරු වසන්තය එහි දියුණුවේ පදනම බව කිව යුතුය. නැවත හර්තාලයක් මතු නොවීමට නම්, උතුරේ ජනතාවට අපගේ දැත දිය යුතුය. වත්මන් ආණ්ඩුවට එය හොඳින්ම ඉටු කළ හැකිය.

නිකටට වැටුණු මුඛවාඩම් උඩට	ගමු
පොදි කන එකට රැස් වෙන එක අඩු	කරමු
අත් සෝදමින් පිරිසුදුකම රැක	ගනිමු
නැවතත් කොරෝනට සවියෙන් මුහුණ	දෙමු

කොටස් වෙළෙඳපොළේ නවරැල්ල

මේ වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ ශීඝ්‍ර සක්‍රීය වීමක් වාර්තා කරමින් පෙරට ඇදෙයි. ව්‍යාපාරික හා ආයෝජක විශ්වාසය තහවුරු කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඉකුත් 28 වැනි සඳුදා සියලු කොටස් මිල දර්ශකය ඒකක 6028 දක්වා ඉහළ අගයක් වාර්තා කළේය.

කොරෝනා වසංගතය නිසා ලොව පුරා සියලු කොටස් වෙළෙඳපොළ දරුණු පසුබෑමකට ලක් විය. විශේෂයෙන් ලෝක ආර්ථිකය කෙරෙහි සෘජු බලපෑමක් කළ හැකි නිව්යෝර්ක් කොටස් වෙළෙඳපොළ, ලන්ඩන් කොටස් වෙළෙඳපොළ, ජපාන කොටස් වෙළෙඳපොළ මෙන්ම, චීනයේ වෙළෙඳපොළ ද ක්ෂණික කඩා වැටීමකට ලක් වීම නිසා, දරුණු ආර්ථික අවපාතයක් ඇති වන බවට ආර්ථික විද්‍යාඥයෝ අනතුරු අඟවමින්, මේ තත්ත්වයෙන් අත්මිදීමට යෝජනා ද ඉදිරිපත් කළහ.

ක්‍රමයෙන් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් සිටියදී, කොළඹ කොටස් වෙළෙඳපොළේ වූ 'ඒකක 6000 කඩුල්ල' පැනීම ලෙහෙසියෙන් අමතක කළ හැකි පිම්මක් නොවේ. එදින සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 169.16 ක වර්ධනයක් වාර්තා කළේය. කාසන් සහ බුකිඩ් ඩාරා සමාගම් දෙකේ කොටස් මිල අධික වශයෙන් ඉහළ යෑම 44% ක් හා 77%ක් ලෙස වාර්තා විය. තවත් පැහැදිලි කරතොත්, කාසන් එක් කොටසක මිල රුපියල් 255 සිට රුපියල් 370 දක්වා ද, බුකිඩ් ඩාරා එක් කොටසක මිල රුපියල් 297 සිට රුපියල් 518 දක්වා ද ඉහළ ගියේය.

මේ හැර කොමර්ෂල් බැංකුව, හේමාස් හෝල්ඩිංග්ස්, එක්ස්පෝ ලංකා, හේලිස් පැබ්රික් සහ ඉන්ඩියන් අයි. ඕ. සී. කොටස් ද විශාල ලෙස හුවමාරු විය. සඳුදා දිනයේ පමණක් කොටස් දසලක්ෂ 217ක් හුවමාරු විය. ගනුදෙනු සංඛ්‍යාව 2302කි. දිනයේ පිරිවැටුම ද රුපියල් බිලියනය ඉක්ම විය.

කොරෝනා වසංගතයත්, ඒ පසුපසින් පැමිණි ඇඳිරි නීතියත් සමඟ, සෙසු කොටස් වෙළෙඳපොළ මෙන්ම කොළඹ කොටස් වෙළෙඳපොළ ද වසා දැමීය. දීර්ඝ වසා දැමීමකින් පසු මැයි 11 වැනි දින යළි කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු සඳහා විවෘත කළ විට, සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 4392ක් ලෙස පසුබැස තිබිණි. එබැවින් සැප්තැම්බර් 28 වැනි සඳුදා ඒකක 6000 දක්වා වර්ධනයක් වාර්තා කිරීම විශිෂ්ට සිදුවීමකි. එය මැයි 11 වැනි දිනට සාපේක්ෂව ඒකක 1636ක වර්ධනය වීමකි.

සති දෙකකට පෙර රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහතා මාධ්‍යයට පැවසූයේ, වැඩි කල් නොගොස් සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 7000 සීමාවට ළං වන බවයි. එම 7000 සීමාවට ළං වීමට පෙර කොටස් මිලදී ගන්නා ලෙස ආයෝජකයන්ට අවවාද කළ ඔහු, වෙළෙඳපොළේ සිදු වන මේ වෙනසින් විදේශිකයන් වාසි ලබා ගැනීමට පෙර ක්‍රියාකාරී වන ලෙස ද, දේශීය ආයෝජකයන්ට අවවාද කර තිබිණි.

විදේශ ආයෝජකයන් සහ කොළඹ කොටස් වෙළෙඳපොළ අතර දුරස්ථභාවයක් දැනට දක්නට ලැබේ. මැයි 11 වැනිදාට පෙර සිටම විදේශීය ආයෝජකයෝ රුපියල් දසලක්ෂ 475ක අගයකින් යුතු කොටස් විකුණා, සිය ආයෝජන අකුලා ගත්හ. ඇෆ්ගනිස්තාන හා කසකස්තානය මේ ගැටලුවට තදින් මුහුණ දුන් රටවල්ය. පොදුවේ බලන විට වස්තු භංග වීමේ අනතුරින් ගැලවීම සඳහා ආයෝජකයන් මෙවැනි පියවර ගැනීම ස්වභාවිකය.

එහෙත් ශ්‍රී ලංකාවෙන් සිය ආයෝජන ඉවත් කර ගැනීම 2019 වසරේදී දක්නට ලැබුණු බව කොටස් වෙළෙඳපොළ 2019 වාර්තාවේ කියැවේ. 2019දී රටේ ආර්ථික පසුබෑමක් වූ බව ද, ඊට හේතුව ලෝක ආර්ථිකයේ පැවැති විසම තත්ත්වය සහ රටේ දේශපාලන ස්ථාවරත්වයක් නොමැති වීම යැයි පවසන එම වාර්තාව, කෘෂිකාර්මික වර්ධනය සියයට 2.3ක් ලෙස ද, කර්මාන්ත අංශය සියයට 2.3ක් ලෙසද, සේවා අංශය සියයට 2.8ක් ලෙස ද වාර්තා වීමෙන් එම පසුබෑම විදහා දැක්වෙන බව ද කියයි.

රටක දේශපාලන ස්ථාවරත්වය, ඒ රටේ විදේශ ආයෝජන කෙරෙහි ද, කොටස් වෙළෙඳපොළ කෙරෙහි ද බලපෑමක් ඇති කරයි. දේශපාලන අවුල්සහගත රටකට, ආයෝජකයන් දිනා ගැනීම පහසු ක්‍රියාවක් නොවේ.

ඉකුත් ජනාධිපතිවරණයට පෙරාතුව රට තුළ පැවතුණේ දේශපාලන බල අරගලයකි. මේ දේශපාලන සංහිඳියාවක් නොමැතිකම, කොළඹ කොටස් වෙළෙඳපොළේ පසුබෑමට එක් හේතුවක් බව කොටස් වෙළෙඳපොළ 2019 වාර්තාව තව දුරටත් සඳහන් කරයි.

> ● ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවලට අනුව, ඉකුත් සැප්තැම්බර් 25 වැනිදායින් අවසන් වූ සතියේ ගනුදෙනු සිදු වූ දිනක කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් දසලක්ෂ 2685කි. එනම් බිලියන 2.6කි. සැප්තැම්බර් 25 වැනි දින අවසන් වූ සතියේ එක් දිනක සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් දසලක්ෂ 3195කි. එනම් රුපියල් බිලියන 3.1කි. වසරකට පෙරදී පිරිවැටුම රුපියල් දසලක්ෂ 331කි. 2020 සැප්තැම්බරයේ පිරිවැටුමේ වර්ධනය එමඟින් හෙළි වේ.

අගෝස්තු 05 පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව රට තුළ දේශපාලන සංහිඳියාව නිසා කොටස් වෙළෙඳපොළේ ද ධනාත්මක ලක්ෂණ දිස් විය. ක්‍රමයෙන් වෙළෙඳපොළ සියලු දර්ශක ද, පිරිවැටුම ද ඉහළ යෑම ඇරැඹිණ. මේ පරිවර්තනයේ කූටප්‍රාප්තියට සැප්තැම්බරයේදී ළඟා වීමට කොටස් වෙළෙඳපොළට හැකි විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන මඟින් හෙළි වන අන්දමට ඉකුත් අගෝස්තු 28 වැනිදායින් අවසන් වූ සතියේ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු වූ එක දවසක සාමාන්‍ය පිරිවැටුම, රුපියල් දසලක්ෂ 1743 කි. අගෝස්තු 21 වැනි දිනට ගනුදෙනු අවසන් වූ සතියේ දිනක දෛනික පිරිවැටුම රුපියල් දසලක්ෂ 2212කි.

එහෙත් 2019 කාල සීමාවේදී වෙළෙඳපොළ තත්ත්වය කෙබඳු ද? 2019 අගෝස්තු 28 වැනිදා වන විට වෙළෙඳපොළ දෛනික සාමාන්‍ය පිරිවැටුම් රුපියල් දසලක්ෂ 651.70 කි. ඉකුත් සැප්තැම්බර් මාසයේ දිනක සාමාන්‍ය පිරිවැටුම රුපියල් බිලියනය ඉක්ම විය.

කොරෝනා වසංගතය නිසා පහත වැටුණු සමස්ත කොටස් මිල දර්ශකය, මාර්තු 20 වැනිදා ඒකක 4570 දක්වා පහත වැටිණි. 2019 මාර්තු 20 වන විට එම දර්ශකය ස්ථාපිතව තිබුණේ එකක 5500 - 5540 සීමාවේය. දේශපාලන ස්ථාවරත්වය තහවුරු වූයේ පාර්ලිමේන්තු මැතිවරණයෙනි. ක්‍රමයෙන් සමස්ත කොටස් මිල දර්ශකය සක්‍රීය වෙමින්, අගෝස්තු 21 වැනි විට ඒකක 5382 දක්වා ද, සැප්තැම්බර් 18 වන විට ඒකක 5720 දක්වා ද, සැප්තැම්බර් 25 වන විට ඒකක 5850 දක්වා ද ඉහළ ගොස්, අවසානයේ සැප්තැම්බර් 28 වැනිදා ඒකක 6000 සීමාව පසු කළේය.

එස් ඇන්ඩ් පී දර්ශකය ද මේ හා සමානව ඉහළ ගොස්, අගෝස්තු 07 වන විට ඒකක 2179 දක්වා ද, සැප්තැම්බර් 18 වන විට ඒකක 5720 දක්වා ද ඉහළ ගියේය.

විවිධ රටවල කොටස් වෙළෙඳපොළ අගය මැනීමේදී විවිධ දර්ශක උපයෝගී කර ගනු ලැබේ. කලින් කල සිදු වන වෙනස්කම් එමඟින් නිරූපණය වන අතර, වෙළෙඳපොළ පිළිබඳ සැබෑ චිත්‍රයක් මවා ගැනීමට මේ දර්ශක ඉවහල් කර ගනු ලැබේ. මේ සඳහා එම වෙළෙඳපොළ හැඳෑරිය යුතුය.

කොටස් වෙළෙඳපොළක් සිය රටේ ජනතාව සඳහා විවිධ අධ්‍යාපන වැඩසටහන් මෙහෙයවයි. ශ්‍රී ලංකාව ද කොටස් වෙළෙඳපොළ ශාඛාවන්ගෙන් අධ්‍යාපනික දැනුම බෙදා දෙන අතර, ආර්ථික විද්‍යාව, මූල්‍ය වෙළෙඳපොළ සහ ආයෝජනය මෙන්ම කොටස් වෙළෙඳපොළක හැසිරීම ද එම අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත්ය. මේ හැර ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය මූල ධනය සපයා ගැන්මේදී කොටස් වෙළෙඳපොළ ආර්ථික මෙවලමක් ද වේ. ඒ පිළිබඳ දැනීමක් ද මේ අධ්‍යාපන අංශය මඟින් ලබාගත හැකිවේ.

කොටස් වෙළෙඳපොළ යනු වෙනත් ග්‍රහ ලෝකයක් යැයි සිතන තරමට එය බොහෝ කොට ජනතාවගෙන් ඈත්ව තිබෙන බවක් ද පෙනේ. එසේම කොටස් වෙළෙඳපොළ බූරු පිටියක් ලෙස සිතන්නෝ ද සිටිති. 2019 වසරේදී කොටස් වෙළෙඳපොළ අධ්‍යාපනික වැඩසටහන් 385 ක් මෙහෙය වූ බව 2019 වාර්ෂික වාර්තාව කියයි. ඉදිරියටත් මේ අධ්‍යාපනික සේවා කොටස් වෙළෙඳපොළේ පැවැත්වේ.

ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවලට අනුව, ඉකුත් සැප්තැම්බර් 25 වැනිදායින් අවසන් වූ සතියේ ගනුදෙනු සිදු වූ දිනක කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් දසලක්ෂ 2685කි. එනම් බිලියන 2.6කි. සැප්තැම්බර් 25 වැනි දින අවසන් වූ සතියේ එක් දිනක සාමාන්‍ය දෛනික පිරිවැටුම රුපියල් දසලක්ෂ 3195කි. එනම් රුපියල් බිලියන 3.1කි. වසරකට පෙරදී පිරිවැටුම රුපියල් දසලක්ෂ 331කි. 2020 සැප්තැම්බරයේ පිරිවැටුමේ වර්ධනය එමඟින් හෙළි වේ.

මේසා දැවැන්ත පිරිවැටුමකට දායකත්වය සැපයූ බහුතරය දේශීය ආයෝජකයන් විම සැලකිල්ලට ගත යුතු කරුණකි. තම රටේ ජනතාව සමාගම් කොටස් හිමි ජනතාවක් බවට පත් කිරීමේ උත්සාහයක් සෑම රටකම පාහේ දක්නට ලැබෙන විශේෂත්වයකි.

සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක පිහිටා සිටි චීනය සහ වියට්නාමය පවා දැන් සිය ජනතාව කොටස් වෙළෙඳපොළ වෙත යොමු කරවීමේ නිරතව සිටිති.

සංවෘත ආර්ථික ප්‍රතිපත්ති ලිහිල් කිරීමත් සමඟ චීනය 1980දී ෂැංහයි කොටස් වෙළෙඳපොළ නැවත විවෘත කළේය. ආසියාවේ ඉතා පැරැණි කොටස් වෙළෙඳපොළක්වූ ෂැංහයි කොටස් වෙළෙඳපොළ, කොම්යුනිස්ට් පක්ෂය බලයට පත් වීම සමඟ 1947 දී වසා දමන ලද්දකි. අද වන විට නිව්යෝර්ක් කොටස් වෙළෙඳපොළ තරමට තාක්ෂණ අංශයෙන් දියුණු ෂැංහයි කොටස් වෙළෙඳ පොළ විදේශීය ආයෝජකයනට විවෘත කර ඇති නමුත්, ඔවුන්ට විවිධ සීමා පනවා තිබේ. එහෙත්, දේශීය ආයෝජකයන්ට විවිධ දිරිමත් කිරීම් හඳුන්වා දී තිබේ. මේ සමාගම් කොටස් හිමි නව ආයෝජක තරුණ පෙළක් චීනයේ පහළ වෙමින් තිබේ.

අමෙරිකාව, කැනඩාව, ඔස්ට්‍රේලියාව සහ ආසියා පැසිපික් කලාපීය රටවල ඉතා විශාල වශයෙන් චීන ජාතිකයෝ ව්‍යාපාරයන්හි යෙදී සිටිති. ඔවුනගේ ආයෝජන තම රටට ගෙන්වා ගෙන, එම ධනය කොටස් වෙළෙඳපොළට යෙදවීම චීනයේ එක් උපාය මාර්ගයකි.

චීනයේ මේ උපක්‍රමය අනුව යමින්, කැනඩාව, ඔස්ට්‍රේලියාව සහ මැද පෙරදිග රටවල සිටින ශ්‍රී ලාංකේය ජනතාවගේ ආයෝජන කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ආකර්ෂණය කර ගැනීමට, ශ්‍රී ලංකාව ද සූදානමින් සිටින බව කොටස් වෙළෙඳපොළ 2019 වාර්ෂික වාර්තාව කියයි.

චීනය මෙන්ම සංවෘත ආර්ථිකයක් සහිත රටක්වූ වියට්නාමයේ කොටස් වෙළෙඳපොළ දෙකකි. ඉන් වඩා ප්‍රබල වන්නේ හෝචිමිං සිටි කොටස් වෙළෙඳ පොළයි. අනෙක හැනෝයි කොටස් වෙළෙඳපොළයි. එය ආරම්භ කරන ලද්දේ 2000 ජූලි මාසයේදීය. හෝචි මිං සිටි කොටස් වෙළෙඳපොළ දිනකට කොටස් හුවමාරු ලක්ෂ 3ක් සැපිරීමේ අංග සම්පූර්ණ පහසුකම් සහිතය. විදේශිකයනට යම් යම් සීමා පනවා දේශීය ආයෝජකයනට විවිධ පහසුකම් සපයයි.

කොළඹ කොටස් වෙළෙඳපොළේ මුදුන් මුල් 1896 තරමට ඈතට දිව යයි. 1985 දී එය ප්‍රතිසංවිධානය කෙරුණු අතර මේ වන විට එය ලන්ඩන් ස්ටොක් එක්ස්චේන්ජ් ගෘප්, ඩකා ස්ටොක් මාකට් සහ සවුත් පැසිපික් ස්ටොක් මාකට් නම් විදේශීය වෙළෙඳ පොළ සමඟ අවබෝධතා ගිවිසුම්ගතව සිටින ආයතනයකි.

කොටස් වෙළෙඳපොළ කඩිනමින් ධනය සොයා ගැනීමට මාර්ගයක් වන්නා සේම අත පුච්චාගෙන ධනය නැති කර ගැනීමේ පහසු මාර්ගයකි. කොටස් වෙළෙඳපොළකදී මිල වැඩිවූ කොටස් වහා විකුණා, ලාභය ඉවත් කර ගැනීමේ සිරිතක් ද ඇතැම් ආයෝජකයන් වෙතින් දිස් වේ. උදාහරණයක් කිවහොත් ඉකුත් 28 වැනි දින ඒකක 6000 කඩුල්ල පැනීමට හේතු වූයේ, කාසන් සහ බුකිඩ්ඩාරා සමාගම් දෙකේ කොටස් මිල ඉහළ යෑමය. වහ වහා මිල ඉහළ යන නිසා එක දිනක් ඇතුළත විශාල ලාභයක් අත් කර ගැනීමට එක් දින ගනුදෙනුකාරයෝ ඉදිරිපත් වූහ. කොටස් වෙළෙඳ පොළ භාෂාවෙන් මෙය වන් ඩේ ට්‍රේඩ් යනුවෙන් හැඳින්වේ. ඔවුන්ගෙන් අය කරන බ්‍රෝකර් ගාස්තුව ද පහළ මට්ටමක පවතී. මේ තරගය නිසා සඳුදා රුපියල් 297 සිට රුපියල් 518 දක්වා මිල ඉහළ ගිය බුකිඩ්ඩාරා කොටසක මිල, අඟහරුවාදා රුපියල් 478 දක්වා පහත වැටිණි. මේ අයුරින්ම සඳුදා රුපියල් 364 ට අලෙවි වූ කාසන් කොටසක් පසු දින අලෙවි වූයේ රුපියල් 328කටය. මෙවැනි තත්ත්ව, සෑම කොටස් වෙළෙඳපොළකම සිදුවේ. එහෙයින් කොටස් මිලදී ගත යුතු වන්නේ මනා හැදෑරීමකින් පසුවය. ඒ සඳහා අධ්‍යාපනයක් අවශ්‍යය. එසේ නැතිව දුවන්නන් වාලේ දිවීම අතේ ඇති මුදල නැති කර ගැනීමකි. මෙවැනි තත්ත්වයක් කොටස් වෙළෙඳපොළේදී රැල්ලට හසුවීම යනුවෙන් හැඳින්වේ.

සැප්තැම්බර් මාසය, කොටස් වෙළෙඳපොළේ විශිෂ්ටතම මාසය බව, කොටස් වෙළෙඳපොළ පවසයි. කොළඹ කොටස් වෙළෙඳපොළ ගිය සතියේ නිවේදනයකින් කියා සිටියේ ඩිජිටල්කරණය ඇතුළු නවතම පියවර නිසා කොළඹ කොටස් වෙළෙඳපොළ වඩ වඩා ශක්තිමත් වන බවයි. එසේම, කොළඹ, ගම්පහ, මහනුවර, කුරුණෑගල, ගාල්ල සහ මාතර යන දිස්ත්‍රික්කවල ආයෝජකයන් වත්මන් සක්‍රීයත්වයට වැඩි දායකත්වය සලසා ඇති බවයි. ජනතාව අතරට කොටස් වෙළෙඳපොළ සේන්දු වෙමින් සිටින බව එමඟින් හෙළි වේ.



කරුණාරත්න අමරතුංග



කොවිඩ් මාරයා පරදන්න අවදියෙන් සිටින්න

පසුගිය මාස දෙකක පමණ කාලයක් මෙරට සමාජයෙන් කොවිඩ් - 19 වයිරසය ආසාදිත පුද්ගලයකු වාර්තා නොවීම නිසා, රටේ ජනතාවට වයිරසය සම්බන්ධයෙන් අමතකව ගොස් තිබිණ. නිසි පරිදි මුඛ ආවරණ නොපැළඳීම, දෑත් නොසේදීම යනා දී කොරෝනා වයිරසය වළක්වා ගැනීමේ සෞඛ්‍ය ආරක්ෂිත පිළිවෙත් අනුගමනය කිරීම ජනතාවගෙන් ගිලිහිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රදේශයේ මිනුවන්ගොඩ නගරයේ පිහිටි පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලාවක සේවයේ නියුතු කාන්තාවක්, වයිරසයට ගොදුරුවී ඇති බවට පෙරේදා (03) සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණයකින් වාර්තාවී ඇත. දැන් නැවතත් කොරෝනා වයිරසය සම්බන්ධයෙන් බිය විය යුතු කාලය එළැඹ තිබේ. පසුගිය කාලයේ දී මෙරටින් වයිරසය තුරන් වීමේ ලක්ෂණ පහළ වුවත්, ලෝකයේ වෙනත් රටවලින් වයිරසය තුරන්ව ගොස් නොමැත. ලෝකයේ රටවල වයිරසය වේගයෙන් පැතිර යන විට, අපේ රටේ වයිරසය මර්දනයවී තිබිණ. ඒ හේතුවෙන්, මෙරට ජනතාව නිදහසේ සැරිසරමින්, වයිරසය ගැන මතකය අමතක කළහ. අපට නොපෙනෙන සතුරා එය තෝතැන්නක් කර ගනිමින්, නැවත ව්‍යාප්තිය සඳහා හිස ඔසොවමින් සිටියි. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමින්, සතුරාට පහර දීම සඳහා සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් අනුගමනය කිරීම අවියක් කර ගත යුතුය.

ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රදේශයේ මිනුවන්ගොඩ නගරයේ පිහිටි පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලාවක සේවයේ නියුතු කාන්තාවක් පසුගිය 30 වැනිදා ඇති වූ සෞඛ්‍යමය තත්ත්වයක් යටතේ ගම්පහ රෝහලට ඇතුළත්ව තිබේ. ඇගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් අතට හැරීමත් සමඟ රෝහලෙන් පිටත් කිරීමට පෙර, පී.සී.ආර්. පරීක්ෂාවකට ලක් කිරීමට රෝහල් කාර්ය මණ්ඩලය පියවර ගෙන ඇත. ස්වසන රෝග සම්බන්ධයෙන් ප්‍රතිකාර ගැනීමට ප්‍රධාන රෝහල්වලට දිනක දී පැමිණෙන රෝගීන් දහ දෙනකුගෙන් නියැදි ගෙන අහඹු ලෙස පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කළ යුතු බවට සෞඛ්‍ය අමාත්‍යාංශය ලබා දී ඇති උපදෙස් පිළිපැදීම නිසා, මේ කාන්තාවට වයිරසය ආසාදනය වී ඇති බවට හඳුනා ගැනීමට හැකියාව ලැබී ඇත.

ජනාධිපතිවරයාගෙන් සහ අගමැතිවරයාගෙන් ලැබුණු උපදෙස් අනුව, ආසාදිත කාන්තාවගේ පවුලේ උදවිය නිරෝධායනයට ලක් කිරීමට මේ වන විට පියවර ගෙන තිබේ. වයිරසය ආසාදිත කාන්තාවගේ පවුල සමඟ සම්බන්ධවූ තවත් පවුල් කිහිපයක් නිරෝධායන මධ්‍යස්ථානයක් වෙත රැගෙන ගොස් ඇත. පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලාවේ පරීක්ෂක නිලධාරිනියක ලෙස සේවය කරන ඇය, සේවයේ නියුතු ගොඩනැඟිල්ලේ සිටි අය සහ ආසාදිත කාන්තාව සමඟ ආශ්‍රය කළ සහ ආයතනයේ බස් රථයෙන් ගමන් කළ පුද්ගලයන් පෙරේදා (03) රාත්‍රියේදීම තම තමන්ගේ නිවෙස්වලම ස්වයං නිරෝධායනයට යොමු කිරීමට, සෞඛ්‍ය හා ආරක්ෂක අංශය පියවර ගෙන තිබේ.

වයිරසය ආසාදිත කාන්තාව හඳුනා ගැනීමත් සමඟ වහාම ක්‍රියාත්මක වන පරිදි මිනුවන්ගොඩ සහ දිවුලපිටිය පොලිස් බල ප්‍රදේශයන්ට නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමට රජය පියවර ගෙන ඇත. මේ ඇඳිරි නීතිය නැවත දැනුම් දෙන තෙක් ක්‍රියාත්මකවේ. නිරෝධායන ඇඳිරි නීතියට ගරු කරමින් ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජනතාව තම නිවෙස් තුළම රැඳී සිටිය යුතු අතර සෞඛ්‍ය සේවාව වැනි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් නිවෙස්වලින් පිටතට යා හැකිය. මේ නීතිවලට අවනතවී, වයිරසය ආසාදිත කාන්තාවගේ ආශ්‍රිතයින් සියලුදෙනා හඳුනා ගැනීමට මහජනතාව සහාය ලබා දීමද වැදගත්ය. නිරෝධායන ඇඳිරිනීතිය උල්ලංඝනය කරන පුද්ගලයන් අත්අඩංගුවට ගෙන, නීති ක්‍රියාත්මක කරමින්, නිරෝධායන කටයුතුවලට ලක් කිරීමටත්, නිරෝධායන ඇඳිරි නීතිය උල්ලංඝනය කර අධිකරණය හමුවේ වරදකරුවකු වුවහොත්, අදාළ වැරැදිකරුට සිර දඬුවමක් සහ දඩ මුදලක් නියම කිරීමටත් රජයට හැකිවේ.

කොවිඩ් - 19 වයිරසය වළක්වා ගැනීමේ සෞඛ්‍ය මාර්ගෝපදේශන පිළිපදින්නේ ද? යන්න සෞඛ්‍ය අංශ මඟින් දැඩි ලෙස සොයා බැලීමටද සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කර තිබේ. මේ වයිරසය වළක්වා ගැනීමට ජනතාව ලබා දුන් සහාය නැවත ලබාදෙන ලෙසත්, වයිරසය වළක්වා ගැනීමට අදාළ සෞඛ්‍ය උපදෙස් නිරන්තරයෙන් පිළිපදින ලෙසත් සෞඛ්‍ය අමාත්‍යාංශය ජනතාවගෙන් ඉල්ලීමක් කරයි. ලෝකයේ සෙසු රටවලට සාපේක්ෂව ශ්‍රී ලාංකේය ජනතාව සෞඛ්‍ය අංශ ලබා දුන් උපදෙස් පිළිපැදීම කළ අතර, වයිරසය ව්‍යාප්තියෙන් රට මුදා ගැනීමට එය විශාල සහයෝගයක් සහ ශක්තියක් විය. ඖෂධයක් නැති මේ රෝගයෙන් ලක්ෂ ගණන් රෝගීන් ලෝකයේ රටවල මරණයට පත්ව ඇත. මේ රෝගය හුස්ම ගැනීමෙන් පවා බෝ විය හැකි නිසා, සෙනඟ ගැවසෙන ස්ථානවලට නොයෑමට ජනතාව වග බලාගත යුතු ය. වයිරසය ව්‍යාප්ත වීම වැළැක්වීමේ අරමුණෙන් සංගීත සංදර්ශන, ප්‍රියසම්භාෂණ වැනි උත්සව කිසියම් කාල සීමාවක් සඳහා නැවැත්විය යුතු බවට සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුම් දී ඇත. කොරෝනා මර්දනය සඳහා රටේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි මාර්ගෝපදේශන 56ක්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිකුත් කර ඇති අතර, එම මාර්ගෝපදේශන www.health.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

පසුගිය මාර්තු 11 වැනිදා සිට මේ දක්වා වයිරසය ආසාදිතයන් 3396ක් වාර්තාවී තිබේ. වෙනත් රටවල සිට මෙරටට පැමිණි ශ්‍රී ලාංකිකයන් 1408 කටද, විදේශිකයන් 74කට ද, නාවික හමුදා සාමාජිකයන් හා ආශ්‍රිතයන් 950 කටද, කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සාමාජිකයන් හා ඔවුන්ගේ ආශ්‍රිතයන් 651 කටද, සමාජයේ වෙනත් පුද්ගලයන් 313 කටද වයිරසය ආසාදනයවී තිබේ. වයිරසය ආසාදිතයන්ගෙන් 3258ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් ඇත. මරණ වාර්තා වූයේ 13කි. වයිරසය ආසාදිතවූ තවත් පුද්ගලයන් 125ක් ඊයේ (04) වන විට රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින බවට, වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි. වයිරසය ආසාදිත බවට සැක සහිත පුද්ගලයන් 42ක්ද රෝහල් ගතකර තිබේ.

කොරෝනා වයිරසය යනු සෙම්ප්‍රතිශ්‍යාවේ සිට දරුණු නිදන්ගත ශ්වසන රෝගයක් දක්වා වර්ධනය විය හැකි රෝගාබාධ ඇති කරන වයිරසයකි. ලෝකය පුරා පැතිරෙමින් පවතින මේ වයිරසය, මින් පෙර පුද්ගලයන්ට ආසාදනය වූ බව හඳුනාගෙන නොමැත. එම නිසා මෙතෙක් වයිරසය පාලනය කළ හැකි ඖෂධයක් හෝ එන්නතක් සොයා ගැනීමට හැකි වී නොමැත. කොරෝනා වයිරසය සතුන්ගෙන් මිනිසුන්ට සම්ප්‍රේෂණයවේ. පසුගිය කාලයේ ලොව පුරා ව්‍යාප්ත වූ සාර්ස් කොරෝනා වයිරසය උරුලැවන්ගෙන් ද, මර්ස් කොරෝනා වයිරසය ඔටුවන්ගෙන් ද, මිනිසුන්ට සම්ප්‍රේෂණයවී ඇති බව පරීක්ෂණ වාර්තාවලින් හෙළිවී තිබේ. මෙතෙක් මිනිසුන්ට ආසාදනයවී නොමැති කොරෝනා වයිරස් කිහිපයක් සතුන් අතර සංසරණය වන බව ද හඳුනාගෙන ඇත. මෙවැනි වයිරසයක් ආසාදනයවූ පුද්ගලයකුට, ශ්වසන රෝග, උණ, කැස්ස, හුස්ම හිරවීම සහ හුස්ම ගැනීමේ අපහසුතා වැනි රෝග ලක්ෂණ ඇති විය හැකිය. වඩාත් දරුණු අවස්ථාවල දී නියුමෝනියාව, දරුණු නිදන්ගත ස්වසන රෝග, වකුගඩු අකර්මණ්‍ය වීම සහ මරණය පවා සිදු හැකිය. කොවිඩ්-19 ලෙස නම් කර ඇති නව කොරෝනා වයිරසයෙන් හට ගැනෙනුයේ ස්වසන රෝගී තත්ත්වයකි. එය, උණ රෝගී තත්ත්වයකින් ආරම්භ වන අතර, පසුව වියළි කැස්සක් දක්වා වර්ධනයවේ. සතියකට පසු හුස්ම ගැනීමේ අපහසුතාවක් ඇති වන අතර, ඇතැම් රෝගීන්ට රෝහල්ගතවී ප්‍රතිකාර ගැනීමට ද සිදු විය හැකිය. මේ රෝග ලක්ෂණ තිබූ පමණින් පුද්ගලයකුට කොරෝනා වයිරසය ආසාදනයවී ඇතැයි නිශ්චිතව කිව නොහැක. මේ රෝග ලක්ෂණ උණ සහ සෙම්ප්‍රතිශ්‍යාව වැනි වෙනත් සාමාන්‍ය වෛරස් ආසාදනය වීමෙන් ඇති වන රෝග ලක්ෂණවලට සමානය. කොරෝනා වයිරසය සහ සාමාන්‍ය උණ අතර බොහෝ සමාන රෝග ලක්ෂණ තිබීම හේතුවෙන්, නිසි වෛද්‍ය පරීක්ෂණයකින් තොරව රෝගය විනිශ්චය අපහසුවේ.

චීනයෙන් ආරම්භවූ කොරෝනා වයිරසය, ලොව පුරා වේගයෙන් පැතිරී යන අතර, මේ වන විට රටවල් සහ ස්වයං පාලන ප්‍රදේශ 215ක පුද්ගලයන් මිලියන 35කට වැඩි පිරිසකට ආසාදනයවී තිබේ. මේ වන විට පුද්ගලයන් මිලියනයකට වැඩි පිරිසක් මරණයට පත්ව ඇත. අමෙරිකාව, ඉන්දියාව, බ්‍රසීලය, ඉතාලිය, ප්‍රංශය, ස්පාඤ්ඤය සහ එක්සත් රාජධානිය වැනි රටවලින් බහුතර රෝගීන් සංඛ්‍යාවක් වාර්තාවේ. සෙසු රටවල ද වයිරසය තව දුරටත් ව්‍යාප්ත වෙමින් පවතියි. සාමාන්‍ය දෛනික කටයුතුවලට තහංචි පනවා, බොහෝ රටවල් සිය ජනතාව නිවාසවලට සීමා කරනු ලැබීමත් (ලොක්ඩවුන්) සමඟ වයිරසය පැතිරෙන වේගයේ සුළු පසුබෑමක් දක්නට ලැබිණි.

වයිරසය ආසාදිත පුද්ගලයකුගෙන් පිටවන බේටය හෝ සෙම් බිඳිති, යම් මතුපිටක තැවරී තිබිය හැකි අතර, එහි ඇති වයිරසයට දින ගණනාවක් ක්‍රියාකාරීව පැවැතීමේ හැකියාවක් තිබේ. වයිරසය ආසාදනයවූ අවස්ථාවේ සිට රෝග ලක්ෂණ පෙන්නුම් කිරීම සඳහා දින 14ක කාලයක් ගතවන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. එහෙත්, ඇතැම් පර්යේෂකයන් පවසනුයේ, රෝග ලක්ෂණ මතුවීම සඳහා දින 24ක් දක්වා කාලයක් ගතවන බවය.

> “ කොරෝනා වයිරසය යනු සෙම්ප්‍රතිශ්‍යාවේ සිට දරුණු නිදන්ගත ශ්වසන රෝගයක් දක්වා වර්ධනය විය හැකි රෝගාබාධ ඇති කරන වයිරසයකි. ලෝකය පුරා පැතිරෙමින් පවතින මේ වයිරසය, මින් පෙර පුද්ගලයන්ට ආසාදනය වූ බව හඳුනාගෙන නොමැත. එම නිසා මෙතෙක් වයිරසය පාලනය කළ හැකි ඖෂධයක් හෝ එන්නතක් සොයා ගැනීමට හැකි වී නොමැත.

වයිරසය බෝවීම වළක්වා ගැනීම සඳහා සබන් හෝ පිරිසුදු කාරකයක් යොදා දෑත් නිතර සේදීම, කැස්ස සහ කිව්සුම් යෑමේ දී මුඛය සහ නාසය ලේන්සුවක් හෝ ටිෂූ කඩදාසියකින් ආවරණය කර ගත යුතු අතර, භාවිතයෙන් පසු ටිෂූ කඩදාසිය ක්‍රමානුකූලව ඉවත දැමීම, ටිෂූ කඩදාසි නොමැති අවස්ථාවක වැළමිට නවා අතේ උඩ කොටසෙන් මුහුණ ආවරණය කර කැස්ස හෝ කිව්සුම් යැවීම සිදු කිරීම, අපිරිසුදු දෑත්වලින් මුහුණ ස්පර්ශ නොකිරීම, ආසාදිතයන් සමීපයට යාමෙන් වැළකීම, පොදු ස්ථානවල නිකරුණේ ගැවසීමෙන් වැළකීම, නිසි පරිදි මුඛ ආවරණයක් භාවිතය, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම යනා දී සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පිළිපැදිය යුතුය.

ස්වයං නිරෝධායනයේ දී නිවෙස තුළ හොඳින් වාතාශ්‍රය තිබෙන කාමරයක හෝ යම් කොටසක රැඳී සිටීම, නිවසේ පුද්ගලයන්ගෙන් ඈත්ව සිටීම, නිවෙසින් පිටත ක්‍රියාකාරකම් සීමා කිරීම, පොදු ස්ථානවලට යාමෙන් සම්පූර්ණයෙන් වැළකීම, පොදු ප්‍රවාහනය හෝ කුලී රථ භාවිත කිරීමෙන් වැළකීම, ආහාර සහ වෙනත් අවශ්‍ය දේ අදාළ කාමරය අසල තබා යන ලෙසට ඥාතීන්ට හෝ මිතුරන්ට උපදෙස් ලබා දීම, හැකි නම් වෙනම නාන කාමරයක් භාවිත කළ යුතු වන අතර, එසේ නැත්නම් සෙසු සියලුදෙනා නාන කාමරය භාවිත කිරීමෙන් පසු එහි ගොස් ස්නානය, නිවෙසට අමුත්තන් පැමිණීම සම්පූර්ණයෙන් වැළැක්වීම, අවශ්‍ය ඕනෑම මොහොතක වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීම යනා දී සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් අනුගමනය කළ යුතුය. වයස්ගත පුද්ගලයන්ට, කුඩා දරුවන්ට, දියවැඩියාව, හෘදයාබාධ වැනි නිදන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයන්ට වයිරසය වැළඳීම අවදානම්වේ.

කොරෝනා වයිරසය අපට එරෙහිව ක්‍රියා කරන මේ අවස්ථාවේ, තමාගේත්, සිය පවුලේ ආදරණීයන්ගේත් ජීවිත ආරක්ෂා කර ගැනීමට නම්, මිනිසාගේ ස්වයං අවබෝධය සහ ස්වයං පාලනයක් පැවතීම වැදගත්ම කරුණකි. වයිරසය සඳහා පර්යේෂණ පවත්වමින්, එන්නත් සොයමින් සිටියි. මෙතෙක් විසැඳුමක් සොයාගෙන නොමැති මේ වයිරසයෙන් ආරක්ෂා වීම සඳහා, උණ, සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස, ඇඟපත වේදනාව, ස්වසන අපහසුතා වැනි රෝග ලක්ෂණ පවතින්නේ නම්, 1390 ක්ෂණික දුරකථන අංකය අමතා වෛද්‍ය උපදෙස් අනුව රෝහල්ගත වීම ඉතා වැදගත්ය. කොවිඩ් පාලනය අතින් ලෝකයේ දෙවැනි ස්ථානයට පත්වූ රට ලෙස ශ්‍රී ලංකාව පසුගියදා ගෞරවයට පාත්‍ර විය. එම ගෞරවය ඉදිරියටත් පවත්වා ගන්නේ ද යන්න තීරණය කළ යුත්තේ අපම ය. එම ගෞරවය ආරක්ෂා කර ගන්නට නම්, කොවිඩ් - 19 වැළැක්වීමේ සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම හැර වෙන කළ යුතු දෙයක් නොමැත.

සටහන
සන්ධ්‍යා කරුණාරත්න

ඡායාරූපය-සමන්ත වීරසිරි

නොමඟට මඟ වසන ගුරු භූමිකාව

දෙගුරුන්ගේ ඇසුරේ උස් මහත් වන හෙට ලෝකයෙහි උරුමක්කාරයන්, නැණ ගුණ පිරි පරපුරක් බවට පත් කරන්නට ඉත සිතින් කැප වන්නේ ගුරුවරුන් ය. 'අ' යන්න 'ආ' යන්න ද මතු නොව, ජීවත් වීමේ කලාව ද නිවැරැදිව උගන්වන්නට සැබෑ ගුරුවරුන්ට හැකියාව තිබිය යුතුය. මවුපියන්ගේ අතැඟිලිවල එල්ලී දෙපයින් නැගී සිටින්නට හුරු වන දරුවා, පිට කොන්ද ඍජුව තබාගෙන සමාජයෙහි කෙළින් සිට ගන්නට ඉගෙන ගන්නේ ගුරුවරයා වෙතිනි.

ශ්‍රී ලාංකික වෘත්තිය සමිති නායකයකු වූ එම්. පී. මෙන්ඩිස් මහතා 1993දී ලෝක ගුරු සංසදය වෙත කරන ලද ඉල්ලීම තුළ, ලෝකයටම පොදු ගුරු දිනයක් සැමරීමේ එකඟත්වයක් ඇති වීමට මූලික හේතුව සකස් විය. ඒ අනුව ලෝක ගුරු ප්‍රඥප්තිය අත්සන් කිරීමට යෙදුණු 1966 ඔක්තෝබර් 5 වැනිදා සිහිපත් කරමින්, සෑම වසරකම ඔක්තෝබර් 5 වැනිදා ලෝක ගුරු දිනය ලෙස නම් කෙරුණු අතර, එය පළමු වරට සැමරීම ආරම්භ වන්නේ 1994 වසරේදීය.

'අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් තකා
කල් ගිය රෙදි වැරලි ඇඳ දැලි කුණෙන් වකා
ඇල්මෙන් අකුරු උගනිවු ඉදිරි වැඩ තකා

දශක කිහිපයකට පෙර දරුවකු ලෙස ඇසූ එම උපදේශාත්මක කාව්‍ය, අදත් අප මතකයෙහි රැඳී පවතී. ඇල්මෙන් අකුරු ඉගෙන ගන්නට නම් පාසල සහ ගුරුවරුන් කෙරෙහි දරුවන්ගේ සිත තුළ ඇල්මක් ඇති විය යුතුය. ගුරුවරුන් කෙරෙහි දරුවන්ගේ සිත් තුළ එබඳු ඇල්මක් ගොඩනැඟෙන්නේ, ඔවුන් මානුෂීය මුහුණුවරකින් යුතුව, දරුවන්ගේ ජීවිත ආලෝකවත් කරන අයුරින් සිය රාජකාරිය ඉටු කරනවා නම් පමණි. වර්තමානය වන විට ලෝකය බෙහෙවින් තරගකාරී තත්ත්වයකට පත්ව තිබේ. අධ්‍යාපනය ද ඒ තරගයෙහි ප්‍රබල කොටසක් බවට පත්ව තිබීම තුළ, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය යාන්ත්‍රික වී තිබෙන ආකාරයක් දක්නට ලැබේ. එය දෙව්වරුන් බවට පත්ව තිබූ ගුරු භූමිකාව, ඇතැම් ස්ථානවලදී හැල්ලුවට ලක් වීමට ද හේතුවක් වීම, කනගාටුදායක ය.

ඇතැම් අයගේ ජීවිත කතාවල හැරවුම් ලක්ෂය බවට පත් වූ ගුරුවරුන් සිටින බව විවිධ චරිත කතා ඇසුරේදී අසන්නට ලැබේ. එබඳු හැරවුම් ලක්ෂ්‍යවලින් ජීවිත යහපත් මඟක් වෙත හරවා යවා ඇති අතීතයේදී බොහෝ අවස්ථාවල අසන්නට ලැබුණ ද, වර්තමානයෙහි පවතින තරගකාරී රටාව හේතුවෙන් දරුවන්ගේ ජීවිත සතුටුදායක පැතිකඩක් වෙත යොමු නොකරන්නට ද, ඇතැම් ගුරුවරුන්ගේ භූමිකාව බලපා ඇති බවක් දක්නට ලැබේ.

ගුරුවරයා යනු සමාජ ශෝධකයෙකි. සමාජයෙහි නරක සෝදා හැරීම ඉතා හොඳින්ම කරන්නට හැකි තැනැත්තන් වන්නේ ද ගුරුවරුය. ජීවිතයේ ඉදිරියට ගමන් කරන දරුවන්ට, දිනෙක නැවත හැරී බලද්දී ආදරෙන් සිහිපත් කරන්නට හැකි ගුරුවරුන් ජීවිතය තුළ මුණගැසී තිබේ නම්, එබඳු දරුවන් කිසිසේත්ම අවාසනාවන්තයන් වන්නේ නැත.

ඉපැරැණි සාහිත්‍ය තුළ දිසාපාමොක් පරපුරෙහි ආචාර්යවරුන් පිළිබඳ ලියැවුණු කතා රැසක් අපි අසා, කියවා ඇත්තෙමු. එබඳු කතාවල තක්ෂිලාවෙහි සිල්ප උගත් ඇතැම් දරුවන් යහපත කරා මෙහෙයවූ දයාදහදවත් ඇති ඇදුරුතුමන්ලා මෙන්ම, අංගුලිමාල වැන්නවුන්ගේ ජීවිත පාපය කරා මෙහෙයවූ ඇදුරුතුමන්ලා ද මුණගැසේ.

යාන්ත්‍රීකරණය වූ සමාජය තුළ නොමඟට ගමන් කරන්නට ලක්ෂ සංඛ්‍යාත මාර්ග මුණ ගැසෙන විට, දරුවන් සුමඟට රැගෙන යා හැකි හොඳම මඟ වන්නේ අධ්‍යාපනයයි. එහි මාර්ගෝපදේශකයා ගුරුවරයාය. 'ගුරු' යන වදනට අරුත් දෙන පරිපූර්ණ ගුරු භවතුන්ට ඒ නොමඟට යන මාර්ග සියල්ල වසා දමන්නට තරම් හැකියාවක් තිබේ.

ජලය සහ පොහොර නොලැබ, කිසිදු සාත්තුවක් නොලබා අයාලේ වැඩුණු ගස් වැනි මිනිසුන් පිරි සමාජයක් බිහි කරනවා වෙනුවට, විවිධාකාර වූ හැකියා වැඩි දියුණු කර ගත් ලොවක් තනන්නට, ලොව සුරකින්නට හැකි මිනිසුන් සපිරි සමාජයක් බිහි කරන්නට දායක වන ගුරුවරයාගේ කාර්යභාරය, සුළුකොට තැකිය හැකි නොවේ.

ආදරණීය ගුරුභවතුනි, ඔවුන් ජීවිතය දකින්නේ ඔබේ ආදරය මතිනි. ඒ ආදරය සහ නිවැරැදි මාර්ගෝපදේශනය සමඟ ඔවුන් සුරක්ෂිත අනාගතයක් කරා රැගෙන යන්නට ඔබේ උපරිම කැපවීම, ජාත්‍යන්තර ගුරු දිනයේදී අපගේ අපේක්ෂාව බව කිව යුතුය.

සිප්හලේ දොරටුවෙන් ඇතුළු වූ මල් කැකුළු
පෙති සිඳෙන්නට නොදී හෙම් හෙමින් පුබුදන්න
සෙවණ රැකවරණ දෙන මහ තුරක් විලාසෙන්
දරුවන්ගෙ හිස් මතින් අතුපතර විහිදන්න

රළු පරළු ලෝකයෙහි සුමුදු තැන් සොය සොයා
වැඩෙන සුහුඹුල් පැටවු සෙනෙහසින් නහවන්න
දිරිය ශක්තිය පතමු සෑම ගුරු සිතකටම
මිනිස්කම රජ කරන ලොවක් ඉදිකරවන්න

දිල්රූ ජයසේකර

ගොවිසෙත	සුපිරි වාසනා	ලග්න වාසනාව	කෝටිපති කප්රුක	සංවර්ධන වාසනාව	ජයෝදා	ශනිදා වාසනාව	සුපර් බෝල්	ජාතික සම්පත	අද කෝටිපති	වාසනා සම්පත	දරු දිරි සම්පත
2020 - 10 - 04	2020 - 09 - 21	2020 - 09 - 08	2020 - 09 - 27	2020 - 07 - 31	2020 - 09- 09	2020 - 09 - 09	2020 - 09- 27	2020 - 09-30	2020 - 09 - 09	2020 - 09 - 28	2020 - 07 - 30
දිනුම් වාරය - 2560	දිනුම් වාරය - 1537	දිනුම් වාරය - 2916	දිනුම් වාරය - 630	දිනුම් වාරය - 354	දිනුම් වාරය - 1688	දිනුම් වාරය - 3366	දිනුම් වාරය - 1228	දිනුම් වාරය - 1059	දිනුම් වාරය - 1036	දිනුම් වාරය - 1617	දිනුම් වාරය - 013
23 29 30 78	01 33 37 57	21 37 45 59	11 21 45 64	22 23 40	07 31 35 43	31 34 60 64	11 27 35 42	0 0 2 7 9 6	07 12 39 48	37 46 48 58	04 12 33 63
අක්ෂරය M	සුපිරි අංකය -01	ලග්නය-මිතුන විශේෂිත අංක	ඉංග්‍රීසි අක්ෂරය- E	දෛව අංකය - 02 අක්ෂරය- L	අක්ෂරය-A	අක්ෂරය - D	අක්ෂරය - Q විශේෂ අංකය -5767	අක්ෂරය -H	අක්ෂරය - K	අක්ෂරය - G	අක්ෂරය - U
		රු 500 ත්‍යාග සඳහා-9609							රු 500 ත්‍යාග සඳහා-2169		

කැලෑ පාළුවන් 12ක් වෙනුවෙන් ශ්‍රීධරන් පාරට බසී

උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ

වන සංරක්ෂණ නිලධාරීන් විසින් කිළිනොච්චියේ වුණ්ඩිකුලම් රක්ෂිතයේදී අත්අඩංගුවට ගත් දැව ජාවාරම්කරුවන් 12 දෙනකු ආපසු ඉල්ලා දෙමළ ජාතික සන්ධානයේ කිළිනොච්චිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශ්‍රීධරන් ඇතුළු පිරිසක් වන සංරක්ෂණ කාර්යාලය ඉදිරිපිට 3 දා උද්ඝෝෂණය කොට තිබේ.

කිළිනොච්චියේ ඉයක්කච්චි වුණ්ඩිකුලම් ප්‍රදේශයේ රක්ෂිත වනයට අයත් ප්‍රදේශයකට ගිය මේ පුද්ගලයන් 12 දෙනා එම භූමිය කෝවිලකට අයත් භූමියක් බව කියමින් එහි වූ දැව කපන්නට පටන් ගෙන තිබේ.

කපන ලද දැව හා දැව කැපීමට උපයෝගී කර ගන්නා ලද මැෂින් කියත් සමඟ සැකකරුවන් වන සංරක්ෂණ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන කාර්යාලය වෙත රැගෙන ඒමෙන් පසු ඔවුන්ව නිදහස් කරන ලෙස ඉල්ලා ගම්වාසීන් හා මන්ත්‍රීවරයා කෑකෝ ගසා තිබේ. නිලධාරීන් සැකකරුවන් නිදහස් නොකිරීමෙන් පසුව මන්ත්‍රීවරයා ගම්වාසීන් සමඟ වන සංරක්ෂණ කාර්යාලයේ බිම වාඩි වී නිලධාරීන්ට විරෝධය පළ කොට තිබේ.

පැය කිහිපයකට පසු එම පිරිස ආපසු ගොස් ඇති අතර, වන සංරක්ෂණ නිලධාරීන් පවසන්නේ මේ සැකකරුවන් 12 දෙනා 5 වැනිදා කිළිනොච්චිය අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇති බවයි.

01 වැනි පිටුවෙන්...

නිවි ඩයමන්ඩ්...

ඉන්දියාව දෙසට නෞකාව ඇදගෙන යන බවට ප්‍රකාශ කළද එය මේ වන විට මැදපෙරදිග මුහුදු කලාපයට අදගෙන යෑම සිදු කරන බව නාවික හමුදා මාධ්‍ය ප්‍රකාශවරයාද සඳහන් කරයි.

ගලවා ගැනීමේ කටයුතුවලදී වැයවූ මුදල් හා වන්දි ගෙවීමේ පදනම මත නැව ඉන්දියාව දෙසට ඇදගෙන යෑමට අවසර හිමිවූයේ එකඟත්වයක් මත බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධරිණී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය වැඩිදුරටත් පැවසුවාය.

ගිනි ගැනීමට ලක් වූ නෞකාවේ ගින්න නිවීම සඳහා වැය වූ මුදල් හා නැවෙන් කාන්දු වූ ඉන්ධන හේතුවෙන් සමුද්‍ර පරිසරයට වූ හානිය සම්බන්ධයෙන් වන්දි ගෙවීමට නෞකාව අයත් සමාගමේ හිමිකරුවන්ගේ නීතිඥවරුන් සමඟ එකඟතාවකට පැමිණීමෙන් පසු නැව ශ්‍රී ලංකා මුහුදු කලාපයෙන් පිටතට ඇදගෙන යෑමට නීතිපතිවරයා උපදෙස් ලබාදී තිබුණි.

ඒ අනුව මිලියන 402ක මුදලක් ශ්‍රී ලංකා රජයට ලබාදීමට නෞකාව අයත් සමාගම එකඟතාව පළ කර ඇති බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධරිණිය පවසයි.

ඉදිරි පැය 48...

කෙසේ වුවද වොෂිංටනයේ වෝල්ටර් රීඩ් හමුදා රෝහලේ වෛද්‍යවරු පෙන්වා දෙන්නේ ජනාධිපතිවරයා ප්‍රතිකාරවලට හොඳින් ප්‍රතිචාර දක්වන නමුත් ඒ මහතාගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ තීරණාත්මක දින ඉදිරියේ දී එළඹෙනු ඇති බවයි. ඒ අනුව කොරෝනා වෛරසයට එරෙහි ජනාධිපතිවරයාගේ ප්‍රතිදේහ සටන ඉදිරි පැය 48 තුළ තීරණාත්මක වන බවද එම වෛද්‍යවරු පෙන්වා දී ඇත.

මේ නිසා එය ඉතා අවධානයෙන් සිටිය යුතු අවධියක් ලෙස පෙන්වා දී තිබෙන අතර, වෝල්ටර් රීඩ් හමුදා රෝහලේ සිට විඩියෝ පටයක් නිකුත් කළ ජනපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතා තමා, ප්‍රතිකාර ලැබීමෙන් පසු වඩාත් හොඳ තත්ත්වයක සිටින බවද ඉක්මනින්ම නැවතත් සාමාන්‍ය රාජකාරිවල නිරතවීමට හැකිවනු ඇති බවට ද විශ්වාසය පළ කර තිබේ.

කෙසේ නමුත් නොවැම්බර් 03 දාට යෙදී ඇති ජනාධිපතිවරණයේ සිය ප්‍රචාරක ව්‍යාපාරය සඳහා කඩිනමින් එක්වී එය අවසන් කිරීමට හැකිවනු ඇතැයි ද ජනපති ට්‍රම්ප් විශ්වාසය පළ කර ඇත.

අමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතාට පසුගිය 01 වැනිදා වන අතර, 02 දා රෝහල්ගත කෙරිණි. මේරිලන්ඩ් හි පිහිටි වෝල්ටර් රීඩ් ජාතික හමුදා මධ්‍යස්ථානයේ පිරිවි රෝහලකට ඒ මහතා ඇතුළත් කරන ලද අතර, ධවල මන්දිරයේ සිටි හෙලිකොප්ටරයකින් රෝහල වෙත රැගෙන ගොස් තිබේ.

පාස්කු ප්‍රහාර පරීක්ෂණ...

මාස 5කට පෙර ත්‍රස්තවාදී කණ්ඩායම සමඟ ගනුදෙනු කළා යැයි ප්‍රකාශ කළ පුද්ගලයෙක් එකවරම නිදහස් කළේ කෙසේදැයි කියා පරීක්ෂණයක් කරන්නැයිද උන්වහන්සේ ඉල්ලා සිටියහ.

උන්වහන්සේ මේ බව පැවසුවේ කොළඹ අගරදගුරු මැදුරේදී පෙරේදා (03) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගි වෙමිනි .

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ උන්වහන්සේ මෙසේද ප්‍රකාශ කළහ.

පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිදුකරන පරීක්ෂණවලින් අනාවරණය වූ කරුණු මත දැඩි චෝදනා එල්ල වී තිබෙන සැකකරුවන් ලෙස අත්අඩංගුවේ සිටින පුද්ගලයන් අධිකරණ ක්‍රියාවලියකින් තොරව නිදහස් කර යැවීමේ ප්‍රවණතාවක් පසුගිය දිනවලදී අපි දැක්කා. මේ සම්බන්ධයෙන් අපේ බලවත් අප්‍රසාදය පළ කරනවා.

මේ සම්බන්ධව පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් අතර ඇති වී තිබෙන්නේ කනගාටුදායක තත්ත්වයක්, ඒ අය දැඩි කැළඹීමකට හා වේදනාවකට පත් වි සිටිනවා .

ඒ ප්‍රහාරය නිසා තවම ආබාධිත තත්ත්වයෙන් සිටින අය ඉන්නවා. රට පාලනය කරන අයගෙන් යුක්තිය සාධාරණය ඔවුන් බලාපොරොත්තු වෙනවා.

මෑතකදී නිදහස් කර යැවූ පුද්ගලයන් සම්බන්ධව මුලින්ම කියූ දෙවල් සහ දැන් කියන්නාවූ දේවල් අතර පරස්පරතාවයක් තිබෙනවා. මෙවැනි දේවල් සිදුවීම හරහා යම් ආකාරයක සාධාරණ සැකයක් ඇති වී තිබෙනවා. සැකකරුවන් හදිසියේම මුදා හැරීම ඇතුළුව දැනට සිදුවෙමින් පවතින දේවල් දෙස බැලීමේදී මේ කටයුතු නිසා වේදනාවට පත් වී සිටින කතෝලික ජනතාව අපේක්ෂා කරන පරීක්ෂණ අපක්ෂපාතීව සිදුවෙයිද කියා සාධාරණ බයක් අපිට තිබෙනවා.

මේ තුළ යම් ආකාරයට දේශපාලන ඩීල් එකක් තිබෙනවා ද කියන සැකය මගේ හිත තුළ ඇති වී තිබෙනවා . ඒ නිසා සිදුවෙමින් පවතින මේ ක්‍රියාදාමයන් සම්බන්ධව මගේ කතෝලික ජනතාව මගෙන් ප්‍රශ්න කරනවා. මේ ක්‍රියාදාමය විනිවිදභාවයෙන් හා අපක්ෂපාතීව සිදුකිරීම ඉතාම වැදගත්. මේ ගැන කතෝලික මන්ත්‍රීවරු පමණක් නොව රටේ යුක්තිය,සාධාරණය බලාපොරොත්තු වන සෑම කෙනෙක්ම කටයුතු කළ යුතුයි කියා මම විශ්වාස කරනවා.

මාස 5කට පෙර ඒ ත්‍රස්තවාදී කණ්ඩායම සමඟ ගනුදෙනු කළා යැයි ප්‍රකාශ කළ පුද්ගලයෙක් එකවරම නිදහස් කළේ කෙසේදැයි කියා පරීක්ෂණයක් කරන්න.

එහිදී මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දුන් උන්වහන්සේ,

මේ රජය බලයට එන විට අපිට දුන් පොරොන්දු තුළ මේ ප්‍රහාරය සම්බන්ධව ස්වාධීන පරීක්ෂණයක් පවත්වා, එයට හේතු වූ සියලු කරුණු සොයා බලා මෙය පිටුපස සිටින්නේ කවුද කියන දේ ගැන සොයා බලා ඒ අයට දඬුවම් දීමට කටයුතු කරනවා කියන පොරොන්දුව අපිට ලැබුණා. නමුත් ඒ පොරොන්දුව ඒ ආකාරයෙන් ඉටු වෙනවාද කියා ප්‍රශ්නයක් මතුවී තිබෙනවා. ඒ තිබූ උනන්දුව අද නැතිවී ගිහින් කියා අපිට පෙනෙන්න තිබෙනවා. බොහොම සැහැල්ලුවට ගෙන තිබෙන බවක් පෙනෙනවා.

මම ඉන්නේ මේ ප්‍රහාරය නිසා පීඩාවට පත් වී සිටින ජනතාවගෙ පැත්තේ. ඒ වගේම සාමය හා සාධාරණත්වය අගයන, ආගමික පැවැත්ම අගයන ජනතාව සමඟ මම සිටිනවා. මේ රටේ සියලුම ජනතාව සමඟම ඉන්නවා . නමුත් අයුක්තියට, අසාධාරණයට ඉඩ දෙන්න බැහැ.

මෛත්‍රී අද...

එමෙන්ම හෙට (06) හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ද කොමිසම හමුවේ පෙනී සිටීමට නියමිතය.

මේ බව දන්වා කොමිසමේ ලේකම්වරයා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට සහ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට නොතිසි නිකුත් කර ඇත.

මහර සහ මීගමුවේ සිරකරුවන් බලන්න එන්න එපා

බුද්ධික ඉඹුලාන

මහර සහ මීගමුව බන්ධනාගාරවල සිටින සිරකරුවන් බැලීම සඳහා අමුත්තන් පැමිණීම ඊයේ (04) සිට නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇත.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා පැවසුවේ ඊයේ (04) දිනයේ ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රදේශයෙන් කොරෝනා රෝගියකු වාර්තාවීමත් සමඟ රජයේ සෞඛ්‍ය අංශ ගත් ක්‍රියාමාර්ගවලට සමගාමීව සිරකරුවන්ගේ සෞඛ්‍යාරක්ෂාව සඳහා මේ පියවර ගත් බවයි.

එමෙන්ම මේ බන්ධනාගාර තුළට පිටත සිට පැමිණෙන බන්ධනාගාර නිලධාරීන්ටද උපදෙස් ලබා දී ඇත්තේ නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සේවයට වාර්තා කරන ලෙස බව ද උපුල්දෙණිය මහතා පවසයි.

එම බන්ධනාගාරවල සිට අධිකරණ කටයුතු සඳහා පිටත රැගෙන යන සිරකරුවන් සම්බන්ධයෙන් ද උපරිම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලෙස ද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා එම බන්ධනාගාර අධිකාරිවරුන් වෙත උපදෙස් ලබා දී තිබේ.

දෙවැනි වාරයේ පාසල් නිවාඩුව අද සිට

සිතාරා සේනානි

රට පුරා සියලු පාසල්වල දෙවැනි වාරයේ පාසල් නිවාඩුව අද (5) සිට ආරම්භ වන බව අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙයි.

දෙවැනි වාරයේ පාසල් නිවාඩුව සිකුරාදා (9) ආරම්භ වීමට මිට පෙර නියමිතව තිබිණි.

එසේම, අධ්‍යාපන අමාත්‍යාංශය ගත් මේ තීරණය පෙර පාසල් සඳහා ද වලංගු බව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සඳහන් කරයි.

මේ කාලසීමාවේ උපකාරක පන්ති පැවැත්වීමද අත්හිටුවා තිබේ.

01 වැනි පිටුවෙන්...

රිෂාඩ් සමඟ...

2019 අප්‍රේල් මස 21 වැනි දින එල්ල කෙරුණු ත්‍රස්ත ප්‍රහාරයට හේතු වූයේ ආරක්ෂක ක්ෂේත්‍රයේ සිදු වූ බරපතළ කඩාවැටීමත්, ත්‍රස්තවාදයට සහ අන්තවාදයට උඩගෙඩි දෙන දේශපාලන හා සමාජ පසුබිමක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැඟී තිබීමත්ය. එබැවින් ත්‍රස්තවාදය හෝ අන්තවාදය හෝ පෝෂණය කරනු ලබන සියලු මාර්ග සහ ක්‍රියාකාරකම් අහුරාලීමට අවශ්‍ය නිශ්චිත පියවර ගැනීමට අප රජය පසුබට වී නැත.

පාස්කු ප්‍රහාරය ගැන ජනාධිපති කොමිසමක් මඟින් පූර්ණ විභාගයක් සිදු කෙරෙමින් පවතී. එමෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව පරීක්ෂණ සිදුකරමින් සිටී. එම විභාග සහ පරීක්ෂණවලට අනතුරුව දැඩිව නීතිය ක්‍රියාත්මක කරනු ඇත. පසුගිය කාලයේ සිදුවූ ආකාරයට පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හෝ අත්තනෝමතිකව නිදහස් කිරීමේ බලය දේශපාලනඥයන් අතට පත් කිරීමට මා සූදානම් නැත.

එය නිසි පරීක්ෂණවලින් පසු අදාළ බලධාරීන් විසින් නීත්‍යනුකූලව ඉටු කෙරෙනු ඇත. අදාළ බලධාරීන් හෝ නිලධාරීන් අතින් යම් අතපසුවීමක් හෝ අත්වැරැද්දක් වී ඇත්නම් ඒවා නිවැරදි කිරීමට ද මම කටයුතු කරමි. රිෂාඩ් බදුයුදීන් මන්ත්‍රීවරයා සමඟ කිසිදු දේශපාලන ගනුදෙනුවක් (ඩීල් එකක්) අප ආණ්ඩුව ඇතිකරගෙන නොමැති බැව් අවධාරණය කරමි.

මෙතෙක් කල් ජනතාව මා කෙරෙහි තැබූ විශ්වාසය කිසිසේත් පළුදු වන ආකාරයට කටයුතු නොකරන අතර, ඉදිරියේදී ද එම විශ්වාසය තවදුරටත් තහවුරු වන පරිදි ක්‍රියා කරන බැව් ජනතාවට සහතික කරමි.

20 ගැන ජානිපෙ මතය...

ඒ අනුව එම සංශෝධනයට එක්විය යුතු සහ සංශෝධනය විය යුතු කරුණු සම්බන්ධයෙන් ජාතික නිදහස් පෙරමුණේ ප්‍රධාන ලේකම් එස්. විජයසිරි මහතා විසින් ලිපියක් මඟින් අගමැතිවරයා දැනුවත් කර ඇත.

ඒ අනුව අගමැති මහින්ද රාජපක්ෂ මහතා වෙත යොමු කරන ලද ලිපියේ වැඩිදුරටත් මෙසේ ද සඳහන් වෙයි.

යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට ඇතුළු කොට ඇති යම් ප්‍රතිපාදන පිළිබඳ අප පක්ෂයේ නායකත්වය සහ සෙසු පක්ෂ නායකයන් මෙන්ම පොදු මහජනතාව විසින් ඉදිරිපත් කළ විරෝධතා පිළිබඳ සංවේදීවීම පිළිබඳ පළමුවෙන්ම අප පක්ෂයේ ප්‍රණාමය ඔබතුමාට පිළිගැන්විය යුතුය. ඒ අනුව ඔබතුමා විසින් පත් කරන ලද කමිටුවට අප පක්ෂයේ නායක විමල් වීරවංශ සහෝදරයා විසින් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා පිළිබඳ යම් එකඟතාවකට පැමිණීමට උත්සාහ කිරීම ද අපගේ ඇගයීමට ලක්වේ.

නමුත් නීතිපතිවරයා විසින් රජයේ යෝජනා ලෙස අධිකරණයට ඉදිරිපත් කරන ලද සහ පාර්ලිමේන්තු විවාදයේ කාරක සභා අවස්ථාවේ දී සංශෝධනය කිරීමට නියමිත බවට සඳහන් කළ යෝජනාවලිය තුළ අප පක්ෂයේ නායකයා විසින් ඉදිරිපත් කළ සංශෝධන කිසිවක් අඩංගු නොවන බව කනගාටුවෙන් සඳහන් කළ යුතුය. අප පක්ෂයේ නායක විමල් වීරවංශ සහෝදරයා විසින් ඔබතුමා වෙත ඉදිරිපත් කළ සහ නීතිපතිවරයාගේ යෝජනා තුළ අඩංගු නොවූ සංශෝධන අතුරින් ප්‍රධාන ත්‍රිත්වයක් ඉතා තීරණාත්මකව වැදගත් වේ. ඒවා පිළිබඳ ප්‍රබල මහජන විරෝධයක් ගොඩනැඟී ඇති අතර, එම විරෝධයන් නොසලකා කටයුතු කිරීම මගින් අපගේ ආණ්ඩුවේ ජනවරමේ ආධ්‍යාත්මයට සහ ආණ්ඩුවේ ප්‍රතිරූපයට බලවත් අගතියක් සිදුවන බව ඔබතුමා ද පිළිගන්නවා ඇත.

ඉතිහාසයට මෙන්ම ජනවරමට සාධාරණය ඉටු කිරීම සඳහා 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු වන අපගේ දැඩි විරෝධයට ලක්ව ඇති සහ නැවත සංශෝධනය කළ යුතු හෙවත් නිවැරදි කළ යුතු ප්‍රතිපාදන ත්‍රිත්වය මෙසේ නැවත අවධාරණය කරමු. සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කොට ඇති රජයට බහුතර කොටස් හිමි සමාගම් විගණකාධිපතිවරයාගේ විගණනයෙන් නිදහස් කිරීම, මහජනයාගේ දැනගැනීම පිණිස ගැසට් කිරීමෙන් තොරව හදිසි පනත් සම්මත කිරීම සහ ද්විත්ව පුරවැසි බාධකය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඔබ්බට තානාපතිවරුන් සහ රජයේ ප්‍රධාන උසස් නිලතලවලට ද පැනවීම වෙනුවට එම බාධකය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම ඒ අතර වෙයි.

ඒ අනුව ජාතික නිදහස් පෙරමුණ ලෙස අප ඔබතුමාට ඉතා ගෞරවයෙන් අවධාරණය කරනු ලබන්නේ අප ආණ්ඩුවක් ලෙස එම වැරදි නිවැරදි කළයුතු බවය. එය ජනවරම ආරක්ෂා කිරීම සඳහා අප විසින් ගනු ලබන දේශපාලන ස්ථාවරයකි. ආණ්ඩුව සමස්තයක් ලෙස එම දේශපාලන ස්ථාවරය නොසලකා කටයුතු කරන්නේ නම් එහි දේශපාලන වගකීම අප විසින් බාර නොගන්නා බව ඉතා ගෞරවයෙන් සඳහන් කරමි. එහෙත් ආණ්ඩුවට සහ රටට එරෙහිව පවතින සතුරු වටලෑම පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුතුව 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අදාළව ආණ්ඩුව ආරක්ෂා කිරීමේ දේශපාලන ස්ථාවරයක් අප විසින් ගනු ලබන බව පූර්වගාමීව මෙසේ දැනුම් දෙමු.

දිවුලපිටියේ මවකට...

උණ රෝගයට ගම්පහ රෝහලෙන් ප්‍රතිකාර ලබාගෙන නිවෙසට යෑමට පෙර සිදු කළ පී. සී. ආර්. පරීක්ෂණයෙන් ඇයට වෛරසය ආසාදනය වී ඇති බවට හඳුනාගෙන ඇති අතර, ඒ අනුව වහාම ක්‍රියාත්මක වෙමින් ඇයගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීමට ද පියවර ගෙන තිබේ. මේ අතර ඇයගේ දියණියට සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණ මඟින් දියණියටද කොරෝනා වෛරසය ආසාදනය වී ඇති බව ඊයේ (04) තහවුරු වී තිබේ. මෙම දියණිය දිවුලපිටිය ප්‍රදේශයේ පාසලක ඉගෙනුම ලබා ඇති අතර, ඇය නොකඩවා පාසල් ගොස් ඇතැයිද අගේ පන්තියේ සිසු සිසුවියන් 31දෙනකු ඉගෙනුම ලබන බවද හෙළිව ඇත.

මෙම කාන්තාව සහ දියණියගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීමේ පහසුව සඳහා මිනුවන්ගොඩ සහ දිවුලපිටිය පොලිස් බල ප්‍රදේශයන්ට නැවත දැනුම් දෙන තෙක් ඊයේ (04) සිට නිරෝධායන ඇඳිරි නීතිය පැනවීමට ද පොලීසිය පියවර ගෙන තිබේ.

ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ උපදෙස් අනුව ආසාදිත කාන්තාව ඇසුරු කළ පුද්ගලයන් හඳුනාගෙන යුද හමුදාව තුළ නිරෝධායනයට ලක් කරන්නේ යැයි ද, ඇයට වෛරසය ආසාදනය වූ මූලාශ්‍රය තව පැය කිහිපයකින් හඳුනා ගත හැකි යැයි ද යුද හමුදාපතිවරයා පැවැසුවේය.

කොවිඩ් - 19 පැතිරවීම වැළැක්වීමේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානයේ පැවැති මාධ්‍ය හමුවට සහභාගි වෙමින් ඒ මහතා මේ බව ඊයේ (04) පැවැසුවේය.

මේ කාන්තාව මිනුවන්ගොඩ ප්‍රදේශයේ පෞද්ගලික ඇඟලුම් කර්මාන්ත ශාලාවක වැඩ පරීක්ෂක නිලධාරිනියක් ලෙස සේවය කර ඇති බවත් ඇය පොදු ප්‍රවාහන සේවය භාවිත කර නොමැති අතර, කර්මාන්ත ශාලාවේ බස් රථයකින් ගමන් කර ඇති බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

මේ කාන්තාව ඇසුරු කළ පුද්ගලයන් හඳුනාගෙන පී. සී. ආර්. පරීක්ෂාවට ලක් කිරීම ඊයේ (04) සිට ආරම්භ කර තිබේ.

පසුගිය 28 වැනිදා මේ කාන්තාව ප්‍රදේශයේ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයකින් උණ රෝගය සඳහා ප්‍රතිකාර ලබාගෙන ඇති බවත් එම ප්‍රතිකාරවලින් සුවපත් නොවීම හේතුවෙන් පසුගිය 30 වැනිදා ගම්පහ රෝහලට ඇතුළත් කළ බවත් වසංගත රෝග අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය සුදත් සමරවීර මහතා පැවැසුවේය.

පසුගිය මාස දෙකක් පුරාවට සමාජයෙන් කොවිඩ් ආසාදිත රෝගියකු වාර්තා නොවූ බව ද ඔහු කියා සිටියේය.

නිරෝධායන ඇඳිරි නීතියට ගරු කරමින් ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ජනතාව තම නිවෙස් තුළම රැඳී සිටිය යුතු බවත් සෞඛ්‍ය සේවාව වැනි අත්‍යවශ්‍ය සේවා සඳහා පමණක් නිවෙස්වලින් පිටට යා යුතු බවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා කීය.

මේ නීතිවලට අවනත වී වෛරසය ආසාදිත කාන්තාවගේ ආශ්‍රිතයන් සියලුදෙනා හඳුනා ගැනීමට මහජනතාව සහාය ලබා දිය යුතු යැයි ද ඔහු පැවැසුවේය.

නිරෝධායන ඇඳිරි නීතිය උල්ලංඝනය කරන පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරමින් නිරෝධායන කටයුතුවලට ලක් කරන බවත් නිරෝධායන ඇඳිරි නීතිය උල්ලංඝනය කර අධිකරණය හමුවේ වරදකරුවකු වුවහොත් අදාළ වැරදිකරුට සිර දඬුවමක් සහ දඩ මුදලක් ගෙවීමට සිදු විය හැකි බවත් ඒ මහතා කීය.

කොවිඩ් - 19 වළක්වා ගැනීමේ සෞඛ්‍ය උපදෙස් නිරන්තරයෙන් අනුගමනය කිරීමෙන් වෛරසය බෝ වීමෙන් වැළකිය හැකි බවත් උත්සව හෝ සාද වැනි මහජනතාව වැඩි පුර ගැවසෙන ස්ථානවල සෞඛ්‍ය උපදෙස් අනුව කටයුතු කළ යුතු බවත් ඒ මහතා කියා සිටියේය.

මිනුවන්ගොඩ, වේයන්ගොඩ සහ දිවුලපිටිය ප්‍රදේශවල සිටින යුද, ගුවන්, නාවික හා සිවිල් ආරක්ෂක බළකායේ රාජකාරි කරන සියලු දෙනා නැවත දැනුම් දෙන තුරු රාජකාරි ස්ථානයන්ට රපෝර්තු නොකරන ලෙස කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය දැනුම් දී ඇත.

එම ප්‍රදේශ දෙක හැර ගම්පහ දිස්ත්‍රික්කයේ සෙසු ප්‍රදේශවලට අයට අද (05) පමණක් රාජකාරියට රපෝර්තු නොකරන ලෙස ද කඳවුරු රාජකාරිවල නිරත අය එම කඳවුරු තුළම රඳවා ගන්නා ලෙස ද උපදෙස් ලබා දී ඇත.

ආණ්ඩුව ඒකාධිපති...

මාධ්‍ය වෙත විශේෂ ප්‍රකාශයක් කරමින් රුවන් විජයවර්ධන මහතා මේ බව සඳහන් කරයි.

මේ තත්ත්වය බරපතළ ඛේදවාචකයක් බව පෙන්වා දෙන ඒ මහතා ජාතිවාදය ආගම්වාදය තම දේශපාලන ව්‍යාපාර වෙනුවෙන් යොදා ගනිමින්, පාස්කු ප්‍රහාරය, වඳ සැත්කම් ආදී මාතෘකා තුළ ප්‍රසිද්ධියේ තමන් චෝදනා කළ කණ්ඩායම් ප්‍රමාණවත් සාක්ෂි නැතැයි පවසමින් නිදහස් කරමින් ආණ්ඩුව ගෙන යන වැඩපිළිවෙළෙහි අරමුණ සහ එදා ඔවුන්ට අවශ්‍යව තිබූ අරමුණ කුමක් දැයි රටේ බුද්ධිමත් ජනතාවට වැටහෙනු ඇති බව සිය විස්වාසය බවද පවසයි.

දැනට මතුව ඇති සෞඛ්‍ය අවදානම් තත්ත්වය ද අවබෝධ කර ගනිමින් රජය විසින් වහා කළ යුතුව ඇත්තේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාවත්, රටේ ආර්ථිකයත් ආරක්ෂා කිරීමත්, නැවත යථා තත්ත්වයට පත් කිරීමත් උදෙසා ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කිරීම බව එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවට අවධාරණය කරන බවද එලෙස කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ එම වගකීම පැහැර හරින්නේ නම් හෝ එය මෙරට ඉතිහාසය තුළ ආණ්ඩුවක් විසින් සිදු කරන ලද බරපතළම දේශපාලනික වරද බවට පත්වුණු ඇතැයිද ඒ මහතා සඳහන් කරයි.

කොරෝනා වසංගතයේ අවදානම මෙරට තුළින් පහව ගොස් නැති බව මිනුවන්ගොඩ ප්‍රදේශයෙන් කොරෝනා ආසාදිතයකු හමුවීමත් සමඟ පැහැදිලි වන බවද මෙය සුළුකොට තැකිය නොහැකි බරපතළ තත්ත්වයේ බවද පවසන ඒ මහතා රට තුළ කොරෝනා ආසාදිතයන් නොමැති බව සෘජුව ප්‍රකාශ නොකළද රජය විසින් සියලු සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේදයන් ලිහිල් කරමින් කටයුතු කිරීම පිළිබඳ කනගාටු වෙන බව පවසයි. සමාජ දුරස්ථකරණය සහ සෞඛ්‍ය නිර්දේශ ආරක්ෂා කිරීම පවා සමහර විට අමතක වී සහ අමතක කිරීමට සෘජුව වගකිව යුත්තේ රජය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය බව පෙන්වා දෙන ඒ මහතා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශයන් පවා බැහැර කරමින් රජය කටයුතු කිරීමේ ප්‍රතිඵල ඇතැම් විටක බරපතළ ඛේදවාචකයක මූලාරම්භය විය හැකි බවද අවධාරණය කරයි.

සජිත් පිලේ...

ඒ අනුව 20 වැනි සංශෝධනයට එරෙහි වැඩපිළිවෙළ පිළිබඳ එම පක්ෂ නායකයන් සහභාගි වන විශේෂ රැස්වීමක් අද (05) දිනයේ පැවැත්වීමට නියමිතය.

විසි වැනි සංශෝධනයට එරෙහිව සමඟි ජන බලවේගය ලබන 08 වැනිදා පැවැත්වීමට නියමිත මහා ජන රැලිය පිළිබඳවද අදාළ සාකච්ඡාවේදී අවධානය යොමු කිරීමට නියමිත බව එම පක්ෂයේ ජාතික සංවිධායක තිස්ස අත්තනායක මහතා දිනමිණට පැවසීය.

කෙසේ වුවද කොවිඩ් 19 හදිසි අවස්ථාව හමුවේ ඊයේ (04) දිනය දක්වා විස්සට එරෙහිව සිය පක්ෂය පැවැත්වූ සියලු වැඩසටහන් සාර්ථක කර ගැනීමට හැකි වූ බව සමඟි ජන බලවේගයේ සංවිධායකවරයා වැඩිදුරටත් පැවසීය.

වේදිකා නාට්‍ය නිෂ්පාදක උපාලිගේ මව අභාවප්‍රාප්ත වෙයි

වේදිකා නාට්‍ය නිෂ්පාදක උපාලි මහතාගේ මව වන සමාජ සේවිකාවක් වූ වයි.ලූවී නෝනා මහත්මිය අභාවප්‍රාප්ත වූවාය. දේහය10/1,ඒ රන්වැලි පෙදෙස නුවර පාර යක්කල

මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ඉඩම් අහිමි වූවන්ට සුදුසු ස්ථානවලින් වහා ඉඩම් දෙන්න

ජනපතිගෙන් අදාළ නිලධාරීන්ට උපදෙස්

මහින්ද අලුත්ගෙදර

මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඉඩම් අහිමි වූවන්ට සුදුසු ස්ථානවලින් ඉඩම් සපයා දී තමාට වහාම දන්වන්නැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අදාළ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

සියලු නිලධාරීන් එක් ස්ථානයකට කැඳවා සෙසු ඉඩම් ගැටලුවලට ද කඩිනම් විසඳුම් දෙන්නැයි ඒ මහතා දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරියට නියම කළේය.

මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඹිලියාකඩ ග්‍රාම නිලධාරී වසමේ නාගවනාරාම විහාරස්ථාන භූමියේ දී පසුගිය දා (2) පැවති 'ගම සමඟ පිළිසඳර' වැඩසටහනට සහභාගී වෙමින් ජනාධිපතිවරයා මේ බව පැවසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගී වූ 'ගම සමග පිළිසඳර' දෙවන වැඩසටහන මෙය වන අතර පළමුවැන්න පසුගිය සතියේ සිකුරාදා බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙලන්විට ගම්මානයේ දී පැවැත්විණි. දීර්ඝ කාලයක සිට නොවිසඳී ඇති ග්‍රාමීය ජනතාවගේ ගැටලු පිළිබඳ ඔවුන් සමඟ කතා බහ කර, ඒවා නිලධාරීන්ට ඉදිරිපත් කර කඩිනම් විසඳුම් දීම ජනාධිපතිවරයාගේ අපේක්ෂාව වේ.

අතිදුෂ්කර ගම්මානවල වෙසෙන ජනතාව මුණගැසීම රාජපක්ෂ මහතාගේ තවත් අරමුණක් වන අතර, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගැඹුරු ඔය, ලේඩියන්ගල, අලියාවල, වෙහෙරගල, හිඹිලියාකඩ සහ අවට ප්‍රදේශ ගණනාවක ගම්මූන් ජනාධිපතිවරයා හමු වී දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට නාගවනාරාම විහාරස්ථානයට පැමිණ සිටියහ. රැස්ව සිටි බොහෝ දෙනාගෙන් ඉඩම් පිළිබඳ ගැටලු රැසක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කෙරුණු අතර, දීර්ඝ කාලයක සිට නොවිසඳී ඇති හෙට්ටිපොළ නගරයේ විශාල පිරිසකට බලපා ඇති ඔප්පු පිළිබඳ ප්‍රශ්නයට ද කඩිනම් විසඳුම් දීමේ අවශ්‍යතාව ඒ මහතා අවධාරණය කළේය.

ස්වයං රැකියාවක් ලෙස කිරි ගොවි කර්මාන්තයේ නිරත පිරිස මුහුණ දී සිටින ගැටලු කෙරෙහි ජනාධිපතිවයාගේ විශේෂ අවධානය යොමු වූ අතර, ඔවුන් ව්‍යවසායකයන් බවට පත්කිරීමට සහාය දිය යුතු බව පෙන්වා දුන්නේය. ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ නිෂ්පාදන මිල දී ගැනීමට හා පහසුකම් සැලසීමට පියවර ගත යුතු යැයි සඳහන් කළ අතර, අඩු මුදලට කිරි ගවයන් දීමට අදාළ ආයතන දැනුවත් කිරීමට ද තීරණ කෙරිණි.

කිරි ගොවීන් ණය ඉල්ලුම් කිරීමේ දී සැපයිය යුතු ඇප කොන්දේසි ලිහිල් කිරීමට බැංකු සමඟ සාකච්ඡා කර පියවර ගන්නැයි ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් දුන්නේය. දිස්ත්‍රික්කයේ ගම්මාන රැසක ජනතාව වකුගඩු රෝගයෙන් පීඩා විඳින අතර, ඔවුන් මුහුණ පා සිටින ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලෙස අර්ධ වශයෙන් නිමකර ඇති හෙට්ටිපොළ වකුගඩු 'රුධිර කාන්දුකරණ' ඒකකයේ වැඩ කඩිනමින් අවසන් කර ඒකකයට අවශ්‍ය උපකරණ සැපයීමට රාජපක්ෂ මහතා උපදෙස් දුන්නේය.

දඹුල්ල, මහනුවර, කුරුණෑගල සහ මහියංගණය රෝහල් වෙත ගොස් 'රුධිර කාන්දුකරණ' ප්‍රතිකාර ගන්නා රෝගීන්ට මෙමගින් විශාල සහනයක් හිමි වන බව ප්‍රදේශවාසීහු පෙන්වා දුන්හ. දිස්ත්‍රික්කයේ රෝහල්වල පවතින හෙද හිගය පියවීමට වහාම පියවර ගැනීමට ද තීරණය කෙරිණි.

වෙහෙරගල සිට හෙට්ටිපොළ නගරයට ඇති කි.මි 2.8 ක සහ හිඹිලියාකඩ වැව් තාවුල්ලේ සිට හිඹිලියාකඩ ග්‍රාමයට ඇති මාර්ග කඩිනමින් සංවර්ධනය කරන ලෙස ඒ මහතා උපදෙස් දුන් අතර, හිඹිලියාකඩ ප්‍රාථමික විද්‍යාලයට පන්තිකාමර තුනකින් යුත් ගොඩනැගිල්ලක්, ගුරු නිවෙසක් ඉදිකිරීමට ද නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ගම සමඟ පිළිසඳරට ජනපති හිඹිලියාකඩට යයි

කිරි ගොවීන්ට කඩිනම් සහන

හෙට්ටිපොළ රුධිර කාන්දුකරණ ඒකකයේ වැඩ කඩිනම් වෙයි

ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේගම සහ විල්ගමුව නාමිණිඔය මහා විද්‍යාල සියලු පහසුකම් සහිත ජාතික පාසල් බවට පත්කරන ලෙස ද උපදෙස් දෙනු ලැබිණ. දිස්ත්‍රික්කයේ පාසල් රැසක පවතින ගුරු හිගයට කඩිනම් විසඳුම්දීමේ අවශ්‍යතාව ද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

පාසල් අධ්‍යාපනය අවසන් කළ ප්‍රදේශයේ තරුණ තරුණියන් වෙනුවෙන් වෘත්තීය පුහුණු අවස්ථා ඇතිකර වැඩ වශයෙන් ඔවුන් ඊට යොමු කර පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම කාලීන අවශ්‍යතාවක් බව ජනාධිපතිවරයා පැවසූ අතර, ඊට එක්වන ලෙස ද ඒ මහතා තරුණයන් දිරිමත් කළේය.

වාරි පහසුකම් නොමැතිකමින් විල්ගමුව සහ අවට ප්‍රදේශ රැසක කෘෂිකර්මාන්තයට අහිතකර බලපෑමක් ඇති කර තිබේ. ඊට විසඳුම් ලෙස වත්තේගෙදර, වෙහෙරගල, දොඩම්ගොල්ල සහ වැරැව්ගහ වැව් ප්‍රතිසංස්කරණය පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි. කෙටි, මධ්‍ය සහ දිගුකාලීනව විසඳුම් ලැබෙන පරිදි දෙවසරක් තුළ වැව් සංවර්ධනයටත්, එතෙක් කෘෂිකර්මාන්තයට වගා ළිං ජලය සැපයීමට නිසි පියවර ගන්නැයි ද ජනාධිපතිවරයා උපදෙස් දුන්නේය.

මෙහිදී හිඹිලියාකඩ වැවේ කඩිනම් ප්‍රතිසංස්කරණ කටයුතු යුද හමුදාවට පැවරිණි.

ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන රෝහණ දිසානායක, නාලක කෝට්ටේගොඩ, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහත්වරු සහ ප්‍රදේශයේ මහජන නියෝජිතයන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

සඳහිරු සෑයේ ඉදිකිරීම් ජනපතිගේ අධීක්ෂණයට

අගමැති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති සමයේ ඉදිකිරීමට මුල්ගල් තැබූ අනුරාධපුර සඳහිරු සෑයේ ඉදිරි සංවර්ධන කටයුතු නිරීක්ෂණයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසු ගිය දා (3) සහභාගී යේය.

මීටර් 85ක් උස, මීටර් 244ක වට ප්‍රමාණයකින් යුත් මෙම සඳහිරු සෑයේ වැඩ කටයුතු කඩිනමින් අවසන් කිරීමට ජනතා ශ්‍රම දායකත්වය ද ලැබෙමින් පවතී.

මෙම ස්ථානයේදී ජනාධිපතිවරයා පැමිණ සිටි ජනතාව සමඟ සුහදව කතා බහක නිරත වූ අතර, ජනතාවට එතුමා සමඟ ඡායාරූප ගැනීමට ද අවස්ථාව උදා විණි.

මෙම අවස්ථාවට යෑමට පෙර අනුරාධපුර පුරපති එච්.පී. සෝමදාස, උතුරු පළාත් හිටපු ආණ්ඩුකාර රෙජිනෝල්ඩ් කුරේ යන මහත්වරුන් අතර මඟ දී හමු වී 'පළාත් සභාවට තරග කරන්න ලෑස්ති වනවාද?' කියා සිනා මුසු මුහුණින් ජනාධිපතිතුමා ඔවුන්ගෙන් විමසීය.

ආරක්ෂක අංශවල නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

චිත්‍රාරත්න කළුආරච්චි - හිදෝගම සමූහ

මහාත්මා ගාන්ධි 151 වැනි ජන්ම දිනයේ

අරලියගහ මැඳුරේදී ගාන්ධි පිළිරුවට පුෂ්පෝපහාර

මහාත්මා ගාන්ධිතුමන්ගේ 151 වැනි ජන්ම දිනය නිමිත්තෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ කොළඹ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිත පිරිසක් අරලියගහ මන්දිරයේදී එතුමාගේ පිළිරුවට පසුගිය දා (2) පුෂ්පෝපහාර දැක් වූහ.

ඉන්දියාවේ පියා යන ගෞරව නාමයෙන් හැඳින්වෙන මහත්මා ගාන්ධිතුමන්, ඉන්දීය නිදහස් සටනේ පුරෝගාමියකු මෙන්ම අවිහිංසාවාදයේ පියා ලෙසින් ද නම් දරයි. අවිහිංසා වාදය පිළිබඳ සංකල්පය ඉන්දියාවට පමණක් නොව මුළු ලෝකය පුරා ප්‍රචලිත කිරීමට ද එතුමා කටයුතු කළේය.

වර්ෂ 1927 දී ශ්‍රී ලංකාවට පැමිණි මහත්මා ගාන්ධිතුමන් සති කීපයක් මෙරට සංචාරය කර ඇති අතර, කොළඹ ආනන්ද විද්‍යාලයේ දී බුදු දහම පිළිබඳ දේශන පවත්වා ඇත.

එසේම, ගාල්ලේ මහින්ද විද්‍යාලය ඇතුළුව රට පුරා ස්ථාන කිහිපයක දේශන පවත්වා ඇති එතුමා, කොළඹ, මහනුවර, මාතලේ, කුරුණෑගල, හලාවත, බදුල්ල, නුවරඑළිය, මොරටුව, පාණදුර, හොරණ, කළුතර, බලපිටිය, ගාල්ල, මාතර, අක්මීමන සහ යාපනය ඇතුළු බොහෝ නගරවල සංචාරය කර තිබේ.

මහත්මා ගාන්ධිතුමන් උපත ලැබුවේ 1869 ඔක්තෝබර් 2 වැනි දින ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේය.

එතුමන්ගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීමේ අවස්ථාවට ශ්‍රී ලංකාවේ ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජාකොබ්, රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල්, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් චමින්ද කුලරත්න, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් (නීති) ගනේෂ් ධර්මවර්ධන මහත්වරු හා ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිත පිරිසක් එක්ව සිටියහ.

පරිසර පනත සංශෝධනය කර දඩ දස ගුණයකින් වැඩි කරනවා

පරිසර ඇමැති මහින්ද අමරවීර

අසේල කුරුළුවංශ සහ මධ්‍යම පළාත් සංචාරක

පරිසර පනත මෙම වසර අවසන් වීමට පෙර දඩ හා සිර දඬුවම් වැඩි වන සේ සංශෝධනය කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

පරිසර පනත සංශෝධනය කිරීමෙන් පසු දැනට ඒ යටතේ දෙන මුදල් දඩ දස ගුණයකින් පමණ ඉහළ යනු ඇති බවත් සිර දඬුවම් දෙන කාලයද වැඩි කරන බවත් ඒ මහතා කීය.

මල්වතු අස්ගිරි මහානායකහිමිවරුන් දෙනම ඊයේ (04) බැහැ දැක ආශිර්වාද ලබා ගැනීමෙන් පසු මාධ්‍ය හමුවේ අදහස් දක්වමින් ඇමැතිවරයා මේ බව පැවසුවේය. මහ පරිමාණ පරිසර හානියක් රජයේ අනුදැනුම මත සිදු වන බවට ඇතැම් සමාජ මාධ්‍ය අසත්‍ය ප්‍රචාරයක් ගෙන යන බවත් ඒ සම්බන්ධව සැබෑ තත්ත්වය මහනාහිමිවරුන්ට පැහැදිලි කර දීමට තමන් පැමිණි බවත් ඇමැතිවරයා කීවේය.

නව නීති සකස් කර ඒවා නීතිපති වෙත යොමු කරන බවත් හැකි ඉක්මනින් සංශෝධිත පනත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව මගින් සම්මත කර මෙම වසර අවසන් වීමට පෙර ක්‍රියාත්මක කරන බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

පරිසරයට යම් විනාශයක් කවුරුන් හෝ කරන්නේ නම් ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීමට කිසිසේත් පක්ෂය හෝ තනතුර අදාළ නොවන බවත් පරිසරයට හානි කළ ආණ්ඩු පක්ෂයේ ප්‍රබල දේශපාලනඥයකු හා සම්බන්ධ ප්‍රදේශීය දේශපාලනඥයකුට නීතිය ක්‍රියාත්මක කරමින් මෙය ප්‍රායෝගිකව ඔප්පු කර පෙන්වා තිබෙන බවත් ඇමැතිවරයා පැවසුවේය.

පසුගිය කාලයේ දේශපාලනඥයන් හා බලවතුන් වැරදි කර නිදැල්ලේ සිටියදී සාමාන්‍ය ජනතාව සුළු වරදකට අල්ලාගෙන ගොස් දඬුවම් දුන් බවත් දැන් එවැන්නකට කිසිදු ඉඩක් නොමැති බවත් ඒ මහතා කීය.

දර කැල්ලක් කපා ගත්තොත්, ගඩොල් කපා ගන්න පස් ටිකක් කපා ගත්තොත්, පොඩි ට්‍රැක්ටරයකින් වැලි ටිකක් අරන් ගියොත් සාමාන්‍ය ජනතාවට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක වෙත්දී මහ පරිමාණ ජාවරම්කරුවන් එදා නිදැල්ලේ සිටි බවත් එවැනි තත්ත්වයක් යළි ඇති නොවන බවත් අමරවීර මහතා පැවසුවේය.

විසිවන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේදී සම්මත වෙන්නේ යම් යම් සංශෝධන සමඟ බවත් ශ්‍රීලනිපය මේ සඳහා යෝජනා කිහිපයක් දුන් බවත් ඇමැතිවරයා කීය.

මැතිවරණ ක්‍රමයේ වෙනසක් සමඟ නව ව්‍යවස්ථාවක් කඩිනමින් ගෙන ඒම ශ්‍රීලනිපයේ අදහස බවත් එතෙක් සම්මත කෙරෙන විසිවන සංශෝධනයට අවශ්‍යය සහාය දෙන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

ආනවිලින්දාව ප්‍රදේශයේ ඩෝසර් කළ අක්කර 1 1/2 ක භූමිය යථා තත්ත්වයට පත් කිරීමට පියවර ගෙන තිබෙන බවත් එහි අක්කර එක්දහස් ගණනක් වන භූමියේ කඩොලාන වගා කිරීමට කටයුතු කර තිබෙන බවත් හෙතෙම කීය.

වනාතවිල්ලුව සිමෙන්ති කර්මාන්ත ශාලාවට අයත් භූමියේ ගස් කිහිපයක් කපා තිබෙන බවත් එයට කිසිදු දේශපාලන සම්බන්ධයක් නොමැති බවත් අමරවීර මහතා පැවසුවේය.

කොළඹ අගරදගුරුගේ සැකය අහේතුක නැහැ

ඇමැති දිනේෂ් ගුණවර්ධන

මහින්ද අලුත්ගෙදර

හිටපු ඇමැතිවරයකු වූ රිෂාඩ් බදියුදීන්ගේ සහෝදරයා රක්ෂිත බන්ධනාගාරයෙන් නිදහස් වීම පිළිබඳ කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් කළ ප්‍රකාශය සම්බන්ධයෙන් දැඩිව අවධානය යොමු කරන බව මහජන එක්සත් පෙරමුණ කියා සිටියි.

මහජන එක්සත් පෙරමුණේ නායක හා විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා ඊයේ (04දා) මේ බව ප්‍රකාශ කෙළේ අවිස්සාවේල්ල, වැලිකන්ද ග්‍රාමයේ පැවැති හමුවකට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ඒ මහතා පෙන්වා දුන්නේ රිෂාඩ් බදියුදීන් හිටපු ඇමැතිවරයාගේ සහෝදරයා අත්අඩංගුවට ගෙන තිබෙන්නේ අපරාධකරුවන් සමඟ සමීප ඇසුරක් පවත්වා ගෙන යමින් විවිධ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ බවට චෝදනා කරමින් බවයි.

එදා එවැන්නක් ප්‍රකාශ කළ පොලීසිය අද වන විට චෝදනා ඔප්පු කිරීමට සාක්ෂි නැතැයි පවසන බවද මේ හේතුවෙන් අගරදගුරු හිමියන්ට ඇතිව තිබෙන සැකය අසාධාරණ යැයි කිව නොහැකි බවද දිනේෂ් ගුණවර්ධන මහතා පැවසීය.

රිෂාඩ් බදියුදීන්ට එරෙහිව පාර්ලිමේන්තුවට විශ්වාසභංග යෝජනාවක් ගෙනැවිත් ඒ සඳහා අස්සන් කළ අප මේ සිද්ධිය පිටුපස අදෘශ්‍යමාන හස්තයක් ක්‍රියාත්මක වී ඇත්ද යන්න පිළිබඳ අවදියෙන් සිටින බවද ඇමැතිවරයා කීවේය.

ස්වාමිනාදන් පොලිස්පතිට යැවූ ලිපිය ඉදිරිපත් කරන්න

ජනපති කොමිසමෙන් CIDයට නියෝග

රෝෂන් තුෂාර

විමර්ශන අවසන් කර තිබූ බන්ධනාගාර කැරැල්ල සම්බන්ධයෙන් වසර පහකට පසු නැවත පරීක්ෂණ ආරම්භ කරන ලෙස හිටපු බන්ධනාගාර ඇමැති ඩී. එම්. ස්වාමිනාදන් මහතා පොලිස්පතිවරයාට යැවූ ලිපිය හෙට (06) ඉදිරිපත් කරන්නැයි දේශපාලන පළි ගැනීම් විමර්ශන ජනාධිපති කොමිසම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කර තිබේ.

2012 නොවැම්බර් මස 10 වැනිදා වැලිකඩ බන්ධනාගාරයේ ඇතිවූ කැරැල්ලේදී රැඳවූවන් 27 දෙනකු ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන අවසන් කර තිබූ පසුබිමක යහපාලන ආණ්ඩු සමයේ දී යළි එම විමර්ශන ආරම්භ කළේ හිටපු බන්ධනාගාර හා පුනරුත්ථාපන ඇමැති ඩී. එම්. ස්වාමිනාදන් මහතාගේ බලපෑම් මත බව හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා කොමිසම හමුවේ සාක්ෂි ලබාදුන් අතර, ඒ අනුව අදාළ ලිපිය කැඳවීය.

හිටපු බන්ධනාගාර කොමසාරිස් එමිල් රන්ජන් ළමාහේවා මහතා දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බලන ජනපති කොමිසමට කළ පැමිණිල්ලකට අදාළව හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා එහි වගඋත්තරකරුවකු ලෙස නම් කර තිබිණි.

හිටපු ඇමැති ඩී. එම්. ස්වාමිනාදන් මහතා එවූ ලිපියක් අනුව වැලිකඩ සිද්ධියට අදාළව නැවත පරීක්ෂණ ආරම්භ කරන්නැයි 2017 වසරේ දී තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දුන් බව පූජිත් ජයසුන්දර මහතා පැවසීය.

දූෂණ විරෝධී කමිටුවේ රැස්වීමේදී ගත් තීරණ අනුව ස්වාමිනාදන් මහතා මේ පරීක්ෂණ නැවත ආරම්භ කිරීමට අදාළ ලිපිය සකස් කරන්නට ඇති බව හෙතෙම සඳහන් කළේය.

ඊයේ දිනයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු කොමිසම ඉදිරියේ පෙනී සිටි අතර, අදාළ ලිපිය සහිත ලේඛන ගොනුව ඉදිරිපත් කරන ලෙස කොමිසමේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා දන්වා සිටියේ.

නුවර සිසුවිය අපයෝජනය කිරීමට සැක පොලිස් නිලධාරියා සොයා විමර්ශන

අසේල කුරුළුවංශ

මහනුවර පොලිස් මූලස්ථානයට අනුයුක්තව සේවය කරන පොලිස් නිලධාරියකු පහළොස් හැවිරිදි බාල වයස්කාර පාසල් සිසුවියක අපයෝජනය කළ බව කියන සිද්ධියක් සම්බන්ධයෙන් වත්තේගම පොලීසිය පරීක්ෂණ ආරම්භ කර තිබේ.

සැකකාර පොලිස් නිලධාරියා පසුගිය වසරේදී අවස්ථා කිහිපයකදී මෙම පාසල් සිසුවිය අපයෝජනය කර තිබෙන බව පරීක්ෂණ මගින් අනාවරණය වී ඇත.

කටුගස්තොට පොලිස් බල ප්‍රදේශයට අයත් පාසලක අධ්‍යාපනය හදාරන අදාළ සිසුවිය සම්බන්ධයෙන් පාසල් බලධාරීන් විසින් කටුගස්තොට පොලීසියට දැනුම්දී තිබේ. සිසුවිය පදිංචිව සිටිනේ වත්තේගම පොලිස් වසමේ බැවින් කටුගස්තොට පොලිසිය විසින් අදාළ පැමිණිල්ල වත්තේගම පොලිසියට යොමු කර ඇත.

අදාළ සිසුවිය වෛද්‍යවරයකුට යොමු කිරීමෙන් පසු සිසුවිය අපයෝජනයට ලක්ව තිබෙන බව තහවුරු වීමෙන් පසු සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරියා අත්අඩංගුවට ගැනීමට පොලීසිය විමර්ශන ආරම්භ කර තිබේ.

සිසුවිය සැකකාර පොලිස් නිලධාරියාගේ ඥාති දියණියක බව පොලීසිය පවසයි. වත්තේගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පාලිත ඉලංගන්සේකර මහතාගේ උපදෙස් පරිදි මෙම පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශය සැඟව සිටින සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂණ සිදුකරයි.

රොහාගේ කල්ලියේ 4ක් ගල්කිස්සේදී අත්අඩංගුවට

චන්ද්‍රිකා පෙරේරා සහ බොරලැස්ගමුව සමූහ

සංවිධානාත්මක අපරාධ කල්ලි ප්‍රබලයකු වූ "රත්මලානේ රොහා" ගේ කල්ලියේ සිටු දෙනෙකු විවිධ වර්ගයේ ජීව පතරොම් 262ක් සමඟ ගල්කිස්ස කල්දෙමුල්ල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකාය පෙරේදා (03) අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් මොරටුව සහ රත්මලානේ පදිංචි අවුරුදු 34, 38, 28 සහ 44 වයස්වල පසුවන්නන් බව පොලිසිය පැවසීය.

මෙසේ අත්අඩංගුවට ගෙන ඇති පතරොම් තොගය රත්මලාන ගොනාකෝවිල ප්‍රදේශයේ වළ දමා තිබියදී සොයා ගෙන තිබේ.

එම උණ්ඩ තොගය ඉතා ආරක්ෂාකාරීව අසුරා වළ දමා තිබී ඇති අතර, ටී 56 වර්ගයේ උණ්ඩ 255ක්, මිලිමීටර් 9 වර්ගයේ උණ්ඩ 4ක් සහ මිලිමීටර් 8 වර්ගයේ උණ්ඩ 3ක් එහි තිබුණු බව පොලීසිය කීය.

රත්මලානේ රොහා සමඟ ඉතා සමීපව කටයුතු කරමින් විවිධ අපරාධවලට අධාර අනුබල දී ඇති බවට පොලීසියට තොරතුරු ලැබී ඇත. රත්මලානේ රොහා හෙවත් දේවමුණිගේ හැරල්ඩ් රෝහණ ද සිල්වා මීගමුව කොච්චිකඩේ ප්‍රදේශයේදී පොලීසිය සමඟ ඇති වූ වෙඩි හුවමාරුවකදී පසුගිය දා මරණයට පත් විය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් "රත්මලානේ රොහා" මිය යෑමට පෙර ඔහු සමඟ නුවරඑළිය ප්‍රදේශයේ පැවති අවසාන සාදයටද සහභාගී වී ඇති බව සිදු කළ මූලික විමර්ශනවලින් අනාවරණය වී ඇත. සැකකරුවන් සහ ජීව උණ්ඩ තොගය වැඩි දුර විමර්ශන සඳහා ගල්කිස්ස පොලීසියට භාර දී තිබේ.

මේ අතර එදින රුවන්වැල්ල නිකවලමුල්ල, කුරුපැත්ත ප්‍රදේශවල සිදු කළ වැටලීම්වලදී මෙරට නිෂ්පාදිත ගිනි අවි හතරක් සමඟ සැකකරුවන් දෙදෙනකු රුවන්වැල්ල පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙසේ අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 47 සහ 41 වයස්වල පසුවන රුවන්වැල්ලේ පදිංචි අය වෙති. රුවන්වැල්ල අධිකරණය වෙත සැකකරුවන් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇති අතර, වැඩිදුර විමර්ශන රුවන්වැල්ල පොලීසිය පවත්වයි.

ආමි සමන්තගේ බිරිය කුඩු සමඟ කොටු වෙයි

චන්ද්‍රිකා පෙරේරා සහ කොටදෙනියාව සමූහ

බන්ධනාගාරගතව සිටින මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු වන "ආමි සමන්තගේ" බිරිය හෙරොයින් ග්‍රෑම් දෙකයි මිලිග්‍රෑම් 540ක් සහ රුපියල් ලක්ෂ 24ක මුදලක් සමඟ දිවුලපිටිය, කෙහෙල්ඇල්ල ප්‍රදේශයේදී පොලිසිය පෙරේදා (3) අත්අඩංගුවට ගෙන තිබේ.

මේ සැකකාරිය ඊසි කෑෂ් ක්‍රමයට හෙරොයින් අලෙවි කිරීමේ ජාවාරමක නිරතව සිට ඇත. මීට පෙර හෙරොයින් ජාවාරම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරුවකු හෙළි කළ තොරතුරු මත සිදු කළ විමර්ශනයකදී සැකකාරිය අත්අඩංගුවට ගෙන ඇත.

සහතික ඔන්ලයින් ක්‍රමයට

විභාග දෙපාර්තමේන්තුවේ මහජන කවුළු වසයි

සිතාරා සේනානි

රටේ පවතින තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙතින් සහතික පත්‍ර නිකුත් කිරීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ පමණක් සිදු කෙරෙන බව එම දෙපාර්තමේන්තුව පවසයි.

නිරෝධායන හේතු මත දෙපාර්තමේන්තු පරිශ්‍රය වෙත මහජන පැමිණීම සීමා කර ඇති බැවින් නැවත දැනුම් දෙන තුරු දෙපාර්තමේන්තු එක් දින හා සාමාන්‍ය සේවා කවුළු තාවකාලිකව වසා තැබෙන බවත් එම දෙපාර්තමේන්තුව පවසයි.

නව ව්‍යවස්ථාවක් සැකසීම දිනකින් දෙකකින් කරන්න බැහැ

සබරගමුව ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව

ඉන්ද්‍රානි තෝරදෙණිය

දින කිහිපයක් ඇතුළත ගෙනා දහනවය මෙන් නොව විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය කතිකාවකට දොර විවර කර තිබේ යැයි සබරගමුව පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා පැවසීය. ආණ්ඩුකාරවරයා එම අදහස් පළ කළේ විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ සිය අදහස් ප්‍රකාශ කරමිනි.

ඒ මහතා මෙසේද පැවසීය. දහනව වැනි සංශෝධනය ගෙන එන විට එය ඉතා කඩිනමින් ගෙන සම්මත කර ගත්තා. ජනතාවගේ ඡන්දයෙන් පත් වන ජනාධිපති සහ අගමැති ජනතාව පැත්තෙන් හිතුවේ නැහැ. දහනවයෙන් රට ආපස්සට ගියා. පාස්කු ප්‍රහාරය සිදුවීමෙන් පසු ලොකු විනාශයක් සිදු වුණා. ලෝක වාර්තාවක් තබමින් පොලිස්පතිවරයා නිල ඇඳුම පිටින් සිරගත වීමට සිදු වුණා. දහ නව වැනි සංශෝධනය පිළිබඳ ජනතාවට කතිකාවක් ඇති කර ගැනීමට තරම් කාලයක් තිබුණේ නෑ. ඔවුන්ට අවශ්‍ය දේ ඔවුන් කර ගත්තා.

පසු ගිය ජනාධිපතිවරණය වන විට ජනතාවට දහ නව වැනි සංශෝධනය පිළිබඳල පැහැදිලි අවබෝධයක් තිබුණා. ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වෙද්දි දහ නවය අහෝසි කරන බවටත්, නව ව්‍යවස්ථා සංශෝධනයක් කරන බවටත් ඉන් පසු පූර්ණ ව්‍යවස්ථා සංශෝධනයකට යන බවත් පැහැදිලිව ප්‍රකාශ කළා. ජනතාව ඒ සියල්ල අනුමත කර විශාල ජනවරමකින් ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා වශයෙන් තෝරා ගත්තා. ඔහු කෙරෙහි ජනතාවට ලොකු විශ්වාසයක් එදා තිබුණා වගේම අදත් තිබෙනවා.

නව ව්‍යවස්ථාවක් සැකසීම දිනකින් දෙකකින් කළ හැකි දෙයක් නොවෙයි. නමුත් රට පවතින නොයෙක් අර්බුදවලින් බේරා ගැනීමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාව දැඩිව තිබෙනවා. එයට අවශ්‍ය වට පිටාව සකසා ගත යුතුයි. වෙනසක් නොකරන්නේ නම් දශක ගණනක් අපේ රට ගිය විදිහට ඔහේ ගලා යයිද ජනතාව මෙතරම් බලයක් දුන්නේ ඒ වෙනස දකින්ට යැයි ද ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව මහතා පැවසීය.

මුඛ ආවරණ නැතිව දුම්රිය ස්ථානවලට ඇතුළුවීම තහනම්

නිමල් රාජපක්ෂ

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අද (05) සිට යාවකයන්,වෙළෙන්දන් හා මුඛ ආවරණ නොමැති මගීන් දුම්රිය ස්ථානවලට ඇතුළුවීම සම්පූර්ණයෙන්ම තහනම් කොට ඇතැයි දුම්රිය සාමාන්‍යාධිකාරී ඩිලන්ත ප්‍රනාන්දු මහතා පවසයි.

දුම්රිය ස්ථානවලට මගීන් පැමිණෙද්දී සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු අතර දුම්රිය ස්ථානවලට ඇතුළු වීමට පෙර දෑත් සෝදා මුඛ ආවරණ පැළඳ සිටිය යුතුවෙයි. කිසිදු යාවකයෙක් හෝ වෙළඳුන්හට දුම්රිය තුළත් ගමන් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කොට තිබේ. සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය නොකරන කිසිදු මගියකුට දුම්රියේ ගමන් කිරීමට නොහැකි වන අතර මගීන්ගේ ආරක්ෂාව දැඩි ලෙස යොදවන බවද ඩිලන්ත ප්‍රනාන්දු මහතා පවසයි.

බස් රියේ දුම්රියේ මුඛ ආවරණ අනිවාර්යයි

නිමල් රාජපක්ෂ

පොදු ප්‍රවාහන සේවා බස්රථවල මගීන් ගමන් කරද්දී නියමිත සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරමින් අද (5) බස් රථ ධාවනය කරවීමට රජය තීරණය කොට ඇත.

ඒ අනුව බස්රථවලට මගීන් ගොඩකර ගැනීමේදී මීටරයේ සීමාවට පවත්වාගෙන යා යුතු අතර ,මාක්ස් පැළඳ ගත් මගීන් පමණක් බස්රථවලට ගොඩකරවා ගත යුතු බව ප්‍රවාහන රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

සියලුම මගීන් දෑත් සෝදා පිරිසුදුවී බස් රථවලට ගොඩවියයුතු අතර රියදුරු කොන්දොස්තර මහත්වරුන්ද සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වෙයි. මීට අමතරව කිසිදු ලංගම හෝ පෞද්ගලික බස් රථයක මීටරයේ සීමාවෙන් පිටත මගීන් පටවාගෙන යා නොහැකියි. හදිසියේවත් පෞද්ගලික බස් රථයක මගීන් කොටට පොල් ගානට ,සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට පිටස්තරව ගෙන ගිය හොත් බස් අයිතිකරුවන් ඒ සඳහා වගකිවයුතු බවත්,දුලුම් ඇමැතිවරයා වැඩිදුරටත් පැවසුවේය.

සීඅයිඩීය භාර ඩීඅයිජී වෙදසිංහ ඉවතට

චන්ද්‍රිකා පෙරේරා

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස ඊයේ (04) සිට වහාම ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය පොලිස්පති එස්.පී.රණසිංහ මහතා පත් කර තිබේ.

ඒ අනුව මේ වන තෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කළ නුවන් වෙදසිංහ බස්නාහිර උතුර පළාත වැඩබලන නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස තාවකාලිකව මාරුකර යවා ඇත. ජාතික පොලිස් කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මේ මාරුකිරීම් සිදු කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජාලිය සේනාරත්න මහතා පැවසීය.

අතුරු වැටුප් යෝජනාව ලබන අයවැයෙන් ක්‍රියාත්මක කරන්න

ලංකා ගුරු සංගමය

සිතාරා සේනානි

සමස්ත පාසල් පද්ධතිය කොවිඩ් - 19 තත්ත්වය මත වසා දැමීමට රජය තීරණය කර ඇතත්, ලෝක ගුරු දිනය අද (5) දින සැමරීම පදනම් කර ගෙන, ගුරු වැටුප් හා වෘත්තීය ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දීමට රජය කටයුතු කළ යුතු බව ලංකා ගුරු සංගමය පවසයි.

ලෝක ගුරු දිනය ඔක්තෝබර් 5 ලෙස ලොව පුරා සැමරීම සිදුවුවද ලංකාවේ ගුරු දිනය ඔක්තෝබර් 6 වැනිදා විකෘතියක් බවත් ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා පවසයි.

ගුරු සේවා ව්‍යවස්ථාව නිකුත් වූ දිනය 1994 ඔක්තෝබර් 06 බැවින් එම දිනය පදනම් කර ගෙන මෙරට ගුරු දිනය ඔක්තෝබර් 06 වැනිදා සැමරීම සිදුවුවද, ලෝක ගුරු දිනයට සමගාමීව එම දිනය ඔක්තෝබර් 5 වැනිදා සමරන ලෙස ලංකා ගුරු සංගමය අඛණ්ඩව ඉල්ලා ඇති බවත්, වත්මන් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතාගෙන් සහ අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාගෙන් ද එම ඉල්ලීම සිදුකරන බවත්, ඒ මහතා සඳහන් කරයි.

තම ඉල්ලීම් දෙන බවට රජය දුන් රැවටිලිකාරී පොරොන්දු මධ්‍යයේ, සේවා තත්ත්වය පිළිබඳ අත්‍යෂ්තිකර වාතාවරණයක වුවද මෙරට ගුරුවරු කොවිඩ් - 19 ව්‍යාප්තිය හමුවේ අධ්‍යාපන පද්ධතිය තුළ දරුවන්ට සිදු වූ පාඩුව අවම කිරීමට වෙර දරමින් කටයුතු කරන බව ද ස්ටාලින් මහතා පෙන්වා දෙයි.

2020 සැප්තැම්බර් 29 දින වර්තමාන අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතා සමඟ ලංකා ගුරු සංගමය සිදු කළ සාකච්ඡාවේ දී ගුරු - විදුහල්පති සේවා සංවෘත සේවා බවට පත්කර වැටුප් ගැටලුව විසඳීමට අදාළ කැබිනට් පත්‍රිකා 3ක් පැවැති රජය හා වර්තමාන රජය ඉදිරිපත් කර ඇති බව පෙන්වා දුන් බවත් පවසයි. එසේම, වැටුප් ගැටලුව පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීම වෙනුවට 2018 සැප්තැම්බර් මස හිටපු අධ්‍යාපන ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මහතා ගුරු විදුහල්පති වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කොට රනුග්ගේ වැටුප් කොමිසමට ඉදිරිපත් කළ අතුරු වැටුප් යෝජනාව එළඹෙන අයවැයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන ලෙස තම සංගමය අධ්‍යාපන ලේකම්වරයාගෙන් ඉල්ලා සිටි බවත් පවසන ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම්වරයා, එසේ නොවන්නේ නම් අයවැයෙන් පසු සියලු ගුරුවරුන් හා විදුහල්පතිවරුන් සමඟ යළි වැටුප් අරගලය ඇරඹීමට කටයුතු කරන බවත් අවධාරණය කරයි.

දිවුලපිටිය ඥානවිමල විදුහලේ ගුරුවරුන් - සේවකයන් සහ සිසුහු 1500ක් නිරෝධායනයට

සන්ධ්‍යා කරුණාරත්න

කොරෝනා ආසාදිත කාන්තාවගේ දියණිය අධ්‍යාපනය ලැබූ දිවුලපිටිය ඥානවිමල විද්‍යාලයේ සිසු සිසුවියන් 1500 ක් හා ගුරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය ස්වයං නිරෝධායනයට ලක් කිරීමට පියවර ගන්නා බව ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා දිනමිණට ඊයේ පැවසීය.

දිවුලපිටිය හා මිනුවන්ගොඩ ප්‍රදේශ ආශ්‍රිතව පුද්ගලයන් 750 ක් පමණ නිරෝධායනයට ලක්කර ඇති අතර ඉන් 150 ක් දිවුලපිටිය ප්‍රදේශයේ අය බවත් ඉතිරි හයසිය දෙනා මිනුවන්ගොඩ ප්‍රදේශයේ අය බවත් ඔහු කීය.

මේ සිද්ධිය ආශ්‍රිතව පුද්ගලයන් 1500 කට පී.සී.ආර්. පරීක්ෂණ අද (05) සිදුකරන බව ද හෙතෙම පැවසීය. මෙම ප්‍රදේශ ආශ්‍රිතව කිසියම් පුද්ගලයකු උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව ඇතුළු ස්වසන රෝගයකින් පෙළෙන්නේ නම් ළඟම ඇති ප්‍රධාන රෝහලට ගොස් පී.සී.ආර්. පරීක්ෂාවකට ලක්වන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් කරයි.

රාජ්‍ය ආයතනවල අද මහජන දිනය නැහැ

මහින්ද අලුත්ගෙදර

කිසිදු රාජ්‍ය ආයතනයක අද (05) දිනයේ මහජන දිනය නොපැවැත්වෙන බව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ප්‍රකාශ කරයි. ඒ අනුව මීළඟ සතියේ පැවැත්වීමට නියමිත මහජන දිනය සම්බන්ධයෙන් පසුව දැනුම් දෙන බවද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ.ජේ. රත්නසිරි මහතා පෙන්වා දෙයි. මීට පෙර බදාදා දිනයේ පැවැති මහජන දිනය සඳුදා දිනයට යොදා ගැනීම සඳහා වත්මන් රජය විසින් තීරණය කරන ලද අතර ඒ අනුව අද දිනයේ සියලුම රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශයන්හි මහජන දිනය පැවැත්වීමට නියමිතව තිබිණි.

"ආණමඩුවේ තරුණයකුට තෙවැනි වරටත් කොරෝනා

මිහිර විජේසේකර-මාරවිල සමූහ

ශ්‍රී ලංකාව තුළ තුන්වැනි වරට කෝවිඩ් ආසාධිතයකු ලෙස වාර්තා වූ පළමු රෝගියා ආණමඩුව තෙන්නන්කුරියා ප්‍රදේශයන් හමුවෙයි.

23 හැවිරිදි තරුණයකු වන මේ පුද්ගලයා තුන්වැනි වරටත් කෝවිඩ් ආසාධිතයකු ලෙස සනාථ

වී ඇති බව වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය එම් .ෆරිඩ් මහතා පැවසීය.

මෙසේ කෝවිඩ් 19 ආසාධිකයකු ලෙස හඳුනාගෙන ඇත්තේ ඩුබායි රාජ්‍යයේ රැකියාවකට ගොස් පසුගිය අගෝස්තු මස 18 දින ශ්‍රී ලංකාවට පැමිණ පළමු වරට වැලිකන්ද කොරෝනා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී ආසාධිතයකු බවට තහවුරු වූ අයෙකි.

අදාළ තරුණයා ආණමඩුව තෙන්නන්කුරියාව පදිංචි කරුවකු වන අතර මොහු වැලිකන්ද කෝවිඩ් රෝහලින් ප්‍රතිකාර ලබා අදාළ නිවසට පැමිණ නැවත නිරෝධායනය වෙමින් සිටි ඇති බව සඳහන්. සිය මව සමඟ නිවසේ නිරෝධායනයට ලක්වෙමින් සිටියදී දෙවැනි වරට නැවතත් රෝග ලක්ෂණ පහළ වීමෙන් පසු සැප්තැම්බර් 17 වැනි දින අසනීපව සිටියදී හලාවත රෝහලේ කොවිඩ් ඒකකයට ඇතුළත් කර ඇත.

මේ තරුණයා ඉරණවිල කෝවිඩ් රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබා යළි නිවසට පැමිණ තිබේ.

කෙසේ නමුත් අදාළ තරුණයා නිසි නිරෝධායන ක්‍රමවේදයන් යටතේ ඔහු පදිංචි නිවස තුළ රඳවා නිරෝධායනයට ආණමඩුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කටයුතු කර තිබිණි.

අනතුරුව ඉකුත් ඔක්තෝම්බර් 2 දින නිවසේ නිරෝධායනය වෙමින් සිටියදී නැවතත් අසනිප වූ ඔහු හලාවත මහ රෝහලේ කෝවිඩ් ඒකකයට යැවීමට සෞඛ්‍ය බලධාරීන් කටයුතු කළේය.

එහිදි නැවත අදාළ තරුණයා පීසීආර් පරීක්ෂණවලට යොමු කිරීමෙන් පසුව තුන්වැනි වරට ද කෝව

හන්තානට මොකද වෙන්නෙ?

මධ්‍යම කඳුකරයේ පවත්නා සුවිශේෂී පාරිසරික පද්ධතියකින් සමන්විත හන්තාන කඳුවැටිය, ජෛව විවිධත්වය අතින් ඉහළ වැදගත්කමක් පෙන්නුම් කරයි. මෙරටට ආවේණික සත්ත්ව හා ශාක විශේෂ ගණනාවකින් සමන්විත හන්තාන පුරා පැතිර පවතින්නේ, දුටුවන්ගේ සිත් පැහැර ගන්නා හරිත පැහැයකි. මහවැලි ගංගාවේ වැදගත්ම ජල පෝෂක ප්‍රදේශයක් වන හන්තාන කඳුවැටිය මුහුදු මට්ටමේ සිට අඩි 3720 ක උසක් දක්වා විහිදී පැතිරී පවතී. මෙහි සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර 1200 කි. ඉංග්‍රීසි පාලන සමයේ හන්තාන කඳුවැටියේ පහළ කොටසේ අක්කර 432 ක ප්‍රමාණය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේ, විශ්වවිද්‍යාලයට පවරාදී තිබේ. පසුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය ලෙසින් එය නම් කරනු ලැබිය. සර් අයිවර් ජෙනින්ස් මහතා විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සඳහා මේ ප්‍රදේශය තෝරාගෙන තිබෙන්නේ, එහි වූ අති සුන්දර පරිසරය හේතුවෙනි. ලොව සුන්දරතම විශ්වවිද්‍යාල පරිශ්‍ර තේරීමේදී, පේරාදෙණිය සෑම වසරකම එහි මුල් නම් කිහිපය අතරට ගැනෙන්නේ, හන්තානේ අසිරිය නිසාය. හන්තානේ සුන්දරත්වය හා බැඳුණු කවි, ගීත පමණක් නොව, සිනමාපට ද නිර්මාණයවී තිබේ. ප්‍රේමවන්තයන්ගේ පාරාදීසයක් බඳු හන්තාන, නොඉඳුල් කන්‍යාවියක ලෙස සුරකින්නට පරිසරවේදීන් කොතෙක් උත්සාහ ගත්ත ද, අද ඒ කන්‍යාවිය නොයෙක් දෙනා අතින් දූෂණයට ලක් වෙමින් පවතී. කාමාතුරයකුගේ ග්‍රහණයට අසුවූ තරුණියකට සිදුවන විනාශය දශකයක පමණ සිට හන්තානට සිදු වෙමින් තිබෙන්නේ යැයි පැවසුවොත්, එය නිවැරදිය.

හන්තාන කන්ද ආශ්‍රිත ඉහළ කොටසේ පවත්නා සුවිශේෂී කාලගුණික තත්ත්වයත්, එහි ඕනෑම ස්ථානයක සිට අංශක 180 කට වඩා වැඩි කෝණයක් ඔස්සේ මැවෙන සුන්දර දසුනත් නිසා, දේශපාලනඥයන්ගේ මෙන්ම ඉහළ ධනවතුන්ගේ ගොදුරක් වන්නට හන්තානට සිදුව ඇත්තේ, අද ඊයෙක සිට නොවේ. මෙය වළක්වා, හන්තාන සුරැකීම අරමුණු කර ගනිමින්, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, ගැසට් පත්‍රයක් මඟින් 2010 පෙබරවාරි 17 වැනි දින හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කරනු ලැබිය. හන්තාන පරිසර ආරක්ෂක ප්‍රදේශය මෙහිදී කලාප තුනකට බෙදූ අතර, එය අඩි 3000ට ඉහළ, අඩි 2500-3000 අතර හා අඩි 2500 ට පහළ ලෙස වර්ග කර තිබේ. එම ප්‍රදේශයේ බලතල ක්‍රියාත්මක කිරීම හෝ යම් කාර්තව්‍යයක් ඉටු කිරීමේ බලය පවරා ඇත්තේ, මධ්‍යම පරිසර අධිකාරියටය. මේ පාරිසරක කලාපය කළමනාකරණය හා නියාමනයට, මධ්‍යම පරිසර අධිකාරිය යටතේ හන්තාන පාරිසරික කමිටුවක් පිහිටුවා තිබේ. එහි සභාපති ධූරයට මහනුවර දිස්ත්‍රික් ලේකම් ද, මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂවරයා ලේකම් ධූරයට ද, නිල බලයෙන් පත් වෙයි. මෙයට අමතරව හන්තානට අයත් භූමියේ පහළ සීමා අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ලේකම්වරුන්, එහි ඉඩම්වල අයිතිය ඇති ආයතන, හන්තාන සුරැකීමේ සංවිධානය ඇතුළු ආයතන හා සංවිධාන කිහිපයක නියෝජිතයන් කමිටුවට ඇතුළත්ය. ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඉඩම් ප්‍රතිංස්කරණ කොමිසම, නිවාස සංවර්ධන අධිකාරිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට, මේ ඉඩම්වල අයිතිය තිබේ. මෙයට අමතරව ඇතැම් ඉඩම්වලට පෞද්ගලික ඔප්පු ඇති පිරිසක් ද සිටිති.

හන්තාන ආශ්‍රිත ඉඩම් අල්ලා ගැනීම, එහි වන වගාවලට හානි කිරීම, ගිනි තැබීම් පිළිබඳ අපට නිතර අසන්නට ලැබේ. මහනුවර නගරයේ පවතින සෞම්‍ය කාලගුණික තත්ත්වය ආරක්ෂා කිරීමට ප්‍රබලම සාධකයක් වන හන්තාන රැක ගැනීමට, නිරන්තරව කටයුතු කරන හන්තාන සුරැකීමේ සංවිධානය, පසුගිය මස අග භාගයේ මහනුවර පොලීසිය, මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු අංශ ගණනාවකට පැමිණිල්ලක් කරමින් පැවසුවේ, හන්තානේ අඩි 3000 ට ඉහළ සංවේදී කලාපයේ වන එළි පෙහෙළි කිරීමක් සිදුවන බවයි. ඒ සම්බන්ධව අදහස් දැක්වූ එම සංවිධානයේ ලේකම් අමිත් සේනානායක මහතා මෙසේ අදහස් දැක්වීය.

"හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කළේ, මේ ජෛව විවිධත්වයෙන් අනූන භූමිය රැක ගැනීමේ අරමුණින්. ඒත්, දැන් ඒක මෙහි විනාශයට හේතු වෙලා. අඩි 3000ට ඉහළ කොටසේ කිසිදු ඉදිකිරීමක් කරන්න බැහැ. වන වගා හා දැනට පවතින ගම්මිරිස්, තේ වැනි බහුවාර්ෂික බෝග වගා පවතින ප්‍රදේශවල, එම වගා සිදු කිරීමට පුළුවන්. අඩි 2500-3000 අතරේ කොටසේ වන වගා, සත්ත්ව පාලන කටයුතු වගේම, බහුවාර්ෂික බෝග, අර්ධ වාර්ෂික බෝග වගා කළ හැකියි. මෙයට අමතරව දැනට පවතින පාරම්පරික ගම්මානවල වාණිජ මට්ටමින් නොවන සංවර්ධන කටයුතු හා යටිතල පහසුකම් දියුණු කිරීම කරන්න පුළුවන්. තේ කර්මාන්ත ශාලාවල ඉන්ධන අවශ්‍යතාව සඳහා අදාළ ආයතනවලින් වගා කර තිබෙන ගස් ඉවත් කරන්න හැකියාව තිබෙන බව ගැසට් පත්‍රයේ දැක්වෙනවා. අඩි 2500 සමෝච්ච රේඛාවට පහළ ප්‍රදේශයේ සංවර්ධන කාර්යය, ව්‍යාපෘති හා කර්මාන්ත කරන්න හැකියාව තිබෙන්නේ හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ කමිටුවේ අනුමැතිය යටතේ පමණයි. ඒත්, මේ නීතිවලට උඩින් යමින් ඇතැම් පිරිස් මේ වටිනා භූමියට හානි කරනවා. එහි ආසන්නතම සිදුවීම හිටපු ඇමැතිවරයකු වගේම පාර්ලිමේන්තුවේ වත්මන් මන්ත්‍රීවරයකු වන අධිනීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ දියණියට අයත් අඩි 3000 සීමාවේ පිහිටි භූමියක් එළිපෙහෙළි කිරීම පෙන්වා දෙන්න පුළුවන්. එම ප්‍රදේශයේ අලුතින් බෝග වගාවට ඉඩ නොදිය යුතුයි කියලා ගැසට් පත්‍රයේ පැහැදිලිව දක්වා තිබෙනවා. නීතිය දන්නා උදවිය තමන්ගේ වගකීම ඉටු නොකරන නිසයි. ජනතා වතු සංවර්ධන මණ්ඩලය දන්නේ නැහැ ඔවුන්ට තියෙන ඉඩම් මොනව ද? කියලා. ඔවුන්ට අයිති ඉඩම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම දන්නේ නැහැ. මේ දෙපාර්ශ්වයම නීතියට පිටින් ගිහින් ඉහළ පුටුවල ඉන්න අයගේ හිතවත් අයට මේ වටිනා භූමියේ ඉඩම් කොටස් හිතුමතේ ලබා දෙනවා. පසුගිය දිනක අඩි 2500ට පහළ කොටසේ පතන කොටසක් ගිනි තබා විනාශ කර තිබුණා. අක්කර 08ක පමණ තෘණ වගාවකට හානි සිදුව තිබෙනවා. සිද්ධිය සම්බන්ධයෙන් අප කළ පැමිණිල්ලකින් පසු දෙදෙනකු සැකපිට අත්අඩංගුවට ගත්තා. මේ ගිනි තියපු අය මිසක් ගිනි තියන්න උපදෙස් දුන්න අය නොවෙයි. ඒ අයට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. "අමිත් සේනානායක මහතා පවසයි.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා මේ සම්බන්ධයෙන් මෙසේ අදහස් දැක්වීය.

" හන්තාන කියන්නේ මහනුවර හදවත වගේ තැනක්. මෙහි ඇති පාරිසරික වටිනාකම ඉතාම ඉහළයි. කොවිඩ් වසංගතය සමාජයේ පැතිර යමින් තිබියදී, යම් යම් පුද්ගලයන් මේකට ඇතුළු වෙලා ඉඩම් අල්ලා ගන්න, ගස් කපන්න කටයුතු කර තිබුණා. කිරිඇල්ල මහතාගේ දියණියට අයිතියි කියන ඉඩමේ එළි පෙහෙළි කිරීම සම්බන්ධයෙන් මේවන විට නීතිය ක්‍රියාත්මකවී තිබෙනවා. මේ දේ රැක ගන්න ඕන කියන හැඟීම අපි හැමෝටම තියෙන්න ඕනෑ. මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ ගැන අප කතා කළා. වත්මන් ආණ්ඩුවේ අනුදැනුම ඇතිව වන විනාශයක් සිදුවන බව පෙන්වන්න, ඉතා සැළසුම් සහගත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ජනාධිපතිවරයා හොඳින් වැඩ කරගෙන යද්දී, ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න මොකක් හරි බොරුවක් ප්‍රචාරය කරන්න ඇතැමුන් උත්සාහ කරනවා. ඉන්දියාවේ ගහක් කපන ඡායාරූපයක් සංස්කරණය කරලා, ඒක වනාතවිල්ලුවේ සිදුවන දෙයක් විදිහට පෙන්නලා තිබුණා. ජනතාව මේ ගැන අවධියෙන් ඉන්න ඕනෑ. හන්තාන, මතු පරපුරට ආරක්ෂා කරදිය යුත්තේ එහි ඇති සුන්දරත්වය නිසාම පමණක් නෙවෙයි. ඒක ආරක්ෂා වීම අපේ ජීවිතවල පැවැත්මටත් බලපානවා. ඒක හැමෝම තේරුම් ගන්න ඕනෑ. හන්තානේ ඉඩම්වල අයිතිය හරියටම තියෙන්නේ කාටද? කියලා තේරුම් බේරුම් කර ගන්න ඕනෑ. ජනතා වතු සංවර්ධන මණ්ඩලය තමන්ගේ ඉඩම් ප්‍රමාණය දන්නේ නැහැ. එල්. ආර්.සී එක දන්නෙත් නැහැ. මේ නිසා, යම් යම් අය හිතුමතේ මේ ඉඩම් අල්ල ගන්නවා. සේරටම කලින් මේ හඳුනා ගැනීම කරන්න ඕනෑ."

මේ සම්බන්ධව මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී අදහස් දැක්වූ මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, නීතිඥ උදයන කිරිඳිගොඩ මහතා මෙසේ පැවසුවේය.

"හන්තාන උස සීමාව තුළ සිදු කරන ඉදිකිරීම් සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ව්‍යවස්ථාපිත නිශ්චයක් ලැබුණත්, ඒ නීති රාමුවෙන් පිටට යාමේ කිසිදු හැකියාවක් කිසිදු අයකුට නැහැ. මේ ගැන අප දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. මේ පරිසර සංහාරයත් සමඟ, වත්මන් ආණ්ඩුවට විශාල ලෙස පහර ගැසීමක් කරනවා .මේක රජයේ දායකත්වයකින් තොරව සිදුවන දෙයක්. රජයේ ඉදිරි ගමනට හානි කිරීමේ අදහසින් ඇතැම් පිරිස් මේ වන සංහාරය පසුපස රජය සිටින බව පෙන්වන්න උත්සාහ කරනවා. මේ පොලීසිය, නිලධාරීන් මේ ගැන දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ."

මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාත් අධ්‍යක්ෂ කෝසල වැලිකන්නගේ මහතා හන්තාන සම්බන්ධයෙන් මෙසේ ප්‍රකාශ කළේය.

"හන්තානේ කිසිම බිම් කොටසක් මධ්‍යම පරිසර අධිකාරියට නැහැ. ඒ බිම අයිති රාජ්‍ය ආයතන වගේම පෞද්ගලික අයත් ඉන්නවා. තමන්ගේ ඉඩමක නීතියට පිටින් ගිහින් කුමන හෝ ක්‍රියාකාරකමක් වෙනවා නම්, ඒ අයට පුළුවන් පෞද්ගලිකව පොලීසියට පැමිණිලි කරලා, නීතිය ක්‍රියාත්මක කරන්න. හන්තාන පරිසර ආරක්ෂණ කමිටුව මඟින් එය කළ හැකියි. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට ඇති නීති අප කිසිදු අයුරකින් යටපත් කරලා නැහැ. අප කරන්නේ, අදාළ නීති ක්‍රියාත්මක කරන්න ඒ අයට ශක්තිය ලබා දීමයි. තමන්ගේ වගකීම් අමතක කරලා, පරිසර අධිකාරියට අත දික් කිරීම අනුමත කරන්න බැහැ. කෙළින් නහය අල්ලන්න පුළුවන්කම තියෙද්දී, ඔළුව වටේ අත ගෙනිහින් නහය අල්ලනවා වගේ වැඩක් තමයි මධ්‍යම පරිසර අධිකාරිය ක්‍රියාත්මක වෙනකල්ම මේ ආයතන නිකන් බලාගෙන හිටියම වෙන්නේ.

මම 2017 මධ්‍යම පළාතට ආවේ. හන්තාන සුරැකීම සඳහා හඳුන්වා දුන් ගැසට් නිවේදනය උල්ලංඝනය කරමින් කටයුතු කළා කියලා මම එනකොට එක නඩුවයි දාලා තිබුණේ. ඒ වෙනකොට හන්තාන පරිසර කමිටුව හදලා වසර 07ක් ගතවෙලා තිබුණා. මම මේ වික කාලෙට කිරිඇල්ල හිටපු ඇමැතිවරයාගේ දියණියට එරෙහිව ගොනු කළ නඩුව ඇතුළු නඩු 17ක් ගොනු කරලා තියෙනවා. තවත් සිදුවීම් 18කට අදාළ ලිපිගොනු සකස් කරමින් තිබෙනවා. ඒ අනුව තවත් මාස දෙකක් තුළ හන්තානේ පරිසරයට හානි කිරීම් කළ සිදුවීම් 35කට අදාළව නඩු ගොනු වෙනවා. ඒක පලදායි වෙන්නේ, අනෙක් පාර්ශ්වවලත් සහය ලැබුණොත් විතරයි. "

"හන්තාන ආරක්ෂිත කළාපයේ අනවසර ඉදිකිරීම් රැසක් තිබෙනවා. අඩි 3000ට ඉහළ සීමාවේ ආරාමයක් හදලා තියෙනවා. මේ ඉදිකිරීම්වලට අදාළ කිසිම සැලැසුමක් ගඟවට කෝරළය ප්‍රාදේශීය සභාව මඟින් අනුමත කරගෙන නැහැ. මේ කළාපයේ ගොඩනැඟිලි හිමිකරුවන් 18 දෙනකුට මම ලිඛිතව දැනුම් දුන්නා. ලියකියවිලි පෙන්වන්න කියලා අදාළ අනුමැති ගත්තා නම් හරි. කිසිම කෙනෙක් මේ සම්බන්ධයෙන් තාමත් ප්‍රතිචාර දක්වලා නැහැ.මේ ගැන මම පරිසර අධිකාරිය,ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, හන්තාන සුරැකීමේ පරිසර කමිටුව ඇතුළු ආයතන හා සංවිධාන ගණනාවකට දැනුම් දුන්නා." ගඟවට කෝරළය ප්‍රදේශීය සභාවේ සභාපති සුභාෂ් යටවර මහතා කීය.

හන්තාන අඩි 3000 ට ඉහළ සීමාවේ පිහිටි ඉඩම එළිපෙහෙළි කිරීම සම්බන්ධයෙන් ලක්ෂ්මන් කිරිඇල්ල මහතාට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් හෙතෙම පැවසුවේ මෙසේය.

"මේ ඉඩම රජයේ එකක් කියලා මුලින් කිව්වා. ඔප්පුවත් පෙන්නලා මම මේක මගේ පෞද්ගලික ඉඩමක් කියලා පෙන්නුවහම, මධ්‍යම පරිසර අධිකාරිය දැන් ඉඩමට ඇතුළු වෙලා, වල් පඳුරු ගැලෙව්වා කියලා නඩුවක් පවරලා. මොකක්ද ක්‍රියාත්මක වෙන්නේ දේශපාලනයක්. මේ රටේ පොදු නීතිය අනුව බැලුවහම, අයිතිකරුවාට තමන්ගේ ඉඩමට ඇතුළු වෙන්න හිමිකමක් තියෙනවා. අවුරුදු 300 ක් 400 ක් පැරැණි මේ පොදු නීතියට වඩා, පරිසර නීති බලවත් වෙන්නේ නැහැ. හන්තානට ක්‍රියාත්මක පරිසර නීති 2010 හදපු ඒවා. අප මේ ඉඩමට යන්න ප්‍රවේශ මාර්ගය හදා ගන්න විතරක් තණකොළ පඳුරු කිහිපයක් ගැලෙව්වා. ගස් කපලා නැහැ. පරිසරයට හානි කරලා නැහැ. ඉඩමට යන පාර එළි කරන්නෙ නැතිව, ඉඩමට ඇතුළු වෙන්නේ කොහොමද? වසර 2010න් පස්සේ අඩි 3000ට වැඩි සීමාවේ ඉදිකිරීම් පවා සිදු කර තිබෙනවා. ඒවාට නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒකයි මම මේක දේශපාලන පළි ගැනීමක් කියලා කියන්නේ. අප පරිසරයට ආදරෙයි. ඒත්, පරිසරය විනාශ කරන අයට පරිසර සංවිධාන රැකවරණ දෙනවා.

මේ විදිහට නීතියට පිටින් කටයුතු කිරීම ඇත්තටම කනගාටුවට කරුණක්. මේ එළිපෙහෙළි කිරීමේදී, පැළ ගස් කිහිපයක් ද කපා තිබෙනවා. මේ සම්බන්ධව අපට තොරතුරු ලැබෙන විට අක්කර දෙකක පමණ ප්‍රදේශයක් එළි කරලා ඉවරයි. පොලීසියට, මධ්‍යම පරිසර අධිකාරියට වගේම, හන්තාන පාරිසරික ආරක්ෂක කමිටුවේ සභාපති වන මහනුවර දිසාපතිවරයාට ද පැමිණිලි කළා. ඒත්, කවුරුවත් ක්‍රියාත්මක වුණේ නැහැ. මාධ්‍ය මඟින් මේක හෙළි කරාම තමයි හැමෝගෙම ඇස් ඇරුනේ. ඒ වනවිට තවත් අක්කර තුනක් විතර එළි කරලා ඉවරයි."

හන්තාන සුරැකීමේ සංවිධානය මහනුවර පොලීසියට කරන ලද පැමිණිල්ලකට අනුව, පොලීසිය මඟින් මේ එළි පෙහෙළි කිරීමේ සිද්ධියට අදාළව අධිකරණයට කරුණු වාර්තා කර තිබිණි. එම කාලය තුළ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් මේ ඉඩමේ හිමිකරු ලෙස හඳුනාගත් ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ දියණියට එරෙහිව මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය එලෙස නඩු පැවරීමත් සමඟ පොලීසිය විසින් පවරා තිබූ නඩුව ඉවත් කරගෙන ඇත.

"හන්තාන ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් නිකුත් කර තිබෙන ගැසට් පත්‍රයේ වගන්ති මඟින් රිංගූ ඇතැමුන් නොයෙකුත් නොමනා ක්‍රියා කරනවා. අඩි 3000 සීමාවෙන් ඉහළ ප්‍රදේශයේ නව ඉදිකිරීම් කිසිවක් කරන්න නීතියෙන් අවසර නැහැ. ගැසට් පත්‍රය නිකුත් වීමට පෙර තිබූ පැරැණි ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීමට යැයි පරිසර ආරක්ෂක කමිටුවෙන් අවසරය ලබාගෙන, එම ගොඩනැඟිලි සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර නව ගොඩනැඟිලි හදනවා. පසුගිය යහපාලන ආණ්ඩුවේ ප්‍රබල ඇමැතිවරයකුගේ ළඟම ඥාතියකු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් පැරැණි ගොඩනැඟිල්ලක් කඩා එහි හෝටලයක් ඉදිකර තිබෙනවා. කමිටු නිර්දේශ අවභාවිත කරමින් ඇතැම් පිරිස් අත්තනෝමතික ලෙස කටයුතු කළත්, බලධාරීන් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම කනගාටුවට කරුණක්. අදාළ සීමාවේ තිබෙන ආරාමයක ප්‍රවිශ්ට මාර්ගයේ ගේට්ටුවක ඉදිකිරීම් මේ වන විට සිදු කෙරෙනවා. ඒ කමිටුව දැනුවත් නොකරයි. යම් වටිනා භූමියක් ආරක්ෂා කර ගැනීමට ගැසට් පත්‍රයක් මඟින් නියමයන් ප්‍රසිද්ධ කර තිබෙනවා නම්, ඒවා ඒ ආකරයෙන්ම ක්‍රියාත්මක විය යුතුයි. නමට විතරක් නීති තිබිලා වැඩක් නැහැ. අද හන්තානට මේ විනාශය වෙලා තියෙන්නේ, මේක රකින්න ඉන්න අය

කිරිඳිගොඩ

අමිත්

කිරිඇල්ල

ලලිත් යූ ගමගේ

සටහන හා ඡායාරූප
අසේල කුරුළුවංශ

'ගම් නගර චාරිකා' තිනකරන් ප්‍රවර්ධන වැඩසටහන යාපනයේදී

කොකුවිල් සමූහ,
අරුල් සත්‍යනාදන්, සුමිති තංගරාසා
බුද්ධි කරුණාරත්න

පත්තර මහ ගෙදර නම් ලත් ලේක්හවුස් ආයතනය මගින් දෙමළ භාෂාවෙන් නිකුත් කරන තිනකරන් පුවත්පත නවාංග රාශියක් සමඟ වෙළෙඳපොළට හඳුන්වා දීම යාපනය විශ්වවිද්‍යාලයේ දී පසුගිය දා (2) උත්සවශ්‍රීයෙන් සිදු කෙරිණි.

ලේක්හවුස් ආයතනය ක්‍රියාත්මක කරන ගම නගර චාරිකා වැඩසටහන යටතේ යාපනය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් මෙම ප්‍රවර්ධන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරිණි.

ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල, ධීවර ඇමැති ඩග්ලස් දෙවානන්දා, ඇතුලු මැති ඇමැතිවරු සහ ලේක්හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න මහතා ප්‍රමුක අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන කර්තෘවරුන් ඇතුළු නිලධාරීන් පිරිසකගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි.

රටේ දිස්ත්‍රික්ක 25ටම එක් දිස්ත්‍රික්කයකට එකක් බැගින් ජනමාධ්‍ය පාසල් ආරම්භ කිරීමට රජය කටයුතු කරන බවත්, රටේ සිසු පරපුරේ මාධ්‍ය දැනුම වර්ධනය කිරීමට මේ පියවර ගන්නා බවත් මේ අවස්ථාවේ දී අදහස් පළ කරමින් ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ අතුරුදහන් වී යැයි පවසන බොහෝ අය විදේශවල සිටින බවත්, ඒ අය ශ්‍රී ලංකාවේ වීසා රැගෙන විදේශගත වී සිටින බවත් 2010න් පසු කිසිම ජනමාධ්‍යවේදියකු අතුරුදන් වී නැති බවත් පැවැසීය.

අතුරුදන් වූ ලැයිස්තුව මාධ්‍යවේදීන් යැයි වෙන් කර බැලිය යුතු නැතැයි ද බැලිය යුත්තේ පොදුවේ යැයි ද ඔහු වැඩිදුරටත් කීවේය. රටේ අවුරුදු 30ක් යුද්ධයක් පැවැති බවත් යුද්ධයක් පවතින රටවල මෙවැනි සිද්ධීන් සිදු විය හැකි බවත් ඔහු පෙන්වා දුන්නේය. අතුරුදන් වී යැයි කියන බොහෝ අයගේ තොරතුරු තමන්ට ලැබී ඇතැයි ද ඔවුන් වැඩි දෙනෙක් විදේශගත වී ඇතැයි ද අමාත්‍යවරයා මේ අවස්ථාවේදී කීවේය. මේ අය තමන්ගේ අනන්‍යතාව සහ ලිපිනයන් වෙනස් කර ඇතැයි දැනගන්නට තිබෙන බවත්, යුද්ධ කාලයේ අතුරුදන් වූයේ යැයි කියන අයගේ පසුබිම බැලීමට අවශ්‍ය බවත් ඒ අය යුද්ධ කාලයේ සිදු කළේ කුමක් දැයි බැලිය යුතු බවත් අමාත්‍යවරයා මේ මාධ්‍ය හමුවේදී කීවේය. 2010ට පෙර මාධ්‍යවේදීන් අතුරුදන් වුණත් ඊට පෙර එක් අයකු වත් අතුරුදහන් වුණේ නැතැයි අමාත්‍යවරයා වැඩි දුරටත් පෙන්වා දුන්නේය.

අන්තර්ජාලය ඔස්සේ කාන්තාවන්ට අපහාස නඟා තොරතුරු පළ වන බවත් ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කුමක්දැයි මේ අවස්ථාවේ මාධ්‍යවේදියකු නැඟූ පැනයකට පිළිතුරු දුන් ඇමැතිවරයා කීවේ අන්තර්ජාලයේ මෙවැනි ක්‍රියා පාලනයට අලුත් නීති ගෙන ආ යුතු බවයි. මේ සම්බන්ධව දින 3කට පෙර තමන් ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කළ බවත් එවැනි කාරණා සම්බන්ධව සාක්ෂි සොයා ගැනීම තරමක් අපහසු දෙයක් බවත් ඉදිරියේ දී මේ සම්බන්ධව නව නීති සකස් කරන බවත් ජනමාධ්‍ය ඇමැතිවරයා මේ අවස්ථාවේ පැවැසීය.

දැන් ඇත්තේ අකුරු අමුණ අමුණා වැඩ කළ කාලයේ සිට රේඩියෝ වටේ කැරැකි කැරැකී ප්‍රවෘත්ති ඇසූ කාලයේ තිබූ මාධ්‍ය නොවන බවත් දැන් මාධ්‍ය ජංගම දුරකතන දක්වා දියුණු වී ඇති බවත් කෙහෙලිය අමාත්‍යවරයා යාපනේදී මාධ්‍යවේදීන් හමුවේ කීවේය. ජනමාධ්‍යයේ මේ වේගය මෙතැනින් නතර වන්නේ නැති බවත් එය දිගටම ඉදිරියට යන බවත් ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝක මට්ටමිනුත් මාධ්‍යය දේශපාලනය ක්ෂේත්‍රයේ ප්‍රධාන කරුණක් බවත් බඩු කෝච්චිවලින් අපට ගමන් කළ නොහැකි බවත් දැන් ගමන් කළ යුත්තේ ජෙට්වලින් බවත් මාධ්‍ය දෙස තාක්ෂණය ඔස්සේ බැලීමට කාලය පැමිණ ඇති බවත් කෙහෙලිය රඹුක්වැල්ල අමාත්‍යවරයා වැඩි දුරටත් කීවේය. මීළඟ පරම්පරාවට නිසි පරිදි මාධ්‍ය අධ්‍යාපනය දීමේ වැදගත්කම ද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. යාපනය විශ්වවිද්‍යාලයේ මාධ්‍ය පීඨය මනා ලෙස පවත්වාගෙන යන බව ද ඔහු වැඩිදුරටත් කීවේය.

මේ අවස්ථාවට ලේක් හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න, නීති අධ්‍යක්ෂ රඛිත අබේගුණවර්ධන, මූල්‍ය අධ්‍යක්ෂ ජනක රණතුංග, මෙහෙයුම් අධ්‍යක්ෂ කණිෂ්ක විතාරණ, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ධර්ම ශ්‍රී කාරියවසම්, තිනකරන් පුවත්පතේ ප්‍රධාන කර්තෘ සෙන්තිල් වේලවර් යන මහත්වරුන් ඇතුළු කර්තෘවරු සමඟ අනෙකුත් නිලධාරීහු සහ සේවක පිරිසක්ද සහභාගී වූහ

ඡායාරූප - අයි. ශිව සාන්තන්

ලෝක ගුරු දිනය අදයි

අදට (5) යෙදී තිබෙන ලෝක ගුරු දින සැමරුම නිමිත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කළ ලිපියකි

රටක සියලුම අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන ආයතනය වන්නේ පාසලයි. මානව සංස්කෘතිය පවරාදීමේ දී ප්‍රමුඛතම ගාමක බලවේගය (Driving Force) අධ්‍යාපනය වන බැවින් පාසල නමැති සමාජ සංස්ථාවට වැදගත් කාර්යභාරයක් පැවරී ඇත. පාසල දරුවකුගේ ජීවිතයට ශක්තිමත් අඩිතාලමක් සපයන කේන්ද්‍රස්ථානයයි.

වයස අවුරුදු හයේදී පාසලට පිවිසෙන දරුවකුගේ දෙවන මව්පියන් විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ය. සිසුන්ට දැනුම ලබාගැනීමට, කුසලතා වැඩිදියුණු කිරීමට, ධනාත්මක ආකල්ප ගොඩනගා ගැනීමට මෙන්ම සාර්ථකත්වයට නිවැරදි මාවත තෝරාගැනීමට මඟ පෙන්වා දෙන්නේ විදුහල්පතිවරුන් හා ගුරුවරුන් ය.

ගුරුවරයාගේ විශේෂ අවධානය ඉගැන්වීම් කාර්ය කෙරෙහි යොමු වී පැවතිය ද වර්තමානයේ දී එය පුද්ගල සංවර්ධනය, සමාජ සංවර්ධනය, ශිෂ්‍ය ඉගෙනුම් අත්දැකීම් පුළුල් පරාසයකට යොමු කිරීම වැනි ක්ෂේත්‍ර ගණනාවක් සමඟ බැඳී පවතී. වසර 30කට පමණ එපිටින් වූ ලෝකය සඳහා ප්‍රවිශ්ඨ වන දරුවන් නිර්මාණය කරන ගුරුවරයා අනාගතය විනිවිද දකින්නකු විය යුතුය. බොහෝ විට ගුරුවරුන් මවක හෝ පියකු, මිතුරකු, උපදේශකයකු, ආරක්ෂකයකු වශයෙන් විවිධ භූමිකා ඔස්සේ කටයුතු කරමින් සමාජයේ වටිනා සාමාජිකයන් වීමට සිසුන්ට මඟපෙන්වන අතරම, සිසු දරුවන්ට යහපත් ආදර්ශ සැපයීමෙන් එම මෙහෙවර වඩාත් සාර්ථකව ඉටු කරති. විවිධ ප්‍රවේශ ඔස්සේ සිදුවන ශිෂ්‍ය සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඵලදායීව දායකවීමට නම් ගුරුවරයා වෘත්තීයමය නිපුණයකු විය යුතු ය.

පාසලේ දී මෙන්ම සමාජයේ දී ද තම ගුරු භූමිකාව නිවැරදි ව හසුරුවා ගැනීම සහ විවිධ අවශ්‍යතාවලට අනුරූප වනසේ තම කාර්යභාරය ඉටු කිරීම ගුරුවරයාගේ වගකීමකි.

වසර 2030 දී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්කයක් වන ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ ශ්‍රී ලංකාවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා දැනුම, කුසලතා, ආකල්ප හා වටිනාකම්වලින් සමන්විත පාසල් ප්‍රජාවක් බිහි කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා අධ්‍යාපන පද්ධතියෙහි ගුරුවරයා සිදු කරන සේවය කොතරම් දුරට ගුණාත්මක ද යන්න ස්වයංව විමසීමට ලක් කිරීම ඉතා වැදගත් වේ. එමඟින් ගුරු කාර්යභාරය පිළිගත් සහ අපේක්ෂිත ප්‍රමිතියට අනුකූලව පවත්වා ගැනීම සඳහා යම් මඟපෙන්වීමක් ගුරුවරයාට ලැබෙන අතර, එය වඩාත් ගුණාත්මක භාවයෙන් යුතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා ඉවහල් වනු ඇත. ඕනෑම කාර්යයක ගුණාත්මකභාවය හා ප්‍රමිතිය රඳා පවතිනුයේ, එම කාර්යය හා සබැඳි පුද්ගල නිපුණතා මත වන අතර, ප්‍රශස්ත වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් පාසල් පද්ධතිය තුළ ස්ථාපිත කිරීම සඳහා නිපුණතාවලින් පරිපූර්ණ වූ ගුරුභවතුන් සිටීම අත්‍යවශ්‍ය වේ.

අනපේක්ෂිතව ලොවම මුහුණ පෑ කොවිඩ් 19 ව්‍යසනය වැනි අවස්ථා හමුවේ ද ගුරුවරුන් මුහුණ දුන් අභියෝග රාශියකි. ඒවා සඳහා නොසැලී මුහුණ දෙමින් ලොව පුරා ගුරුභවතුන් සාධනීය කාර්යභාරයක් ඉටු කරමින් සිටිති. ශ්‍රී ලංකාවේ ද ගුරුභවතුන් විවිධ වූ දුෂ්කරතාවන් මැද තම කාලය, ශ්‍රමය කැප කරමින් සුවහසක් වූ දරු දැරියන්ගේ නැණ නුවණ පාදන්නට ගන්නා වූ වෑයම වත්මන් සමාජයේ බොහෝ කතා බහකට ලක් විය. කෝවිඩ් 19 ව්‍යසන අවස්ථාවේ දී ද නිවසේ වෙසෙන දරුවන් වෙනුවෙන් අන්තර්ජාලය ඔස්සේ විෂය ආවරණය කිරීම සඳහා ගත් උත්සාහය ප්‍රශංසනීය ය. අවම පහසුකම් යටතේ වුව ද පවතින සම්පත් කළමනාකරණය කර ගනිමින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට ඇප කැපවන ශ්‍රී ලාංකේය ගුරුභවතුන් අතිශයින්ම අගය කළ යුතු ය.

වෘත්තිකයෙක් වශයෙන් ගුරුවරයා සවිබල ගැන්වීම උදෙසා පහත සඳහන් ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කළ යුතු බව අන්තර්ජාතික මට්ටමෙන් ද අවධානය යොමු ව ඇත.

ගුරු වෘත්තිය සම්බන්ධව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රතිමාන අනුව සැකසූ ඇගයීම් උපකරණ භාවිතයෙන් ගුරු කාර්යභාරය නියාමනය, එක් එක් රටවල ගුරුවරුන් සම්බන්ධ පවත්නා ප්‍රතිපත්ති සහ උපාය මාර්ග විවරණය කර ඒවා සංවර්ධනය, ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය, 2030 වර්ෂය වනවිට අත්පත් කර ගත යුතු අධ්‍යාපනය සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු කරා ළඟාවීම සඳහා ගුරුවරුන්ගේ දැනුම, ඉගැන්වීම් සහ නියාමන ක්‍රමවේද සංවර්ධනය, ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා ගුරුවරුන්ට මාර්ගෝපදේශ සැපයීම සහ දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසීම, එමෙන්ම විධිමත් පටිපාටි අනුව බඳවා ගැනීම, විෂයානුබද්ධව පුහුණු කිරීම, වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවස්ථා සැලසීම, අභිප්‍රේරණය කිරීම සහ අවශ්‍ය සම්පත් සැපයීම තුළින් ද ගුරුවරයා ඵලදායී වෘත්තිකයකු වශයෙන් සංවර්ධනය කළ හැකි වේ.

විශ්වීය තත්ත්වයන්ට ගැළපෙන පරිදි ශ්‍රී ලාංකික ගුරුවරයා සංවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විවිධ කාර්යයන් ඉටු කරයි. ගුරුවරුන් සඳහා විවිධ වෘත්තීය සංවර්ධන අවස්ථා සැපයීම, ජාතික මට්ටමෙන් වාර්ෂිකව ගුරු හා විදුහල්පති ඇගයීම් වැඩසටහන් පැවැත්වීම මෙන්ම ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා ඉදිරි වර්ෂයේ සිට ස්වයං තක්සේරු ක්‍රමවේදයක් ලෙස ගුරු නිපුණතා රාමුවක් පාසල් පද්ධතියට හඳුන්වා දීමට ද සැලසුම් කර ඇත.

එමෙන්ම ගුරු වෘත්තීය අභිමානය ඉහල නැංවීමට ශ්‍රී ලංකාවේ ගුරු සංගම් නායකයකු වන එම්.ජී.මෙන්ඩිස් මහතාගේ යෝජනාවකට අනුව 1990 වර්ෂයේ සිට ලෝකයෙහිම ජාත්‍යන්තර ගුරු දිනය සැමරීම ලාංකිකයන් වන අපට සුවිශේෂී අවස්ථාවකි.

දැයේ සුවහසක් සිසු ප්‍රජාවගේ දිවිමඟ ඒකාලෝක කිරීමට නොමඳ ව වෙහෙසෙන විශිෂ්ට වූ ගුරු හා විදුහල්පතිවරුන්ගේ අමිල මෙහෙවරට උපහාරයක්ම වේවා! යන්න අධ්‍යාපන අමාත්‍යාංශයෙහි ප්‍රාර්ථනයයි.

විදේශ රැකියාවක නිරතව සිට "කොවිඩ් 19" හේතුවෙන් නැවත මෙරටට පැමිණි ඔබට කෙරෙන විශේෂ නිවේදනයයි.

නිරෝධායනය අවසන් කළ ඔබට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත තොරතුරු ලබාදීමට නොහැකි වූයේ නම්, පහත සඳහන් කාර්යාංශ වෙබ් අඩවියට පිවිස තොරතුරු ලබාදීමේ පත්‍රිකාව භාගත කරගෙන එය සම්පූර්ණ කර නැවත කාර්යාංශය වෙත ලැබීමට සලස්වන්න.

තොරතුරු පත්‍රිකා එවිය යුතු ලිපිනය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ සංවර්ධන) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

www.slbfe.lk

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
24 පැය සේවය-1989 ප්‍රත්‍යානුකලන අංශය-0112791473

2020-10-02 හා 2020-10-03 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 1,458,799

ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 61,784,680.00

රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 04 රු. 100,000.00 ත්‍යාග 57

www.nlb.lk

දිනුම් වාරය - 4264 නිල ප්‍රතිඵල

මහජන සම්පත

දිනය: 2020-10-03

ජයග්‍රාහී අක්ෂරය F ජයග්‍රාහී අංක 3 5 5 7 6 3

ත්‍යාග රටාව - අග සිට මුලට

			ජයග්‍රාහකයන් ගණන
1 වැනි ත්‍යාගය	3 5 5 7 6 3	රු. 2,000,000/-	01
2 වැනි ත්‍යාගය	5 5 7 6 3	රු. 100,000/-	12
3 වැනි ත්‍යාගය	5 7 6 3	රු. 10,000/-	114
4 වැනි ත්‍යාගය	7 6 3	රු. 1,000/-	1,112
5 වැනි ත්‍යාගය	6 3	රු. 100/-	11,165
6 වැනි ත්‍යාගය	3	රු. 20/-	110,298

ත්‍යාග රටාව - මුල සිට අගට

			ජයග්‍රාහකයන් ගණන
7 වැනි ත්‍යාගය	3 5 5 7 6	රු. 10,000/-	12
8 වැනි ත්‍යාගය	3 5 5 7	රු. 1,000/-	106
9 වැනි ත්‍යාගය	3 5 5	රු. 100/-	1,136
10 වැනි ත්‍යාගය	3 5	රු. 50/-	11,039
11 වැනි ත්‍යාගය	F	රු. 20/-	43,841

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 10,542,830.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 20,283,674.00

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

දිනුම් වාරය - 4263 නිල ප්‍රතිඵල

දිනය: 2020-10-02

5C මහජන සම්පත

ජයග්‍රාහී අක්ෂරය H ජයග්‍රාහී අංක 9 6 3 0 1 0

ත්‍යාග රටාව - අග සිට මුලට

				ජයග්‍රාහකයන් ගණන
සුපිරි ත්‍යාගය	H 9 6 3 0 1 0	රු. 18,095,917/-		-
1 වැනි ත්‍යාගය	9 6 3 0 1 0	රු. 2,000,000/-		01
2 වැනි ත්‍යාගය	6 3 0 1 0	රු. 100,000/-		13
3 වැනි ත්‍යාගය	3 0 1 0	රු. 10,000/-		142
4 වැනි ත්‍යාගය	0 1 0	රු. 1,000/-		1,402
5 වැනි ත්‍යාගය	1 0	රු. 100/-		14,035
6 වැනි ත්‍යාගය	0	රු. 20/-		139,289

ත්‍යාග රටාව - මුල සිට අගට

			ජයග්‍රාහකයන් ගණන
7 වැනි ත්‍යාගය	9 6 3 0 1	රු. 10,000/-	13
8 වැනි ත්‍යාගය	9 6 3 0	රු. 1,000/-	141
9 වැනි ත්‍යාගය	9 6 3	රු. 100/-	1,390
10 වැනි ත්‍යාගය	9 6	රු. 50/-	13,969
11 වැනි ත්‍යාගය	H	රු. 20/-	55,601

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 13,781,750.00

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 19,487,909/-

රු 25,000 ත්‍යාග 50ක් දිනාගත් විශේෂිත අංක

0121580	0958105	0249115	0231431	0018247	0598466	1437031	0731150	1025261	0273103
0806328	1313543	1102646	1141209	1341204	0491704	0477574	1107196	0216074	1128648
1292029	0176030	0084197	1556699	1392427	1078469	0640856	0079304	1138176	0116723
0327803	0119406	0484235	0222650	0631397	0773639	1172904	0650729	1613232	1281674
0834567	0910501	0679841	0501663	0436791	0589486	1201133	1255691	0313035	0917959

රුපියල් ලක්ෂ 5ට වඩා වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය | ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය | www.nlb.lk

ජාතික සම්පත

නිල ප්‍රතිඵල

දිනුම් වාරය 1060
දිනය 2020.10.03

ජයග්‍රාහී ඉංග්‍රීසි අක්ෂරය O

ජයග්‍රාහී අංක 2 2 5 9 4 1

අග සිට මුලට ත්‍යාග රටාව

01 ත්‍යාගය	2 2 5 9 4 1	රු: 2,000,000.00	ත්‍යාගය	0
02 ත්‍යාගය	2 5 9 4 1	රු: 100,000.00	ත්‍යාග	3
03 ත්‍යාගය	5 9 4 1	රු: 10,000.00	ත්‍යාග	27
04 ත්‍යාගය	9 4 1	රු: 1,000.00	ත්‍යාග	293
05 ත්‍යාගය	4 1	රු: 50.00	ත්‍යාග	3,061
06 ත්‍යාගය	1	රු: 20.00	ත්‍යාග	29,220

මුල සිට අගට ත්‍යාග රටාව

07 ත්‍යාගය	2 2 5 9 4	රු: 10,000.00	ත්‍යාග	6
08 ත්‍යාගය	2 2 5 9	රු: 1,000.00	ත්‍යාග	31
09 ත්‍යාගය	2 2 5	රු: 100.00	ත්‍යාග	301
10 ත්‍යාගය	2 2	රු: 50.00	ත්‍යාග	3,067
11 ත්‍යාගය	O	රු: 20.00	ත්‍යාග	13,398
12 ත්‍යාගය	ජයග්‍රාහී අංක 6ම ඕනෑම පිළිවෙලට ගැලපීමෙන්	රු: 200.00	ත්‍යාග	139

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,170,660.00

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස හයක කාලසීමාවකට පමණි. රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යයි වේ.

ලබන බදාදා සුපිරි ත්‍යාගය රු. 10,752,054.50

ජාතික ලොතරැයි මණ්ඩලය
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 4607000, 011 2324324
ෆැක්ස්: 011 4669416
Web : www.nlb.lk

දිනුම් වාරය 708 දිනය 2020/10/02 නිල ප්‍රතිඵල

නිරෝගා

ලග්න ජය

ලග්නය: ධනු

ජයග්‍රාහී අංක 18 27 28 59

	ත්‍යාග රටාව	ත්‍යාග මුදල	ජයග්‍රාහකයින් සංඛ්‍යාව
1 වන ත්‍යාගය	අංක 4 ම ගැළපේ නම්	රු. 1,000,000/-	1
2 වන ත්‍යාගය	අංක 3 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 10,000/-	9
3 වන ත්‍යාගය	අංක 3 ක් ගැළපේ නම්	රු. 2,000/-	71
4 වන ත්‍යාගය	අංක 2 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 200/-	307
5 වන ත්‍යාගය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100/-	3,673
6 වන ත්‍යාගය	අංක 1 ක් සමඟ ලග්නය ගැළපේ නම්	රු. 60/-	4,708
7 වන ත්‍යාගය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20/-	52,441
8 වන ත්‍යාගය	ලග්නය පමණක් ගැළපේ නම්	රු. 20/-	19,418

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 3,380,360.00

මීළඟ සුපිරි ත්‍යාගය රු. 17,994,155.50

රුපියල් ලක්ෂ 5 ක් හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.

ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 2324324, 011 4607000
වෙබ් අඩවිය: www.nlb.lk

නිල ප්‍රතිඵල

දිනුම් අදින ලද දිනය 2020 / 10 / 03 1540 දිනුම් වාරය

සුපිරි අංකය 10 ජයග්‍රාහී අංක 36 53 54 55

1 ත්‍යාගය	අංක 04 ම ගැළපේනම්	රු. 500,000.00	01
2 ත්‍යාගය	සුපිරි අංකය සමඟ අංක 3 ක් ගැළපේ නම්	රු. 15,000.00	08
3 ත්‍යාගය	අංක 03 ක් ගැළපේ නම්	රු. 1,000.00	131
4 ත්‍යාගය	සුපිරි අංකය සමඟ අංක 2 ක් ගැළපේ නම්	රු. 200.00	383
5 ත්‍යාගය	අංක 02 ක් ගැළපේ නම්	රු. 100.00	4982
6 ත්‍යාගය	සුපිරි අංකය සමඟ අංක 1 ක් ගැළපේ නම්	රු. 60.00	4511
7 ත්‍යාගය	අංක 01 ක් ගැළපේ නම්	රු. 20.00	64310
8 ත්‍යාගය	සුපිරි අංකය පමණක් ගැළපේ නම්	රු. 20.00	16126

මෙවර දිනා ඇති මුළු මුදල රු. 3,205,180.00

ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 06 ක කාල සීමාවක් පමණි. රුපියල් ලක්ෂ 05 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 21,084,895.88

ජාතික ලොතරැයි මණ්ඩලය
දේශීය ලොත්තර් සභා
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

ඩබ නිධානය නිල ප්‍රතිඵල

දිනය - 2020/10/02

දිනුම් වාරය - 323

ඉංග්‍රීසි අක්ෂරය M ජයග්‍රාහී අංක 12 43 69 73

	සංයෝග	තෑගි	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 04 ගැළපේ නම්	රු. 1,000,000.00	-
2 ත්‍යාගය	අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 100,000.00	02
3 ත්‍යාගය	අංක 3 ක් ගැළපේ නම්	රු. 3,000.00	67
4 ත්‍යාගය	අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 1,000.00	151
5 ත්‍යාගය	අංක 2 ක් ගැළපේ නම්	රු. 100.00	3,901
6 ත්‍යාගය	අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම්	රු. 60.00	2,718
7 ත්‍යාගය	අංක 1 ක් ගැළපේ නම්	රු. 20.00	66,736
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම්	රු. 20.00	12,368

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 2,687,260.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 85,943

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය 118,084,725.44

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
දේශීය ලොත්තර් සභා
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2559 දිනුම් අදින ලද දිනය 2020.10.03

ඉංග්‍රීසි අක්ෂරය I ජයග්‍රාහී අංක 26 40 57 58

	සංයෝගය	තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 4 ම නිවැරදි	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 3 ක් නිවැරදි	රු. 100,000.00	06
3 ත්‍යාගය	අංක 3 ක් පමණක් නිවැරදි	රු. 2,000.00	188
4 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 2 ක් නිවැරදි	රු. 1,000.00	402
5 ත්‍යාගය	අංක 2 ක් පමණක් නිවැරදි	රු. 100.00	10119
6 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 1 ක් නිවැරදි	රු. 40.00	6741
7 ත්‍යාගය	අංක 1 ක් පමණක් නිවැරදි	රු. 20.00	167564
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු. 20.00	30581

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 215,602

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 7,622,440.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 60,936,677.60

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යයවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
දේශීය ලොත්තර් සභා
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

ගොවි සෙත නිල ප්‍රතිඵල

දිනුම් වාරය 2558 දිනුම් අදින ලද දිනය 2020.10.02

ඉංග්‍රීසි අක්ෂරය D ජයග්‍රාහී අංක 36 49 61 65

	සංයෝගය	තෑගි මුදල	ජයග්‍රාහකයන් ගණන
1 ත්‍යාගය	අංක 4 ම නිවැරදි	රු. 1,000,000.00	01
2 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 3 ක් නිවැරදි	රු. 100,000.00	08
3 ත්‍යාගය	අංක 3 ක් පමණක් නිවැරදි	රු. 2,000.00	187
4 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 2 ක් නිවැරදි	රු. 1,000.00	439
5 ත්‍යාගය	අංක 2 ක් පමණක් නිවැරදි	රු. 100.00	10645
6 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර සමඟ අංක 1 ක් නිවැරදි	රු. 40.00	7068
7 ත්‍යාගය	අංක 1 ක් පමණක් නිවැරදි	රු. 20.00	175650
8 ත්‍යාගය	ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි	රු. 20.00	32084

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 226,082

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 8,114,900.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 60,620,062.80

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ජාතික ලොතරැයි මණ්ඩලය
දේශීය ලොත්තර් සභා
NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

නූතන සමාජයේ වැරදි ඇබ්බැහිවීම්වලට යොමු වී නිකරුණේ තමන්ගේ ජීවිත නාස්ති කර ගන්නා පුද්ගලයන්ගේ ප්‍රවණතාව වැඩි වී ඇති බව මාධ්‍ය ඔස්සේ දැක ගත හැකි ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නාවලපිටියේ අනුරාධා සුධම්මිකා මෙහෙණින් වහන්සේ මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළේ මෙසේයි.

සදහම් මඟ

හිත පාලනය කර ගත්තොත් දුරාචාරය නැති කර ගන්න පුළුවන්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නාවලපිටියේ අනුරාධා සුධම්මිකා මෙහෙණින් වහන්සේ

● බුදු දහමට අනුව ඇබ්බැහි වීම කියලා කියලා කියන්නේ කුමක් ද?

ඇබ්බැහි වීමට ඉංග්‍රීසි භාෂාවෙන් addict කියනවා. ශබ්ද කෝෂ අර්ථය දෙන්නෙ දෝනාව කියලයි. ඇබ්බැහි වීම කොයි එකටත් හොඳ නැහැ. යහපත වෙනුවෙන් ඇබ්බැහි වීම හොඳ දෙයක්. වර්තමානයේදී ඇබ්බැහි වීම කියන වචනය භාවිත කරන්නේ නරක දේවල්වලට. බුදු දහමෙහි ඇබ්බැහි වීම කියලා කියන්නේ ගසාගෙන යෑමට. සුළඟ අපිට හුස්ම ගන්න ඕනෑ. ඒ වුණාට සුළං වැඩි වශයෙන් ආවොත් සුළි සුළං ඇවිල්ලා මහා විපත් සිදු වෙනවා. ජලය අපට එදිනෙදා ජීවිතයේදී නැතුවම බැරි දෙයක්. ඒ වුණාට ජලය පිටාර ගැලුවොත් මිනිස් ජීවිත පවා විනාශ වෙනවා.

උදාහරණයක් විදිහට සුනාමි බේදවාචකය පෙන්වා දෙන්න පුළුවන්. උණුසුම අපිට නැතුවම බැරි දෙයක්. ඒ වුණාට උණුසුම ඕනෑවට වඩා වැඩි වෙලා මහ ගින්නක් ඇති වුණොත් ඒක භයානක තත්ත්වයක් වෙන්න පුළුවන්. බුදු දහමෙහි ගසාගෙන යනවා කියන එකට භාවිතා කරන්නේ ඕස කියන වචනය.

බුදු දහමෙහි කාම ඕස, භව ඕස, දිට්ඨි ඕස, සහ අවිජ්ජා ඕස කියලා චතුර්විධ ඕස හඳුන්වලා දීලා තියනවා. ඇත්තටම ඇබ්බැහිය කියලා කියන්නේ නැතුවම බැරි වීම. ඒ නිසා කිසිම දෙයකදී ඉක්මවා නොයන්න කියලා බුදු දහම පෙන්වා දීලා තියෙනවා.

> **මිනිස්සු එපා කියන දේවල් කරන්න කැමතියි. ඒ පෘථග්ජන මිනිසුන්ගේ ස්වභාවය. එකිනෙකා පරයා තමන්ගේ අභිමතාර්ත ඉෂ්ඨ කර ගන්න හදන මිනිසුන් සිටින වර්තමාන සමාජයට මනෝ උපදේශන වැදගත් වෙනවා. කුඩා කාලයේ පටන්ම දරුවන්ට හොඳ නරක මොනවා ද?, නරක දේවල් කළොත් අත්වන ප්‍රතිඵල මොනවා ද? කියන දේ පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න ඕනෑ, එතකොට කුඩා කාලයේ ඉඳන්ම දරුවන් වැරදි දේවල් කරන්න යොමු වෙන්නේ නැහැ,**

● අද කාලයේ විතරක් නෙමෙයි, අතීතයේදීත් අනවශ්‍ය ඇබ්බැහි වීම් නිසා මිනිස් ජීවිත විනාශ වෙලා තියනවා. ඒ ගැන පැහැදිලි කළොත් ?

අයහපත් දේවල්වලට ඇබ්බැහි වීමෙන් මිනිස් ජීවිත පරිහානියට පත් වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. පුරුෂයා දකින්න කැමතිම රූපය ස්ත්‍රී රූපය බවත් ස්ත්‍රීය දකින්න කැමතිම රූපය පුරුෂ රූපය බවත් අංගුත්තර නිකායේ සඳහන් කරලා තියෙනවා. ඒ නිසා ස්ත්‍රී පුරුෂ ලෝලීත්වය නැති කරන්න බැරි දෙයක්. තමන්ගේ විවාහක පුරුෂයා සිටියදී වෙනත් පුරුෂයන් සමඟ අනියම් සම්බන්ධතා පැවැත්වීමත්, තමන්ගේ විවාහක බිරිය සිටියදී වෙනත් කාන්තාවන් සමඟ අනියම් සම්බන්ධතා පැවැත්වීමත් ජීවිත විනාශයට පත් කරවන කාරණාවන් කියලා බුදු දහමෙහි සඳහන් කරලා තියෙනවා.

වයස්ගත පුරුෂයන් ළාබාල තරුණියන් විවාහ කර ගැනීමේදී එම පුරුෂයන්ට තම විවාහක ළාබාල තරුණිය තවත් පුද්ගලයකු අයිති කර ගනී කියන සැකය හේතුවෙන් එම තරුණිය පිළිබඳ දැඩි ඊර්ෂ්‍යාවක් ඇති කර ගන්නවා. ඒ නිසා මිනිස් ජීවිත පවා විනාශ වුණු අවස්ථා අතීත කථා වස්තුවල දක්වලා තියනවා.

උදාහරණයක් විදිහට ස්වර්ණතිලකා කථා වස්තුවේ උද්දාල බ්‍රාහ්මණයා කියලා කියන්නේ ස්ත්‍රීය කුල හීන, දකින්නවත් හොඳ නැති ප්‍රජාවක් කියලා හිතා ගෙන සිටි දැඩි මාන්නයෙන් ජීවත් වුණු බ්‍රාහ්මණයෙක්. එවැනි ස්වර්ණතිලකා තමන්ගේ ශරීර ආකර්ෂණය උපයෝගී කර ගෙන කෙසේ හෝ බ්‍රාහ්මණයෙක්ගේ සිත තමන්ට නතු කර ගන්නවා. පසුව උද්දාල බ්‍රාහ්මණයා දරුවන්ට උගන්වන්න යන්නේ නැතුව ස්වර්ණතිලකාව නිවෙසට කරගෙන ආරක්ෂා කරනවා. අවසානයේදී උද්දාල බ්‍රාහ්මණයාව ගෙන්වන්න කරන උපායක් විදිහට ශිෂ්‍යයන් ස්වර්ණතිලකාව මරා දමනවා.

ස්වර්ණතිලකා මැරුණු ශෝකයෙන් උද්දාල බ්‍රාහ්මණයාත් ස්වර්ණතිලකාගේ දර සෑයට පැනලා මිය යනවා. ඒ නිසා ස්ත්‍රී ඇබ්බැහි වීම ජීවිත විනාශයට මූලික කරුණක්. අතීත සිටුවරු, රජවරු සුදු ක්‍රීඩාවට ඇබ්බැහි වෙලා තමන්ගේ තිබුණු සියලු ධනස්කන්දය නැති කරගෙන තියෙනවා. ඒ වාගේ ම මත්වතුර පානය කිරීමට ඇබ්බැහි වීමෙනුත් තමන්ගේ සම්පතමයන් නැති කර ගෙන සියලු වස්තුව නැති කර ගත් පුද්ගලයන් අතීතයේදී ඉඳලා තියනවා.

● වර්තමානයේදී මත්ද්‍රව්‍ය, මත්වතුර, ස්ත්‍රී ලෝලීත්වය යනාදී දුරාචාරයන්ට ඇබ්බැහි වීමේ ප්‍රවණතාව වැඩි වෙලා තියෙනවා. ඔබ වහන්සේ සිතන විදිහට එහෙම වෙලා තියෙන්නේ ඇයි?

ඇත්ත වශයෙන්ම වර්තමානයේදී මත්ද්‍රව්‍ය, මත්වතුර, ස්ත්‍රී ලෝලීත්වය යනාදි දුරාචාරයන්ට මිනිස්සු ඇබ්බැහි වීමේ ප්‍රවණතාවය වැඩි වෙලා තියෙන්නේ හිතේ පාලනයක් නැතිකම නිසා. ඉස්සර රජවරුන්ට අන්තඃපුරයක් තිබුණේ තමන්ගේ රජ පෙළපත රැක ගන්න රජ දරුවන් වැඩි වශයෙන් අවශ්‍ය වුණු නිසයි. සක්විති රජ කෙනකුට රජ දරුවන් දහසක් සිටි බව පොත් පත්වල සඳහන් වෙනවා. ඒ වුණත් වර්තමානයේදී පුද්ගලයන් අයථා සම්බන්ධතා පවත්වා ගැනීමෙන් තමන්ගේ ජීවිත විනාශ කර ගන්නේ ස්වයං හික්මීමක් නැති කම නිසා. පාසල් දරුවන් පවා අද කාලයේ අනියම් සම්බන්ධතා ගොඩනඟාගෙන තමන්ගේ ජීවිත කුඩා අවදියේදීම විනාශ කර ගන්නේ ඔවුන් තුළ හික්මීමක් නැති නිසා.

ශ්‍රී ලංකාවේ දිනකට ගබ්සා කිරීම් 800ක් පමණ සිදු වෙනවා කියලා මම එක්තරා පුවත්පතක දැක්කා. ඒ තරමටම ස්ත්‍රී පුරුෂ සම්බන්ධතාවන් දුර දිග ගිහින්. මිනිසුන් තමන්ගේ ජීවිත නිකරුණේ විනාශ කර ගන්නේ තමන්ගේ සිත පාලනය කර ගන්න බැරිකම නිසා. බොහෝ පුරුෂයන් මත්වතුර පානයට ඇබ්බැහි වෙලා ඔවුන්ට එක් දවසක්වත් මත්වතුර පාලනය නොකර ඉන්න බැරි වෙලා තියනවා.

එවැනි මිනිස්සු තමන් ඇයි මත්වතුර බොන්නේ, ඇත්තටම මත්වතුර බිව්වහම යහපතක් වෙනවද කියන එක ගැන හොඳ සිහියෙන් සිටින වෙලාවක සිතන්න ඕනෑ. මත්වතුර මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම ඇත්තටම එම පුද්ගලයන්ගේ පවුලේ සාමාජිකයන්ට පවා විශාල ගැටලුකාරී තත්ත්වයක්.

සෑම පුද්ගලයෙක්ම තමන් කවුද? තමන්ගේ වගකීම් මොනවා ද? තමන් වැරදි විදිහට හැසිරුණොත් බලපෑම් සිද්ධ වන්නේ කාට ද? කියන දේ පිළිබඳව අවබෝධයෙන් සිතන්න ඕනෑ. වැරදි දේවල්වලට ඇබ්බැහිවෙලා තමන්ට අත්වන යහපත මොකක් ද? කියලා හොඳින් හිතට ගන්න ඕනෑ. එතකොට ඇබ්බැහිකම ලෙහෙසියෙන්ම නැති කර ගන්න පුළුවන්. ඇබ්බැහි වීමට මූලික වෙන්නේ මිනිස් සිත. සිත පිරිසුදුව තියා ගත්තොත් කිසිම කෙනෙක් වැරදි දේවලට ඇබ්බැහි වෙලා ජීවිත විනාශ කර ගන්නේ නැහැ.

● අවශ්‍ය මනෝ උපදේශනවල යම් අඩුපාඩුවක් නිසා මිනිස්සු වැරදි ඇබ්බැහිවීම්වලට යොමු වෙලා තියනවා කියලා ඔබ සිතනව ද?

මිනිස්සු එපා කියන දේවල් කරන්න කැමතියි. ඒ පෘථග්ජන මිනිසුන්ගේ ස්වභාවය. එකිනෙකා පරයා තමන්ගේ අභිමතාර්ත ඉෂ්ඨ කර ගන්න හදන මිනිසුන් සිටින වර්තමාන සමාජයට ඇත්තටම මනෝ උපදේශන වැදගත් වෙනවා. කුඩා කාලයේ පටන්ම දරුවන්ට හොඳ නරක මොනවා ද?, නරක දේවල් කළොත් අත්වන ප්‍රතිඵල මොනවා ද? කියන දේ පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න ඕනෑ, එතකොට කුඩා කාලයේ ඉඳන්ම දරුවන් වැරදි දේවල් කරන්න යොමු වෙන්නේ නැහැ, එතකොට දරුවන් වුණත් වැරදි දේවල්වලට ඇබ්බැහි වෙන්න හිතන්නේ නැහැ,

සෑම පුද්ගලයෙක්ම කළ යුතු නොකළ යුතු දේවල් ගැන ස්වයං අවබෝධයකින් කටයුතු කරන්න ඕනෑ. තමන්ට වඩා උගත්, බුද්ධිමත්, පැහැදිලි නිවැරැදි උපදේශයක් ලබා ගත හැකි පුද්ගලයන්, යහපත් මිත්‍රයන්ව ඇසුරු කරලා ඔවුන්ගෙන් තමන්ගේ ජීවිත සාර්ථක කර ගන්න අවශ්‍ය උපදෙස් ලබා ගන්න ඕනෑ. එහෙම වුණාම වැරදි ඇබ්බැහිවීම්වලට සිත ඇදෙන ස්වභාවය පාලනය කර ගන්න පුළුවන්.

● ඇබ්බැහි වීමෙන් තොරව සාර්ථක ජීවිතයක් ළඟා කර ගැනීම සඳහා මිනිසුන්ට දෙන පණිවිඩය කුමක් ද?

තමන් කැමති දෙයක් ලැබුණාම සතුටක් දැනීමත්, තමන් අකැමැති දේවල් ලැබුණහම දුකක් දැනීමත් සාමාන්‍යයෙන් සිද්ධ වෙන දෙයක්. ඒ වුණාට සතුටේදී ඕනෑවාට වඩා සතුටු නොවී, දුකේදී ඕනවාට වඩා දුක් නොවී මධ්‍යස්ථව සිටින්න වග බලා ගන්න ඕනෑ. එතකොට ජීවිතයට පැමිණෙන බොහෝ ප්‍රශ්නවලට සාර්ථක විසඳුම් සොයා ගන්න පුළුවන්.

සටහන - මදාරා මුදලිගේ

වත්ථූපම සූත්‍රය

එදිනවල භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමාගේ අසපුවේ. එදා භාග්‍යවතුන් වහන්සේ, පින්වත් මහණෙනි කියලා භික්ෂු සංඝයා ඇමතුවා. පින්වතුන් වහන්ස, කියලා ඒ භික්ෂූන් වහන්සේලාත් භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නා. ඒ මොහොතේදී තමයි භාග්‍යවතුන් වහන්සේ මේ දෙසුම වදාළේ.

මහණෙනි, කිලුටු වෙලා, අපිරිසුදු වූ ඇඳුමක් තියෙනවා කියලා හිතමු. රෙදිවලට සායම් පොවන කෙනෙක් හිතනවා ඒ ඇඳුමට සායම් පොවන්න ඕන කියලා. එසේ හිතලා නිල් පාට, කහ පාට, රතු පාට, මදටිය පාට වැනි සායම් ඇති භාජනයක ඒ ඇඳුම දානවා. ඇත්තෙන්ම ඒ ඇඳුමට ලස්සනට සායම අල්ලන්නේ නෑ. අවලස්සන පාටක්මයි ඇති වෙන්නේ. ඇයි එහෙම වෙන්නේ?

මහණෙනි,

ඒක එහෙම වෙන්නේ ඒ ඇඳුම අපිරිසුදු එකක් නිසා. අන්න ඒ විදියටමයි සිතක් වුණත් කිලුටු වුණොත් සිදුවෙන්නේ දුගතියේ උපතක්ම තමයි.

මහණෙනි,

හොඳ පිරිසුදුවට බබළන ඇඳුමක් තියෙනවා කියලා හිතමු. ඉතින් රෙදිවලට සායම් පොවන කෙනෙක් හිතනවා ඒ ඇඳුමට සායම් පොවන්න ඕනි කියලා. එහෙම හිතලා නිල්පාට, කහ පාට, රතු පාට, මදටිය පාට වැනි සායම් තියෙන භාජනයකට ඒ ඇඳුම දානවා. එතකොට ඒ ඇඳුමට හොඳට සායම් අල්ලනවා. ලස්සනට පාට වෙනවා. පිරිසුදු පාටකට හැරෙනවා. ඇයි එහෙම වෙන්නේ? ඒ ඇඳුම පිරිසුදු එකක් නිසයි. මහණෙනි, අන්න ඒ වගේමයි සිතක් වුණත් කිලුටු වෙලා නැත්නම් සිදු වෙන්නේ සැප තියෙන ලෝකයක ඉපදීමක්ම තමයි.

මහණෙනි,

මොනවයින් ද සිතක් කිලුටු වෙන්නේ? තමන් සතු දේ ගැනත්, අනුන් සතු දේ ගැනත් ලෝභකමක් ඇති වෙනවා. අන්න ඒ සිතට (කිලුටු) කේන්තියෑමක් ඇතිවෙනවා. ක්‍රෝධයක් ඇති වෙනවා. ඒකත් සිතට කිලුටක්. වෛර බැඳ ගැනීම් ඇතිවෙනවා. ඒකත් සිතට කිලුටක්. අනුන්ගේ ගුණවත්කම් මකලා දානවා. අන්න ඒකත් සිතට කිලුටක්. එකට එක කරනවා. ඒකත් සිතට කිලුටක්. ඉරිසියාවක් ඇති වෙනවා. ඒකත් සිතට කිලුටක්. තමන්ගේ දෙයක් තව කෙනෙක් පාවිච්චි කරනවට කැමති නෑ. (මසුරුකම) ඒකත් සිතට කිලුටක්. ගුණවතුන් හැටියට රඟපානවා. අන්න ඒකත් සිතට කිලුටක්. කපටිකම ඇති වෙනවා. ඒකත් සිතට කිලුටක්. සාධාරණ අදහස්වලට විරුද්ධව දැඩිව ඉන්නවා. තරඟෙට වැඩ කරනවා. අහංකාරකමින් ඉන්නවා. ධර්මයේ හැසිරෙන්න ප්‍රමාද වෙනවා. මෙන්න මේ සියල්ලම සිත කිලුටු කරන දේවල්.

මහණෙනි,

යමෙක් තමන් සතු දේ ගැන හෝ අනුන් සතු දේ ගැන ලෝභකම ඇති වීමෙන් තමාගේ සිත කිලුටු වන බව අවබෝධ කර ගන්නවා නම් ඒ ලෝභකම අතහරිනවා. කේන්ති යාම තුළින් සිත කිලුටු වෙන බව අවබෝධ කර ගැනීමෙන් කේන්තියාම අතහරිනවා. මේ විදියට තමා සතු සියලුම අඩුපාඩුකම් ගැන සිතා, ඉහත සඳහන් පරිදි ඒ සෑම අඩුපාඩුවක් නිසාම සිත කිලුටු වන බව දැන ඒ බව මැනවින් අවබෝධ කර ගැනීම ගුණවත්භාවයයි. එම ගුණවත්කම තමා විසින් පෝෂණය කිරීමෙන් මරණයේදී තමාට තමා ගැනම සතුටු වී දෙලොව වැඩ සාදා ගැනීමට හැකියාවක් ලැබෙන්නේය.

පින්වත් මහණෙනි,

යම් දවසක යමෙක් තමන් සතු දේ ගැනත්, අනුන් සතු දේ ගැනත් ඇති වෙලා තිබුණු ලෝභයෙන් සිත කිලුටු වන බව අවබෝධ කරගෙන, ඒ ලෝභකම සිතින් බැහැර කරයි නම්, කේන්ති යාමෙන් සිත කිලුටු වන බව අවබෝධ කරගෙන ඒ කේන්ති යන ගතිය සිතින් ඉවත් කරයි නම්, ක්‍රෝධය නිසා සිත කිලුටු වන බව අවබෝධ කරගෙන, ඒ ක්‍රෝධ සිත ඉවත් කරයි නම්, වෛර බඳින්නට යෑමෙන් සිත කිලුටු වන බව අවබෝධ කොට ගෙන එයින් වැළකී සිත පිරිසුදු කර ගන්නේ නම්, යම් යම් අඩුපාඩු ඇති බව දැනගෙන ඒ අඩුපාඩුකම් සකසාගෙන හොඳ අවබෝධයෙන් යුතුව යමෙක් ධර්මයේ හැසිරෙන්නේ නම්, ඔහු අවබෝධයෙන් ජීවත්වන්නෙකි. ඒ පින්වන්ත මනුෂ්‍යයා විසින් බුදුරජාණන් වහන්සේ මෙන්න මේ ගුණවලින්යුක්ත යැයි අවබෝධයෙන් යුතුව වාසය කරයි. මා සරණ ගිය බුදුරජාණන් වහන්සේ රාග, ද්වේශ, මෝහ, නැති පරම පිවිතුරු සිතක් ඇති උතුමෙකි. බුදුරජාණන් වහන්සේ අරහං නම් වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ බාහිර උපකාරයකින් තොරව තම බුද්ධි මහිමයෙන් චතුරාර්ය සත්‍යය අවබෝධය ගත් කෙනෙකි. එනම් සම්මා සම්බුද්ධ වන සේක. මාගේ බුදුපියාණන් වහන්සේ ඉතා පිරිසුදු අවබෝධ ඥානයෙන් යුක්තව වැඩ සිටි බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

මාගේ බුදුපියාණන් වහන්සේ සුන්දර නිවනට පැමිණ වදාළ සේක. එබැවින් බුදුරජාණන් වහන්සේ සුගත නම් වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ සකල ලෝක ධාතුවම පරිපූර්ණ වශයෙන් අවබෝධ කළ කෙනෙකි. එබැවින් බුදුරජාණන් වහන්සේ ලෝකවිදූ නම් වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන් දමනය කිරීමෙහි අති දක්ෂ උතුමෙකි. එසේ හෙයින් බුදුරජාණන් වහන්සේ අනුත්තරෝ පුරිස ධම්ම සාරථී නම් වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ දෙවි මිනිස් ප්‍රජාවට නිවැරදි නායකත්වය සපයන කෙනෙකි. එබැවින් බුදුරජාණන් වහන්සේ සත්ථා දේව මනුස්සානං වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ අවබෝධ කළ ශ්‍රී සද්ධර්මය අන්‍යයන්ට අවබෝධ කරවන හෙයින් උන්වහන්සේ බුද්ධ නම් වන සේක.

මාගේ බුදුරජාණන් වහන්සේ මේ සියලුම ගුණයන් දරා ගැනීමට තරම් භාග්‍යසම්පන්න වන බැවින් උන්වහන්සේ භගවා නම් වන සේක.

ඒ වගේම ශ්‍රී සද්ධර්මය ගැනත් හොඳ අවබෝධයකින් තමයි ඔහු වාසය කරන්නේ. එනම් මා සරණ ගිය ශ්‍රී සද්ධර්මය මුල, මැද, අග පිරිසිදු ධර්මයකි. (ස්වක්ඛාතෝ) මේ ශ්‍රී සද්ධර්මය මේ ජීවිතයේදීම අවබෝධ කර ගැනීමට පුළුවන් (සන්දිට්ඨිකෝ) මේ ශ්‍රී සද්ධර්මය ඕනෑම කාලයක අවබෝධ කර ගැනීමට පුළුවන්. (අකාලික) ඇවිත් අවබෝධ කර ගැනීමට පුළුවන් ධර්මයක් (ඒහි පස්සික) තමා තුළින් අවබෝධ කර ගත යුතුයි. (ඕපනයික) බුද්ධිමත් උදවියට වෙන් වෙන් වශයෙන් අවබෝධ කර ගැනීමට පුළුවන්. (පච්චත්තං වේදිතබ්බ විඤ්ඤූහි) එනම් මා සරණ ගිය ශ්‍රී සද්ධර්මය මෙවැනි ගුණයන්ගෙන් යුක්ත බව ඔහු සිතයි.

ඊළඟට භික්ෂු ශ්‍රාවක සංඝරත්නය කවුද කියලා හඳුනා ගන්නට ඕන. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය රාග, ද්වේෂ, මෝහ දුරු කරන ප්‍රතිපදාවෙන් යුක්ත නිසා සුපටිපන්නයි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන ඍජු මාර්ගය නම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන නිසා උජුපටිපන්නයි. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන චතුරාර්ය සත්‍යාවබෝධය ඇති කරවන ප්‍රතිපදාවෙන් යුක්ත නිසා ඥායපටිපන්නයි. බුදුරජාණන් වහන්සේගේ සඟරුවන අන්‍යයන්ට ශ්‍රී සද්ධර්මය කියා දෙන නිසා සාමීචිපටිපන්නයි. යුගල වශයෙන් ශ්‍රාවකයන් හතරකුත්, පුද්ගලයන් වශයෙන් ශ්‍රාවකයන් අටකුත් දකිනට ලැබෙනවා.

බුදුරජාණන් වහන්සේගේ සඟරුවන දුර සිට රැගෙන ආ දන් පැන් ලබන්නට සුදුසුයි. ආගන්තුක සත්කාර ලබන්නට සුදුසුයි. පින් ලබා ගැනීම පිණිස දන් පැන් බෙදන්නට සුදුසුයි. වැඳුම් පිදුම් කරන්නට සුදුසුයි. ලෝකයේ උතුම් පින් කෙතක් බඳුයි.

මහණෙනි,

ඔන්න ඔය විදියට යම් දවසක ආර්ය ශ්‍රාවකයන්ගේ සිතින්, සිත කිලිටි කරන දේවල් බැහැර වුණොත්, වමනෙ දැම්මා වගේ වුණොත්, ඒවායින් නිදහස් වෙලා ගියොත්, දුරු වෙලා ගියොත්, එතකොට ඒ භික්ෂුව අනේ මාත් බුදු සම්දුන් කෙරෙහි නොසෙල්වෙන ප්‍රසාදයකින් යුක්තයි නේද කියලා සිත සතුටට පත් කර ගන්නවා. ඒ ගැන අවබෝධයක් ඇති වෙනවා. ඒ නිසාම සිත පිනා යනවා. එතකොට ප්‍රීතියක් ඇති වෙනවා. සිත ප්‍රීතිමත් වුණාම ඇඟපත සැහැල්ලු වෙනවා. එතකොට සිතට ලොකු සැපයක් ඇති වෙනවා. සැප ඇති සිත තමයි සමාධිමත් වෙන්නේ.

ඒ වගේම ශ්‍රී සද්ධර්මය කෙරෙහිත් නොසෙල්වෙන ප්‍රසාදයක් ඇති කර න්නවා. එතකොට සිතට සැප ගෙන දෙනවා. ඒ සිත තමයි සමාධිමත් වෙන්නේ.

ඒ වගේම ශ්‍රාවක සඟරුවන ගැනත් නොසැලෙන ප්‍රසාදයක් ඇති කර ගන්නවා. එසේ සිතා සතුටු වෙනවා. සතුටු වුණාම සිත පිනා යනවා. එතකොට ඇඟ පත සැහැල්ලු වෙනවා. සැප ඇති සිත තමයි සමාධිමත් වෙන්නේ.

දම් සිසිල ශ්‍රී සදහම් යෝගාශ්‍රමාධිපති
පූජ්‍ය ආටිගල අමිතදේව හිමි
මඩපාත, මාකන්දන,

භික්ෂු ගිලන් විවේක මධ්‍යස්ථානයේ චෛත්‍යයක් ඉදි කිරීමට මුල් ගල

වැල්ලම්පිටිය භික්ෂු ගිලන් විවේක මධ්‍යස්ථානයේ අභිනව චෛත්‍ය රාජයාණන් වහන්සේ ඉදිකිරීමට මංගල ශීලා ප්‍රතිෂ්ඨාපන උත්සවය අගුණකොළපැලැස්සේ විපුලසිරි ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

එදින මතින් තොර දේශයක් උදෙසා මත්ද්‍රව්‍ය කාර්යාංශයේ රණසිංහ මහතා විශේෂ දේශනයක් කළ අතර, අග්‍රාමාත්‍ය මාධ්‍ය ප්‍රකාශක නීතිඥ ප්‍රේමනාත් දොළවත්ත මහතාගේ පියාණන් වන සිරිසේන දොළවත්ත මහතා, කඩුවෙල නගරාධිපති ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්වූහ.

ජයන්ති කුරේ

රැක ගත යුතු බිතු සිතුවම්

ගණේවත්ත, කුරුණෑගල, වාරියපොළ, ඉබ්බාගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි පුරාණ රාජ මහා විහාරස්ථාන ගණනාවක සිතුවමට නඟා තිබෙන ඉතා අලංකාර බිතුසිතුවම් හා වියන් සිතුවම් දිනෙන් දින විනාශ වී යෑමේ තර්ජනයකට ලක් වෙමින් පවතී.

ඇතැම් විහාරස්ථානවල මෙම සිතුවම්වලින් බොහෝ කොටස් දැනටමත් දුර්වර්ණ වී, පතුරු වශයෙන් ගැලවී විනාශ වී ගොස් තිබේ. එම විහාර ගෙවල් ඇතුළත නිතර පිරිසුදු නොකිරීමත් වවුලන් ලැගීම හා මකුළු දැල් බැඳීමත්, කිරි වේයන් වැනි කෘමීන්ගෙන් හානි පැමිණීමත් මේ විනාශයට හේතු වී ඇත.

කුඹුක්ගැටේ කසාගල, වාරියපොළ නුවර කන්ද, වැල්ලව යක්ගිරි ලෙන, හුණුපොළ කන්දේගම, පොල්පිතිගම නියදවනේ, මඩහපොළ දැව පිට යන පුරාණ රාජ මහා විහාරයන්හි මෙසේ සිතුවම් විනාශ වෙමින් පවතී. මින් ඇතැම් සිතුවම්, දිවයිනෙහි වෙනත් කිසිම විහාරස්ථානයක දක්නට නොලැබෙන අන්දමේ වර්ණ සංයෝජනයකින් යුක්තය.

කලාත්මක හා ඓතිහාසික අතින් ද අගනා මෙම සිතුවම් තව දුරටත් විනාශ වී යා නොදී රැක ගැනීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ වයඹ පළාත් සංස්කෘතික අමාත්‍යාංශයෙහි අවධානය යොමු විය යුතු බව එම විහාරාධිපති හිමිවරු පවසති.

චන්ද්‍රතිලක රත්නායක - ඉබ්බාගමුව විශේෂ

ආලින්දය

රංගනය වෘත්තියක් කර ගන්නෙ නෑ....

නෙත්මි රොෂෙල්

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ජාතික නාලිකාව මඟින් සංවිධානය කළ 2019 අවුරුදු කුමරිය තරගයේ අවුරුදු කුමරිය ලෙස කිරුළු පැලඳි ඇය, මේ වන විට දෙරණ රූපවාහිනි නාළිකාවෙන් විකාශය වන ඓතිහාසික මාලා නාටකයක් වන 'රාවණා' හි 'සුපර්ණිකා දේවිය' ලෙසත් 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ 'ආක්ෂා' ලෙසත් රංගනයට එක්ව සිටින්නී ය. නෙත්මි රොෂෙල් නම් වූ ඇය ඉතා කෙටි කාලයක් ඇතුළත ඉහළ ජනප්‍රියත්වයක් ලැබූ තැනැත්තියකි. මේ ඇය 'ආලින්දය' හා එක්වූ මොහොතයි.

● ආධුනික රංගන ශිල්පිනියක් නිසා මුලින්ම ඔබේ සම්පූර්ණ නම දැනගන්න කැමැතියි..

මගේ සම්පූර්ණ නම නෙත්මි නිෂේකා රොෂෙල් රොජර්ස්.

● ඔබේ පවුලේ තොරතුරු මොනවද?

මා උපන්නේ කඩුවෙල කොරතොට කියන ප්‍රදේශයේ. මගේ අම්මා බුද්ධාගමේ. තාත්තා කතෝලික ආගමේ. අපි පන්සලටත් පල්ලියටත් යනවා. කිසිම භේදයක් නෑ. තාත්තා ව්‍යාපාරිකයෙක්. මාපියන් හැරුණම මට නංගි කෙනෙක් සහ මල්ලි කෙනෙක් ඉන්නවා. නංගි තවමත් උසස් පෙළ හදාරනවා. මල්ලි 2019 සාමාන්‍ය පෙළ විභාගය කළා.

● ඔබ ඉගෙන ගත්තේ?

කඩුවෙල බෝමිරිය මධ්‍ය මහා විදුහලෙන්.

● නෙත්මිගේ සරසවි සිසුවියක් නේද?

ඔව්. මම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ උපාධිය හදාරමින් සිටිනවා. බාහිර කටයුතුවලට යොමු වුණත් මම අධ්‍යාපන කටයුතුවලට මූලිකත්වය දෙන කෙනෙක්. අධ්‍යාපනය කියන්නේ ඕනෑම ක්ෂෙත්‍රයක නියැළෙද්දී අත්‍යාවශ්‍ය දෙයක් විදියට මම දකිනවා. මට ඒ දෙපැත්තම සමබරව පවත්වාගෙන යන්න පුළුවන්.

● ඔබ සරසවියේ කීවැනි වසරෙ ද?

සරසවියේ දෙවැනි අවුරුද්ද

● කලා ක්ෂේත්‍රයට යොමු වුණේ කොහොමද?

2019 වර්ෂයේ ජාතික රූපවාහිනි සේවය මඟින් පැවැත්වූ අවුරුදු කුමරිය තරගයට අයදුම්පතක් යොමු කළේ මගේ අම්මා. ඒකට අම්මා, තාත්තාගෙන් අවසරය ගත්තා. ඒ ජයග්‍රහණයෙන් තමයි මට රංගනයට මඟ විවර වුණේ කියලා මං හිතනවා.

● මුලින්ම ආරාධනා ලැබූ කලා නිර්මාණය මොකක්ද?

මට මුලින්ම ආරාධනා ලැබුණේ 'සක්කාරං' කියන ටෙලි නාට්‍යයේ 'ජයවති' කියලා ගැමි චරිතයකට. එයට මම පූර්ණ දායකත්වය ලබා දුන්නා.

● ඉන් අනතුරුව ඔබේ නිර්මාණ මොනවද?

'රාවණා' ටෙලි නාට්‍යයේ 'සුපර්ණිකා දේවිය' ලෙසත් 'දෙවෙනි ඉනිම' ටෙලි නාට්‍යයේ ටිකක් සැර පරුෂ 'ආක්ෂා' කියන චරිතයටත් මම රංගනයෙන් දායක වෙනවා. තවත් නිර්මාණ රැසකටම ආරාධනා ලැබුණත් විශ්වවිද්‍යාලයේ මගේ අධ්‍යාපන කටයුතුවලට මුල්තැන දෙන්න වුවමනා නිසා මම ඒවා භාර ගත්තේ නෑ. අධ්‍යාපන කටයුතු සාර්ථකව අවසන් කිරීමෙන් පසුව මම කලා කටයුතුවලට වැඩි වශයෙන් දායක වීමට කැමැත්තෙන් ඉන්නවා.

● වැඩි කැමැත්තක් දැක්වූ චරිතය?

මම රඟපෑමට ආසාවෙන්ද හිටපු විදිහේ චරිතය වුණේ රාජ කුමාරිකාවකගේ චරිතය. ඒ අවස්ථාව මට ලැබුණේ 'රාවණා' ටෙලි නාට්‍යයෙන්. ඒ ගැන මම තෘප්තිමත්.

● ජනප්‍රිය 'දෙවෙනි ඉනිම' නාට්‍යට සම්බන්ධ වුණු හැටි මතක් කරමු..

දවසක් ඒ නාට්‍යයේ චාමිකා මෙන්ඩිස් මහත්මිය ජාතික රූපවාහිනියට කථා කරලා මා ගැන තොරතුරු අහලා තිබුණා. ඇය මගේ දුරකතන අංකය හොයාගෙන, එම ටෙලි නාට්‍යයේ අලුත් චරිතයකට සම්බන්ධ කරගන්න කැමැති බව මට දැන්වූවා. මම එයට කැමැත්ත පළ කළා. මම ඒ ටෙලි නාට්‍ය වෙනුවෙන් උපරිම දායකත්වය දක්වනවා.

● ඔබ ජනතාව අතරට ගෙන ආ ජාතික රූපවාහිනියේ නිර්මාණවලට දායක වුණේ නැද්ද?

ජාතික රූපවාහිනියේ අවුරුදු කුමරිය ලෙස ජය ගත්තට පස්සේ එහි ඉදිරි වැඩකට සූදානමින් සිටින ලෙස මට දැන්වුවත් කුමක් හෝ හේතුවකට ඒ කාර්යය නතර වුණා. මෑතකදීත් ඒ ගැන ඔවුන් මා දැනුවත් කළත් තවමත් කැඳවීමක් කළේ නෑ. ඉදිරියේ දී එයට සම්බන්ධ වීමට කැමැතියි.

● ඔබට අමතක නොවන රංගන අත්දැකීම මොකක් ද?

මම රඟපෑ සුපර්ණිකා දේවියගේ චරිතයේ එක් අවස්ථාවකදී කෙනෙක් මට කිණිස්සකින් අනිනවා. ඒ සිද්ධියට මම පෙර පුහුණුවීම් කරලයි තිබුණේ. නමුත්, එහි රූගත කිරීම කරන දවසේ එතැන මගේ තාත්තා හිටියා. කිණිස්සෙන් අනින සිද්ධියට තාත්තා හොඳටම බයවුණා. ඒ නිසා එදා එය රූගත කරන්න වුණේ නැහැ. වෙන දවසක එය රූගත කළත් මට එය අමතක නොවන සිදුවීමක්.

● නෙත්මි පෙම්වතියක් ද?

තවම ඒ ගැන හිතලා නැහැ. අධ්‍යාපන කටයුතු හමාර කරලා තමයි ඒ ගැන තීරණයකට එන්නේ.

● ඔබේ අනාගත බලාපොරොත්තුව වෘත්තීය රංගන ශිල්පිනියක් වීම ද?

නැහැ. රංගනය වෘත්තිය කර ගන්න මම කැමැති නැහැ. මගේ අධ්‍යාපන කටයුතු සහ ඒ ඔස්සේ මගේ වෘත්තිය තෝරාගෙන අමතර කටයුත්තක් ලෙස රංගන කටයුතුවලට දායක වෙන්නයි මම අදහස් කරන්නේ. ඒ වගේම, මගේ මේ ගමනට සහයෝගය දුන් මගේ පවුලේ අයටත්, හිතවතුන්ටත්, මට ආදරය කරන සියලුම රසිකයටන්ටත් මගේ හෘදයංගම ස්තුතිය පළ කරන්න කැමැතියි.

හේමන්ත බණ්ඩාර

Bollywood

බොලිවුඩයේ 'මත් තරු' ලැයිස්තුව එළියට

සුෂාන්ත් සිං රාජ්පුත් තරුව නිවී ගියේ සිනමා ක්ෂේත්‍රයම ගිනි අවුළමිනි. ඔහුගේ පෙම්වතිය රියා චක්‍රබෝර්තිත් ඇයගේ සොහොයුරාත් සුෂාන්ත්ට මර්ජුවානා ලබා දීම නිසා සිර භාරයට රැගෙන අවසන්ය.

ඒ සමඟ හෙළි වූයේ බොලිවුඩයේ අංක එකේ බොහෝ තරු මත් ද්‍රව්‍ය භාවිතකරන්නන් බවය. රියා මත් ද්‍රව්‍ය භාවිත කරන්නන් 15 දෙනකුගේ නම් මත් ද්‍රව්‍ය නිරෝධායන අංශයට පවසා තිබෙයි. කෙදර්නාත් සිනමා පටයේ සුසාන්ත්ගේ පෙම්වතිය ලෙස රඟපෑ සයිෆ් අලි බාන්ගේ දියණිය සාරා අලි බාන් පවා සිටින්නීය. සුසාන්ත් මර්ජුවානාවලට ඇබ්බැහි වී ඇත්තේ ද කෙදර්නාත් රූගත කරමින් සිටියදීය.

මෑත යුගයේ මතට ඇබ්බැහි වූවන් අතර සංජේ දත්, ප්‍රතීක් බාබර්, ෆර්ඩීන් බාන්, රන්බීර් කපූර්, ර්තික් රෝෂන්ගේ බිරිය සුසේන් බාන්, ෂාරුක් බිරිය ගෞරි බාන්, මනීෂා කොයිරාල, මමිතා කුල්කර්නි, කන්ගනා රනවුත් ද සිටියි. විශිෂ්ට නිළියක වූ මීනා කුමාරි, පර්වින් බාබි මතට ඇබ්බැහි වූ පෙර පරපුරය.

සිරගෙන තරුව කන්ගනා

කන්ගනා රනවුත් කෙදිනත් රංගනයටත් වඩා කකට නිසා පුවත් මවන්නියකි. සුෂාන්ත්ගේ අකල් මරණයෙන් පසු ඇය වැඩිපුර කතාබහට ලක්වෙන චරිතයක් බවට පත්ව සිටියි. මෑතකදී ඇයගේ සේවා ස්ථානය කඩා බිඳදැමීම නිසා ඇය මහත් සිත්වේදනාවට පත්වී සිටින අතර නැති ප්‍රශ්න ගණනාවක්ම ඇති කර ගෙන තිබෙයි. ඇය නිළි උර්මිලා මතොන්දකාර්ට නිල් සිනමා රංගනයක යෙදුණු බවට කළ චෝදනාවට ක්ෂේත්‍රයේ වැඩි දෙනකුගේ විරෝධය එල්ල වී ඇත. කන්ගනා මෙසේ පවසා ඇත්තේ භාරතීය ජනතා පක්ෂයෙන් තරග කිරීමට බලාපොරොත්තුවෙන් සිටින නිසා බවට ද රාවයක් පවතියි.

පූනම්ට මංගල සීනු

ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම ලෝක ක්‍රිකට් ශූරතාව දිනා ගත්තොත් තමන් උපන් ඇඳුමින් සිටින බවට 2011 වසරේදී ප්‍රකාශයක් කළ පූනම් පාණ්ඩේට, ජනතා විරෝධය නිසා සමාජය ඉදිරියේ නිරුවත් වීමට ඉඩ නොලැබිණි. ඒත් ඇය, සමාජ වෙබ් අඩවි ඔස්සේ සිය අඩ නිරුවත් රූව පෙන්වමින් ඒ ආශාව ඉටු කර ගත්තාය. 2013 වසරේ 'නාශා' සිනමා පටයෙන් බොලිවුඩයට පිවිසි ඇය තවමත් රඟපා ඇත්තේ සිනමා පට පහක පමණි. පූනම් අවසන් වරට රසිකයන් තිරයෙන් දැක්කේ 2018 දී තිරගතවූ 'ද ජර්නි ඔෆ් කර්ම' සිනමා පටයෙනි. විසිනව හැවිරිදි පූනම්, සිය දිගු කාලීන පෙම්වතා වූ සැම් බොම්බේ සමඟ සැප්තැම්බර් 11 වැනි දින විවාහ වූවාය.

මංගල ඡායාරූප කිහිපයක් සමාජ වෙබ් අඩවිවලට ඇය යොමු කර තිබුණේ "ඔබ සමඟ ආත්ම හතක් යෑමට බලා සිටිනවා" යන වදන් පෙළ සටහන් කරමිනි.

අන්තර්ජාලයෙනි
සටහන - චම්පිකා දීපානි රණසිංහ

අලෙවිකරණය තරම් වැදගත් මාතෘකාවක් අද ලෝකයේ නෑ

විමසුම් බුද්ධියෙන් හා සිහියෙන් සිටීමත් අත්‍යවශ්‍යයි

› ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්

සිතාරා සේනානි

අලෙවිකරණය අද වන විට සියලු විෂය පථයන්හි අත්‍යවශ්‍ය සාධකය බවට පත්ව තිබෙන බව අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසීය.

ඇමැතිවරයා මේ බව පැවසුවේ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සහ එමරල්ඩ් ප්‍රකාශන ආයතනය (ERMLD Publishing) එක්ව සම්පාදනය කරන ලද දකුණු ආසියානු අලෙවිකරණ සඟරාව (South Asian Journal of Marketing) එළිදැක්වීම වෙනුවෙන් ජයික් හිල්ටන්හි පසුගියදා (30) පැවැති උත්සවයේ දීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද කීය.

"අද ලෝකයේ අලෙවිකරණය තරම් වැදගත් මාතෘකාවක් නැති තරම්. ඕනෑම භාණ්ඩයක්, සේවාවක් සැපයීමේ දී එහි සාර්ථකත්වය රඳා පවතින්නේ අලෙවිකරණයේ මැදිහත්වීම මතයි. එය ආර්ථික වේවා, දේශපාලන හෝ සාමාජයීය වේවා සියලුම විෂය පථයන්හි අත්‍යවශ්‍ය සාධකය බවට පත් වී හමාරයි. අද අලෙවිකරණය කොතරම් දුර ගොස් තිබෙනවා දැයි කිවහොත් අනුන්ගෙන් ණයට ගත් මුදලින් තමන්ට භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට හැකියාව වෙළෙඳපොළේ සැකසී තිබෙනවා. ක්‍රෙඩිට් කාඩ් කියා අප අද ඒවා පාවිච්චි කරනවා. මේ තමයි අලෙවිකරණයේ සැබෑ හැකියාව. එමෙන්ම විමසුම් බුද්ධියෙන් සහ සිහියෙන් එළැඹ සිටිනවා නම් ගැටලු විසඳීමට හැකියි. අභියෝග හමුවේ නොසැලීම අතිශයින්ම වැදගත්. කොරෝනා සටන ජය ගැනීමත් සමඟ අපට ලොව විශාල පිළිගැනීමක් තිබෙනවා. එයම යතුරක් බවට පත්කොටගෙන අපට පුළුවන් ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරන්න. අපට ඒ සඳහා පසුගිය කොරෝනා සමයේ හොඳ සම්පත් ලැබුණා. ඒ ඒ රටවලින් පැමිණ සිටි රෝගීන්ට මෙරටින් ලැබුණු සහයෝගය, මෙරට පොදු ජනතාවගෙන් ලත් සහයෝගය අගයන විදේශිකයන් පිරිසක් දැන් එම රටවල ඉන්නවා. ඒක අපේ රටේ අනාගතයට හොඳ ලකුණක්. අධ්‍යාපනයේ වැදගත්කම මතු කරමින් අද ඔබ ආයතනය සිදු කරන මෙහෙය අප ඇගැයීමට ලක් කරනවා."

අලෙවිකරණ සඟරාවේ සම්පාදක කණ්ඩායම ලෙස විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ, සබරගමුව විශ්වවිද්‍යාලයේ වැඩ බලන උපකුලපති මහාචාර්ය අතුල ඥානපාල, එමරල්ඩ් ආයතනයේ අධ්‍යක්ෂ ටෝර්නි රෝච්, විවෘත විශ්ව විද්‍යාලයේ මහාචාර්ය නලින් අබේසේකර, පාකිස්තානයේ GIFT විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මොහොම්මද් කෂිෆ් සහ ඩයලොග් ආසියාටා ආයතනයේ අධ්‍යක්ෂ සුපුන් වීරසිංහ යන මහත්වරුන් කටයුතු කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග, ශ්‍රී ලංකා කළමනාකරණ ආයතනයේ සභාපති රොෂාන් ප්‍රනාන්දු මහත්වරු ද විශ්වවිද්‍යාල උපකුලපතිවරු සහ ලේඛකාධිකාරිවරු පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

සිරි දළදා යල් අස්වනු පූජාව පැරණි චාරිත්‍ර අනුව

අසේල කුරුළුවංශ සහ නිහාල් ජයවර්ධන
මධ්‍යම පළාත් සමූහ

මෙවර යල් කන්නයේ වී වගා කළ ගොවීන් පළමුවෙන් නෙළා ගත් අස්වනු කොටස ශ්‍රී දළදා සම්දුන් වෙත පූජා කිරීම වෙනුවෙන් සංවිධාන කළ සිරි දළදා යල් අස්වනු පූජාව පෙරේදා (3) මහනුවර ශ්‍රී දළදා මාලිගාවේදී පෞරාණික චාරිත්‍රානුකූලව පැවැත්විණි.

ඒකාබද්ධ ජාතික ගොවි සංවිධානය සහ වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාශය, ග්‍රාමීය කුඹුරු හා වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ඇතුළු තවත් අංශ කිහිපයක් එක්ව මෙම යල අස්වනු පූජාව මෙවර සංවිධාන කළේ පස්වන වරටය.

ශ්‍රී දළදා සම්දුන් උදෙසා කිරි ආහාර පූජාවක් පවත්වා අනතුරුව අලුත් සහල්, ධාන්‍ය සහ ගොවිබිම්වලින් පළමුව කපා ගත් වී කරල් රැගත් ගොවීන් පෙරහරින් දළදා මාලිගාවට ගොස් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ අලුත් සහල් පූජාව පැවැත්විණි.

පුරාණයේ සිට පැවත එන යල් කන්නයේ අලුත් සහල් දළදා සම්දුන්ට පූජා කිරීමේ ආගමික චාරිත්‍රය වර්තමානයේ නැවතත් ජන ගතකිරීමක් ලෙස මෙම යල් අස්වනු පූජාව සංවිධානය කරන බව ග්‍රාමීය කුඹුරු හා වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රජ්‍ය අමත්‍ය අනුරාධ ජයරත්න මහතා කීය.

මල්වතු අස්ගිරි මහ නාහිමිවරුන්ගේ අනුශාසනා පරිදි දියවඩන නිලමේතුමන්ගේ මඟපෙන්වීමෙන් මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන්, ආදිවාසි නායක ඌරුවරිගේ වන්නියලැත්තෝ සහ රට පුරා විසිරි තිබෙන ගොවි සංවිධාන 500ක පමණ නියෝජිතයෝ මෙම අවස්ථාවට සහභාගී වූහ.

ලංසු කැඳවීම

සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම

ලංසු අංකය : 084/T/2019

මඩකලපුව, මඩකලපුව ගුවන් තොටුපොළට එළිමහන් ඇන්ටනා සමඟ වී එච් එෆ් එයාර් බෑන්ඩ් සම්ප්‍රේෂක 03 ක් සැපයීම.

2020 සැප්තැම්බර් මස 07 වන දින 'දිනමිණ' පුවත්පතේ පළ කරන ලද ඉහත ලංසු කැඳවීමට අදාළ පුවත්පත් දැන්වීමට වැඩිමනත් වශයෙනි.

ලංසු තැබීමේ අවසන් දිනය 2020 ඔක්තෝබර් මස 20 වන අඟහරුවාදා දින ප.ව. 2.00 දක්වා දීර්ඝ කරන ලද අතර, ලංසු ලිපි ලේඛන කට්ටල 2020 ඔක්තෝබර් මස 19 වන දින දක්වා නිකුත් කරනු ලැබේ.

අතෙකුත් දෑ නොවෙනස්ව පවතී.

සභාපති
සී/ස. ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක.

මහාමාර්ග හදන්න අමුද්‍රව්‍ය හිඟයකින් තොරව සපයන්න

› ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දුගෙන් උපදෙස්

සුභාෂිණී සේනානායක

මහාමාර්ග සංවර්ධනය හා කිලෝමීටර් 100,000ක මාර්ග සංවර්ධනය ව්‍යාපෘති දැනටමත් වේගවත් වී ඇති නිසා මහාමාර්ග ඉදිකිරීමේ දී අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟයකින් තොරව කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමට ඇති හැකියාව සොයා බලන ලෙස මහාමාර්ග ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා අමාත්‍යාංශ ලේකම් ආර්.ඩබ්. ආර්. පේමසිරි මහතාට උපදෙස් දී ඇත.

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව යමින් සිදු කරන වේගවත් සංවර්ධනයන්වල දී අමුද්‍රව්‍ය හිඟවීමක් ඉදිරියේ දී ඇති වෙතොත් එයට පිළියමක් වශයෙන් මහාමාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමෙන් අමුද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමේ වැඩපිළිවෙළක් සැකසීමට කටයුතු සොයා බලන ලෙස ඇමැතිවරයා මෙහිදී උපදෙස් ලබා දුන්නේය. මෙමඟින් අනවශ්‍ය හිඟයක් ඇති වීමත් අනවශ්‍ය ලෙස අමුද්‍රව්‍ය මිල ඉහළ යෑමත් වළක්වා ගත හැකි බවත් අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් පැවසීය. මේ හරහා ව්‍යාපෘති ප්‍රමාද වීම අවම කර ගැනීමටත් මහජන මුදල් ඉතිරි කර ගැනීමටත් හැකි බව අමාත්‍යවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

දිවයින පුරා ඇති මහාමාර්ග ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඇති ස්ථාන හඳුනා ගන්නා ලෙසත් භූ විද්‍යා හා පතල් කාර්යාංශය, මහවැලි අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තුමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනයන් ද මේ සඳහා සහභාගී කරගෙන නිසි අවසර ලබා ගන්නා ලෙස ද අමාත්‍යවරයා උපදෙස් දුන්නේය.

මෙම උක්ත ආයතනයන් සමඟ එළැඹෙන සතියේ දී මහාමාර්ග අමාත්‍යාංශයේ දී සාකච්ඡාවක් සූදානම් කරන ලෙස ද අමාත්‍යවරයා අමාත්‍යාංශ ලේකම් ආර්.ඩබ්.ආර් පේමසිරි මහතාට වැඩිදුරටත් උපදෙස් දී තිබේ.

සෞඛ්‍ය හා ආරක්ෂක අංශවල උපදෙස් අකුරටම පිළිපදිනවා

› මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් සමාගම

මහින්ද අලුත්ගෙදර

සෞඛ්‍ය සහ ආරක්ෂක අංශවල උපදෙස් අනුව ක්‍රියා කරමින් ඔවුන්ට උපරිම සහාය ලබා දෙන බවට ගම්පහ, දිවුලපිටිය ප්‍රදේශයේ කොවිඩ් - 19 ආසාදිත වූ කාන්තාව සේවය කළ බ්‍රැන්ඩික්ස් සමාගම ප්‍රකාශ කළේය.

බ්‍රැන්ඩික්ස් සමාගමේ මිනුවන්ගොඩ පිහිටි කර්මාන්තශාලාවේ සාමාජිකාවකට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වී ඇති බවට එම සමාගම හඳුනාගෙන තිබෙන අතර, ඒ අනුව බ්‍රැන්ඩික්ස් සමාගමේ සියලු මෙහෙයුම් අංශ තුළ දැඩි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බව ද මහජන සෞඛ්‍ය පරීක්ෂක ඇතුළු අදාළ සෞඛ්‍ය බලධාරීන්ගේ කඩිනම් ක්‍රියාමාර්ග සහ සහයෝගය හේතුවෙන් එම ආසාදන තත්ත්වය කල් තියා හඳුනාගෙන එම සාමාජිකාව වහාම ප්‍රතිකාර සඳහා අයි.ඩී.එච්. රෝහලට ඇතුළත් කර තවදුරටත් වයිරසය ව්‍යාප්ත වීම පාලනය කර ගැනීමට හැකි වී ඇති බව ද එම සමාගම කියා සිටියේය.

මෙම ක්‍රියාවලිය සඳහා අදාළ බලධාරීන්ගේ උපදෙස් මත ඔවුන්ට අවශ්‍ය උපරිම සහයෝගය ලබා දීමට සූදානම් බව පවසන එම සමාගම වයිරසය ව්‍යාප්ත වීම මුළුමනින්ම නවතා දැමීම සඳහා එම සාමාජිකාව සේවය කළ පරිශ්‍රය දැඩි විෂබීජහරණයකට ලක් කිරීම ඇතුළු කඩිනම් ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ගෙන තිබෙන බව ද කීය. එම රෝගියා සමඟ කටයුතු කළ එම පරිශ්‍රයේ තවත් සාමාජිකයන් 45 දෙනකු ද ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ද වහාම නිරෝධායනයට ලක් කර තිබේ. ඔවුන්ට එම වයිරසය ආසාදනය වී ඇති දැයි තහවුරු කර ගැනීම සඳහා පී.සී.ආර්. පරීක්ෂණ සිදු කෙරේ.

මෙහිදී අදාළ බලධාරීන් දැක්වූ කඩිනම් ප්‍රතිචාර සහ අඛණ්ඩ සහයෝගය වෙනුවෙන් ඔවුන්ට අපගේ කෘතඥතාව පළ කරන බ්‍රැන්ඩික්ස් සමාගම, සිය කාර්යමණ්ඩල සාමාජිකයන්ගේත් ඔවුන්ගේ ප්‍රජාවගේත් සුරක්ෂිතතාව සඳහා උපරිම ප්‍රමුඛතාව ඇති බැවින් සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කරනු ලබන දැඩි ආරක්ෂණ ක්‍රමවේද අඛණ්ඩව ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට කැප වී සිටින බව ද කියා සිටියේය.



ඉහළ ප්‍රමිතියෙන් අඩු මිලට ශ්‍රී ලාංකික නිෂ්පාදන 200ක් එකවර හඳුන්වා දෙන්න යයි

ජයසිරි මුණසිංහ

පාරිභෝගික ජනතාවට අඩු මිල ගණන් යටතේ ඉහළ ප්‍රමිතියෙන් යුතු ශ්‍රී ලාංකික නිෂ්පාදන 200ක් (Made In Sri Lanka) එකවර හඳුන්වා දීමේ වැඩසටහනක් ලබන මස ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව කර්මාන්ත සංවර්ධන සංසදය (IDF) කියා සිටියේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ අගමැති සහ මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ, කර්මාන්ත ඇමැති විමල් වීරවංශ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මෙම නිෂ්පාදන 200 ජාතියට ඉදිරිපත් කිරීමේ අවස්ථාව සිදු කරන බව කර්මාන්ත සංවර්ධන සංසදයේ අධ්‍යක්ෂ මයික්‍රෝ ඉලෙක්ට්‍රිකල් ඉන්ටර්නැෂනල් සමාගමේ සභාපති ධම්මික සමරවික්‍රම මහතා සඳහන් කළේය. ඒ මහතා කියා සිටියේ, රජයට බරක් නොවී නව නිෂ්පාදන සිදු කරන ව්‍යවසායකයන් 200 දෙනකු බලගන්වන මෙම වැඩපිළිවෙළ හරහා ස්වදේශිකත්වය මුල් කර ගත් භාණ්ඩ ලබා ගැනීමට පාරිභෝගික ජනතාව පොලඹවාලීමක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවයි. මෙම ක්‍රමවේදය තම සංසදයේ උපදේශක ආචාර්ය උදය ඉන්ද්‍රරත්න මහතාගේ සහ සභාපති සම්පත් මායාකඩුව මහතාගේ මූලිකත්වයෙන් ආරම්භ කිරීමට පියවර ගත් බව ද හෙතෙම පැවසීය.

නව ශ්‍රී ලාංකේය නිෂ්පාදන ජාලයක් එකවර ජාතියට හඳුන්වා දීම සඳහා කටයුතු කරන කර්මාන්ත සංවර්ධන සංසදය එතුළින් රටේ ජාතික ආර්ථිකය බලගැන්වීම අපේක්ෂා කරයි. දුප්පත්කම, විරැකියාව දුරු කර සෑම ජන කොටසකගේම ජීවනෝපාය ඉහළ නැංවීම නව වැඩපිළිවෙළේ තවත් බලාපොරොත්තුවකි. සංසදයේ අධ්‍යක්ෂ මණ්ඩලය වන සාගර ගුණවර්ධන, කපිල වික්‍රමසිංහ, ආසිරි ගුරුසිංහ, අතුල හපුතන්ත්‍රි මහත්වරුන් ප්‍රධාන සුළු හා මධ්‍ය පරිමාණ සහ මහා පරිමාණ ව්‍යවසායකයන් 900 දෙනෙක් සාමාජිකත්වය උසුලති. මෙවැනි පිරිසක් එකවර මනා සම්බන්ධීකරණයක් සහිතව නව නිෂ්පාදන ජාතියට හඳුන්වා දීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාව තුළින් බලාපොරොත්තු වන රටේ ආර්ථික දියුණුවේ වේගය වැඩි කරන්නක් වනු ඇතැයි ද ඒ මහතා සඳහන් කළේය.

ටොරානා වෙතින් අලුත් රසයක්

Investor Forum

ටොරානා යනු මීට දශක තුනකට පෙර ආරම්භ කළ විඩියෝ චිත්‍රපට, ගීත අලෙවි කරන රසවින්දනාත්මක කලා ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ව්‍යාපාරයකි .මෙම ව්‍යාපාරයේම තවත් ව්‍යාපාරයක් ලෙස ටොරානා තේ සහ කුළුබඩු ව්‍යාපාරය ආරම්භ කිරීමේ උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු විද්වතුන් , කොළඹ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මේ අවස්ථාවට සහභාගී වූ ආරාධිතයින් කිහිප දෙනෙකු දැක්වූ අදහස් මෙසේ ය.

කැළණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ගාමිණී හපුආරච්චි

“ඇත්තටම කුළු බඩු පිටුපස විශාල දර්ශනයක් තියනවා. අපි තුනපහ වර්ග ආහාරයට ගන්නවා කියලා තවමත් බටහිර ජාතීන් අපිට හිනා වෙනවා. නිසි පරිදි විද්‍යාත්මකව ඔප්පු කරන්න බැරි වුණත් මේ කොරෝනා තත්ත්වය යම් තාක් කල් මර්දනය කරන්න පුළුවන්කම තුන පහවලට තියෙනවා. අපේ කුළුබඩුවලට ලෝකයේ හොඳ ඉල්ලුමක් තියනවා. අපි ස්වභාව දහමත් එක්ක ජීවත් වෙච්ච මිනිස්සු. කුළු බඩු කියලා කියන්නේ අපේ ජාතික චින්තනයේ කොටසක්. අද කොතලාවල මහත්මිය ආරම්භ කළ කුළුබඩු සහ තේ කොළ ව්‍යාපාරය ජාතික චින්තනයේ කොටසක්. අද ඉඳන් ජාතික චින්තනයේ ඉදිරි ගමන ගෙනියන්න ඇයත් කොටස්කාරියක් වෙනවා. කාන්තාවන් ව්‍යාපාරවලට සම්බන්ධ වීම ගැන මම පෞද්ගලිකව සතුටු වෙනවා. මේ ව්‍යාපාරය සර්වප්‍රකාරයෙන් සාර්ථක වන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඇයට මම මගේ පූර්ණ සුභාශිංසනය පිරිනමනවා “

කේ ඇන්ඩ් ඩී සමූහ ව්‍යාපාරයේ කළමණාකාර අධ්‍යක්ෂක ගාමිණී සිල්වා

“මම ව්‍යාපාරිකයෙක් නෙමෙයි ව්‍යවසාහකයෙක්. මම තනුජාව හඳුනා ගත්තේ 1997 වර්ෂයේදී . එදා ඉඳන් අපි හොඳ මිතුරෝ .ඇය සතුව හොඳ ව්‍යවසායක හැකියාවන් තියෙන බව මම ඒ කාලේ ඉඳන්ම දැනගෙන හිටියා. ඇයගේ ව්‍යවසායක හැකියාවන් තුළින් අද හොඳ අංශයකට ගිහින් තියනවා. මුල්‍ය පහසුකම් සොයා ගැනීමේ ගැටලුව, වෙළෙඳපළ සොයා ගැනීමේ ගැටලුව, සන්නාමයක් නිර්මාණය කිරීමේ ගැටලුව යන ගැටලු 03 සාමාන්‍ය මට්ටමේ ව්‍යවසාහකයන්ට තියනවා. ඇය මේ ව්‍යාපාරය ආරම්භ කළේ මේ ප්‍රශ්නවලට යම් විසඳුමක් සොයා ගෙන. දේශීය වශයෙන් සහ විදේශීය වශයෙන් මේ ව්‍යාපාරයට වෙළෙඳපළක් තියෙනවා. ලබන සතියේදී කැනඩාව, ඇමරිකාව, ඔස්ට්‍රේලියාව, සහ ඉතාලිය යන රටවල් හතරටම අපිට සැපයුම් කරන්න අවස්ථාව ලැබිලා තියනවා. ඉස්සර ටොරානා කියන එකෙන් අපිව පිනෙව්වේ ඇස් දෙකයි කනයි. දැන් අපේ දිව පිනවන්න යනවා. මේ ව්‍යාපාරයේ ග්‍රීන් ටී, ප්‍රිමියම් බ්ලැක් ජින්ජ ටී, සිංගල් ඕගනික් ප්‍රිමියම් ටී. එක්ට්‍රා ස්ට්‍රොන්ග් යනාදී තේ වර්ග වගේ ම තුනපහ වර්ග කිහිපයක් තියනවා. අපේ රටේ තේවලින් අපි ජාත්‍යන්තරය ජය ගෙන තියනවා. ඒ නිසාම ලංකාවේ තේවලට වෙළෙඳපළ තරඟකාරීත්වය වැඩියි. අපේ රටේ අයට බාල දේවල් දීලා විදේශිකයන්ට ගුණාත්මක දේවල් දෙන ව්‍යාපාරිකයන් බොහෝමයක් ඉන්නවා. ඒ වුණත් තනුජා විදේශිකතයන්ට වගේ ම අපේ රටේ අයටත් දෙන්නේ ගුණාත්මක දේ. ඒ දෙය ඇයගේ ව්‍යාපාරයේ දියුණුවට විශාල අත්වැලක් වෙනවා “

ඩිජිටල් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂක - බර්ට්‍රම් නිහාල්

“මේ අවස්ථාවට ආරාධනා කළාට මම විශේෂයෙන් තනුජා කොතලාවල මහත්මියට ස්තුතිවන්ත වෙනවා. ඇයගේ නව ව්‍යාපාරය සර්වප්‍රාකාරයෙන් සාර්ථක වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. අලෙවිකරණ සංකල්පයක් තියනවා. ලෝකය පුරා විහිදී තිබෙන නූතනවාදය තුළින් කොතරම් මානුෂීය ගුණාංග ඉස්මතු වෙනව ද කියලා ප්‍රශ්නය මතු වෙනවා. කොවිඩ් - 19 පසුව වෙනස් මානයකින් බලන්න මිනිස්සු පුරුදු වුණා. මහා පරිමාණ ව්‍යාපාරවලට දැන් දැන් මානුෂීය ගුණාංග ආරෝපණය කරන්න පුළුවන්කම ලැබිලා තියනවා. සංචාරක ව්‍යාපාර වගේ ව්‍යාපාරවලට මානුෂිය මුහුණුවරක් දීලා තියනවා. ලෝකයේ සියලු ව්‍යාපාර මානුෂීය තත්ත්වයකට පත් කරන්න ඕන. ඒ මගින් විශාල ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වේවි“

සටහන- මදාරා මුදලිගේ

ලංකා හොස්පිටල්ස් නව ස්කෝලියෝසිස් සායනය අරඹයි

ජාත්‍යන්තර පිළිගැනීමට ලක් වූ සම්මානිත සුව සේවා සම්පාදකයකු වන ලංකා හොස්පිටල්ස් ඇද වූ සහ හානි වූ කොඳු ඇට පෙළ සඳහා ප්‍රතිකාර කිරීමේ විශේෂඥ ස්කෝලියෝසිස් සායනයක් අරඹා ඇත. ස්කෝලියෝසිස් යනු කොඳු ඇට පෙළ ඉංග්‍රීසි ‘S’හෝ ‘C’ අක්ෂරයේ හැඩයට ඇද වන ප්‍රතිකාර කිරීමෙන් සුව කළ හැකි රෝගයකි. ස්කෝලියෝසිස් සඳහා බලපාන සාධක බොහොමයක් මෙතෙක් පැහැදිලිව හඳුනා ගෙන නොමැති නමුත් අසමතුලිත උරහිස්, එක් උරහිසක උරපෙත්ත අනෙකට වඩා කැපී පෙනීම, ඉඟටිය අසමතුලිත වීම හෝ උකුළේ එක් අංශයක් අනෙකට වඩා උස්වීම ආදී රෝග ලක්ෂණ මඟින් රෝගය හඳුනා ගත හැකිය. “ලංකා හොස්පිටල්ස් සතුව මනාව ස්ථාපනය කෙරුණු විකලාංග ඒකකයක්, ස්නායු ඒකකයක් මෙන්ම පරිපූර්ණ භෞත චිකිත්සක මධ්‍යස්ථානයක් පවතිනවා. ස්කෝලියෝසිස් යනු මෙරට යෞවනයන් සහ තරුණියන් අතර බහුලව දැක ගත හැකි රෝගයක් බැවින් එම රෝගීන්ට විශේෂඥ ප්‍රතිකාර ලබා ගැනීමේ අවස්ථාව වඩාත් පහසු කිරීමට අප තීරණය කළා. ඒ සඳහා අපගේ අත්දැකීම්වලින් පරිපූර්ණ විකලාංග, ස්නායු සහ මානසික වෛද්‍ය විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩාම් ඒකාබද්ධ කරමින් සුවිශේෂ ස්කෝලියෝසිස් ප්‍රතිකාර සායනයක් ඇරඹුවා.” ලංකා හොස්පිටල්ස් සමූහ ප්‍රධාන විධායක නිලධාරි දීප්ති ලොකුආරච්චි මහතා පැවසීය.

“ස්කෝලියෝසිස් රෝගය නිසා රෝගීන්ගේ මවුපියන් තුළ සාංකාව වැනි මානසික ව්‍යාකූලතා රැසක් ඇති වන අතර, රෝගී දරුවන් තුළ මානසික කම්පන තත්ත්ව ඇති වෙනවා. ස්කෝලියෝසිස් රෝගයේ විකලාංග තත්ත්වය කලින් පරීක්ෂාවට ලක් කිරීම සහ නිසි ප්‍රතිකාර හරහා එය තව දුරටත් බරපතළ වීම වළක්වා ගත හැකියි. අප එම තත්ත්වය තව දුරටත් බරපතළ වීම පාලනය කිරීමට භෞත චිකිත්සක ක්‍රමවේද සහ බන්ධන ක්‍රමවේද අනුගමනය කරනවා. දැනටමත් බරපතළ තත්ත්වයේ සිටින රෝගීන් ශල්‍යකර්ම හරහා සතුටුදායක මට්ටමකට ගෙන ඒමේ හැකියාව අප සතුයි.” ලංකා හොස්පිටල්ස් ස්කෝලියෝසිස් සායනයේ විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍ය ගාමිණී පුංචිහේවා මහතා පැවසීය. ස්කෝලියෝසිස් ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගෙන්, භෞත චිකිත්සකවරුන්ගෙන්, මනෝ වෛද්‍යවරුන්ගෙන්, තාක්ෂණික විශේෂඥයන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් ස්කෝලියෝසිස් සඳහා ලංකා හොස්පිටල්ස් තුළ ප්‍රතිකාර කරන අතර, රෝගියාගේ තත්ත්වය මත කොඳු නාරටිය බන්ධනය කිරීම සහ අමතර සහායක් ලබා දීම සිදු කෙරේ. ලංකා හොස්පිටල්ස්හි ස්කෝලියෝසිස් ප්‍රතිකාර සේවාවන් පරිණත විශේෂඥ ස්නායු ශල්‍ය වෛද්‍යවරුන් සහ විශේෂඥ විකලාංග ශල්‍ය වෛද්‍යවරු විසින් මෙහෙයවනු ලබති.

GPV ලංකා සමාගම රන් සම්මාන දිනයි

ජපන් ශ්‍රී ලංකා කාර්මික හා සංස්කෘතික සංගමය (JASTECA) විසින් මෙහෙය වන ලද 2019 වර්ෂයට අදාළ Taiki Akimoto 5S මහා පරිමාණ ව්‍යාපාර කාණ්ඩයේ රන් සම්මානය GPV ලංකා (පුද්ගලික) සමාගම විසින් සතු කර ගන්නා ලදි.

මේ ජයග්‍රහණයේ විශේෂත්වය වනුයේ, සම්මානය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ පිළිගත් ආයතන සමූහයක් ඉදිරිපත් වූ අතර, ඒ අතරින් පළමු වතාවේදීම GPV ලංකා (පුද්ගලික) සමාගම විසින් රන් සම්මානය දිනා ගැනීමයි. එමෙන්ම, 2015/ 16/ 17/ 18 වර්ෂවල අඛණ්ඩව සිවු වසරක් ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් ක්ෂේත්‍රය යටතේ ඉහළම විදේශ විනිමය උපයන්නා සඳහා වන ජනාධිපති අපනයන සම්මානය හිමි කර ගැනීමට GPV ලංකා ආයතනය සමත් විය. මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ජපන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ටොෂිහිරෝ කිටමුරා මහතා සහ ජැස්ටෙකා සාමාජිකයෝ ද සහභාගි වූහ.

අලෙවි නියෝජිතයින්ට Sell-X වෙතින් මූල්‍යමය ඇගයීමක්

දකුණු ලක පරිගණක සහ සී.සී.ටී.වී. කැමරා අලෙවියේ හා බෙදා හැරීමේ ප්‍රමුඛයා වන Sell-X පුද්ගලික සමාගම Hikvison සී.සී. ටී.වී. කැමරා අලෙවි නියෝජිතයින් හා පාර්ශ්වකරුවන් මූල්‍යමය වශයෙන් ඇගයීමට ලක් කරයි.

Hikvison සී.සී. ටී.වී. කැමරා අලෙවි නියෝජිතයින් හා පාර්ශ්වකරුවන් අනුවකට වැඩි සංඛ්‍යාවක් Sell-X පුද්ගලික සමාගම සමඟ සම්බන්ධවී සිටින අතර, ඔවුන්ගෙන් වැඩිම අලෙවියක් වාර්තා කළ අය අගය කිරීමට ලක් කළේ මූල්‍යමය වශයෙන් හා තවත් දිරිගැන්වීම් ලබාදෙමින්ය.

Hikvison ආයතනය සී.සී.ටී.වී. කැමරා අලෙවි හා සවි කිරීම කටයුතු කරන බිම් මට්ටමේ අලෙවි නියෝජිතයින්ට සිය ප්‍රතිලාභ බෙදා හැරීමේ වැඩසටහනක් පසුගිය වසරේ අවසන් කාර්තුවේදී ආරම්භ කළේය. පාර්ශ්වකරුවන් අගය කිරීමට ලක් කළේය.

“සිය අලෙවි ඉලක්ක සම්පූර්ණ කරන කලාපීය නියෝජිතයින්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දුන්නා. පසුගිය වසරේ අවසන් කාර්තුවේ සිට මෙය තවදුරටත් ඉදිරියට ගෙන යමින් බිම් මට්ටමේ අලෙවි නියෝජිතයින්ට ද ප්‍රතිලාභ ලබාදෙන ක්‍රමවේදයක් ආරම්භ කර තිබෙනවා. එයට Sell-X පුද්ගලික සමාගමේ ද දායකත්වය ද ලබාදෙමින් අපේ අලෙවි නියෝජිතයින් හා පාර්ශ්වකරුවන් අගය කිරීමට ලක් කළා. ලංකාවේ ඕනෑම අයෙක්ට Hikvison සී.සී. ටී.වී කැමරා සහ අනෙකුත් උපාංග අලෙවි නියෝජිතයෙක් ලෙස අප සමඟ සම්බන්ධ වීමට අවස්ථාව තිබෙනවා. Sell-X පුද්ගලික සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ සමීර බෝපගේ පැවසුවේය.

සියලු කොටස් මිල දර්ශකය වාර්තාවක් තබයි

සැප්තැම්බර් මස තුළ 12%ක වර්ධනයක් දැක් වූ සියලු කොටස් මිල දර්ශකය ලොව අනෙක් මිල දර්ශකයන් අභිභවමින්,එම මාසයෙහි වැඩිම වර්ධනයක් දැක්වූ මිල දර්ශකය බවට පත්ව ඇත. සැප්තැම්බර් මාසයේ කොළඹ කොටස් වෙළෙඳපොළේ හි සමස්ත වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 279.6ක් එකතු වීමද විශේෂත්වයකි.කොළඹ කොටස් හුවමාරුවෙහි විශාලතම සහ ද්‍රවශීලතාවයෙන් ඉහළම කොටස් 20කින් සමන්විත මිල දර්ශකය වන S & P ශ්‍රී ලංකා 20 මිල දර්ශකයද සැප්තැම්බර් මාසයෙහි 4.39% ක ප්‍රගතියක් වාර්තා කළ අතර සැප්තැම්බර් 30 වන දිනය අවසානයේදී දර්ශක අගය 2,463.27ලෙස සටහන් විය.

වෙළඳ ගනුදෙනු දිනයක් තුළ සිදු කරන ලද සාමාන්‍ය ගනුදෙනු ගණන 20,607ලෙස සැප්තැම්බර් මාසයේදී වාර්තා වූ අතර මෙම වසරේදී දක්නට ලැබෙන සාමාන්‍යට සාපේක්ෂව 96%කින් සැප්තැම්බර් මාසයේදී මෙම අගය වර්ධනය වීම තවත් විශේෂත්වයක් වන අතර මෙමගින් ආයෝජකයින්ගේ උනන්දුවද පෙන්නුම් කරයි.තවද සැප්තැම්බර් මාසයේදී සමස්ත වෙළෙඳපොළ පිරිවැටුම රුපියල් බිලියන 50ක් ලෙස වාර්තා විය.

මෙම වාර්තාව පිළිබඳව කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති දුමිත් ප්‍රනාන්දු මහතා අදහස් දක්වමින් පවසා සිටියේ“මැයි 11 නැවත වෙළඳපොළ විවෘත කල පසු වෙළඳපොළ දැක් වූ ඉහළ ප්‍රගතිය ගැන අප සතුටු වෙනවා. පොලී අනුපාතයන් යම් තාක් දුරට පහත වැටී ඇති වාතාවරණයක තැන්පතු වශයෙන් රැඳී ඇති මුදල් කොටස් වෙළඳපොළහි ආයෝජනය වන රටාවක් මෑතකදී අප දැක ඇති අතර මෙය ඉදිරි මාස කිහිපය තුල එලෙසම සිදුවනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. කොටස් වෙළෙඳපොලෙහි ලැයිස්තුගත සමාගම් කොවිඩ් වසංගතයෙහි මූල්‍ය මය බලපෑම පාලනය කිරීම හේතුවෙන් අයෝජක ප්‍රජාව අතර විශ්වාසයක් ගොඩනැගෙමින් තිබෙනවා. ඉදිරි කාර්තු වලදී ශක්තිමත් ඉපැයීම් ඉදිරිපත් කල හැකි යැයි බලාපොරොත්තුවන සමාගම් ආයෝජක ප්‍රජාවගේ දැඩි අවධානයට ලක්ව තිබෙනවා”. යනුවෙනි.

හොඳම සේවක ප්‍රතිලාභ සපයන්නා සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ්

එක්සත් අරාබි එමිර් රාජ්‍යය පදනම් කර ගත් International Business Magazine 2020 වර්ෂයේ හොඳම සේවක ප්‍රතිලාභ සපයන්නා (Best Employee Benefits Provider Sri Lanka 2020) ලෙස සහ ක්ෂුද්‍ර රක්ෂණය සඳහා හොඳම ජීවිත රක්ෂණ සැපයුම්කරු (Best Life Insurance Provider For Micro Insurance Sri Lanka 2020) ලෙස සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් ආයතනය ඇගයුමට ලක් කරයි. International Business Magazine 2020 සම්මාන ලැබූවන් අතර බොහෝ ශ්‍රී ලාංකික සමාගම් දක්නට ලැබුණු අතර, ශ්‍රී ලංකාවේ සුප්‍රකට ව්‍යාපාර හා අනෙකුත් ගෝලීය වෙළෙඳ නාමයන් අභිභවමින් සණස ලයිෆ් මෙලෙස අන්තර්ජාතික සම්මාන ද්විත්වයකින් පිදුම් ලැබීම රක්ෂණ ක්ෂේත්‍රයේ සණස ලයිෆ් අත් කර ගෙන ඇති සාර්ථකත්වය මැනවින් විදහා දක්වයි.

2019 වසරේ හොඳම ක්ෂුද්‍ර රක්ෂණ ආයතනය ලෙසද, 2020 වසරේ හොඳම සේවක ප්‍රතිලාභ සපයන්නා ලෙසද Global Banking & Finance සම්මානයට පාත්‍ර වූ සණස ලයිෆ් සමාගම 2020 වසරේ හොඳම සේවක ප්‍රතිලාභ සපයන්නා සහ ක්ෂුද්‍ර රක්ෂණය සඳහා හොඳම ජීවිත රක්ෂණ සැපයුම්කරු ලෙස නැවතත් තේරී පත්වීම රක්ෂණ ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණයකි. මේ පිළිබඳ අදහස් දක්වමින් “සණස ලයිෆ් ප්‍රධාන විධායක නිලධාරි ඉන්දික කිරිවන්දෙනිය මහතා, සණස ලයිෆ් ආරම්භයේ සිට විශ්වාසනීය හවුල්කරුවන් ලෙස අප සමඟ අත්වැල් බැඳ ගත් සියලු පාර්ශ්වකරුවන්ට අපගේ ස්තුතිය පුද කරන අතර, ඔබ අප කෙරෙහි තැබූ විශ්වාසය ආරක්ෂා කර ගනිමින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ රැකවරණය වෙනුවෙන් කැප වී ක්‍රියා කිරීම අපගේ අභිප්‍රායයි” යනුවෙන් පැවසීය. පුරා වසර 28ක් රක්ෂණ ක්ෂේත්‍රයේ දැවැන්තයකු ලෙස නම් දරා සිටින සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම සාමාන්‍ය ගැමි ජනතාවට මුහුණ පෑමට සිදුවන හදිසි අනතුරුවලදී සහනයක් ලබා දීමේ වැඩපිළිවෙළක් වශයෙන් ආරම්භ විය. 1991 ඔක්තෝම්බර් මස සමස්ත ලංකා අන්‍යෝන්‍ය ආරක්ෂණ සංවිධානය අල්මාවෝ නමින් මසකට රුපියල් 5 - 20 වැනි සුළු මුදලක් අය කරමින් දැවැන්ත රක්ෂණායතනයකට මූලික අඩිතාලම දැමූ අතර, 2003 වර්ෂයේ ජීවිත රක්ෂණ කටයුතු සඳහා ද 2005 වර්ෂයේදී සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා ද බලපත්‍ර හිමි කර ගනිමින් වර්තමානය වන විට සුවහසක් ශ්‍රී ලාංකිකයන්ගේ රැකවරණය වෙනුවෙන් කටයුතු කරමින් තරුණ ප්‍රජාවට රැකියා සපයමින් විශාල සමාජ සේවයක් සිදු කරයි.

CHSGA 49 වැනි මහ සභා රැස්වීමේ දී ප්‍රියාල් පෙරේරා යළි සභාපති ධුරයට

ලංකා හෝටල් පාසල් උපාධිධාරීන්ගේ සංගමයේ (CHSGA) නව සභාපතිවරයා ලෙස ප්‍රියාල් පෙරේරා මහතා යළිත් තේරී පත් විය. සැප්තැම්බර් මස 19 වැනිදා ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවති එම සංගමයේ මහසභා රැස්වීමේදී මේ තීරණය ගෙන ඇත. මෙරට සංචාරක සහ සත්කාරක කර්මාන්තයේ සේවා ප්‍රමිතිකරණය කිරීමේ සංගමයක් ලෙස එම සංගමය කීර්තිමත් නාමයකට හිමිකම් කියයි. සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් එස්. හෙටිආරච්චි මහතා මහසභා රැස්වීමේ සැමරුම් උළෙලට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (SLTDA) සහ ශ්‍රී ලංකා සත්කාරක සහ සංචාරක කළමනාකරණ ආයතනයේ (SLITHM) සභාපතිනි කිමාලි ප්‍රනාන්දු මහත්මිය එහි ගරු ආරාධිත ලෙස සහභාගි වූවාය. මෙවර මහසභා රැස්වීම් සැමරුම් උළෙලේ ප්‍රධාන දේශනය යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා විසින් සිදුකරන ලදි.

මහසභා රැස්වීමෙන් පසු සංගමයේ සාමාජිකයන්ට මුණගැසීමටත්, සිය සබඳතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමටත් අවස්ථාව සලසා දෙමින් රාත්‍රී භෝජන සංග්‍රහයක් ද සංවිධාන කර තිබිණි. හෝටල් ක්ෂේත්‍රයේ වසර 30කට අධික අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන හෝටල්කරුවකු වන ප්‍රියාල් පෙරේරා මහතා, 2020/21 කාලය සඳහා සභාපතිවරයා ලෙස යළි තේරී පත්විය. අහාර-පාන, හෝටල් සහ සත්කාරක කර්මාන්ත කළමනාකරණය ආදී විවිධ අංශ රැසක අත්දැකීම්වලින් හෙබි ඒ මහතා, ආහාර-පාන මෙහෙයුම් පිළිබඳ ලංකා හෝටල් පාසලේ විශේෂ උපාධියකට හිමිකම් කියයි. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, යුදහමුදාපති සහ COVID-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ (NOCPCO) ප්‍රධානී ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාට ගෞරවයක් වශයෙන් මෙහිදී ප්‍රධාන කතාව සිදුකිරීම සඳහා එතුමාට ආරාධනය කරන ලදි.

සිංගර් ශ්‍රී ලංකා පරිගණක අලෙවියේ මුල් තැනට

මෙරට පාරිභෝගික භාණ්ඩ වෙළෙඳාමේ ප්‍රමුඛයා වන සිංගර් ශ්‍රී ලංකා සමාගම, පසුගියදා නිකුත් වූ ඉන්ටර්නැෂනල් ඩේටා කෝපරේෂන් (IDC) වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ අංක එකේ පරිගණක අලෙවිකරු ලෙස නම් කර තිබේ.

ශීතකරණ, රූපවාහිනී හා මහන මැෂින් ඇතුළු නිෂ්පාදන රැසක් සහිත සිංගර් ශ්‍රී ලංකා සමාගමේ වෙළෙඳපොළ ප්‍රමුඛත්වය මේ හරහා යළි තහවුරු වේ. පාරිභෝගික විද්‍යුත් උපකරණ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් අවබෝධයක් හා විශ්වාසනීය විශිෂ්ටත්වය පිළිබඳ ශක්තිමත් පසුබිමක් ද රැගත් සිංගර් ශ්‍රී ලංකා සමාගම, 2000 දශකය මුල එනම්, නව සහස්‍රකයේ උදාවත් සමඟ මෙරට පාරිභෝගිකයන්ගේ පරිගණක අවශ්‍යතා සපුරාලීමට ඉදිරිපත් විය.

වර්තමානය වන විට සිංගර් ශ්‍රී ලංකා සමාගම Dell, Asus හා Huawei ආදී ලොව ඉහළ පෙළේ පරිගණක අලෙවිය අතින් මෙරට පෙරමුණට පැමිණ තිබේ.

මේ සාර්ථකත්වය පිළිබඳ අදහස් දක්වමින් සිංගර් ශ්‍රී ලංකා සමාගමේ අලෙවි අධ්‍යක්ෂ ශනිල් පෙරේරා මහතා මෙසේ පැවසීය. “ශ්‍රී ලංකාවේ අංක එකේ පරිගණක අලෙවිකරු බවට පත්වීම, ඩිජිටල් නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ඉදිරියට පැමිණීම සඳහා සමාගම භාවිත කළ ක්‍රමෝපායේ ඵලදායීතාවට කදිම සහතිකයක් ලෙස හැඳින්විය හැකියි. 2019 වසරේදී අපගේ වෙළෙඳපොළ පංගුව 29%ක්. නමුත් කොවිඩ් වසංගතයත් සමඟ ජන ජීවිතය හා ජීවන විලාසය වෙනස් වීම නිසා ලැප්ටොප් සහ පරිගණක අංශය තවදුරටත් වර්ධනය වේවි.

CINEC CAMPUS උපාධි ප්‍රධානෝත්සවය උත්කර්ෂවත්ව

මාලඹේ CINEC CAMPUS උසස් අධ්‍යාපන ආයතනයේ වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවය උත්සවය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාගේ විශේෂ සහභාගීත්වයෙන් හා කපිතාන් අජිත් පීරිස් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත් විණි. මේ සඳහා සිසු සිසුවියන් සහ මවුපියෝ 1,800කට වැඩි පිරිසක් සහභාගී වූහ. මෙහිදී සිසු සිසුවියන් 600කට වැඩි පිරිසක් ඉංජිනේරු, නාවික, කළමනාකරණ, තොරතුරු තාක්ෂණ, ගුවන් යානා නඩත්තු ඉංජිනේරු, ඉංග්‍රීසි සහ අධ්‍යාපනවේදී ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධිවලින් පිදුම් ලැබූහ.

දිනමිණ ක්‍රීඩා

sports.dinamina@lakehouse.lk

2020 ඔක්තෝබර් 05 සඳුදා

දේශීය විස්සයි20 ක්‍රිකට් පිටිය උණුසුම් වෙයි

යුද හමුදාපති කුසලානයට කණ්ඩායම් 4ක් අද සිට ගැටෙති

නිරෝෂාන් ප්‍රියංකර

කොරෝනා වසංගතය හේතුවෙන් ලංකා ප්‍රීමියර් ලීග් ක්‍රිකට් තරගාවලිය දිනෙන් දින කල් යද්දී ජාතික ක්‍රිකට් ක්‍රීඩකයන් රැසක් යළි විස්සයි20 තරග බිමට කැඳවමින් ශ්‍රී ලංකා යුද හමුදාව ප්‍රථම වරට සංවිධාන කරන යුද හමුදාපති කුසලාන (ARMY COMMANDER'S LEAGUE) ලීග් ක්‍රිකට් තරගාවලිය අද (5) දොඹගොඩ යුද හමුදා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී ආරම්භ වෙයි.

අන්තර් සමාජ ක්‍රිකට් තරග බිමේ පළමු කාණ්ඩයෙන් තරග වදින යුද හමුදාව සතුව ක්‍රීඩකයන් 350කට අධික පිරිසක් ක්‍රිකට් ක්‍රීඩාවේ නිරත වෙති. ඔවුන් අතරින් එළැඹෙන පළමු පෙළ තරගාවලිය සඳහා නවක දක්ෂ ක්‍රීඩකයන් සොයා ගැනීමත්, යුද හමුදා ක්‍රීඩකයන්ට නව තරග අත්දැකීම් දීමේත් අරමුණින් මේ තරගාවලිය සංවිධාන කරන බව යුද හමුදා ක්‍රිකට් කමිටු සභාපති මේජර් ජෙනරාල් රුවන් වනිගසූරිය මහතා පවසයි.

අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩා කරන සෑම රටක්ම විස්සයි20 ලීග් තරගාවලි පවත්මින් ජාතික කණ්ඩායම් සඳහා දක්ෂ ක්‍රීඩකයන් සොයා ගන්නා බැවින් මේ තරගාවලිය ද ශ්‍රී ලංකා කණ්ඩායමට දක්ෂයන් බිහි කිරීමට කදිම අවස්ථාවක් වනු ඇත.

මේ තරගාවලියට ඩිමෝ දකුණ වොරියස්, මෙල්බර්න් බස්නාහිර වොරියස්, සුපර් ෆෑෂන් උතුර වොරියස් සහ ප්‍රීමා ස්ටෙලා නැගෙනහිර වොරියස් ලෙස කණ්ඩායම් 4ක් එක් වන අතර, ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන යුද හමුදා ක්‍රීඩකයන් වන දිනේෂ් චන්දිමාල්, තිසර පෙරේරා, සීක්කුගේ ප්‍රසන්න සහ අසේල ගුණරත්න පිළිවෙළින් එහි නායකයන් ලෙස කටයුතු කරති.

ඩිසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් (දකුණ), මෙල්බර්න් ස්ටීල් (බස්නාහිර), පාණදුර සුපර් ෆෑෂන් (උතුර) සහ ප්‍රීමා ස්ටෙලා (නැගෙනහිර) කණ්ඩායම්වල අනුග්‍රාහකයන් ලෙස කටයුතු කරයි.

මේ සෑම කණ්ඩායමකටම ආරාධිත ක්‍රීඩකයන් ලෙස ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් තිදෙනකු බැගින් එක් කර තිබේ. ඒ අනුව චන්දිමාල්ගේ කණ්ඩායමට සුරංග ලක්මාල්, දුෂ්මන්ත චමීර සහ වනිඳු හසරංග එක් වන අතර, නුවන් ප්‍රදීප්, ධම්මික ප්‍රසාද් සහ අවිශ්ක ප්‍රනාන්දු තිසරගේ කණ්ඩායමට එක්ව සිටිති.

සීක්කුගේ මෙහෙයවන උතුර කණ්ඩායමට දසුන් ශානක, අකිල ධනංජය සහ භානුක රාජපක්ෂ ක්‍රීඩා කරන අතර, කුසල් මෙන්ඩිස්, සඳුන් වීරක්කොඩි සහ චතුරංග ද සිල්වා එක්ව ඇත්තේ අසේලගේ කණ්ඩායමටයි.

මීට අමතරව අන්තර් සමාජ ක්‍රිකට් තරග බිමේදී පළමු පෙළ සහ අවුරුදු 23න් පහළ යුද හමුදා ක්‍රීඩා සමාජය නියෝජනය කරන ක්‍රීඩකයන් සමඟ අන්තර් රෙජිමේන්තු එක්දින තරගාවලියේ දක්ෂතා දැක්වූ ක්‍රීඩකයන් 64 දෙනකු තෝරා ගෙන කුසපත් ඇඳීම මගින් මේ කණ්ඩායම්වලට එක් කර තිබේ.

තරගාවලියට එක්වන කණ්ඩායම් නායකයෝ අසේල ගුණරත්න (නැගෙනහිර), දිනේෂ් චන්දිමාල් (දකුණ), තිසර පෙරේරා (බස්නාහිර) සහ සීක්කුගේ ප්‍රසන්න (උතුර) *ඡායාරූපය - සමන්ත වීරසිරි*

මේ තරගාවලියේ නීතිරීති අනුව නවකයන්ට අවස්ථාව දීමේ අරමුණින් තරගයකට නම් කරන අවසන් 11 දෙනා අතරට අවුරුදු 23න් පහළ ක්‍රීඩකයන් දෙදෙනකු නම් කිරීම අනිවාර්ය වන අතර, නායකයන් හැර එක් තරගයකට ක්‍රීඩා කිරීමට අවසර ඇත්තේ ජාතික කණ්ඩායම නියෝජනය කරන ක්‍රීඩකයන් දෙදෙනකුට පමණි. මීට අමතරව යුද හමුදා පළමු පෙළ කාන්තා කණ්ඩායම නියෝජනය කරන ක්‍රීඩකාවන් දෙදෙනකු අතිරේක ක්‍රීඩිකාවන් ලෙස නම් කර තිබේ.

මේ තරගාවලිය නවක යුද හමුදා ක්‍රීඩකයන්ට හොඳ අත්දැකීමක් මෙන්ම කොරෝනා වසංගතය හේතුවෙන් තරගකාරී ක්‍රිකට් පිටියෙන් ඈත්ව සිටි තමා ඇතුළු ජාතික කණ්ඩායම නියෝජනය කරන ක්‍රීඩකයන්ට හොඳ අවස්ථාවක් බව දකුණ වොරියස් නායක දිනේෂ් චන්දිමාල් කියා සිටියේ තරගාවලිය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පැවැති මාධ්‍ය හමුවේදීය.

මේ මාධ්‍ය හමුවේදී යුද හමුදා පළමු පෙළ කණ්ඩායමේ නායකයා ලෙස චන්දිමාල් පත් කළ බවට ද නිවේදනය කළ අතර, එය තමාට ඉමහත් ගෞරවයක් බවත් ජාතික ක්‍රිකට් කණ්ඩායම තුළින් ලත් අත්දැකීම් යුද හමුදා ක්‍රිකට් ක්‍රීඩාව නැංවීම සඳහා දායක කර ගන්නා බවත් චන්දිමාල් කියා සිටියේය.

අද ආරම්භ වන තරගාවලියේ මූලික වටයේ තරග 13 වැනිදා දක්වා දොඹගොඩදී පැවැත්වේ. එක් දිනයක පෙරවරුවේ සහ පස්වරුවේ තරග 2ක් බැගින් පැවැත්වේ. නිරෝධායන නීති අනුව මේ තරග නැරඹීමට ප්‍රේක්ෂකයන්ට අවස්ථාව හිමි වන බව යුද හමුදාව පවසයි. මේ වටයේ ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගන්නා කණ්ඩායම් 2 අවසන් මහ තරගයට එක් වන අතර, එම තරගය 17 වැනිදා නව තණතීරු සහිතව ප්‍රතිසංස්කරණය කළ සාලියපුර ගජබා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට නියමිතය.

තරගාවලියේ ජයග්‍රාහකයන්ට ශූරතා කුසලානය සමඟ රු. 150,000ක් පිරිනැමෙන අතර, අනුශූරයන්ට රු. 75,000ක් පිරිනැමේ.

තරග කාලසටහන

අද (5): බස්නාහිර වොරියර්ස් - උතුර වොරියර්ස්, දකුණ වොරියර්ස් - නැගෙනහිර වොරියර්ස්

හෙට (6): නැගෙනහිර වොරියර්ස් - උතුර වොරියර්ස්, දකුණ වොරියර්ස් - බස්නාහිර වොරියර්ස්

8 දා: බස්නාහිර වොරියර්ස් - නැගෙනහිර වොරියර්ස්, උතුර වොරියර්ස් - දකුණ වොරියර්ස්

9 දා: දකුණ වොරියර්ස් - නැගෙනහිර වොරියර්ස්, උතුර වොරියර්ස් - බස්නාහිර වොරියර්ස්

10 දා: බස්නාහිර වොරියර්ස් - දකුණ වොරියර්ස්
නැගෙනහිර වොරියර්ස් - උතුර වොරියර්ස්

13 දා: උතුර වොරියර්ස් - දකුණ වොරියර්ස්
නැගෙනහිර වොරියර්ස් - බස්නාහිර වොරියර්ස්

17 දා: අවසන් තරගය
(සාලියපුර ගජබා ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී)

ශෂිකලා සහ චමරි අයිපීඑල් කාන්තා තරගාවලියට

අයිපීඑල් තරගාවලියට සමගාමීව සාජා නුවර පැවැත්වීමට නියමිත කාන්තා විස්සයි20 තරගාවලියට ශ්‍රී ලංකාවෙන් චමරි අතපත්තු සහ ශෂිකලා සිරිවර්ධන එක් වී සිටිති. ලබන නොවැම්බර් මස 4 වැනිදා සිට 9 දක්වා පැවැත්වෙන එම තරගාවලිය පැවැත්වෙන්නේ තෙවැනි වරටය. චමරි අතපත්තු, ශෂිකලා සිරිවර්ධන සමඟ බංග්ලාදේශයෙන් ක්‍රීඩිකාවන් දෙදෙනකුට ද තරගාවලියට ක්‍රීඩා කිරීමේ අවස්ථාව ලැබී ඇති අතර, බටහිර ඉන්දීය කොදෙව් සහ එංගලන්තයෙන් ද ක්‍රීඩිකාවන් කිහිපදෙනකු එක්වීමට නියමිතය.

එක්සත් අරාබි එමිර් රාජ්‍ය කොරෝනා සෞඛ්‍ය නීතිරෙගුලාසිවලට අනුව දින 6ක කාලයක් නිරෝධායනය වීමෙන් පසුව තරගාවලියට ක්‍රීඩා කිරීමේ අවස්ථාව විදෙස් ක්‍රීඩිකාවන්ට ලැබෙන බව තරගාවලියේ සංවිධායක ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය ඊයේ නිවේදනය කළේය.

කණ්ඩායම් තුනක සහභාගිත්වයෙන් පැවැත්වෙන කාන්තා විස්සයි20 තරගාවලියට සහභාගි වීම සඳහා චමරි අතපත්තු සහ ශෂිකලා සිරිවර්ධන මේ මස අගභාගයේදී සාජා නුවර බලා පිටත්ව යෑමට නියමිතය.

ක්‍රීඩා පුහුණුකරුවන්ට සමුළුවක්

මැද කොළඹ සමූහ

ක්‍රීඩා පුහුණුකරුවන් දැනුවත් කෙරෙන සමුළුවක් අද (5) පෙ.ව. 8.00 සිට ක්‍රීඩා විද්‍යායතන ශ්‍රවණාගාරයේදී පැවැත්වෙයි.

ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂ සජිත් ජයලාල් මහතාගේ අධීක්ෂණයෙන් මේ සමුළුව සංවිධාන කර ඇති අතර, එහි ප්‍රධාන ආරාධිතයා ලෙස නාගරික ක්‍රීඩා අධ්‍යක්ෂ මාශංක ලියනගේ මහතාත්, විශේෂ ආරාධිතයා ලෙස නාගරික කොමසාරිස් නීතිඥ රෝහිණි දිසානායක මහත්මියත් සහභාගි වීමට නියමිතය.

ජාතික තේරීම් කමිටුවේ ලොකු පුටුව යුද හමුදාපතිට



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කරයි.

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා විසින් මේ පත්වීම සිදු කර ඇති අතර, තේරීම් කමිටුවේ සෙසු සාමාජිකයන් පත් කිරීම සහ අභියාචනා උපදේශක කමිටු සාමාජිකයන් පත් කිරීම ද පසුගියදා සිදු කෙරිණි.

ඒ අනුව ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටු සභාපති සුරේෂ් සුබ්‍රමනියම්, ඔලිම්පික් කමිටු මහලේකම් මැක්ස්වෙල් ද සිල්වා, අර්ජුන් ප්‍රනාන්දු සහ මොහොමඩ් හෆීස් මාසෝ යන මහත්වරුන් ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ සෙසු සාමාජිකයන් ලෙස පත් කර තිබේ.

ක්‍රීඩා අභියාචනා හා උපදේශක කමිටු සභාපති ලෙස විනිසුරු කන්කානි තන්ති චිත්‍රසිරි පත් කර ඇති අතර, ජනාධිපති නීතිඥ චණ්ඩක ජයසුන්දර, ජනාධිපති නීතිඥ දිනාල් මාරියෝ රෙක්ස් පිලිප්ස් පීසී, හිටපු ක්‍රිකට් ක්‍රීඩක සිදත් වෙත්තමුනි, දමයන්ති දර්ශා, රාහුල වික්‍රමනායක සහ රොෂානි මාරි කොබ්බෑකඩුව මහත්ම මහත්මිහු සෙසු සාමාජිකයෝ වෙති.

මීට අදාළ පත්වීම් ලිපි ප්‍රදානය ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා අතින් සිදු කළ අතර, එම අවස්ථාවේ අදහස් දැක්වූ යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා කියා සිටියේ ජාතික ක්‍රීඩා වෙනුවෙන් විශාල ක්‍රීඩක ආයෝජනයක් ශ්‍රී ලංකා යුද හමුදාව සිදු කර ඇති අවස්ථාවක තමා මේ තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා ඇමැතිවරයාට සිය ස්තුතිය පළ කරන බවයි.

තමාට රට වෙනුවෙන් දුන් මේ වගකීම උපරිමයෙන් ඉටු කර මෙරට ක්‍රීඩාව ලොව ඉහළ මට්ටමකට ගෙන ඒමට කළ හැකි උපරිම සේවය සිදු කරන බවත් ඔහු පවසයි.

පාපන්දු තරග කමිටු ප්‍රධානියා විධායක සභා තීන්දුවකින් ඉවතට

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ හිටපු තරග කමිටු සභාපති සහරාන් සිංහවංශ මහතා ඉවත් කොට එම තනතුරට සහකාර පොලිස් අධිකාරි හා ශ්‍රී ලංකා පාපන්දු හිටපු නායක අශෝක නවුගලගේ මහතා පත් කිරීමට පාපන්දු විධායක සභාව තීරණය කරයි. තරග කමිටු නියෝජ්‍ය සභාපති ජෝජ් විරක්කොඩි, සාමාජිකයන් වන යූ. එල් පෙරේරා, ප්‍රියංකර පෙරේරා, එම්. එල්. සිනන් හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරි ගාමිණී කෝස්තා යන මහත්වරු එලෙසම එම කමිටුවට ඇතුළත්ව සිටිති.

පසුගිය කාලයේ අවස්ථා කිහිපයකදීම හිටපු තරග කමිටු සභාපති සහරාන් සිංහවංශ මහතාට චෝදනා එල්ල වූ අතර, අවසන් වරට පැවැති සභාපති කුසලාන පාපන්දු තරගාවලියේ අර්ධ අවසන් පූර්ව වටයේදී නිව් ස්ටාර් ක්‍රීඩා සමාජයේ ක්‍රීඩකයකු හොර හැඳුනුම්පතක් සාදා තරගයකට එක් වීම සම්බන්ධව ද චෝදනා එල්ල විය. මතභේදයට තුඩුදුන් නිව් ස්ටාර් ක්‍රීඩා සමාජය ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ තරග කමිටු සභාපති සහරාන් සිංහවංශ මහතාගේ ක්‍රීඩා සමාජය ලෙස හැඳින්වූ බැවින් අනෙකුත් ක්‍රීඩා සමාජ ඔහුගේ තනතුර පිළිබඳ දිගින් දිගටම ප්‍රශ්න කළහ.

සුපර් ලීග් තරග කළමනාකරණයට පංච පුද්ගල කමිටුවක්

මේ අතර, කණ්ඩායම් 10ක සහභාගීත්වයෙන් ආරම්භ කිරීමට නියමිත වෘත්තීය සුපර් ලීග් පාපන්දු තරගාවලිය කළමනාකරණය කිරීම උදෙසා වෙනම විශේෂ පංච පුද්ගල කමිටුවක් පත් කිරීමට පාපන්දු විධායක සභාවේ අනුමැතිය හිමිව ඇත. එම කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස පාපන්දු සභාපති අනුර ද සිල්වා මහතා කටයුතු කරන අතර, ලේකම් ජස්වර් උමාර්, සහකාර පොලිස් අධිකාරී අශෝක නවුගලගේ, නියෝජ්‍ය පොලිස්පති පත්මසිරි මුණසිංහ හා රත්මලාන පාපන්දු ලීගයේ පී.ජී.පී. පීරිස් යන මහත්වරු සාමාජිකයන් ලෙස පත් කර තිබේ.

එෆ්.එම්. රමීස් මහතා අවශ්‍යතා මත අතිරේක නිලධාරියකු ලෙස මේ කළමනාකරණ කමිටුවට සූදානමින් තබා ඇත.

නොවැම්බර් 20 වැනිදා ආරම්භ කිරීමට නියමිතව තිබූ වෘත්තීය සුපර් ලීග් පාපන්දු තරගාවලිය කොරෝනා අර්බුද හේතුවෙන් දින කිහිපයකින් කල් යනු ඇතැයි පැවැසේ. මාස 7ක් පුරා තරග 90ක් ලීග් ක්‍රමයට පැවැත්වෙන අතර, ජයග්‍රාහී කණ්ඩායම්වලට දෙන තෑගි මුදල් වැඩි කිරීමට යෝජනාවක් පාපන්දු සභාපති අනුර ද සිල්වා මහතා විධායක සභාවට ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ජයග්‍රාහී කණ්ඩායමේ තෑගි මුදල රුපියල් මිලියන 5ක් දක්වා වැඩි කිරීමටත් 10 වැනි ස්ථානය දක්වා මුදල් තෑගි පිරිනැමීමටත් යෝජනා කළ බව 'දිනමිණ' කළ විමසීමකදී සිල්වා මහතා පැවැසීය.

මේ අලුත්ම තරගාවලිය සඳහා ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය කෝටි 9කට අධික මුදලක් වැය කරන අතර, තරගාවලියට එක් වන සෑම කණ්ඩායමකට සියලු පහසුකම් සහිතව අවම වශයෙන් රුපියල් ලක්ෂ 30ක් පමණ හිමිවේ.

සෑම ක්‍රීඩා සමාජයකම ක්‍රීඩකයකුට මාසික වේතනයක් හිමි වන අතර, කණ්ඩායමේ නිලධාරීන්ට ද යම් ගෙවීමක් සිදු කෙරෙන ආකාරයට තනතුරු පත්කොට එය ආසියානු පාපන්දු සම්මේලනයේ 'ක්ලබ් ලයිසන්' අනුමැතියට යටත් කොට ඇත. එලෙස අනුමැතිය හිමි වූ කොළඹ පාපන්දු සමාජය, බ්ලූ ස්ටාර්, ගුවන් හමුදාව (බ්ලූ ඊගල්ස්), යුද හමුදාව (ඩිෆෙන්ඩර්ස්), සී හොක්ස් (නාවික හමුදාව), නිව් යංග්ස්, රත්නම්, රිනවුන්, අප් කන්ට්‍රි ලයන්ස් හා පාණදුර රෙඩ් ස්ටාර් යන ක්‍රීඩා සමාජ තරගාවලියට එක්ව සිටිති.

දිල්ලි උඩ එයි

ශ්‍රේයාස් අයියර්

දහතුන් වැනි අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ තෙවැනි ජය අත් කර ගත් දිල්ලි කැපිටල්ස් කණ්ඩායම තරග 16ක් නිමා වෙද්දී ප්‍රසාද ලකුණු සටහනේ පෙරමුණ ගැනීමට සමත් වෙයි.

කොල්කටා නයිට් රයිඩර්ස් පිල සමඟ සාජාහිදී පැවැති තරගයේදී දිල්ලි පිල ලකුණු 18ක ජයක් හිමි කර ගත්තේය. තරගයේ පළමුව පන්දුවට පහර දෙමින් දිල්ලි පිල දුන් ලකුණු 229ක ඉලක්කය හමුවේ කොල්කටා පිලට ඕවර 20 අවසානයේ රැස් කළ හැකි වූයේ ලකුණු 210ක් පමණි.

නිතිෂ් රානා පන්දු 35කින් ලකුණු 58ක්, ඔයින් මෝගන් පන්දු 18කින් ලකුණු 44ක් සහ රාහුල් ත්‍රිපාටි පන්දු 16කින් ලකුණු 36ක් කොල්කටා ඉනිමට එක් කළ ද කණ්ඩායම ජයග්‍රහණය කරා ගෙන යෑමට නොහැකි විණි. පන්දු යැවීමේදී ඇන්රිච් නෝර්ට්ජ් කඩුලු 3ක් බිඳ දැමීමේය.

නායකත්වයේ ඉනිමක් දියත් කළ ශ්‍රේයාස් අයියර් පන්දු 38කින් නොදැවී ලකුණු 88ක් රැස් කරමින් දිල්ලි ඉනිමේ වැඩිම ලකුණුලාභියා විය. හතරේ පහර 7කින් සහ හයේ පහර 6කින් ඉනිම වර්ණවත් කර ගත් ඔහු තරගයේ වීරයා ලෙස ද නම් කෙරිණි. ඉනිමට සාර්ථක ආරම්භයක් දුන් ප්‍රිත්වි ෂෝ ලකුණු 66ක් ඉනිමට එක් කළේය.

බැංගලෝර්ට තෙවැනි ජය

ඉසුරු උදාන නියෝජනය කරන රෝයල් චැලෙන්ජර්ස් බැංගලෝර් පිල මෙවර තරගාවලියේ තෙවැනි ජය වාර්තා කළේ රාජස්ථාන් රෝයල්ස් කණ්ඩායම කඩුලු 8කින් පරාජය කරමිනි.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් රාජස්ථාන් පිල ලකුණු 154කට සීමා කළ බැංගලෝර් ක්‍රීඩකයෝ පන්දු 5ක් ඉතිරිව තිබියදී ජය හිමි කර ගත්තේ කඩුලු 2ක් පමණක් අහිමි කර ගනිමිනි.

අයිපීඑල් තරග බිමේ ඉනිම 8කට පසු අර්ධ ශතකයක් වාර්තා කළ විරාට් කෝලි බැංගලෝර් කණ්ඩායමේ ජයග්‍රහණයේ නියමුවා විය. පන්දු 53කට මුහුණ දුන් ඔහු හතරේ පහර 7ක් සහ හයේ පහර 2ක් ඉනිමට එක් කර ගත්තේය. දෙවිදත් පඩික්කාල් හතරේ පහර 6ක් සහ හයේ පහරක් සමඟින් පන්දු 45කින් ලකුණු 63ක් ඉනිමට එක් කළේය.

මහිපාල් ලොම්රෝර් පන්දු 39කදී හතරේ පහරක් සහ හයේ පහර 3ක් සමඟ ලකුණු 47ක් රැස් කරමින් රාජස්ථාන් ඉනිමේ වැඩිම ලකුණුලාභියා වූ අතර, පන්දු යැවීමේදී යුස්වෙන්ද්‍ර චාහල් ලකුණු 24කට කඩුලු 3ක් දවා ගනිමින් තරගයේ වීරයා විය. ඉසුරු උදාන ලකුණු 41කට කඩුලු 2ක් බිඳ දැමීමේය.

පුත්තලමෙන් කබඩි විරෝධයක්

වයඹ පළාත් වෙරළ කබඩි තරග ප්‍රකාශිත නීතිරීති යටතේ නොපවත්වා නිලධාරින්ගේ අභිමතය මත පැවැත්වීමට පියවර ගැනීම හේතුවෙන් තරගාවලියට එක්වීමට පැමිණි පුත්තලම දිස්ත්‍රික් පිරිමි හා කාන්තා කණ්ඩායම් දෙක ඊට අකැමැත්ත පළ කරමින් පසුගිය සිකුරාදා (2දා) විරෝධතාවක් පැවැත්වූහ.

වයඹ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ සංවිධානයෙන් මේ තරගාවලිය හලාවත මුහුදු වෙරළේදී පැවැත්වීමට පියවර ගෙන තිබිණි.

පළාත් ක්‍රීඩා තරගාවලියක් ලෙස පැවැත්වීමට පියවර ගෙන තිබුණ ද පුත්තලම දිසාවෙන් එක් කාන්තා කණ්ඩායමක් සහ පිරිමි කණ්ඩායමක් පමණක් ඊට එක්වීමට පැමිණ සිටි අතර, කුරුණෑගල දිසාවෙන් කාන්තා සහ පිරිමි කණ්ඩායම් 6 බැගින් මේ තරගාවලියට එක් කර තිබිණි.

වයඹ පළාතට පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික් දෙක ඇතුළත් වන අතර, ඒ අනුව එක් කණ්ඩායමක් බැගින් පිරිමි හා කාන්තා කණ්ඩායම් හතරක් පමණක් පැමිණිය යුතු වුවත් කුරුණෑගල දිසාවෙන් කණ්ඩායම් 12ක් එක් කර ගැනීම අසාධාරණ බැවින් තමන් මේ තරගාවලිය වර්ජනය කරන බව පවසමින් පුත්තලම ක්‍රීඩක ක්‍රීඩිකාවෝ තම විරෝධය ලිඛිතව ඉදිරිපත් කර විරෝධතාවක් ද පැවැත්වූහ.

"මෙවර තරගාවලිය කුරුණෑගල කණ්ඩායම්වලට විශේෂත්වයක් දක්වමින් සංවිධාන කිරීම හේතුවෙන් තරග සංවිධායකයන්ට විරෝධය පළ කරමින් අප තරගාවලියට එක් නොවුණා. අපේ විරෝධය ලිඛිතව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ද බාර දීමට අප කටයුතු කළා" පුත්තලම දිසා පිරිමි කබඩි කණ්ඩායමේ නායක රෝෂාන් සම්පත් පැවැසීය.

කුරුණෑගලින් පැමිණි කණ්ඩායම් 12ට එක් ක්‍රීඩකයකුට ආහාර හා ගමන් ගාස්තුව ලෙස රුපියල් 650 බැගින් මුදලක් ද ගෙවූ අතර, එලෙස මුදල් ගෙවීම මුදල් අපතේ යැවීමක් බවත් පුත්තලම ක්‍රීඩකයෝ පෙන්වා දුන්හ. තරග වර්ජනය කළ බැවින් තමන්ට කිසිදු දීමනාවක් නොලැබුණු බවත් කී ඔවුන් ශ්‍රී ලංකා කබඩි සම්මේලනය විසින් තාවකාලිකව කබඩි ක්‍රීඩා කටයුතු තහනම් කර ඇති ක්‍රීඩා නිලධාරියකු මේ තරගාවලිය සංවිධාන කිරීම ද නීති විරෝධි බව කියති.

වයඹ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් නයනා කාරියවසම් මහත්මියගෙන් කළ විමසීමකදී ඇය පැවැසුවේ කලින් මේ තරග දිසා මට්ටමින් පැවැත් වුවද මේ වසරේ කොරෝනා හේතුවෙන් දිසා තරග නොපවත්වා පළාත් මට්ටමින් පමණක් තරග පැවැත්වීමට අමාත්‍යාංශය නියෝග කළ බැවින් තරගාවලිය පැවැත්වීමට පියවර ගත් බවත් ඒ අනුව තරග සංවිධාන කළ බවත්ය.

සටහන හා ඡායාරූපය
මුන්නේශ්වරම සමූහ
ඊ.සී. ප්‍රනාන්දු

සිමෝනාට අනපේක්ෂිත පරාජයක්

ප්‍රංශ විවෘත ටෙනිස් ශූරතාවලියේ සිවුවැනි වටයේදී පෝලන්තයේ 19 හැවිරිදි යොවුන් ක්‍රීඩිකා ඉගා ස්වියාටෙක් හමුවේ ලකුණු 6-1ක් සහ 6-2ක් ලෙස අනපේක්ෂිත පරාජයක් අත්විඳීමට ලෝක කාන්තා ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණේ පසුවන රුමේනියානු ක්‍රීඩිකා සිමෝනා හැලෙප්ට සිදු විය.

ශ්‍රේණිගත කිරීම්වල 58 වැනි තැන පසුවන පෝලන්ත ක්‍රීඩිකාව ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතාවලියක අර්ධ අවසන් පූර්ව වටයට පිවිසි පළමු අවස්ථාව මෙය විය.

තම ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතා තරග දිවියේ ලැබූ දරුණුතම පරාජය මෙය බව තරගයෙන් පසුව පැවැති මාධ්‍ය හමුවකදී 29 හැවිරිදි සිමෝනා ප්‍රකාශ කළාය.

2020 ඔක්තෝබර් 05 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

■ ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක, අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය සහ ඥානදාස රම්මුතු - අම්බලන්ගොඩ

'අකුරු පින්කම' පුස්තකාලය විවෘත කරයි

ලෝක ළමා හා වැඩිහිටි දිනයට සමගාමීව බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සමෘද්ධි අංශය මඟින් සංවිධානය කරන ලද සමෘද්ධි එෆ්. එම්. අපූරු අකුරු පින්කම යටතේ ලංකාවේ ප්‍රථම අකුරු පින්කම පුස්තකාලය විවෘත කිරීම පසුගියදා (02) ගාල්ල රංදොඹේ දකුණ සමෘද්ධි නිලධාරි පරිශ්‍රයේදී සිදු විය.

මේ යටතේ ළමා ගිණුම් 100ක් සඳහා පොත් හා ඉතුරුම් කැට දීම, පොත්පත් පරිත්‍යාග භාර ගැනීම, පුස්තකාල සම්බන්ධ සහතික බෙදා දීම, සමෘද්ධි නිලධාරීන්ගේ නව නිපැයුම් හා වෙළෙඳ ප්‍රදර්ශනය සහ පුස්තකාලය විවෘත කිරීම ඇතුළු වැඩසටහන් රැසක් සිදු කෙරිණි.

මේ වන විට 'අකුරු පින්කම' පුස්තකාලයට පොත් දහසක් පමණ නොමිලේ ලැබී ඇති අතර ඒවායේ වටිනාකම ලක්ෂ 05කට අධික බව පුස්තකාලයේ නිර්මාතෘ සමෘද්ධි සමාජ සංවර්ධන සහකාර ජගත් ප්‍රියන්ත ද සිල්වා පැවසීය. පුස්තකාලය විවෘත කිරීම හිටපු ප්‍රධාන අමාත්‍ය හා ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන් විජයලාල් ද සිල්වා මහතා අතින් සිදු විය.

■ බී.ඒ.සී.කේ. බාලසූරිය - ගලෙන්බිඳුණුවැව

අවුරුදු 22ක් සේවය කරලත් ස්ථිර කරලා නෑ

"මේ ආණ්ඩුවෙන් හරි මට සාධාරණයක් වෙයි කියලා හිතනවා"

1998 - 05 - 11 වැනි දින කැකිරාව මධ්‍ය විද්‍යාලයේ ආරක්ෂක නියාමක තනතුරට ස්වේච්ඡාවෙන් බැඳී වසර 20ක් යනතුරුත් සේවය ස්ථිර කර ගැනීමට නොහැකිව තවමත් කැකිරාව මධ්‍ය විද්‍යාලයේම සේවයේ නිරතව ඇති සේවිකාවක් පිළිබඳ කැකිරාවෙන් වාර්තා වේ.

"මම 1997 කැකිරාව පාසලේ මුරකරු වශයෙන් පාසලේ අවශ්‍යතාව මත සේවයට එක් වුණා. මගේ අවංක සේවය හා හොඳ කල්ක්‍රියාව මත විදුහල්පති හා පාසල් සංවර්ධන කමිටුව මාගේ සේවය ස්ථිර කර ගැනීම වෙනුවෙන් අවස්ථා ගණනාවක් සම්මුඛ පරීක්ෂණවලට මා ඉදිරිපත් කළා. එහිදී සියලු සුදුසුකම් සපුරා තිබුණත් මම සේවයේ ස්ථිර නොකර වෙනත් තුන් දෙනකු සේවය ස්ථිර කිරීම පිළිබඳ මා අධ්‍යාපන පරිපාලන නිලධාරිවරියකව සිටි දමයන්ති විජේනායක මහත්මියගෙන් විමසා සිටි අවස්ථාවේ ඇය කියා සිටියේ එවකට ශ්‍රීල.නි.ප. කැකිරාව ආසනයේ සංවිධායකවරයාගෙන් පාක්ෂිකත්වය තහවුරු කර ලිපියක් රැගෙන එන්නේ නම් සේවය ස්ථිර කිරීමට හැකි බවයි. මම ඇතුළු පවුලේ අය පාරම්පරික එක්සත් ජාතික පාක්ෂිකයන් වීම හේතුවෙන් ඒ හැම අවස්ථාවකම මට ලිපිය ලැබුනේ නැත්තේ ඒ හැම අවස්ථාවකදීම පැවති රජය වුයේ නිදහස් පක්ෂය වීමෙන්. අද වන විට මම වසර 22 පුරාවට මෙම පාසලේම සේවයේ නිරත වෙනවා. මම මොන පක්ෂයට මාගේ මනාපය දුන්නත් මම ශ්‍රී ලංකිකයෙක්. මොකද මම මොන පක්ෂයේ වුණත් මම කරන සේවයේ පක්ෂය කෙටිලා තියෙනවාද, නැහැනේ. මේ මට වෙන්නේ ලොකු අසාධාරණයක්. මට පස්සේ බැඳුණු අය අද ස්ථිර කරලා. මට අද වෙන රැකියාවක් කරන්නත් බෑ. නමුත් මම මේ පිළිබඳ දේශපාලන පළිගැනීම් කොමිසමටත් මහජන පෙත්සම්කාරක සභාවටත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආමාත්‍යවරුන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ බලධාරීන් මේ පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කරත් මට සාධාරණයක් තවමත් ඉටු වෙලා නෑ. මම ඉල්ලා සිටින්නේ මේකට සාධාරණයක් මේ අණ්ඩුවෙන්වත් ලැබෙයි කියලා"

■ සී. එම්. ආරියපාල - තඹුත්තේගම

අලුත් විදුහල්පතිගේ රාජකාරියට විශ්‍රාමික විදුහල්පතිගෙන් බාධා

මව්පියෝ පාරට බසිති

තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ තලාව මුදුනේගම මහ විදුහලේ වත්මන් විදුහල්පතිට රාජකාරි කිරීමට විශ්‍රාම ගිය විදුහල්පතිවරයකු ඉඩ නොදීම හේතුවෙන් එම විදුහලේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ මව්පියෝ පසුගියදා (02) තලාව ජයගඟ නොච්චියාගම මාර්ගයේ උද්ඝෝෂණයක නිරත වූහ.

මෙහිදී උද්ඝෝෂකයන් පවසා සිටියේ මුදුනේගම විදුහලේ සේවය කළ විශ්‍රාම ගිය විදුහල්පතිවරයකු වර්තමාන විදුහල්පතිවරයාට බලපෑම් එල්ල කරන බවත් විදුහලේ පසුගිය කාලයේ ආපනශාලාවේ සිදු වී ඇතැයි කියනා වංචා පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කරන ලෙසත් වත්මන් විදුහල්පති සම්බන්ධයෙන් පළ වී ඇතැයි කියනා මාධ්‍ය වාර්තා අසත්‍ය බවත්ය. පැයක පමණ කාලයක් මෙම උද්ඝෝෂණය පැවැත්වීම හේතුවෙන් ගමනාගමනයට බාධා එල්ල වී ඇති අතර තලාව පොලිස් ස්ථානයේ නිලධාරීහු පැමිණ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන බවට පොරොන්දු දී උද්ඝෝෂකයන් විසිර යැවූහ.

■ සීගිරිය විශේෂ

සමෘද්ධි නියාමක යුවළක් සමෘද්ධිලාභීන්ගේ මුදල් කොල්ල කාලා

සමෘද්ධි සංවර්ධන නිලධාරි යුවළක් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවගෙන් විශාල වශයෙන් සමෘද්ධි ව්‍යාපාරය පාවාදී මුදල් වංචා කරමින් තවමත් රැකියාවේ නිරතව සිටිනා බවට ප්‍රදේශවාසීහු පවසති.

ගලේවෙල සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා සමෘද්ධිලාභීන් සහ මධ්‍යම පාන්තික පවුල් රැසක් සඳහා ත්‍රිරෝද රථ දෙන බව පවසමින් මුදල් ගැනීම, කිරි ගවයන් දෙන බව පවසා විශාල ලෙස ජනතාව රවටා මුදල් එකතු කිරීම සිදු කරගෙන යන බවත් ඔහුගේම බිරිය ගෑස් සිලින්ඩර් සහ ගෑස් උදුන් දෙන බව ප්‍රකාශ කරමින් මුදල් ගෙන ඇති බවට ද ජනතාව පෙන්වා දෙති. ප්‍රදේශවාසීහු තමන්ට සිදුව ඇති අසාධාරණය පිළිබඳ දඹුල්ල පොලිස් අධිකාරි කාර්යාලයේ සිට දැනුම් දිය යුතු සෑම ආයතනයකටම ලිඛිතව සහ වාචිකව දැනුම් දී ඇතැයි ඔවුහු කියති. එහෙත් මේ බව කිසිදු අයකුගේ අවධානකට යොමු නොවී ඇති බවත් මෙම සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වන ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ නිලධාරිනියක මේ බව මාධ්‍යයෙන් වසන් කිරීමට උත්සාහ දරන බව ද මුදල් අසාධාරණයට ලක් වූවෝ පවසති.

ගලේවෙල සමෘද්ධි බැංකු සංගමයට අයත් සමෘද්ධි නියාමක එස්. ඒ. ගස්සාලි නමැති සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයාගෙන් අසාධාරණයට ලක් වූ කිහිප දෙනකු හමු වීම සඳහා අපි ගලේවෙලට ගියෙමු.

ගලේවෙල ගලපාමුල ප්‍රදේශයේ පදිංචි ඩබ්ලිව්. ජී. ප්‍රේමාවතී මහත්මිය එහිදී මෙසේ පැවසීය.

"මම කුඩා දරුවන් සමඟ ජීවත් වුණු කෙනෙක්. මම සමෘද්ධියෙන් තමයි ජීවිතය ගොඩනඟා ගත්තේ. මම ගේ හදාගත්තේ, පොඩ්වට ගොවිතැනක් කළේ, ඒ ගොවිතැන් කරලා වෙළෙඳාම් කළේ ඔක්කොම සමෘද්ධියේ උදවු උපකාර ඇතිව. එහෙම ඉද්දි තමයි සමෘද්ධි නියාමක මහත්තයා අපේ ගෙදරට ඇවිල්ල කිව්වේ අපේ එළවළු ටික විකුණගන්න පුළුවන් ආකාරයට ත්‍රිරෝද රථයක් දෙන්න තීරණය කරලා තියෙනවා ඒ සඳහා ලක්ෂ එකහමාරක මුදලක් දෙන්න කියලා."

"අපේ පුතාගේ ඉඩම් කැල්ලක් උකස් කරලා මම එයාට සල්ලි දුන්නා. අන්තිමට බලපුවම ත්‍රීවීල් රථයක් නෑ, සල්ලිත් නෑ. තනිකරම බොරු කරලා තියෙන්නේ. මේක හොයල බලන්නවත් ගියේ නැහැ මොකද සමෘද්ධි නිලධාරීන් අපට කවදාවත් බොරු කරලා නැති නිසා. ඒ සමෘද්ධි නියාමකගෙ නෝනත් මේ විදිහටම අපේ පැත්තේ ගෑස් උදුන් සහ ගෑස් ටැංකි දෙනවා කියලා මුදල් අරගෙන ගිහිල්ලා කියලා අපට ආරංචියි. වෙන මොනවත් අපි ඉල්ලන්නේ නෑ සමෘද්ධි වැඩසටහන යටතේ මේ කරපු අපරාධය වහාම හොයල බලල අපෙන් ගත්තු සල්ලි ටික අරන් දෙන්න කියලයි ඉල්ලන්නේ."

ගලේවෙල ප්‍රදේශයේ පදිංචි අපල් ඉක්බාල් මහතා,

"මම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ කම්කරු වැඩ කරන්නේ. සමෘද්ධියත් අපට තියෙනවා. මේ සමෘද්ධි නියමක මහත්තයත් එයාගේ බිරියත් මාරුවෙන් මාරුවට අපේ වසම්වල සමෘද්ධි නියාමක හැටියට කටයුතු කළා. මට දවසක් කිව්වා ත්‍රිරෝද රථයක් අසරණ පවුලකට දෙනවා රජයෙන්, ඒක රුපියල් ලක්ෂ දහයක් පමණ වෙනවා භාර ලක්ෂ හැත්තෑපන්දහසක් රජයට දෙන්න ත්‍රිරෝද රථය දෙන්න පුළුවන් මේක කාටවත් කියන්න එපා කියලා. පස්සේ අපේ නෝනගෙ රත්තරන් බඩු ගෙදර වෙන වෙන තිබුණු බඩු උකස් කරලා පංගුවක් ඒවා විකුණලා රුපියල් භාර ලක්ෂ 75,000ක මුදලක් එයාට දුන්නා. මට එයා ලිපියකුත් දුන්නා රජයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නේ කියලා. එයාගේ රාජකාරි සීල් එකකුත් ගැහුවා. අන්තිමට බලපුවම මට හොර වැඩක් කරල තියෙන්නෙ කියලා පස්සෙ තමයි දන්නෙ."අප මේ පිළිබඳව මාතලේ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ රියාල් ඩීන් මහත්මියගෙන් විමසීමේදී කියා සිටියේ මේ එක නිලධාරියකු ගැන පමණක් පැමිණිලි ලැබී ඇති බවත් එම නිලධාරියා ගැන පරීක්ෂණයක් පවත්වන්නට උපදෙස් දී ඇති බවත්ය. ඔහුගේ වැඩ තහනම් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට දන්වා යවා ඇති බවත් වැඩිදුරටත් කියා සිටියේය.

■ කළුතර අතිරේක සමූහ

ආමි නිලන්තගේ ගෝලයන් තිදෙනෙක් අත්අඩංගුවට

යාගොඩමුල්ල ප්‍රදේශයේදී විදේශීය රටක නිෂ්පාදිත ගිනිඅවි දෙකක්, හෙරොයින් ග්‍රෑම් 2 මිලිග්‍රෑම් 20ක් සමඟ සැකකරුවන් තිදෙනකු අත්අඩංගුවට ගැනීමට පසුගියදා මිනුවන්ගොඩ පොලීසිය සමත් වී තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ දිලීප, විජේසිංහ හා ජගත් නමැති දෙමටගොඩදී බන්ධනාගාර බස් රථයකට වෙඩි තැබීමේ සිද්ධියේ සැකකරුවකු වන ආමි නිලන්ත නමැත්තාගේ ගෝලයන් තිදෙනෙකි. සැකකරුවන් රඳවුම් නියෝග මත වැඩිදුර ප්‍රශ්න කිරීම් සිදුකර පසුගියදා (30) මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත බස්නාහිර උතුර භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ, ගම්පහ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඉන්දික ද සිල්වා, සහකාර පොලිස් අධිකාරි i තුසිත කුමාර යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් මිනුවන්ගොඩ පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රොෂාන් මහේෂ්, උ.පො.ප. මැදගම පො.සැ. (53523) බණ්ඩාර, පො.කො. වරුන් වන (73170) රාජපක්ෂ, (32834) බුද්ධික, (94052) සෙනෙවිරත්න යන මහත්වරු වැටලීමට එක් වූහ.

■ ඊ. සී. ප්‍රනාන්දු - මුන්නේශ්වරම සමූහ

නොච්චියාගම කේරළ ගංජා ජාවාරමක සුලමුල හෙළිවේ

නොච්චියාගම නගරය කේන්ද්‍ර කරගෙන පවත්වාගෙන ගිය මහා පරිමාණ කේරළ ගංජා ජාවාරමක් අනාවරණය කරගෙන එම ජාවාරමේ නිරත වූ තිදෙනකු හා කේරළ ගංජා තොගයක් අත්අඩංගුවට ගැනීමට පුත්තලම පොලිස් විශේෂ ප්‍රහාරක බළකාය පෙරේදා (03) සමත් වී තිබේ.

හදිසියේ ලැබුණු තොරතුරක් මත පුත්තලම පොලීසියේ සහාය ඇතිව පුත්තලම කලපු ඉවුරේදී වාහනයකින් ගෙන ආ කේරළ ගංජා කිලෝවක් සමඟ එක් පුද්ගලයකු අත්අඩංගුවට ගෙන තිබේ. ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී තමන් මෙම ගංජා නොච්චියාගම ප්‍රදේශයේ අයකුගෙන් මිල දී ගෙන හලාවත ප්‍රදේශයේ අයකුට අලෙවි කිරීමට ගෙන යමින් සිට බවට අනාවරණය වී ඇත.

සැකකරුගේ එම ප්‍රකාශය අනුව විශේෂ බළකායේ නිලධාරීන් වහාම නොච්චියාගම ප්‍රදේශයට ගොස් පුත්තලමේදී අත්අඩංගුවට ගත් සැකකරුට කේරළ ගංජා අලෙවි කළ මහා ජාවාරම්කරු ද අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරුවන් හා අත්අඩංගුවට ගත කේරළ ගංජා කිලෝ 2 මිලිග්‍රෑම් 650ක් නඩු පැවරීමට පුත්තලම පොලීසිය වෙත භාර දී තිබිණි.

■ ඒ. ඒ. එල්. ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

ගලේවෙල වාහනවල කෑලි අතුරුදන්

රාත්‍රී කාලයේ නිවාස පරිශ්‍රයන්ට හොර රහසේ ඇතුළු වී නවතා ඇති වාහනවල කොටස් ගලවාගෙන යන කල්ලියක් පිළිබඳ ගලේවෙල පොලිස් බල ප්‍රදේශයෙන් අනාවරණය වේ. මෙවැනි සිදුවීම් දෙකක් පසුගිය පසළොස්වක පෝදා (01) රාත්‍රියේදී ඒ - 6 මාර්ගයේ තොලඹුගොල්ල සහ තලකිරියාගම පෙදෙස්වලදී සිදු වී ඇති බව පොලීසියට පැමිණිලි ලැබී තිබිණි.

නතර කර දමා ඇති මෙම වාහනයන්හි ඉදිරිපස ඇති සියලුම කොටස් සොරුන් විසින් ගලවාගෙන යෑම සිදු කරනා අතර මෙම සොරකම් සම්බන්ධයෙන් මෙතෙක් කිසිවකු අත්අඩංගුවට ගැනීමට නොහැකි වී ඇති අතර ගලේවෙල පොලීසිය මඟින් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ චන්දන ජයවීර - හැටන් සමූහ

ලේ දන් දීමේ පින්කම

නාවලපිටිය ජේතවනාරාම විහාරස්ථානයේ වැඩ සිට අපවත් වී වදාළ ගන්හතේ පේමවංශ නාහිමිපාණන් වහන්සේගේ තුන් මාසයේ දානමය පින්කම නිමිත්තෙන් පසුගියදා (01) නාවලපිටිය නෙර්තාභිෂේක කලායතනයේදී ලේ දන් දීමේ පින්කමක් පැවැත්විණි. මෙහිදී නෙර්තාභිෂේක කලායතනයේ ගුරුවරුන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ප්‍රදේශවාසීහු විශාල පිරිසක් ලේ දන් දීම සඳහා සහභාගි වී සිටියහ. මේ පින්කම සඳහා දික්ඔය සහ රිකිල්ලගස්කඩ මූලික රෝහල්වල වෛද්‍යවරුන් හා හෙද කාර්ය මණ්ඩලය සහභාගි වී සිටියහ.

■ ප්‍රාර්ථනා ලියනගේ - හිනිඳුම සමූහ

නිල්වලා ජාතික විද්‍යා පීඨයේ ලෝක ළමා දින සැමරුම

නිල්වලා ජාතික විද්‍යා පීඨය මඟින් සංවිධානය කරනු ලැබූ ලෝක ළමා දින සැමරුම් උලෙළක් අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදි. එහිදී නිල්වලා ජාතික විද්‍යා පීඨයේ පළමු වසර ගුරු ශික්ෂණලාභීන් විසින් නර්තනයන් ඉදිරිපත් කෙරිණි. නිල්වලා පීඨාධිපති වී. පී. ආර්. ගුණවර්ධන මහත්මිය ඇතුළු කථිකාචාර්ය මණ්ඩලය හා විද්‍යා පීඨයේ ගුරු අභ්‍යාසලාභීන් විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදි.

■ තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

ගරාඬුව කලපුව සහ ඇළ සංවර්ධනයට පියවර

වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගරාඬුව කලපුව සහ ඇළ මාර්ගය, ධීවර අමාත්‍යාංශයේ කලපු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිරි මාස තුන ඇතුළත සංවර්ධනය කිරීමට පියවර ගන්නා බව විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකර මහතා පැවසීය.

ඒ මහතා මේ බව පැවසුවේ වැලිගම - ගරාඬුව කලපුව සහ ඇළ මාර්ගය සංවර්ධනය කිරීමේ පළමු අදියරේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීම වෙනුවෙන් පසුගියදා (02) එහි නිරීක්ෂණ චාරිකාවකට සහභාගි වූ අවස්ථාවේදීය. ඒ සඳහා රුපියල් ලක්ෂ 68ක මුදලක් වෙන්කර ඇති බව ද ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

කලපුව සංවර්ධනය කිරීමෙන් පසු ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ මිරිදිය මත්ස්‍ය වගාව සිදු කිරීමට නියමිතය. වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පකුමාර බැට්ටගේ මහතා ඇතුළු ප්‍රදේශයේ ජනතා නියෝජිතයන් සහ ප්‍රදේශවාසීහු පිරිසක් ද එම අවස්ථාවට සහභාගි වී සිටියහ.

■ ඒ.පී. සමරවික්‍රම - මැදමුලන සමූහ

මුල්ගිරිගල අලුත් සහල් මංගල්‍යදා

වීරකැටිය ගොවිජන සේවා බල ප්‍රදේශයේ වී අස්වැන්න නෙළාගත් ගොවි ජනතාව විසින් සිය අස්වැන්නෙන් ලබාගත් පළමු කොටස බුදු සසුනට පූජා කිරීම හෙවත් අලුත් සහල් මංගල්‍යය මුල්ගිරිගල රාජමහා විහාරස්ථානයේදී පසුගියදා පැවැත්විණි. මෙහිදී ජනතාව සිය අලුත් සහල් පෙරහරකින් විහාරස්ථානයට ගෙනවිත් විහාරස්ථානයේ උඩමළුවේ සකස් කර තිබූ විශේෂ ඉපැරණි තඹ පාත්‍රයට පුරවන ලදී. උඩමළුවේ මෙම අලුත් සහල් මංගල්‍යය මෙවර පැවැත් වූයේ ප්‍රථම වතාවටය.

මුල්ගිරිගල රාජමහා විහාරය රම්බා රාජමහා විහාරය යන විහාරස්ථානයන්හි විහාරාධිපති මාතර හම්බන්තොට දෙපළාතේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය බෙලිගල්ලේ සරණපාල හිමියන්ගේ ප්‍රධානත්වයෙන් මෙම උත්සවය පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා මුල්ගිරිගල මහා විද්‍යාලයේ ආචාර්ය පූජ්‍ය මැදගොඩ සිරිනිවාස කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක කිරම සුමන හිමි ඇතුළු ස්වාමීන් වහන්සේලා සහ බැතිමත්හු විශාල පිරිසක් එක්ව සිටියහ. වීරකැටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සඳහා දායකත්වය දක්වා තිබිණ. මෙහි දැක්වෙන්නේ බෙලිගල්ලේ සරණපාල හිමි ඇතුළු ස්වාමීන් වහන්සේලා අලුත් සහල් පාත්‍රයට පුරවන අයුරුයි.

■ එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

යුරෝපා සංගමයේ තානාපති දකුණේ ආණ්ඩුකාර හමුවෙයි

ශ්‍රී ලංකාවේ යුරෝපා සංගමයේ තානාපති ඩැනිස් චයිබි (DENIS CHAIBI) මහතා පසුගියදා (29) ගාල්ල ලබුදූව දක්ෂිණපාය ගොඩනැඟිල්ලේදී දකුණු පළාත් ආණ්ඩුකාර ආචාර්ය විලී ගමගේ මහතා හමු වී සුහද සාකච්ඡාවක නිරත විය. සංචාරක ගමනාන්තයක් වශයෙන් ගාල්ල නගරයේ ඇති වැදගත්කම තම අවධානයට ලක් වූ බව එහිදී පැවසූ ඩැනිස් මහතා යුරෝපයේ ගස්වලින් වටවූ උස් කඳු ප්‍රදේශ ඇති නිසා යුරෝපීය සංචාරකයන් වැඩි කැමැත්තක් දක්වන්නේ වෙරළ තීරය සහිත තැනිතලා බිම්වල සංචාරය කිරීමට බවත් ඒ සඳහා සුදුසු පරිසරයක් දකුණු පළාතේ ඇති නිසා එම ප්‍රදේශ තව තවත් දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කරන ලෙස දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලා සිටින බවත් කීය. මෙම සාකච්ඡාවට දකුණු පළාත් ආණ්ඩුකාරවරයාගේ ලේකම් දිලේබා කුඩවිව් මහත්මියද සහභාගී වූවාය. සාකච්ඡාව අවසානයේ දෙදෙනා අතර සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය.

දිනමිණ දිසත දස අත ම එක තැන

■ රසුල දිල්හාර ගමගේ -උතුරු පළාත් විශේෂ

විල්පත්තුවේ අක්කර 115ක් මගේ

පුද්ගලයෙක් වන උයනේ පාලක හමුවට ඇවිත්

විල්පත්තු ජාතික වනෝද්‍යානය තුළ තම ඉඩම් ඇති බව කියමින් විශාල පිරිසක් ඉඩම් බලපත්‍රද රැගෙන මේ දිනවල විල්පත්තුවට පැමිණෙන්නට පටන් ගෙන තිබේ. අක්කර 115ක ඉඩමක් තමන් සතුව ඇති බව කියමින් එක් පුද්ගලයකුද තවත් අක්කර 2ක් හිමි අයකුද ඔවුන්ට නිකුත් කළ බලපත්‍ර සමඟ විල්පත්තු ජාතික වනෝද්‍යානයේ පාලකවරු හමුවට පැමිණ තොරතුරු ඉදිරිපත් කොට ඇතැයි විල්පත්තු ජාතික වනෝද්‍යාන පාලක චමත් ලක්ෂ්මන් පෙරේරා මහතා පැවැසීය.

මීට අමතරව විල්පත්තු ජාතික වනෝද්‍යානය තුළ හා ඉන් පිටත ඉඩම්වලට අයිතිවාසිකම් කියමින් පැමිණෙන පිරිස වැඩිවෙමින් පවතින බවත් එම ඉඩම් සඳහා විවිධ වර්ගයේ බලපත්‍ර ඔවුන් විසින් රැගෙන එන බවත් වනෝද්‍යානයේ නිලධාරීහු පවසති. නමුත් එම ඉඩම් සඳහා ඇති බලපත්‍ර පිළිබඳ විශාල සැකයක් ඇති බවත් ත්‍රස්තවාදී කලබල සමයේ විල්පත්තුවේ ඉඩම් අතහැර ගිය පිරිසට වෙනත් පළාත්වලින් ආදේශක ඉඩම් ලබා දීමේ පදනම මත ඔවුන්ට ඉඩම් හිමිව තිබීමත් නිසා විල්පත්තුවේ අයිතිය කියා සිටින ඉඩම් ඔවුන්ට ලබා දීමේ අවශ්‍යතාවක් නැතැයි විල්පත්තු ජාතික වනෝද්‍යානයේ නිලධාරීහු කියා සිටිති.

■ ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

මොනරාගල බුකියට පැන විසිඅට දහසකට විදලා

මොනරාගල නගරයේ පිහිටි රේස් බයි රේස් මධ්‍යස්ථානයට පැන්න පුද්ගලයකු පසුගියදා (29) සවස එහි ගිය අයෙකුට පහරදී ඔහු ළඟ තිබූ රුපියල් විසි අටදහස් භාරසියයක් කොල්ල කා ඇතැයි මොනරාගල පොලිසිය ප්‍රකාශ කළේය.

මොනරාගල හුලංදාව අක්කර 26 පදිංචි ව්‍යාපාරිකයකු රේස් බුකියට ගිය අවස්ථාවේදී ඉන්දික නමින් හඳුන්වන පුද්ගලයකු ඔහු අසලට පැමිණ පහරදී සාක්කුවේ තිබූ මුදල් මංකොල්ල කා පලාගොස් ඇත. සිද්ධිය පිළිබඳව මොනරාගල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

■ බලපිටිය සමූහ - දිලිප් නිශ්ශංක

පියගම පොදු ගොඩනැඟිලි විනාශ මුඛයේ

කොස්ගොඩ පියගම ආදර්ශ ගම්මානය ඒ සියලු පොදු ගොඩනැඟිලි මේ වන විට විනාශ වීම පිළිබඳව රජයට දන්වා පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා යැයි බලපිටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිලන්ත ද සොයිසා මහතා මෙවර බලපිටිය ප්‍රාදේශීය සභා රැස්වීමේදී පැවසීය. සභාපති සමන් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් බලපිටිය ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී ඉකුත්දා මෙම රැස්වීම පැවැත්විණි. වැඩිදුරටත් කතා කළ නිලන්ත මහතා දිවංගත රණසිංහ ප්‍රේමදාස මහතා 1985දී පියගම ආරම්භ කළත් පොත් කර්මාන්ත ශාලාවක් කෞතුකාගාරයක් නිවාස සංවර්ධන අධිකාරියේ කාර්යාලයක් මේ වන විට විනාශ වෙලා. අපි මේ පිළිබඳව මීට පෙර ප්‍රාදේශීය සභාවට යෝජනා ඉදිරිපත් නොකළේ රණසිංහ ප්‍රේමදාස මහතාගේ පුතා වන සජිත් ප්‍රේමදාස මහතා මේ ගම්මානයට සේවයක් කරයි කියලා හිතලා. එතුමා පසුගිය රජයේ නිවාස ඇමතිකම භාරගන්නා විට අප බය වුණා. බලපිටියේ එකම ජන්දයක් වත් අපට නොලැබෙයි කියලා. නමුත් එතුමා පියගම ඇති කරපු පියගම පිළිබඳවත් අවධානය යොමු නොකිරීම ගැන කනගාටු වෙනවා. මේ ගොඩනැඟිලි ප්‍රයෝජනවත් දෙයකට යොමු යොදවන ලෙස ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිලන්ත ද සොයිසා මහතා කීය.

■ සනත් ගමගේ - ලුණම සමූහ

ලුණමට පැමිණි වන අලි වගාවන් විනාශ කරලා

පසුගියදා ලුණම ප්‍රදේශයට පැමිණ සිටි වන අලියා එම ප්‍රදේශයේ පොල් ඉඩම් කිහිපයකට ඇතුළු වී පැළ පොල් වගාවන් විනාශ කර ඇති බව පොල් වගාකරුවෝ පවසති.

හම්බන්තොට සිට අම්බලන්තොට උසන්ගොඩ කලමැටිය අභය භූමිය දක්වා පැමිණෙන වන අලින් මෙලෙස වැලිපටන්විල, ලුණම, කිවුල, ගල්මුල්ල, හාතාගල, තුඩුව යන ගම්මානවලට පැමිණ එම ගම්මානවල පොල්, කෙසෙල්, වී වගාවන් ඇතුළු වගා වන් විනාශ කරමින් දින කිහිපයක් රැඳී සිට වන ජීවී නිලධාරීන් පැමිණ අලි වෙඩි ගසා වන අලියා පලවා හැරීම සිදු කළත් නැවත නැවතත් පැමිණෙන බවද ජනතාව කියති.

මේ පිළිබඳව අදහස් දැක්වූ ඉඩම් හිමියකු වන ජයන්ත ප්‍රනාන්දු මහතා,

"මෙම වන අලින් වාර කිහිපයක් මෙම ප්‍රදේශවලට ආවා. සමහරක් විට කණ්ඩායම් විදියටත් එනවා. කලමැටිය අභය භූමියේ උස්සන්ගොඩ අභය භූමියේ රැඳිලා තමයි මොවුන් මේ ගම්වල ඇති වගා ඉඩම්වලට එන්නේ. මගේ ඉඩමේ ඇති පොල් ගස් 14ක් වාර කිහිපයකදී අලින් විනාශ කරා. වැටට දමා තිබූ කොන්ක්‍රීට් කණු කඩා බිඳ දැම්මා. මෙම වන අලින් පැමිණි අවස්ථාවේ ඉඳලා අලින් එලවන්න වනජීවී අය විශාල වෙහෙසක් දරනවා. අපි කියන්නේ මෙම ප්‍රදේශවලට අලින් පැමිණීමේ මංකඩවල්වලට මොනවහරි පියවරක් ගන්න කියලා. ජීවිත හානියක් වෙන්න පුළුවන් අවස්ථාව ඉතා වැඩියි. මගේ පොල් ගස් සහ අනිත් දේපළවලට වෙච්ච හානිය සම්බන්ධව කවුරුවත් බලධාරියෙක් සොයන්න බලන්න මෙතෙක් ආවේ නැහැ."

■ චන්ද්‍රතිලක රත්නායක - ඉබ්බාගමුව විශේෂ

මූකලන්යාය පාර අබලන්, හදමුද?

අපි බලමු

මහ මූකලන්යාය පේද්දව හරහා හිරිපිටියතෙක් දිවෙන බස් රථ ධාවන මාර්ගයේ මහ මූකලන්යාය තක්සලා මහා විද්‍යාලය ආසන්නයේ ඇති පාලම අසල විශාල ප්‍රමාණයේ වළක් හෑරී ජලාශයක් බවට පත්ව තිබේ. ඒ සමගම පාලම දෙපස මානා ගොල්ලකින් වැසී තිබීමත් හේතුවෙන් රථ වාහන ගමනාගමනයට ද මහත් බාධාවක් වී ඇත. ඉළුක් පදුරු පාරට වැටීම නිසා එන යන වාහන ඉළුක් පදුරුවලට මුවාවන බැවින් ඉදිරි පසින් එන වාහන පෙනේන්නේ නැතැයි පවසන රියැදුරෝ එය අනතුරුදායක බව පෙන්වා දෙති.

■ පී.ජී. ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

රෝහලට ස්ථිර රසායනාගාර තාක්ෂණ නිලධාරියකු ඕනෑ

මාදිපොළ ප්‍රාදේශීය රෝහලේ රසායනාගාරයේ සේවය කිරීම සඳහා ස්ථිර වෛද්‍ය පරීක්ෂණ තාක්ෂණ නිලධාරියෙකු (එම්.එල්.ටී) නොමැති වීම නිසා තමන් දැඩි අපහසුතාවට පත්වී සිටින බව රෝගීහු පවසති.

දැනට එහි සේවය කරනු ලබන්නේ නාලන්ද රෝහලේ සේවය කරන වෛද්‍ය පරීක්ෂණ තාක්ෂණ නිලධාරියාය. ඔහු අදාළ වෘත්තියේ යෙදීමට මාදිපොළ රෝහලට පැමිණෙන්නේ සතියේ සදුදා හා බදාදා දිනවල පමණි. සතියේ අන් දිනවල රසායනාගාර සේවය ලබා ගැනීමට පැමිණෙන සියගණනක් රෝගීන්ට හිස් අතින් යෑමට සිදුවී ඇත. ඇතැම් රෝගීන්ට ඉතා අධික මුදලකට එම සේවය පෞද්ගලික ආයතනයකින් ලබා ගැනීමට සිදු ව ඇත.

■ කේ. ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

වළලා ගොඩ ගන්න හැදූ හුනියම සී.සී.ටී.වී කැමරාවේ

දෙයියෝ සාක්ෂි

බිරියගේ කල්ගත වූ රෝගක් සුව නොවීම හේතුවෙන් යකැදුරුකමක් කර ගැනීමට ගිය නිවෙස් හිමියාට හුනියමක් කර ඉඩමේ වළ දමා ඇති බව පැවසූ දේවාලයේ කතක් රාත්‍රී කාලයේ හොර රහසේ ඉඩමට පැමිණ හුනියමක් නිවෙස ඉදිරිපිට වළ දමා යන ආකාරය නිවෙසේ සවිකර තිබූ ආරක්ෂිත කැමරා පද්ධතියේ සටහන්ව තිබීමත් සමඟ පසු දින රාත්‍රියේ හුනියම ගොඩ ගැනීම සඳහා දේවාරූඪ වූ කාන්තාව ආදාළ ස්ථානය හාරන ලෙස උපදෙස් දීමත් සමඟ උරණ වූ නිවෙස් හිමියා දේවාරූඪයෙන් සිටි කාන්තාවට දැත බදා පොල්ලකින් පහර දීමේ පුවතක් කල්පිටිය, නොරොච්චෝල ප්‍රදේශයෙන් වාර්තා වේ.

අදාළ නිවෙස් හිමියාගේ බිරිය කෙටි කාලයක සිට ඇවිදීමේ අපහසුතාවට ලක්ව එක්තැන්ව සිටීම හේතුවෙන් මෙසේ යකැදුරුකමක් කිරීම සඳහා කටයුතු කර තිබිණි.

ඒ සමඟ යකුන් බැද වැඩ ගන්නා හුලවාලි පරපුරේ නොවරදින අති ප්‍රබල යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් යනුවෙන් දැන්වීමක් දුටු ඔහු දේවාලය වෙත ගොස් ඇත. පසුව ඔහුට දේවාරූඪව සිටි කාන්තාව පවසා ඇත්තේ බිරිය දින විසි එකක් වැනි කෙටි කාලයක් තුළදී හදිසියේම මිය යන බවයි.

පසුව ඈ පවසා ඇත්තේ සිය බිරිය සමඟ උරණ වූ අසල්වාසී කාන්තාවක් විසින් මිනි අළු මතුරා නිවස ඉදිරිපිට වළ දමා ඇති බවයි. පසුව දේවාලයේ කාන්තාව දේවාරූඪයෙන්ම අදාළ නිවෙසට ගමන් ගන්නා මාර්ගය හොඳින් අසා දැන ගත් පසුව පවසා ඇත්තේ මේ හුනියම කැපීම සඳහා ලක්ෂයක් පමණ වැය වන බවත්, නැති බැරිකම් හේතුවෙන් තමන්ට අසූ දහසක් ලබා දිය යුතු බවයි.

දේවාලයේ කාන්තාව පසු දින රාත්‍රියේ පැමිණ රතු පැහැති කුඩා පොට්ටනියක් ගෙබිමේ වළක් හාරා පොට්ටනිය දමා දිව ගොස් තිබේ.

එය දුටු ගේහිමියා දේවාලයේ කාන්තාවගේ සොරකම අසුවී දැත බදා ඇයට එළව එළවා පහර දෙන්නට විය. පසුව නිවැසියා දේවාලයේ කත රැගෙන ගොස් ආරක්ෂිත කැමරා පද්ධතිය පෙන්වන්නට විය. එහිදී ඇයගේ හපන්කම ඇගේ දෑසින්ම දැක ගන්නට ලැබීමත් සමඟම ඇගේ ඇස් රත් පැහැ ගැන්වී විලාප තබන්නට විය.

පසුව ඇය පැමිණි කාර් රථයේම නැඟී අවට පිහිටි පෞද්ගලික රෝහලක් වෙත ගොස් ප්‍රතිකාර ලබා ගත් බව දැන ගන්නට ලැබිණි.

හැටන් මධ්‍යම විශේෂ

අඹගමුව කෙහෙල්වරාව විදුහල කලාපයෙන් මුල්තැනට

හැටන් අධ්‍යාපන කලාපයේ 2019 වර්ෂයේ ශිෂ්‍යත්ව හා සමන්‍ය පෙළ විභාගවලින් සියයට සියයක උසස්ම ප්‍රතිඵල පෙන්වමින් කලාපයේ හොඳම විදුහල ලෙස කෙහෙල්වරාව විදුහල එම සම්මාන හිමි කර ගෙන ඇත. ඒ අනුව 2019 වර්ෂයේ පැවැති ශිෂ්‍යත්ව විභාගය හා අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා සියයට සියයක ප්‍රතිඵල පෙන්වමින් හැටන් කලාපයේ හොඳම විදුහලට ලැබෙන සම්මානය හැටන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පී. ශ්‍රීධරන් මහතා විසින් එම විදුහලේ විදුහල්පතිනි ඩී.එස්.වයි. චාමලි දිල්රුක්ෂි මහත්මිය වෙත ප්‍රදානය කරන ලදි. අඹගමුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අති දුෂ්කර ගම්මානයක් වන කෙහෙල්වරාව ගම්මානයේ දරුවන් අධ්‍යාපනය සඳහා දැඩි කැමැත්තක් දක්වන බවත් මෙම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලදී එම දරුවන්ගේ මව්පියන්ද විශාල සහයක් ලබා දෙන බවත් මේ සියල්ලේ ප්‍රතිඵලය ලෙස හැටන් කලාපයේ 2019 වර්ෂයේ ශිෂ්‍යත්ව හා අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ හොඳම ප්‍රතිඵල ගෙන ඒමට හැකි වූ බවත් විදුහල්පතිනිය වැඩිදුරටත් කීවාය.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

කතරගම වන සංරක්ෂණයේ මහත්වරු ගෙට පැනලා බඩු මුට්ටු කුඩු කළා

● ඒ මහත්වරු ගෙදරට එන්නෙම අරක්කු ඉල්ලන්න

● කතරගම පොලීසියට ගියත් අපේ පැමිණිලි ලියා ගත්තේ නෑ

කඳසුරිඳුගම උපුල්ආර අරුණ උදය කුමාර

බිරිය
එම්. නදීකා කුමාරි

කතරගම කඳසුරිඳුගම පුහුල්ආර ගොවි ජනපදයේ පිහිටි නිවෙසකට කතරගම වන සංරක්ෂණ නිලධාරීන් තිදෙනෙක් පැමිණ නිවෙසේ තිබූ බඩු බාහිරාදියට හානි කර නිවෙසේ තිබූ කැති පොරෝ ඇතුළු උපකරණ මෙන්ම මුදල් හා හැඳුනුම්පත ආදිය ද රැගෙන ගොස් ඇතැයි ගෙහිමියා පැවැසීය.

හේන් ගොවිතැනින් ජීවත් වෙන තමන්ට වන සංරක්ෂණ නිලධාරීන් කලක සිට මෙලෙස හිරහැර කරදර කරන බවත්, මේ සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට පැමිණිළි කළද ඒ කිසිවකුත් මේ පිළිබඳ සොයා නොබලන බවත් අඩුම තරමේ කතරගම පොලීසියෙන්වත් පැමිණිළි ලියා නොගන්නා බවත් නිවෙස් හිමියා චෝදනා කර සිටී. සිද්ධියෙන් අසරණව සිටින නිවෙස් හිමියා වන 37 හැවිරිදි දෙදරු පියකු වන ඩබ්ලිව්.පී. අරුණ උදයකුමාර මහතා තවදුරටත් මෙසේ කීය.

පොළට ගෙනියන්න දිවුල් අහුලන්න වත්ත පහළට ගියා. ඒ යනකොට මම දැක්කා වන සංරක්ෂණ එකේ මහත්තුරු මේ පැත්තට එනවා. මං මගේ පාඩුවේ මගේ වැඩේ කරන්න ගියා. අනික ඒ මහත්තුරු අපේ ඉඩම් තියෙන පැත්තට එන්නෙම කීයක් හරි ගන්න. නැතිනම් අරක්කු බෝතල් දෙක තුනක් ඉල්ලගෙන යන්න. ඒ නිසා ඒ අය එනවා දැක්කත් අපි නොදැක්කා වගේ යනවා. මං ගිහින් දිවුල් ටික අහුලනකොට ටික වෙලාවකින් මගේ ගේ පැත්තෙන් සද්දයක් ඇහුණා. මං හිතුවේ අලි පැනලා කියලයි. අහුලගත්ත දිවුල් ටිකත් අරන් ඉක්මනට වාඩිය පැත්තට ආවා. ඒ එනකොට දුර තියාම දැක්කා ඔවුන් මගේ ගෙදර ඉදන් යනවා. ගෙදරට ඇවිත් බලනකොට තමයි දැක්කේ මගේ ගේ බඩු මුට්ටු ඔක්කොම කුඩු කරලා දමලා කියලා. මගේ ගේ තිබුණු වතුර කෑන්, පුටු ඇතුළු බඩු මුට්ටු ඔක්කොම කුඩු කරලා. ගෙදර තිබුණු මගේ හැඳුනුම්පතයි,බැංකු පොතයි, ඒක ඇතුලේ තිබුණු රුපියල් 1900යි අරන් ගිහිල්ලා. වාඩියේ නවත්තලා තිබුණු මගේ බයිසිකලෙත් පොළොවේ ගහලා.මට මේ මොනවා කුඩු කරත් කමක් නෑ මට දුක තියෙන්නේ මගේ මේ බයිසිකලය කුඩු කරපු එකයි. මන් මගේ දරුවෝ දෙන්නා ස්කෝලෙට හා පෙරපාසලට එක්කගෙන යන්නේ මේ බයිසිකලයෙන්. මට දැන් දරුවා ස්කෝලෙට එක්ක යන්න විදියක් නෑ. වන සංරක්ෂණයේ මහත්තුරු යන ගමන් පාරේ ඉන්න මගේ යාළුවටත් කියාගෙන ගිහින් තිබුණා පැය භාගයක් ඇතුළත කිරියට එන්න කියන්න අපේ ඔෆිස් එකට. ඇවිත් මේක ගොඩින් බේරගන්න කියලා. මන් දැන් අවුරුදු 20ක විතර ඉදන් මේ ඉඩමේ වගා කරගෙන ඉන්නේ .මේ වට ඔප්පු බලපත්‍ර මොකුත් නෑ. මට කියා වෙන ඉඩකඩම් කොහවත් නෑ. මේ ඉඩම්වලට බලපත්‍ර මොකුත් නෑ කියලා නිතර නිතර වන සංරක්ෂණයේ මහත්තුරු ඇවිත් අපෙන් මුදල්, අරක්කු බෝතල් ඉල්ලගෙන යනවා. නොදුන්න දවසට මේ විදියට ඇවිත් අපිට කරදර කරනවා. නැත්නම් අරන් ගිහින් මොනව හරි බොරු චෝදනාවක් දමලා අපිට නඩු දමනවා. රට සහලින් හා ධාන්‍යයෙන් ස්වංපෝෂිත කරන්න්තුරන්ට අතයට සල්ලි දෙන්න ඕනේ. නැත්නම් ඇවිත් කැලේට ඇතුළු වෙලා කියලා අරන් ගිහින් නඩු දමනවා.ජනාධිපතිගෙන් අපි ඉල්ලන්නේ අපිට මේ ඉඩම්වල අයිතිය එපා. අපිට මැරෙනකම් වගා කරගෙන කරදරයක් නැතිව ජීවත් වෙන්න අවස්ථාව දෙන්න කියලයි.

බිරිය එම්. නදීකා කුමාරි - අපි කසාද බැඳපු කාලේ ඉදන්ම පදිංචි වෙලා ඉන්නේ මේ ඉඩමේ. අපි ජන්ද නාමලේඛනයේ පවා ලියාපදිංචි වෙලා ඉන්නේ මේ ඉඩමට. 100/02 ජන්ද හිමි නාම ලේඛනයේ අංකය අපේ. මෙතන අපිට ගෙයක් දොරක් හදාගන්න වන සංරක්ෂණයේ මහත්තුරු ඉඩ දුන්නෙම නෑ. ඇවිත් බලන්න. මේ පැත්තේ කාටවත් ඔප්පු බලපත්‍ර නෑ. හැබැයි වන සංරක්ෂණයේ මහත්තුරුන්ට අත යට මුදල් දීලා ස්ථිර නිවාස හදලා ලයිට් අරන් ඉන්න අය ඕනි තරම් ඉන්නවා. ඇයි අසරණ අපිට විතරක් මේ විදියට කරන්නේ. ඉඩමේ ළිඳ කපන විට වන සංරක්ෂණයේ මහත්තුරුන්ගේ අවසරය ගන්න රුපියල් 60,000ක් දෙන්න වුණා. ගොවිතැනක් කරගෙන අපිට නිදහසේ ජීවත් වෙන්න දෙන්න.

මේ සම්බන්ධයෙන් අප කතරගම වන සංරක්ෂණ කාර්යාලයේ චෝදනාවට ලක්ව සිටින අජිත් මහතාගෙන්ද විමසීමක් කළ අතර එහිදී ඔහු මෙලෙස පැවැසීය.

කැලේ කපන මිනිස්සු අපිත් එක්ක තරහයි. ඒ නිසා ඔය කරන චෝදනාව අපි ප්‍රතික්ෂේප කරනවා. අපි නිතර නිතර ක්ෂේත්‍ර චාරිකා කරනවා. එතකොට කැලේ කපන මිනිස්සු අහුවුණාම අපි ඒ අය අරන් ගිහින් උසාවි දමනවා. ඔය අරුණ කියන කෙනා ඉන්නෙත් අනවසර ඉඩමක. ජන්ද නාමලේඛන ග්‍රාම සේවකට කියලා හදාගෙන වෙන්න ඇති. අනික ඔය මනුස්සයා කොහොඹ ගස් කපලා අපි නඩු දමලත් තියෙනවා. ඊට අමතරව ඉඩමෙන් එළවන්නත් අපි නෙරපීමේ නිවේදන නිකුත් කරලා තියෙනවා. අපි කැලේට ආදරෙයි. අපි කැලේ රකින්න කටයුතු කරවා.

මේ සම්බන්ධයෙන් කතරගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් ලියනගම මහතාගෙන්ද විමසීමක් කළ අතර එහිදී ඔහු මෙසේ කීවේය.

අනවසරෙන් මේ අය ඉන්නේ. ඔය පැමිණිලි අපිට බාරගන්න බෑ. ඔය වන සංරක්ෂණයට අයත් ඉඩම්. ඒ ඉඩම්වල තියෙන දේවල් නැති වුණා කියාගෙන ආවට පැමිණිලි බාරගන්න බෑ. ඒ ගැටලු වන සංරක්ෂණයත් එක්ක විසඳගන්න ඕනේ.

ඔය මනුස්සයාට නෙරපීමේ නිවේදන නිකුත් කරලා තියෙන්නේ

වන සංරක්ෂණ කාර්යාලය

ඔය පැමිණිලි අපිට භාර ගන්න බෑ

කතරගම පොලිස් ස්ථානාධිපති

දිනමිණ දස අත ම එක තැන

උබයරත්න වනසිංහ - පස්සර සමූහ

පස්සර සමාධි පෙර පාසලේ ප්‍රදර්ශනයෙන්...

ළමා දිනයට සමගාමීව පස්සර සමාධි පෙර පාසලේ සිශිති දරු දැරියන්ගේ නිර්මාණාත්මක ප්‍රදර්ශනයක් පසුගියදා පැවැත්විණි. සමාධි බෞද්ධ මධ්‍යස්ථානාධිපති පාලාවත්තේ විමලවංශ හිමිගේ මඟපෙන්වීම යටතේ මෙය පැවැත්වූ අතර සිශිති දරුදැරියෝ පොල්තෙල් පහන දල්වූ අයුරු. පෙර පාසල් පාලිකා ඥාණවති ද සිල්වා මහත්මියද මේ අවස්ථාවට සහභාගී විය.

සීගිරිය විශේෂ

ළමා දිනයයි උපන් දිනයයි එකම දවසේ

ඒත් හස්තිපුර පුංචි චතුරිකා බඩගින්නේ

ලෝක ළමා දිනය දවසේ මෙලොව ජනිත වූ, හත්වන උපන් දිනය සමරන චතුරිකා දිනේෂි නම් වූ දියණියගේ හද කම්පාවන කදුළු කතාවක් අවුකන හස්ති පවුර ගම්මානයෙන් වාර්තා විය.

නිසිලෙස උප්පැන්න සහතිකයක් නොමැති එහෙත් පවුල් සෞඛ්‍ය සේවිකාවකගේ සහායෙන් සකසා ගත් ළදරු සටහන් පතකින් ඇය පාසල් අධ්‍යාපනය ලබන්නීය. ඇය ඉපදී මාස කිහිපයක් ගතවෙද්දී ආදරණීය මව මෙලොව හැරදා ගොස් තිබේ. පුංචි චතුරිකාගේ පියා මානසික රෝගී තත්ත්වයකින් පෙළෙන අයෙකි. මේ වන විට ඇය තම මිත්තනිය වූ ආර්. ජී.ස්වර්ණලතා මහත්මියගේ රැකවරණය මැද දිවි ගෙවයි. දිනකට එක වේලක් සරි කරගනිමින් දැඩි දුෂ්කරතා මධ්‍යයේ මොවුහු ජීවත් වෙති. චතුරිකාගේ මිත්තනියට අයත් අඩක් නිම කළ කුඩා නිවෙසක චතුරිකා සිය සහෝදරයකුද සමඟින් ජීවත් වෙති. නිසි ලෙස දොරක් වසා ගැනීමට වත් නොමැතිව පුටු දෙකක් දොරට හේත්තු කර මුණුබුරාගෙන් - මිණිබිරියගේන් ආරක්ෂාව සැලසීමට මේ වියපත් මිත්තනිය වෙහෙසෙන්නීය.

ලෝක ළමා දිනය දවසේ උපන් දිනය සැමරු චතුරිකාට එදින කුසට බත් ඇටයක් නොමැතිව සිටින්නට සිදු විය. ඊට පෙර ගතවූ දින ගණනාවකද බත් නොකෑ බව මේ මිත්තනිය හඬා වැටෙමින් පැවැසුවාය. චතුරිකා උදෑසන ආප්පයක් රැගෙන පාසල් ගිය බවත් පාසල් ඇරී දහවල් නිවෙසට පැමිණ ආහාරයක් නොමැතිව ඇඹරැල්ලා ගෙඩි දෙකක් අමුවෙන් ආහාරයට ගන්නා අයුරුද දුටුවෙමු.

ප්‍රදේශයේ රෙදි මසන ස්ථානයකින් ඉවත් කරන රෙදි කැබැලි රැගෙන විත් ඒවා එකිනෙක ගැටගසා අත පිසදා ගැනීම සඳහා ඉන්ධන පිරවුම්හල්වලට ලබා දී සොයා ගන්නා ඉතා සොච්චම් මුදලකින් ස්වර්ණ ලතා මව පියා අහිමි දියණියටත්, පුතුටත් දිනකට පාන් රාත්තලක් හෝ ආහාර ටිකක් උපයා දීම සිදු කරන බව ඇය පැවැසුවාය. ඕනෑම දියණියක් තම දෙකණට තෝඩු දෙකක් දමා ගැනීම සිත් සතුටු කරවන සිද්ධියකි. එහෙත් මේ දියණියට තෝඩු දෙකක් වෙනුවට කරපිංචා නැටි කැබලි දෙකක් කන් පෙතිවල දවටා ගන්නට සිදුව තිබේ. බොහෝ දරුවන් දෙපයට අලංකාර සපත්තු දමාගෙන පිළිවෙළකට ඇඳුම් සෝදා පාසල් යද්දී පුංචි චතුරිකා පාවහන් යුගළක් ද නොමැතිව එකම ඇඳුම ඇඳගෙන ඉඳහිට පාසල් යන බව මිත්තනිය කීවාය. පාසලට බාරදීම සඳහා උප්පැන්න සහතිකයක් චතුරිකාට නොමැත. එහෙත් පවුල් සෞඛ්‍ය සේවිකාවකගේ සටහන් සහිත කාඩ් පතක් උපයෝගී කරගෙන ඇය පාසලට බාරදී තිබේ. එහිද උපන්දිනය ලෙස නිවැරදි දිනය සටහන් කොට නොමැති බවත් එහි සඳහන්ව ඇත්තේ ඔක්තෝබර් 5 වැනි දින ඇය මෙලොව එළිය දුටු බවය. එහෙත් මිත්තනිය කියා සිටියේ තම දියණියගේ දියණිය ඔක්තෝබර් පළමු වැනි දින මෙලොව ජනිත වූ බවය. මුළු ලෝකයම දරුවන් දෙස බලා සිටියදී දරුවන් පිළිබඳ කතා කරද්දි චතුරිකා දිනේෂි නම් වූ ලෝක ළමා දිනය දා මෙලොව එළිය දුටු ඇය කුසගින්නේ අනාගතය දෙස අවිනිශ්චිතව බලා සිටින්නීය.

ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

තණමල්විල කංසා හේනකට ගිනි

තණමල්විල - කිවුල්ආර රක්ෂිත වනයේ සිදු කළ වැටලීමකදී මිලියන තුනකට අධික කංසා හේනක් වැටලීමට මැදගම පොලීසිය සමත්ව ඇත. වැටලීම සිදු කරන අවස්ථාවේදී සැකකරුවන් පළාගොස් ඇත.

මේ කංසා හේනේ කංසා ගස් එක්දහස් පන්සියයකට අධික ප්‍රමාණයක් තිබී සොයාගෙන ඇති අතර ඒවා කපා පුළුස්සා විනාශ කර තිබේ. මැදගම පොලීසියේ පොලිස් ස්ථානාධිපති පී. මාරසිංහ මහතා ඇතුළු නිලධරීන් කණ්ඩායමක් විසින් වැටලීම සිදු කර තිබේ.

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

ගාල්ලේ නිවාස 46ක් අද ජනතා අයිතියට

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඔබට ගෙයක් රටට හෙටක් යන තේමාව යටතේ ගාල්ල දිසාවේ ඉදිකර ඇති නිවාස 46ක් අදට (05) යෙදී ඇති ලෝක ජනාවාස දිනය නිමිත්තෙන් ජනතා අයිතියට පත් කරන බව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කළමනාකරු අජිත් කුමරප්පෙරුම මහතා පැවසීය. අගමැති සහ නිවාස ඇමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව කටුමැටි, නිවාස, ලෑලිවලින් ආවරණය කරගත් නිවාස සහ ඉටි කොළවලින් ආවරණය කර ගත් නිවාස වෙනුවට නව නිවාස ඉදිකර ඇති බවද කුමරප්පෙරුම මහතා පැවසීය. ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් තෝරා ගත් අඩුආදායම්ලාභි පවුල් සඳහා මේ නිවාස ඉදිකර ඇත.

ඡායාරූපය- ඩී.එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

වෙල්ලස්ස සිංහ සමාජය වැඩිහිටි දිනය සමරයි

වෙල්ලස්ස සිංහ සමාජය ලෝක වැඩිහිටි දිනය නිමිත්තෙන් සංවිධාන කළ උත්සවයක් පසුගියදා මොනරාගල පිළිසරණ වැඩිහිටි නිවාසයේදී පැවැත්විණි. නේවාසික වැඩිහිටි කාන්තාවන් වෙනුවෙන් වෛද්‍ය සායනයක් පවත්වා ඔවුන්ට ආහාරපානාදියෙන් සංග්‍රහ කිරීමක්ද සිදු කෙරිණි.

දිනමිණ දිසා දස අත ම එක තැන

■ බී.එම්.විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

අනුරපුරේ ටියුෂන් පන්ති කාඩ් එක හදන්න රුපියල් 500ක් අරන්

අනුරාධපුර නව නගරයේ පවත්වාගෙන යන උසස් පෙළ අමතර පන්තියක සිසු සිසුවියන් සඳහා පරිගණක ගත කළ හැඳුනුම්පත් නිකුත් කිරීමට කියමින් මවුපියන් සූරාකෑමට පෞද්ගලික උපකාරක පන්තිය පවත්වා ගෙන යන පුද්ගලයකු කටයුතු කරමින් සිටින බවත් පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරීමට උතුරුමැද පළාත් ආණ්ඩුකාරවරයා පියවර ගතයුතු බව මව්පියෝ පෙන්වා දෙති.

අනුරාධපුර නගරයේ උසස් පෙළ පන්ති පවත්වා ගෙන යන්නන් එක් විෂයක් සඳහා කොළඹ කුරුණෑගල පවත්වන පන්තිවලටත් වඩා මාසික ගාස්තුවක් අයකරද්දී පළාතේ අසරණ මව්පියන් තවතවත් සූරාකෑමට ඇතැම් පන්ති පවත්වන්නන් විවිධ උපක්‍රම භාවිතා කරන බව ඔවුහු පෙන්වා දුන්හ.

පාසල්වලින් විවිධ කටයුතු සඳහා මුදල් එක්කාසු කරන අවධියක උපකාරක පන්ති පවත්වන පුද්ගලයනුත් විවිධ උපක්‍රම භාවිතා කර විශාල වශයෙන් මුදල් එක්කාසු කිරීමේ වැයමක නිරත වන බව අනාවරණය වේ.

ජාතික හැඳුනුම්පත සැකසීම සඳහාත් රුපියල් 250ක පමණ මුදලක් අයකරන අවධියක පන්තියේ හැඳුනුම්පත සඳහා රුපියල් 500ක් අය කිරීම අනුමත කළ නොහැකි බව ඔවුන් පැවසූ අතර අනුරාධපුර නගරයට අමතර පන්ති සඳහා පැමිණෙන බොහෝ පිරිසක් ගොවි පන්තියේ අසරණ මව්පියන්ගෙ දරුවන් බව පෙන්වා දෙමින් ඊට විරෝධය පලකරමින් මෙසේ පැවසුහ.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

තුනුකායි ප්‍රදේශයේ කඩිනම් සංවර්ධනයට සාකච්ඡා

මුලතිව් දිස්ත්‍රික්කයේ අති දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වන තුනුකායි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ඉතා කඩිනමින් සිදු කළ යුතු සංවර්ධන කටයුතු පිළිබඳ පසුගියදා පැවති සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරණු ලැබිය. මෙම සාකච්ඡාව මුලතිව් තුනුකායි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මුලතිව් දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී කාදර් කාදර් මස්තාන් මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම රැස්වීම පැවති අතර මුලතිව් දිස්ත්‍රික්කයේ ඉඩම් බෙදා දීම හා ඉඩම් හඳුනා ගැනීම වහාම සිදු කිරීමටත් පළාතේ සිදුවන කැලෑ කැපීම වැලි ගොඩ දැමීම වැනි ක්‍රියා නිසා සිදුවන විනාශය හා පරිසර හානිය අවම කරගැනීම පිළිබඳ කරුණු සාකච්ඡා කෙරිණි.

මුලතිව් තුනුකායි ප්‍රදේශයේ වැසියන්ගේ එදිනෙදා ජීවිතයට බලපාන ප්‍රධාන ප්‍රශ්න 11 ක් මෙහිදී හඳුනා ගෙන ඒවාට කඩිනමින් පිළියම් යෙදීමටත් එහි වැසියන්ගේ දෛනික ආදායම ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ගත් සාකච්ඡාවටලක් විය. මේ සාකච්ඡාවට මුලතිව් දිසාපති සුන්දරම් අරුමෙනායගම් වන්නි දිස්ත්‍රික්කයේ සෙල්වම් අඩෙයිකලනාදන්, නෝහා රාධලිංගම යන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුද රාජ්‍ය ආයතන ප්‍රධානීහුද සහභාගි වූහ.

■ එස් දීයගහගේ - දකුණු පළාත් සංචාරක

ගාල්ලේ ගොවීහු 14,623කට විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකත්වය

කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කොට ඇති ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ මේ වන විට ගාල්ල දිසාවේ ගොවීන් 14623 දෙනෙක් එම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා ගෙන ඇතැයි කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ගාල්ල දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ ඒ.එම්. යූ. එච් වික්‍රමසිංහ මහතා පැවසීය.

මේ අනුව මාසිකව මෙම ගොවීන් සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක මුදලක් විශ්‍රාම වැටුප් ලෙස ලබා දෙන බවද වික්‍රමසිංහ මහතා වැඩි දුරටත් සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් මෙම ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ගොවීන් වැඩිම සංඛ්‍යාවක් දායකත්වය ලබා ගෙන ඇත්තේ ගාල්ල දිස්ත්‍රික්කයෙනි.

■ ආරියරත්න ගනේගොඩ - මැද කොළඹ සමූහ

බෝගහ හන්දියේ රූස්ස ගස්.....

පරම්පරා ගණනාවක සිට කොළඹ උතුර මෝදර කාලි කෝවිල ප්‍රදේශයට යන බ්ලූමැන්ඩල් සහ මට්ටක්කුලිය ප්‍රදේශවලට යන එන ජනතාවට සෙවණ ලබා දෙමින් විරාජමානව වැජඹෙන රූස්ස ගස් තුනක් අදත් අපට දැකිය හැක.

මෙම ස්ථානයෙන් හැම විටකම එහි පදිංචිව සිටින ජනතාව එහා මෙහා යන අතර ජනතාව බියෙන් පසු වෙති. තවද මේවා දිරාපත් වී ඇත.

නාගරික මන්ත්‍රිනී ගීතා මද්දුමගේ මහත්මිය මේ සම්බන්ධයෙන් දිනමිණ කළ විමසුමකට පිළිතුරු දෙමින් මෙලෙස කීවාය.

මමත් මේ ප්‍රදේශයේම පදිංචිකාරියක්. පැළ සහ ගස් වර්ග සිටවනවා.ඒවා වැඩෙනවා, අතු කඩා වැටෙනවා මා දැක තිබෙනවා. ඒත් තවම කිසිම කෙනකුට හානියක් වෙලා නැති මේ ගස් තුන ගැනයි මම සඳහන් කරන්නේ. මේ ගස් තුන අයත් වන්නේ උතුරු කොළඹ බෝගහ හන්දිය නමින් ප්‍රසිද්ධ මාදම්පිටිය පාර. පඤ්ඤානන්ද මාවත සහ කේ. සිරිල් සී. පෙරේරා මාවත (බ්ලූමැන්ඩල් පාර) යන ප්‍රදේශ මැදි කර ගෙනය.

මෙතෙක් කල් කොළඹ මහ නගර සභාවේ ගස් ඉවත් කරන අංශයේ අවධානය යොමු නොවීම හේතුවෙන් ඔවුන්ගේ අවධානයට සහ පරිසර කමිටුවේ අවදානය මේ රූස්ස ගස්වලට මම අද හෙටම කරුණු ඉදිරිපත් කරන බව නාගරික මන්ත්‍රිනී ගීතා මද්දුමගේ මහත්මිය වැඩිදුරටත් කියා සිටියාය.

පරිසරය ආරක්ෂා කරන ගස් මුළුමනින්ම සිඳ දැමීමට කොළඹ මහ නගර සභාව ක්‍රියා කරන්නේ නැහැ. මොකද කොළඹ මහ නගර සභා බලප්‍රදේශයට සම්බන්ධ දැනට වසර 150කට පෙර සිටුවන ලද ගස් වර්ග වලින් පුදුම සිසිලසක් සහ සෙවණක් යන එන ජනතාවට ලබා දෙනවා. මා ඉල්ලා සිටින්නේ දැනට නගරයේ පිහිටා තිබෙන රූස්ස ගස්වල සිඳලිය හැකි අතුපතර සිඳ ජනතාවට රැකවරණයත් ආරක්ෂාවත් සලසන අන්දමට පවත්වා ගෙන යන ලෙස යැයි මන්ත්‍රීවරිය සඳහන් කළාය.

■ ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

හෙරොයින් ළඟ: හතරක් අසුවේ

කුඩාඔය පොලීසිය මගින් සිදුකළ වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 06යි මිලිග්‍රෑම් 760 ළඟ තබාගෙන සිටි පුද්ගලයන් සිව් දෙනකු අත්අඩංගුවට ගෙන ඇත.

ඌව කුඩාඔය ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් මෙම සැකකරුවන් ළඟ තිබී හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 180,ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 70, ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 310, මිලිග්‍රෑම් 200 ළඟ තබාගෙන සිටි අවුරුදු 35, 36, 42 සහ 32 යන සැකකරුවන් මෙලෙස අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් ඌව-කුඩාඔය සහ මොරටුව-මොරටුමුල්ල පදිංචිකරුවන් වේ. සැකකරුවන් සහ හෙරොයින් සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. කුඩාඔය පොලිස් ස්ථානාධිපති ප්‍රසාද් සිරිවර්ධන මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීම් සිදුකර ඇත.

■ සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

කොරෝනා මඬින්න දිවියම කැප කළ සැමට සෙත් පතා පින්කමක්

මාරාන්තික කොරෝනා වසංගතයෙන් මුළු රටටමත් මුළු මහත් ජනතාවත් බේරා ගැනීමට තම දිවි කැප කොට සටන් කළ පළමුවෙන්ම දෙවිවරුවන් වෛද්‍ය හෙද ඇතුළු අනෙකුත් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට, ත්‍රිවිධ හමුදාව ඇතුළු පොලීසියට, ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යවරයා ඇතුළු මැති ඇමැතිවරුන්ට ද , උරදුන් රාජ්‍ය නිලධාරීන්ට ද සෙත් ශාන්තිය හා පින් අනුමෝදනා කිරීමේ මහා පින්කමක් පසුගියදා ඓතිහාසික සේරුවාවිල පින්බිමේ දී අතිවිශාල පිරිසක් ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

ඓතිහාසික මංගල මහා රාජමහා විහාරාධිපති කථිකාචාර්ය මුංහේනේ මෙත්තාරාම නාහිමියන් ගේ ප්‍රධානත්වයෙන් නිකවැරටිය පුණ්‍ය යාත්‍රා තරුණ බෞද්ධ සංගමයේ මෙහෙයවීමෙන් මෙම පින්කම පැවැත්විණි.

මෙහිදී මංගල මහා සෑ වන්දනා පුණ්‍ය මංගල්‍ය සෑ රදුන් උදෙසා කිරිපිඩු දානය, දෙතිස් වැංජන , ඖෂධ, ගිලන්පස, සම්බුද්ධ පූජා, ද පැවැත්විණි. මංගල මහා සෑය ෂඩ් වර්ණයෙන් යුත් විදුලි බුබුළුවලින් ආලෝකවත් කොට මහ සෑරදුන් පිච්ච, නෙළුම්, අරලිය, මල් දස දහස් ගණනින් පූජා කොට අනතුරු බෝධි පූජා පින්කමක් හා ගම්පහ මහානාම හිමි විසින් දේශනා කරන ලද විශේෂ ධර්ම සාකච්ඡාවකින් මේ කොරෝනා වෛරසය තුරන් කිරීම සඳහා අනගි මෙහෙයක් කළ පින්වන්ත පිරිසට ඒ සියලු පින්පෙත් අනුමෝදන් කළහ.

මෙම අවස්ථාවට නැගෙනහිර පළාතේ ත්‍රිවිධ හමුදාවල සියලු අනදෙන නිලධාරීන්, ප්‍රාදේශීය සභා සභාපතිවරු ඇතුළු මන්ත්‍රීවරුන් ද ත්‍රිකුණාමලය මහ දිසාපති අසංක අබේවර්ධන කන්තලේ ප්‍රාදේශීය ලේකම් උපේක්ෂා කුමාරි යන මහත්ම මහත්මීන් හා රාජ්‍ය ආයතන ප්‍රධානීන් ඇතුළු අතිවිශාල පිරිසක් සහභාගි වූහ.

■ සි. එම්. ආරියපාල - තඹුත්තේගම සමූහ

තඹුත්තේගම නිවාස තුනකට හොරු ඇවිත්

තඹුත්තේගම පොලිස් වසම බැඳිවැව ග්‍රාමයේ පසුගියදා රාත්‍රි කාලයේ නිවාස තුනක් බිඳ එක් නිවසකින් රුපියල් දෙලක්ෂයකට ආසන්න වටිනාකමින් යුත් රන් භාණ්ඩද මුදල් රුපියල් 25000 ට ආසන්න වටිනාකමින් යුත් මුදල් දමා තිබූ කැට දෙකක්ද සොරා ගෙන ගොස් ඇති බව ගෙහිමියෝ පවසති.

මෙලෙස රන් බඩු සහ මුදල් අඩංගු කැට දෙකක් සොරා ගෙන ගොස් ඇත්තේ තඹුත්තේගම බැදිවැව අංක 08 ලිපිනයේ රාජිත තිරෝෂන් තමැති රාජ්‍ය සේවකයාගේ නිවසෙනි. ගෙහිමියන් නිද සිටියදී කුස්සියේ ජනේලයේ යකඩ කුරුගලවා නිවසට ඇතුලුවී කාමරවල තිබූ වේන් පටක් සහ මුදු දෙකක් සමග කැට දෙකක් සොරාගෙන ගොස් තිබේ.

එදිනම රාත්‍රියේ මෙම ගමේම පදිංචි පොලිස් නිලධාරියකුගේ නිවසේ ආලින්දයේ සවිකර තිබූ අනාරක්ෂක ජනේලයකින් නිවසට පැන නිවැසියන් කලබල වීම නිසා සොරුන් පැන ගොස් තිබේ.

■ මහානාම විතානගේ - මල්වාන සමූහ

සම්බාහන මධ්‍යස්ථානයක් වටලයි

මුස්ලිම් කතකුත් ඒ අතරේ

ව්‍යාජ බලපත්‍රයක් ළඟ තබාගෙන බියගම ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය සම්බාහන මධ්‍යස්ථානයක් වටලා එහි සිටි කාන්තාවන් සිවු දෙනකු සමග කළමනාකරුවකු බියගම පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

මෙම සම්බාහන මධ්‍යස්ථානයේ සිටි කාන්තාවන් ගාල්ල , තවලම , වැලිකන්ද හා සෙවනගල යන ප්‍රදේශවල පදිංචි වයස අවුරුදු 21ත් 28 ත් අතර වියේ පසුවන්නන් වන අතර මුස්ලිම් කාන්තාවක් ද ඒ අතර සිටී.

මෙම කළමනාකරු පාදුක්ක ප්‍රදේශයේ පදිංචි 28 හැවිරිදි පුද්ගලයෙකි . මෙම ස්ථානයට පැමිණීමට රුපියල් 1300 ක් ගෙවියවිය යුතුව තිබිණි. අත්අඩංගුවට ගත් පිරිස මහර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය .

බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ. ඒ. සි එල් අමරසේකර මහතාගේ උපදෙස් අනුව උප පොලිස් පරීක්ෂක ඩී .එම්. එස්. සී.කුමාර , සැරයන් සිසිර (38026) , පො කො සේනානායක (88674) , සුරංග (69973) හා කාන්තා පො .කො දිලානි (11151) යන නිලධාරීහු විසින් මෙම වැටලීම සිදු කළහ.

■ එස් දීයගහගේ - දකුණු පළාත් සංචාරක

මම මැරෙනවා අඬන්න එපා

මියගිය සිසුවා සොයුරියට කියයි

"මල්ලි කරාපිටිය රෝහලට මාරු කිරීමෙන් පසු මම මල්ලිගේ දත් මදින්න ගිහින් වතුර ගන්නාවිට ඔහුට හුස්ම ගැනීමට අපහසුවී වෙවිලන්න පටන් ගත්තා. වතුර බොන්න බැරිව ගියා. මම ඒ බව වෛද්‍යවරුන්ට පැවසුවිට විස්තර අසා මල්ලි වෙනම ස්ථානයකට දමා දොර වැසුවා. පසුව මල්ලිට අමාරුවි මියගිය බව කිව්වා."

බල්ලකු සපා කෑම නිසා අසනීපවී කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුල් කළ පසු මරු මුවට පත් පාසල් සිසුවාගේ මරණ පරීක්ෂයේදී සාක්කි දුන් මිය ගිය දරුවාගේ අක්කා වන කහවෙ ගුරුගේ වරුණි නිසංසලා නැමැති අය කීවාය.

මෙසේ මිය ගොස් ඇත්තේ මාපලගම ගොරකගස්දුව පදිංචිව සිටි මාපලගම සිරි සුනන්ද විදුහලේ කහවෙ ගුරුගේ ගවේෂ් නෙත්සර නමැති 12 හැවිරිදි සිසුවෙකි.

මේ පිළිබඳ මරණ පරීක්ෂණය හදිසි මරණ පරීක්ෂක ඒ ආර්.එම්.නාසිම් මහතා විසින් කරාපිටිය රෝහලේ පවත්වන ලද අවස්ථාවේ නාගොඩ පොලිසියේ සැරයන් එන්.ටී.පියතිලක (58871) මහතාගේ මෙහෙයවීම යටතේ සාක්කි දුන් සාක්කිකාරිය මෙසේද කීවාය .

" මියගොස් සිටින්නේ මල්ලී. මාස එකහමාරකට පමණ පෙර මල්ලි වියුෂන් පංතියට යනවිට බල්ලෙක් ගැනු ළමයකුගේ ඇඟට පැනලා තිබෙනවා. ඒ ළමයා මල්ලිගේ බයිසිකලය උඩට වැටෙනවාත් සමග බල්ලා මල්ලිගේ කකුල යාන්තමට සූරලා . දින දෙකකට පසු මල්ලි මට ඒ බව කිව්වා. නමුත් මම ඒ තරම් හිතුවේ නැහැ.

මේ අතර පසුගිය විසිහය වන දින කකුල සහ තුනටිය රිදෙනව කියල මල්ලි කිව්වා. එවිට උඩුගම රෝහලට ඇතුළත් කළා. පසුදින කරාපිටිය රෝහලට මාරු කළා. මම මල්ලි ළඟ හිටියා. උදේ දත් මදින්න ගිහින් වතුර ගන්න විට හුස්ම ගැනීමට අපහසුවී වෙවිලන්න පටන් ගත්තා. වතුර බොන්න බැරිව ගියා. ඒ බව මම වෛද්‍යවරුන්ට කිවුවා.

ඉන්පසු මැඩම් කෙනෙක් විස්තර ඇසුවා. බල්ලෙක් පූසෙක් හීරුවද කියල ඇසුවා. පසුව මම විස්තර සියල්ල කිව්වා. පසුව මල්ලි වෙනම ස්ථානයකට දාලා දොර වැහුවා. මල්ලිට අමාරු වුණා. බෙහෙත් දුන්නා. එවිට කතා කළා. මැරිල ඉපදුනා කියල කිව්වා. මම මැරෙනවා අඬන්න එපා කියලත් කිව්වා. මල්ලිට නැවත අමාරු වුණා. පසුව මියගියා".

මියගිය සිසුවාගේ මව වන චිත්‍රා නන්දනී(48)යන අය සාක්කි දෙමින් මියගොස් සිටින්නේ එකම පුතා බවත් මාස එකහමාරකට පෙර බල්ලෙක් කකුල සීරුවා කියල අක්කට කියල තිබුණත් බෙහෙත් ගැනීමට නොගිය බවත් කකුල සහ තුනටියේ දකුණු පැත්තේ වේදනාවක් නිසා පළමුව උඩුගම රෝහලට ඇතුළත් කළ බවත් පසුව කරාපිටිය රෝහලට ඇතුළත් කළ බවත් එහිදී අමාරුවි මියගිය බවත් කියා සිටියාය. පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ සහකාර අධිකරණ වෛද්‍ය නිලධාරි රුවන් නානායක්කාර සිරුරේ කොටස් කොළඹ වෛද්‍ය පරීක්ෂණාගාරයට යවා වැඩිදුර පරීක්ෂණ පවත්වා වාර්තාව ලැබුණ පසු මරණයට හේතුව ප්‍රකාශ කරන බව පැවසූ අතර ඉදිරිපත්වූ සාක්කි හා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව අනුව මරණ පරීක්ෂණයේ තීන්දුව ප්‍රකාශ කිරීම පසුවට කල් තබා සිරුර මුද්‍රා තබා ඥාතීන්ට භාරදීමට මරණ පරීක්ෂකවරයා නියම කළේය.

■ ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

ගොවීන් තිදෙනෙක් ළඟ බෙහෙත් කොටන තුවක්කු

සියඹලාණ්ඩුව, බඩල්කුඹුර හම්බේගමුව පොලිස් බල ප්‍රදේශවල සිදුකළ වැටලීම් වලදී බෙහෙත් කොටන තුවක්කු 03 ළඟ තබාගෙන සිටි ගොවියන් තිදෙනකු පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

බඩල්කුඹුර - මඩුගස්මුල්ල හම්බේගමුව ජනපදය, සියඹලාණ්ඩුව-කන්ද උඩපංගුව යන ප්‍රදේශවලදී අත්අඩංගුවට ගත් මෙම සැකකරුවෝ තිදෙනා අවුරුදු 41,38 සහ 21 යන වියෙහි පසුවෙති.

සැකකරුවන් සහ නඩු භාණ්ඩ වැල්ලවාය,මොනරාගල සහ සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

උප පොලිස් පරීක්ෂකවරුන් වන සපුගේ, විජේකෝන්,වික්‍රමසිරි යන තිදෙනා විසින් වැටලීම් සිදුකර ඇත.

● ප්‍රහාරයෙන් පසු අගමැති කාර්යාලයේ රැස්වීමකට අපව කැඳෙව්වා

මොන හේතුවක් නිසාවත් මටවත් උදයටවත් රැස්වීමට යන්න එපා කියා හිටපු ජනාධිපති තදින් කිව්වා

හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු සාක්ෂි දෙයි

සුභාෂිණී සේනානායක

යහපාලන රජය බලයට පත් වූ පසු බුද්ධි අංශ දුර්වල වූ බවත් ජාතික බුද්ධි ප්‍රධානී තනතුර හෑල්ලුවට ලක් වූ බවත් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පෙරේදා (3) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

ජනාධිපතිවරයා විදේශගත වන විට ආරක්ෂාව භාරව සිටියත් තමන් එම රාජකාරිය නිසි ලෙස ඉටු කළේ නෑ නේදැයි අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විමසා සිටි අවස්ථාවේදීට පිළිතුරු දෙමින් හිටපු ආරක්ෂක ලේකම්වරයා කියා සිටියේ, "එය විවාදාත්මක කරුණක්. ජනාධිපති බලතල විදේශගත වන විට කාටවත් පැවරුවේ නැහැ. විධිමත් ලෙස පැවරුවේ නැති නම් ලෝකයේ කොහේ හිටියත් බලතල එතුමා සතුව පවතිනවා." යැයි කියාය. ප්‍රහාරයට පෙර ඇඳිරි නීතිය පැනවූයේ නම් බෝම්බකරුවන් අල්ලා ගැනීමට හැකියාවක් පැවැති බව ද ඒ මහතා කොමිසම හමුවේ පැවසීය.

හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති කොමිසම හමුවේ 8 වැනි දිනටත් පෙරේදා (3) සාක්ෂි ලබා දුන්නේය.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - පිපිරීම් සිදු වීමෙන් පසුව එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වුණාද?

සාක්ෂිකරු - ඔව්. උදේ 11ට පැවැත්වෙනවා කියලා මට පැයකට කලින් අගමැති කාර්යාලයෙන් දැනුම් දුන්නා

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ප්‍රහාරයෙන් පසු හිටපු ජනාධිපතිතුමා විදෙස්ගතව සිට ඔබට දුරකතන ඇමතුමක් ගත්තද?

සාක්ෂිකරු - මට මුලින්ම ඇමතුමක් ගත්තේ ජනාධිපති ලේකම් උදය ආර්. සෙනෙවිරත්න. මගෙන් ඇහුවා "හේමා අගමැති කාර්යාලයේ රැස්වීමක් තියෙනවා, දන්නවාද?" කියලා. මම ඔව් කිව්වා. ඔහු කිව්වා, "මටත් පණිවිඩය ලැබුණා. හැබැයි ජනාධිපතිතුමා කෝල් කරලා අපි දෙන්නටම යන්න එපා කියලා කිව්වා." කියලා. ඒ ඇමතුමෙන් විනාඩි 10කට පස්සෙ මට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගෙන් කෝල් එකක් ආවා. "මොන තත්ත්වයක් යටතේවත් ඔය දෙන්නා ඔය රැස්වීමට යන්නේ නෑ..." කියලා ඉතා තදින් මට එතුමා කිව්වා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ලංකාවේ ඒ වන විට බෝම්බ පිපිරීම් ගැන දැනගෙනද ඔය රැස්වීමට යන්න එපා කිව්වේ?

සාක්ෂිකරු - ඒ වෙනකොට එතුමා බෝම්බ පිපිරීම් ගැන දැනගෙන හිටියේ. මාත් කලබලකාරී තත්ත්වය ගැන කිව්වා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ජනාධිපති රටේ නැතුව අගමැතිගේ සාකච්ඡාවට යන්න එපා කියනවා. ඔබට මොකක්ද ඒ අවස්ථාවේ හිතුණේ?

සාක්ෂිකරු - හිතුණේ ඉතින්..., වැටිලා ඉන්න අසරණ තත්ත්වය ගැන තමයි ස්වාමීනී. ජනාධිපති යන්න කලින් බලතල පැවරීමක් අගමැතිට හෝ කාටවත් කරලා තිබුණේ නැහැ. අරාජික තත්ත්වයක රට තිබුණේ. මං ඒ රැස්වීමට යන්න හිටියේ. නමුත් ජනාධිපතිගේ නියෝගයට පිටින් යන්න බැරි නිසා ඊට සහභාගී වුණේ නැහැ. මේ වෙද්දි මමත් ආරක්ෂක අමාත්‍යාංශයට පොලිස්පති, ත්‍රිවිධ හමුදාපතිවරු, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා ඇතුළු සියලු බුද්ධි ප්‍රධානීන්ව කැඳවලා තිබුණා. ඒ රැස්වීමට අගමැතිතුමා නොදන්වා එක පාරටම ඇවිත් රැස්වීම කරගෙන යන්න මම ඔයාගේ කාර්යාලයේ ඉන්නම් කිව්වා. මම රැස්වීමේ සාකච්ඡා කළ කරුණු අගමැතිතුමාට පැහැදිලි කලා. මෘත ශරීර ඉවත් කිරීම ගැන කතා කළා. එතුමා විනාඩි 10ක් 15ක් විතර ඉඳලා ගියා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 21 වැනිදා ගත්ත පියවර 20 වෙනිදා 'හෙට ගහනවා' කියපු වෙලාවේ ගත්තා නම් ආරක්ෂක ප්‍රධානීන්ව කැඳවලා මෘත ශරීර අදින ඒවා ගැන කතා කරන්න ඕනෙ නෑ නේද?

සාක්ෂිකරු - මට ඒකට නම් උත්තර දෙන්න බැහැ. පසුකාලීනව මම දැනගත්තා 20 වැනිදා මේ තොරතුර එනකොටත් සහරාන්ලා හෝටල්වල රැඳී ඉඳලා ඉලක්ක වෙත කිට්ටු වෙලා කියලා. අපි පොලිස් ඇඳිරි නීතිය දැම්මත් ඔවුන් තමන්ගේ ඉලක්ක සපුරනවා. 20 වැනිදා වෙනකොට සහරාන් ෂැංග්‍රිලා එකට ඇවිත් ඉවරයි. මේ තොරතුරු සියල්ල බුද්ධි අංශ සතුව තිබුණා ස්වාමීනී. ඒකයි ප්‍රහාරය වෙලා සති දෙකක් යද්දි මේකට සම්බන්ධ දෙසිය ගාණක් අල්ලගත්තේ. බුද්ධි අංශ NTJ safe houses හොයා ගත්තා. පුහුණු කඳවුරු හොයා ගත්තා. ඒ තොරතුරු ගැන අප්‍රේල් 9 වැනිදා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ දී බුද්ධි අංශවලට කතා කරන්න තිබුණා. ඒවා කතා කළා නම් action plan එකක් හදන්න තිබුණා. මම වගකීමෙන් ගැලවෙන්න නෙවෙයි කියන්නේ. බෝම්බකාරයො බෝම්බ බැඳ ගත්තට පස්සේ එයාලව නවත්තන්න බෑ. බෝම්බ අදින්න කලින් නවත්වන්න ඕනෑ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබ දන්නවාද විමර්ශනවලින් අනාවරණය වුණා කිංස්බරි ප්‍රහාරකයා වූ මුබාරක් 20 වැනිදා රෑ ගෙදර ගිහින් ඇවිත් තිබුණා කියලා. එදා රෑ සහරාන් හා ඉල්හාම් ෂැංග්‍රිලා හෝටලයෙන් එළියට ඇවිත් ආයේ ආවා. පොලිස් ඇඳිරි නීතිය දැම්මා නම් මාර්ග බාධකවල දී නවත්තලා බලනවා නේද? එහෙම නම් ඔවුන්ව පහසුවෙන්ම අත්අඩංගුවට ගන්න තිබුණනෙ?

හිටපු ජනපති මෛත්‍රී රට ගියේ බලතල නොපවරා රට අරාජික කරලයි

සාක්ෂිකරු - පහසුවෙන්ම අත්අඩංගුවට ගන්න තිබුණද කියල මම දන්නේ නැහැ. නමුත් අත්අඩංගුවට ගැනීමක් නම් කරන්න තිබ්බා.

කොමිසම - සාමාන්‍ය මිනිසුන් බෝම්බ හදන්නේ නෑ නේද? වනාතවිල්ලුව අවි ගබඩා සිද්ධියේ දී සහරාන්ගේ නම සිද්ධියට සම්බන්ධ බව දැන ගත් බව ඔබ මින් පෙර සාක්ෂි දෙමින් කීවා. එසේ නම් ඔබ කියන විදිහට සහරාන් ඩෙටනේටර් තියාගන්න ඇත්තේ මිනිස්සුන්ට විකුණන්නද? සාමාන්‍ය මිනිසුන් බෝම්බ හදන්නේ යම් අපරාධ ක්‍රියාවකට නේද?

සාක්ෂිකරු - එහෙමයි ස්වාමීනී.

කොමිසම - අප්‍රේල් 4 වැනිදා සිට 10 වැනිදා දක්වා බුද්ධි තොරතුරු ලැබුණේ නැහැ කිව්වා. ඒත් 18 වැනිදා පිපිරීමක් ගැන තොරතුරු ලැබුණා නේද?

සාක්ෂිකරු - ස්වාමීනී 18 වැනිදා කිව්වේ බයිසිකල් බෝම්බ පිපිරීම ගැන විතරයි. ප්‍රහාරයක් ගැන කිව්වේ නෑ.

කොමිසම - 18 වැනිදා පාලමුනේ සිදුවීමෙන් පස්සේ තොරතුරක් ලැබුණේ නැද්ද?

සාක්ෂිකරු - ස්වාමීනී, මට 4 වැනිදාත් 20 වැනිදාත් අතර කිසිදු බුද්ධි තොරතුරක් ලැබුණේ නැහැ. ඒ කාලය තුළ පොලිස්පතිවරයා වෙත වාර්තා තුනක් හතරක් යොමු කර තිබුණා. බයිසිකල් පිපිරීමයි 4 වැනිදා ලැබුණු බුද්ධි තොරතුරයි අතර සහසම්බන්ධතාවයක් ඇති බව කීවේ නැහැ. යම් පිපුරුමක් වෙලා තියෙනවා, මුස්ලිම් අන්තවාදීන්ගේ වැඩක් වෙන්න ඇති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණ කරනවා, අපේ පරීක්ෂණත් යනවා. කියලා කිව්වා. මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කතා කළා. ඒ අයත් කිව්වේ හොයාගෙන යනවා කියලා. මේ වගේම වවුනතිව් පොලිස් නිලධාරීන් ඝාතනය කළ අවස්ථාවේත් සොයා බලා වාර්තාවක් ගෙන්වා ගත්තා.

9 වැනිදා දැනගත්තා නම් action plan එකක් හදනවා

කොමිසම - 18 වැනිදා සිද්ධිය ගැන හෝ සාකච්ඡාවක් පැවැත්වූවා නම් කරුණු එළියට එන්න තිබුණා නේද?

සාක්ෂිකරු - ස්වාමීනී, එහෙම දෙයක් සිදු වුණාම විමර්ශන නිලධාරීන් කරුණු සොයා මට වාර්තා කළ යුතුයි නේද?

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබට වාර්තා කළාට වැඩක් නැහැ. ඔබ පියවර ගන්නේ නැනේ.

සාක්ෂිකරු - වාර්තා කළේ නැනේ ස්වාමීනී.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - වනාතවිල්ලුව ඩෙටනේටර් 99 සොයා ගත් බව රාජ්‍ය බුද්ධි ප්‍රධානියා ඔබට වාර්තා කළාද?

සාක්ෂිකරු - එසේය ස්වාමීනී.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය මාර්තු 04 වැනිදා රැස්වීමේ දී සහරාන් සම්බන්ධ බව සඳහන් කළා නේද?

සාක්ෂිකරු - එහෙමයි.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - සහරාන් ජීවත් වන්නේ කාතන්කුඩි බව ඔබ දැන සිටියා නේද?

සාක්ෂිකරු - ජීවත් වුණේ කාතන්කුඩි බව දැන සිටියා. මම ආරක්ෂක ලේකම් වෙද්දී සහරාන් අතුරුදන් වී තිබුණේ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අප්‍රේල් 20 ලද බුද්ධි තොරතුරු ගැන උපදෙස් දුන්නෙ නෑ නේද?

සාක්ෂිකරු - එහෙම කරන්න බැරි වුණා ස්වාමීනි. මාව හරි විදියට දැනුවත් කළා නම් ඒක කරන්න පුළුවන්. මම තොරතුරු ලැබුණම තිබුණෙ සීමිත කාලයක්. මම පොලිස්පතිවරයාට උපදෙස් දුන්නා. ඒ අය හරි දේ කරාවි කියලා මම සිතුවා. මොනවා හරි තොරතුරු ලැබුණොත් මට දැනුම් දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම පොලිස්පතිවරයාට උපදෙස් දුන්නා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ජනාධිපතිවරයා ලංකාවට ආපු වෙලාවේ ඔහු මුණගැහෙන්න ගුවන්තොටුපොළට ගියාද? මොනවද එහිදී කතා කළේ?

සාක්ෂිකරු - 21 වැනිදා මධ්‍යම රාත්‍රියේ ආවේ. මොනවත් කතා කළේ නැහැ. ජනාධිපතිවරයා අධික වෙහෙසයි කියා ගුවන්තොටුපොළ පර්යන්තයටවත් එන්නේ නැතිව වාහනයට නැඟලා කොළඹට ආවා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබ ජනාධිපතිවරයාට දුරකථන ඇමතුමක් දුන්නද?

සාක්ෂිකරු - නැහැ ස්වාමීනී.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඇයි ඔබ ගුවන්තොටුපොළට ගියේ?

සාක්ෂිකරු - සාමාන්‍යයෙන් රේඛිය අමාත්‍යවරයා විදේශ ගත වී ලංකාවට පැමිණෙන විට හැකි නම් ආරක්ෂක ලේකම්වරයා ගුවන්තොටුපොළට යනවා. එය සාමාන්‍ය චාරිත්‍රයක්.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඒක නියමයක්ද? ඔබ හුරුපුරුදු කරගෙන සිටි විදියද?

සාක්ෂිකරු - එය අනාදිමත් කාලයක සිට කරගෙන ආපු දෙයක්.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය- ඔබ කොයි අවස්ථාවේ දීද ධුරයෙන් ඉවත් වීමේ ලිපිය දුන්නේ?

සාක්ෂිකරු - 25 වැනිදා ස්වාමීනී. කියන්න අවසරද? අප්‍රේල් 23 වැනිදා පොලිස්පතිවරයා මාව හමුවන්න ආවා. ඔහු කිව්වා ඔහුට ජනාධිපතිවරයා එන්න කියලා ගියා කියලා. ඒ අවස්ථාවේ ප්‍රහාරයේ වගකීම ගන්න, අරගෙන ඉවත් වෙන්න, වෙන රටක තානාපතිකමක් දෙන්නම්, මලල්ගොඩ කමිටුවෙන් නම් ඉවත් කර දෙන්නම් කියලා ජනාධිපතිවරයා දැනුම් දුන් බව පොලිස්පතිවරයා මට කිව්වා. තමාට තීරණයක් ගැනීමට කල් දෙන්න කියා ආපු බවත් ඔහු කිව්වා. ඒ පිළිබඳ මගේ අදහසත් පූජිත් ජයසුන්දර මහතා විමසුවා. මම ඒ අවස්ථාවේ කිව්වා ඔබේ පවුලේ අය, දරුවන් එක්ක කතා කරන්න කියලා. පස්සේ මට ජනාධිපතිවරයා එන්න කිව්වා. මම ඇහුවා අයි.ජී. ට රිසයින් වෙන්න කිව්වා ද කියලා. එවිට ජනාධිපතිවරයා කිව්වා මට කවුරුවත් කිව්වේ නැහැනේ කියලා. එවිට මම කිව්වා අයි.ජී. ඉන්නේ මගේ යටතේ මම රිසයින් වෙන්නම් කියලා. ජනාධිපතිවරයා ජාතිය අමතා අපි දෙන්නා වැරදිකරුවන් කියලා කිව්වා. ඒ වෙනකොට කටඋත්තරයක්වත් අරන් නැහැ. පරීක්ෂණයක්වත් කරලා නැහැ. එවිට මම ඇහුවා මම පත් වෙලා දවස් දෙකකින් ඇවිත් බුද්ධි තොරතුරු කියනකොට "නිලන්ත මට කිව්වා." කියලා සර් කිව්වා නේද, සර්ට මතකද කියලා මම ඇහුවා. තවත් තොරතුරක් කියනකොට "වොරි වෙන්න එපා හේමා, නිලන්ත කියනවා." කිව්වා. මම ඇහුවා මේක නිලන්ත කිව්වේ නැද්ද, එහෙම නම් නිලන්ත නේද වග කියන්න ඕනෑ කියලා මම කිව්වා. එවිට මෛත්‍රීපාල සිරිසේන මහත්තයා පත්තරය බලාගෙන හිටියා මුකුත් නොකියා. මම නිලන්තගෙනුත් මේ ගැන ඇහුවා. ඔහුත් කිව්වේ මම ජනාධිපතිවරයා අවුරුදු තුනක් තිස්සේ දැනුවත් කරනවා, හැබැයි මම ලේකම්වරයාවත් දැනුවත් කරනවා කියලා.

පාස්කු දින ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බලන ජනාධිපති කොමිසම

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ජාතික බුද්ධි රැස්වීම් කැඳවන්නේ කවුද?

සාක්ෂිකරු - ජනාධිපතිවරයා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම කැඳවන්නේ කවුද?

සාක්ෂිකරු - ආරක්ෂක ලේකම්වරයා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - යම් යම් සිද්ධීන්වල දී නිලධාරීන්ට උපදෙස් දෙනවාද?

සාක්ෂිකරු - සමහර අවස්ථාවල දී සිදු කරනවා.

අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 07 වැනිදා ප්‍රහාරයක් ඇති විය හැකි බවට වන බුද්ධි තොරතුර ලැබුණද?

සාක්ෂිකරු - ජාතික බුද්ධි ප්‍රධානී දැනුම් දී තිබුණා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඒ වාර්තාවට අදාළව බුද්ධි අංශ කරුණු වාර්තා කර තිබුණද?

සාක්ෂිකරු - ඒ තොරතුර සම්පූර්ණයෙන් විදේශ බුද්ධි සේවකයන්ගෙන් ලද තොරතුරක්. දේශීය බුද්ධි අංශයකින් ලැබුණු එකක් නෙවෙයි. ඒ ලිපිය ජාතික බුද්ධි ප්‍රධානියාට 08 වැනිදා ලැබී තිබුණා. එදා ඉන්දීය ආරක්ෂක ලේකම්වරයා පැමිණීම, ඉන්දු ලංකා ද්විපාර්ශ්වික ආරක්ෂක වටයට සහභාගී වීමට තිබුණා. අප කාර්යබහුල වෙලා හිටියේ. සවස ජාතික බුද්ධි ප්‍රධානියා මට වාර්තාව පෙන්නුවා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 08 වැනිදා කතෝලික පල්ලිවලට, ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් වන බවට දැනුම් දී තිබුණාද?

සාක්ෂිකරු - එහෙමයි ස්වාමීනී.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - 09 වැනිදා බුද්ධි සම්බන්ධීකරණ රැස්වීම තිබුණා. එහිදී මේ ප්‍රහාරය ගැන දැනුවත් කළාද?

සාක්ෂිකරු - නැහැ. පැහැදිලි කිරීමක් අවශ්‍යයි ස්වාමීනී. නිලන්ත ජයවර්ධන මහතා එවා තිබූ වාර්තාවේ තිබුණේ ප්‍රහාරයක සැලසුමක් ගැනයි.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - දේවස්ථාන ආරක්ෂා කරන්න කියලා උපදෙස් දුන්නද?

අප්‍රේල් 20 ලද බුද්ධි තොරතුරු ගැනත් මම හරියට දැනුම්වත් නෑ

සාක්ෂිකරු - බුද්ධි සම්බන්ධීකරණ රැස්වීමේ දී මෙය සාකච්ඡා කළේ නෑ. ඒ රැස්වීම්වල පළමු ඉදිරිපත් කිරීම කරන්නේ නිලන්ත ජයවර්ධන මහතා. එතුමාගේ දේශනයේ මේ වැදගත් තොරතුරු ඉදිරිපත් කළේ නෑ. යුද හමුදා බුද්ධි අංශය එහි සිටියා. ජාතික බුද්ධි ප්‍රධානියා මේ ලිපිය පෙන්වා ඇසුවා ඇයි කතා කරන්නේ නැද්ද කියලා. එවිට නිලන්ත කිව්වේ ටිම් එකක් ඇරලා තියෙන්නේ, විමර්ශන කරනවා, මම පොලිස්පතිවරයාට වාර්තාවක් යැව්වා, මම සර්ටත් සම්පූර්ණ වාර්තාවක් එවන්නම් කියලා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - රටේ ආරක්ෂාව භාර නිලධාරියා ලෙස පූර්ණ අවබෝධයක් තිබිය යුතුයි නේද?

සාක්ෂිකරු - එහෙමයි ස්වාමීනී.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - මේ සම්බන්ධයෙන් 16 වැනිදා වෙනකල් ක්‍රියා කර තිබුනේ නෑ නේද?

සාක්ෂිකරු - එහෙම වෙන්න බෑ. පොලිස්පතිවරයා 12 වැනිදා වන විට නියෝජ්‍ය පොලිස්පතිවරුන් දැනුවත් කර තිබුණා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අවශ්‍ය කටයුතු සඳහාද යොමු කර තිබුණේ?

ඒ වගේ තොරතුරක් ලැබුණම පළපුරුදු නිලධාරීන් දන්නවා කරන්න ඕන දේ. ඒ අය හොඳින් කටයුතු කර තිබුණා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - එස්. ටී.එම්. ප්‍රධානී ලතීෆ් මහතා විදේශ ගත වෙලා නේද හිටියේ? කවුද අවසර ලබා දුන්නේ?

සාක්ෂිකරු - පසුව දැනගත්තා. ඒ වන විටත් බුද්ධි තොරතුරු සනාථ වී තිබුණේ නැහැ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - කාත්තන්කුඩි පිපුරුමක් ගැන දැනුවත් වුණාද?

සාක්ෂිකරු - නිලන්ත දුරකථන ඇමතුමක් දුන්නාම 16 වැනිදා පිපුරුමක් ගැන 18 වැනිදා දැනගත්තේ.

බෝම්බකාරයො බෝම්බ බැඳ ගත්තට පස්සේ නවත්තන්න බෑ

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අප්‍රේල් 19, 20 දිනවල යම් දෙයක් වෙයි කියලා දැනුවත් කළාද?

සාක්ෂිකරු - අප්‍රේල් 4 වැනිදා සිට 20 වැනිදා දක්වා කිසිම තොරතුරක් ලැබී තිබුණේ නැහැ. පොලිස්පතිවරයාට වාර්තා තුන හතරක් යොමු කර තිබුණා. 20 වැනිදා තොරතුරු ලැබුණම පොලිස්පතිවරයා සමඟ කතා කර උපදෙස් දුන්නා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - තොරතුරු ලැබුණම ආරක්ෂක අංශ කැඳෙව්වේ නෑ නේද?

සාක්ෂිකරු - මට සනාථ වූ තොරතුරු ලැබී තිබුණේ නැහැ. තොරතුරු විශ්වසනීය බව තහවුරු වුණාමයි පියවර ගත හැකි වන්නේ. නිලන්ත වට්ස්ඇප් පණිවිඩයක් එවා මට කතා කළා. මම ඇහුවා කරන්න ඕනෑ මොකක්ද කියලා. ඔහු කිව්වා රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - අප්‍රේල් 19, 20 දිනවල යම් දෙයක් වෙයි කියලා දැනුවත් කළාද?

සාක්ෂිකරු - අප්‍රේල් 4 වැනිදා සිට 20 වැනිදා දක්වා කිසිම තොරතුරක් ලැබී තිබුණේ නැහැ. පොලිස්පතිවරයාට වාර්තා තුන හතරක් යොමු කර තිබුණා. 20 වැනිදා තොරතුරු ලැබුණම පොලිස්පතිවරයා සමඟ කතා කර උපදෙස් දුන්නා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - තොරතුරු ලැබුණම ආරක්ෂක අංශ කැඳෙව්වේ නෑ නේද?

සාක්ෂිකරු - මට සනාථ වූ තොරතුරු ලැබී තිබුණේ නැහැ. තොරතුරු විශ්වසනීය බව තහවුරු වුණාමයි පියවර ගත හැකි වන්නේ. නිලන්ත වට්ස්ඇප් පණිවිඩයක් එවා මට කතා කළා. මම ඇහුවා කරන්න ඕනෑ මොකක්ද කියලා. ඔහු කිව්වා පොලිස්පතිට කතා කළා, සර්ත් කතා කරන්න කියලා. මමත් කතා කළා. ඒ වෙලාවේ පොලිස්පති උපදෙස් දෙමින් හිටියේ. තීරණ ගන්න දේශපාලන නායකත්වය තිබුණෙත් නෑ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - කතෝලික පල්ලිවලට ආරක්ෂාව ලබා දී තිබුණද?

සාක්ෂිකරු - ඒ ගැන ගැටලුවක් තිබෙනවා. කොච්චිකඩේ, කටුවාපිටිය පල්ලිවලට ආරක්ෂාව ලැබී තිබුණේ නැහැ. ඒ ගැන කොමිසමේ අවධානය යොමු කළ යුතුයි.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ඔබ කුච්චවේලි නාවික හමුදා කඳවුරේ සිටියදී සිදු වූ ප්‍රහාරයත් මඟ හැර ගියා නේද?

සාක්ෂිකරු - තොරතුරු ලැබුණු දින ප්‍රහාරය සිදු වුණේ නැහැ. මම දින පහකට පසුව ආවේ. මට මින් පෙර දින වැරදුණා. මම කොමිසම දැනුවත් කළා. මම මාස තුනක් සඳහා ගියේ. මාස හයක් සිටියා.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය - ආරක්ෂාව භාරව සිටියේ ඔබ.

සාක්ෂිකරු - එය විවාදාත්මක කරුණක්. ජනාධිපති බලතල විදේශ ගත වන විට කාටවත් පැවැරුවේ නැහැ. විධිමත් ලෙස පැවැරුවේ නැත්නම් ලෝකයේ කොහේ හිටියත් බලතල එතුමා සතුව තියෙන්නෙ.

රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය හිටපු ආරක්ෂක ලේකම්වරුන් ජාතික ආරක්ෂාව භාර වගකීම් නොපිරිහෙළා ඉටු කළ බව පිළිගන්නවාද?

සාක්ෂිකරු - එහෙමයි ස්වාමීනී.

ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා - ඒ කියන්නේ ඔබ ආරක්ෂක ලේකම්වරයා ලෙස ලංකාවේ සිටියදී සිංගප්පූරුවේ සිටි ජනාධිපතිවරයා වගකියන්නේ ඕනෑ කියලද?

සාක්ෂිකරු -

මට වගකීම් භාර දී තිබුණේ නැහැ. මම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා.

ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා - ආරක්ෂක ලේකම්වරයකු රටක ආරක්ෂාව නොපිරිහෙළා ඉටු කළ බව පිළිගන්නවාද? ඒ වගකීම පැහැර හැරිය නිසයි ජනාධිපතිවරයා කිව්වේ වගකීම පැහැර හැරියා කියලා.

සාක්ෂිකරු - එහෙම ප්‍රකාශ කරන්න් කොහොමද, අනෙක් අයගේ කටඋත්තර ගන්නේවත් නැතිව නම් කිරීම කොයිතරම් දුරට සදාචාරාත්මකද කියා මෙහිදී මම මතු කර සිටිනවා.

ජනාධිපති නීතිඥ අනිල් සිල්වා මහතා - ආරක්ෂක ලේකම්වරයා ලෙස වගකීමක් දැරුවේ නැහැ කියලා මම යෝජනා කරනවා.

සාක්ෂිකරු - ඒ යෝජනාව මම ප්‍රතික්ෂේප කරනවා. ලේකම්වරුන් වැඩ කරන, වගකීමෙන් බැඳෙන ක්‍රමවේදයක් තිබෙනවා. ලේකම්වරයා ලෙස කරන්න පුළුවන් උපරිමය මම කළා.

ජනාධිපති නීතිඥවරයා - ඔබට රාජ්‍ය බුද්ධි අංශවලින් තොරතුරු ලැබුණා නේද?

සාක්ෂිකරු - රාජ්‍ය බුද්ධි අංශය විතරයි මට තොරතුරු දුන්නේ. හමුදා බුද්ධි අංශය මට කිසිදාක බුද්ධි තොරතුරු දී නැහැ. රාජ්‍ය බුද්ධි අංශය දෙන වැදගත් තොරතුරු අපි බුද්ධි රැස්වීමේ සාකච්ඡා කරනවා. වසර 10ක් තිස්සේ සාමය තිබූ රටක් ශ්‍රී ලංකාව. මෙවැනි ප්‍රහාරයක් විය හැකි බවට වාර්තා ලැබී තිබුණේ නැහැ.

හිටපු රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මධු ජයතිලක මහත්මිය - අප්‍රේල් 18 වැනිදා බයිසිකල් පිපුරුමක් වූ අවස්ථාවේ ඒ බව රාජ්‍ය බුද්ධි ප්‍රධානියා දැනුම් දුන්නා නේද? ප්‍රහාරයට පෙර මාවනැල්ල අලියාර් හන්දිය, වවුනතිව්, පාලම්කුඩා ඇතුළු ස්ථාන ගණනාවක සිද්ධීන් රැසක් සිදු වුණා. ඒ ඩොට් කනෙක්ට් කරලා මේවා එකින් එක ගලපගන්න බැරි වුණාද? ඔබ තනි ගමනක් ගියා. ඒ නිසා ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණා කියා යෝජනා කරනවා.

සාක්ෂිකරු - මම ඉන්නේ ඩොට් කනෙක්ට් කරන්න නෙමෙයි. රාජ්‍ය බුද්ධි සේවාව ඉන්නේ ඒකට. ඒ අයගේ වගකීම් මට ගන්න බැහැ. අප්‍රේල් 4 වැනිදා සිට 20 වැනිදා දක්වා ලැබුණු තොරතුරු සනාථ කළා නම් අපිට මෙය යම් ප්‍රමාණයකට අවම කර ගන්නා තිබුණා. අවසාන දින 20 වැනිදා දන්වනකල් ආරක්ෂක ලේකම් සිටියේ අඳුරේ. පොලිස්පතිවරයාට, යුද හමුදාපතිවරයාට මේ තොරතුරු දන්වා තිබුණා. කිසිම දෙයක් නොකියා සිදුවීම වුණාම ආරක්ෂක ලේකම් වැරදිකාරයා. ඔය කියන ඒවා කරලා ප්‍රහාරය සිදු නොවුණා නම් ජාතික අසමගිය ඇති කර ප්‍රශ්නයක් ඇති කළා කියලා ආරක්ෂක ලේකම්වරයා වැරදිකාරයා කරයි. මේ දේවල් හරිම පරිස්සමෙන් කරන්න ඕනෑ ස්වාමීනී.

මේ අවස්ථාවේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සිටි හේමසිරි ප්‍රනාන්දු මහතා, "ස්වාමීනී මට හයියෙන් කතා කරන්න අමාරුයි." යනුවෙන් කොමිසමට සිදු කළ දැනුම් දීමකට අනුව හේමසිරි ප්‍රනාන්දු මහතාගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත තවදුරටත් සාක්ෂි විමසීම සිදු කළ නොහැකි බව කොමිසමේ සභාපතිවරයා දැනුම් දෙමින් ඉදිරි දිනයක කැඳවන ලෙස නියෝග කළේය.

ලෝක ජනාවාස දිනය අදයි

සැමරුම් උත්සවය අරලියගහ මන්දිරයේදී

ලෝක ජනාවාස දින සැමරුම් උත්සවය - 2020 ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආශිර්වාදයෙන් හා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අද (05) ප.ව. 02.00ට අරලියගහ මන්දිරයේ දී පැවැත්වේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1985 වසරේ වාර්ෂික සැසිවාරයේ දී ඉදිරිපත් කෙරුණු යෝජනාවකට අනුව 1986 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය (World Habitat Day) වශයෙන් ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව මෙවර ලෝක ජනාවාස දිනය අද (05) දිනට යෙදී ඇත. පසුගිය වසර 33ක කාලය තුළ නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාළ විවිධ වූ තේමාවන් යටතේ ලෝක ජනාවාස දින සැමරුම සිදු කරනු ලැබ

පුරාවිද්‍යා ස්ථාන රැක ගන්නවා

ආරක්ෂක ලේකම්

අනුරාධපුර අතිරේක හා අනුරාධපුර මධ්‍ය විශේෂ

පුරාවිද්‍යා ස්ථාන විනාශ කරමින් සිදු කරන අපරාධය පිළිබඳ දැඩි අවධානය ලක් කළ යුතු බවත් පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වෙන්නට නොදී බේරා ගෙන සංරක්ෂණය කිරීමට පියවර ගන්නා බවත් ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න මහතා සඳහන් කළේය.

ආරක්ෂක ලේකම්වරයා මේ අදහස් ප්‍රකාශ කළේ පසුගිය දා (02) මිහින්තලා රාජමහා විහාරය නිරීක්ෂණ කොට එම විහාරයේ මිහිඳු මහා සෑය, ධාතු මන්දිරය හා මිහිඳු ගුහාවට පිවිසෙන පියගැට පෙළ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු පිළිබඳ පැවති සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

ආරක්ෂක ලේකම්වරයා තවදුරටත් මෙසේද සඳහන් කළේය.

"ගරා වැටෙමින් පවතින බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කර ජනතාවට වැදුම් පිදුම් කර ගන්න අවස්ථාව සලසා දෙන්නට කියලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන් උපදෙස් ලබා දී තිබෙනවා. ස්ථාන කිහිපයක ප්‍රතිසංස්කරණ කටයුතු මේ වනවිටත් ආරම්භ කර තිබෙනවා.

තිස් වසරක් පැවති යුද්ධය අවසන් වීමෙන් පසුව පස් වන විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් යුද්ධයේ දී රට ජාතිය වෙනුවෙන් දිවි දුන් සෙබළුන් සිහි කරමින් සඳහිරු සෑය අනුරාධපුරයේ ඉදි කිරීමේ කටයුතු ආරම්භ කළා. පසුගිය කාලයේ ඉතාමත් මන්දගාමීව එහි වැඩ කටයුතු සිදු වුණේ. නමුත් හැකි තරම් ඉක්මනින් එහි වැඩ කටයුතු අවසන් කර ඒ සෑය බෞද්ධ ජනතාව වෙනුවෙන් ජනගත කරන්න කටයුතු සූදානම් කරන්න කියල ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමා අපට උපදෙස් දී තිබෙනවා. තව වසර එක හමාරක් පමණ වනවිට සඳහිරු සෑය අපේ රටේ ජනතාවට වන්දනා මාන කළ හැකි ඉතාමත් අනර්ඝ චෛත්‍ය රාජයාණන් වහන්සේ නමක් බවට පත් කරන්න හැකියාව ලැබෙයි.



ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ සඳහිරු සෑය

නැගෙනහිර පළාතේ තිබෙන ශ්‍රේෂ්ඨතම බෞද්ධ සිද්ධස්ථානය වන දීඝවාපි චෛත්‍ය රාජයාණන් වහන්සේ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අපි මෑතක දී ආරම්භ කළා. ඒ සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකාවට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණා. අපි රජයෙන් මුදල් ලබා ගන්නේ නැතිව අපේ රටේ බෞද්ධ ජනතාවගේ සහයෝගය ඇතිව ඔවුන් දෙන මුදල්වලින් එම සෑය හමුදා හා සිවිල් ආරක්ෂක බළකායේ ශ්‍රමය යොදවා ප්‍රතිසංස්කරණය කරනවා.

මිහින්තලා රාජමහා විහාරස්ථාන භූමියේ පිහිටා ඇති ගරාවැටී තිබෙන මිහිඳු මහා සෑය මිහින්තලා රාජමහා විහාරස්ථාන විහාරාධිපති ආචාර්ය වළවාහැංගුණවැවේ ධම්මරතන නාහිමිගේ අනුශාසකත්වයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දුන්නා.

ඊට අවශ්‍ය සැලසුම් සකස් කර ගැනීමට මාස තුනක පමණ කාලයක් ගත වෙයි කියල අපි විශ්වාස කරනවා. ඒ අනුව මෙහි ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව අධ්‍යයනය කර ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් මාස තුනක් ඇතුළත ප්‍රතිසංස්කරණ කිරීමට බලාපොරොත්තු වෙනවා. මිහිඳු මහා රහතන් වහන්සේ පිරිනිවන් පා දෙදාස් දෙසිය අසූවක් වන සංවත්සරය යෙදී ඇති මේ මාසයේ 23 දින මිහිඳු මහා සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරනවා.

නව රජය බලයට පත් වූ පසුව මහා සංඝරත්නය විසින් ජනාධිපතිතුමන්ගෙන් පුරාවිද්‍යා වස්තු විනාශ කිරීමට නොදී රැක ගැනීම සඳහා කළ ඉල්ලීමට අනුව ජනාධිපති කාර්ය සාධක බළකායක් පිහිටවනු ලැබුවා. අපි ඒ සම්බන්ධ විශාල කාර්යභාර්යක් සිදු කරනවා. නැගෙනහිර හා උතුරු පළාතේ විනාශයට පත්වෙමින් යන සියලුම ස්ථාන ආරක්ෂා කරනවා."

මෙහි දී මිහින්තලා රජමහා විහාරස්ථානයට අදාළ භූමිය සීමා නිර්ණය කරමින් එය රැක ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සලසා දෙන මෙන් අදාළ අංශ නිලධාරීන් වෙත ආරක්ෂක ලේකම්වරයා උපදෙස් ලබා දුන්නේය.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් රියාර් අද්මිරාල් ආනන්ද පීරිස්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක යන මහත්වරුන් ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීහු ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ රාජ්‍ය පරිපාලන අංශවල නිලධාරීහු ද මෙම අවස්ථාව සඳහා එක්ව සිටියහ.

ඡායාරූපය- අනුරාධපුර අතිරේක අමිල ප්‍රභාත් වනසිංහ

2030 වන විට විදුලියෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්තියෙන්

හගොඩ සමූහ - පී.පී.ජී.සුගතදාස

ශ්‍රී ලංකාවේ විදුලි ප්‍රවර්ධන ව්‍යාපෘති යටතේ වසර 2030 වන විට මෙරට විදුලිය ජනනය සියයට 70ක් පමණ පුනර්ජනනීය බල ශක්තිය මඟින් නිෂ්පාදනය කිරීම අරමුණ වී තිබෙන බව විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා පවසයි.

මාතර දිස්ත්‍රික්කයේ තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සූර්ය පැනල් පද්ධතිය ජනතා අයිතියට පත්කිරීමෙන් අනතුරුව එම සභා පරිශ්‍රයේ පැවති ජනහමුවක් අමතමින් අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා මෙසේ ද පැවසීය.

දැනට ශ්‍රී ලංකාවේ විදුලිය නිෂ්පාදනයෙන් සියයට 30ක් පමණ නිපදවනු ලබන්නේ ඩීසල් උපයෝගී කර ගෙන බවත් ඒ සඳහා විශාල පිරිවැයක් රජයට දැරීමට සිදු වී තිබෙන බවත් කීය. සූර්ය පැනල් පද්ධති හරහා විදුලිය ජනනයෙන් රජයට සැලකියයුතු පිරිවැයක් ඉතිරි කර ගත හැකි වන බවත් එම වැඩපිළිවෙළ මඟින් කිසිදු පරිසර හානියක් සිදු නොවන බවත් හෙතෙම පැවසී ය.

විදුලිය පරිභෝජනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාවට තම මාසික ආදායමෙන් සැලකිය යුතු මුදලක් වැය කරනවා යැයිද මාසිකව විදුලි ඒකක 30 අඩුවෙන් පාවිච්චි කරනු ලබන මෙරට පවුල් සංඛ්‍යාව ලක්ෂ 12 පමණ වනවා යැයිස කී අමාත්‍යවරයා එම විදුලිය ඒකකයක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් රුපියල් 23ක් වැයකරනවා යැයිද කීය.

සූර්ය පැනල් පද්ධති මඟින් විදුලිය ජනනය කිරීම ලාභදායි බැවින් එම වැඩපිළිවෙළ රට පුරා ව්‍යාප්ත රීම රජයේ අපේක්ෂාව බව සඳහන් කළේ ය. දැනටමත් මෙම ව්‍යාපෘති කඹුරුපිටිය හා තිහගොඩ ප්‍රාදේශීය සභාවන්හි ආරම්භකර ඇති අතර එමගින් මාසික විදුලි බිල පියවාගත හැකිවන අතර ඊට අමතරව සභාවට අමතර ආදායමක් උපයාගතහැකි වන බවද අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේ ය.

තිහගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති නිර්මාල් ලක්ෂ්මන් සමරසිංහ මහතා රැස්වීම අමතමින් සූර්ය පැනල් පද්ධතිය තිහගොඩ ප්‍රාදේශීය සභාවේ ආරම්භ කිරීම වෙනුවෙන් සභාවේ ජනතා නියෝජිතයන් ඇතුලු සමස්ත කාර්ය මණ්ඩලයේ හා ප්‍රදේශවාසි ජනතාවගේ ගෞරවනීය ස්තුතිය විදුලි බල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතාට පිරිනමන බව සඳහන් කළේ ය.

විදෙස් මුදල් රටට ගෙනෙන කෙරවලපිටිය කර්මාන්තපුර මාර්ගය සංවර්ධනයට පියවර

නිමල් රාජපක්ෂ

දේශීය හා විදේශීය ආයෝජක කර්මාන්ත රැසක් පිහිටා ඇති අධිවේගී මාර්ගයට ප්‍රවේශ මාර්ගයක් වන කෙරවලපිටිය කර්මාන්තපුර මාර්ගය මං තීරු හතරක් යටතේ සංවර්ධනය කිරීමට තීරණය කර තිබේ.

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව යමින් ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු සොයා බැලීමට ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා අදාළ නිලධාරීන් සමග පෙරේදා (03) එම මාර්ගයේ නිරීක්ෂණයකට එක් විය.

දේශීය හා විදේශීය ආයෝජකයන් රට තුළ රඳවා ගැනීමට මාර්ග ඇතුළු යටිතල පහසුකම් සපුරා දීම ඉතා වැදගත් බව රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා පැවසීය.

මෙම ප්‍රදේශයේ නව ආයෝජකයන් සිය කර්මාන්ත ආරම්භ කිරීමට සූදානමින් සිටින බැවින් මාර්ගය විධිමත් ලෙස සංවර්ධනය කිරීම පමණක් නොව මාර්ගය අවට සිත් ගන්නා සුලු ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කරන ලෙස ද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මන්නාරම බලශක්තියේ කේන්ද්‍රස්ථානයක් කළාට රදගුරුගෙන් තුති

තිසර සමල් - එප්පාවල

පුනර්ජනනීය බලශක්තියේ කේන්ද්‍රස්ථානයක් ලෙස මන්නාරම නගරය තෝරා ගැනීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරන බව මන්නාරම රදගුරු ෆෙටලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා පැවසුවේ ය.

මන්නාරම රදගුරු ෆෙටලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා හා සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය දුමින්ද දිසානායක මහතා එක්ව මන්නාරමේ රදගුරු නිල නිවෙසේදී සාකච්ඡාවකදී රදගුරුතුමා මේ බව සඳහන් කළේය.



මන්නාරම ඉදි වෙමින් පවතින සුළං බලාගාරය සම්බන්ධයෙන් රදගුරුතුමන් දැනුවත් කළ අමාත්‍යවරයා, මන්නාරම පුනර්ජනනීය බලශක්තියේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනවා යැයි ද පැවසීය. ඒ අනුව මන්නාරමට ඉතා නුදුරින්ම පිහිටි ඉන්දියාවටද විදුලිය ලබා දීමේ හැකියාව පවතින බවද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

මහනුවර සහ අනුරාධපුර එජාප ප්‍රවර්ධන වැඩසටහන්

ශිරෝමි අබයසිංහ

එක්සත් ජාතික පක්ෂය ප්‍රතිසංවිධානය කරන වැඩපිළිවෙළ යටතේ පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා සහභාගී වන පක්ෂ ප්‍රවර්ධන වැඩසටහන් මහනුවර සහ අනුරාධපුර ප්‍රදේශවලදී හෙට (6) සිට දින තුනක් පැවැත්වේ.

පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් පාලන නියෝජිතයන්, ආසන සංවිධායකවරුන් සහභාගී වන මෙම වැඩසටහන්වලදී ප්‍රදේශයේ මහජනතාව හමු වී පක්ෂයේ ඉදිරි ගමන පිළිබඳ දැනුවත් කිරීම කෙරේ. පක්ෂ ප්‍රතිසංවිධාන කටයුතු සඳහා මහජනතාවගේ අදහස් ලබා ගැනීම ද මෙහි දී අරමුණු කෙරේ.

පසුගිය ආණ්ඩු සමයේදී සිදු වූ අඩුපාඩු නිවැරදි කර ගනිමින් රට වටා ගොස් මහජනතාවට සමීප පක්ෂයක් ගොඩනැංවීම කෙරෙහි නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතාගේ අවධානය යොමු වී තිබේ.

20ට අත්‍යවශ්‍ය සංශෝධන දෙන්න ලෑස්තියි

අමාත්‍ය, වෛද්‍ය රමේෂ් පතිරණ

දික්වැල්ලේ තිලකරත්න

විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත්‍යවශ්‍ය සංශෝධන තිබෙනවා නම් කාරක සභා අවස්ථාවේ දී රට ගැන සිතා ඊට යහපත් තීන්දු තීරණ ඉදිරිපත් කරන බව වැවිලි අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා (02) පැවසීය.

ගාල්ල යටගල රාජමහා විහාරස්ථානයේ පැවති ලෝක ළමා දින උත්සවයට සහභාගී වීමෙන් පසුව මාධ්‍යවේදීන් අමතමින් අමාත්‍යවරයා මේ බව කීවේ ය.

අමාත්‍යවරයා තවදුරටත් මෙසේද සඳහන් කළේ ය.

විසි වන ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් කටයුතු කරන්නේ ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදීව. එහිදී ප්‍රජාතන්ත්‍රවාදී අයිතියේ කොටසක් විදියට උසාවියට පෙත්සම් ඉදිරිපත් වී තිබෙනවා. මෙහිදී අධිකරණය ලබාදෙන සියලු තීන්දු තීරණවලට අනුකූලව කටයුතු කරන්න අපි ලෑස්ති වී සිටිනවා.

අදාළ නඩු තීන්දුවෙන් පසුව ලැබෙන තීන්දු තීරණ අනුව එම සංශෝධනය පිළිබඳ ඉදිරි කටයුතු කෙරෙනවා. මෙහිදී අපිට ලබා දිය හැකි සහතිකය මේ රටේ ජනතාව තුනෙන් දෙකක ජනතා බලයක් පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන්නේ 19 වැනි සංශෝධනයේ රටට අහිතකර කොටස් ඉවත් කර රට වෙනුවෙන් ඉදිරි යහපත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා යි. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමා කැප වී සිටිනවා. ජනාධිපතිතුමා රටේ සංවර්ධනය ශක්තිමත්ව ඉටුකරන්න බලා සිටිනවා. අපි ඒ සඳහා තිබෙන නීතිමය බාධක ඉවත් කිරීම සිදු වෙනවා.

අපි ඉතා පැහැදිලිව අත්‍යවශ්‍ය බඩු මිල පාලනය කිරීම සඳහා නීති රැසක් සහ ක්‍රම වේද රැසක් ක්‍රියාත්මක කරනවා. ඒ සඳහා ජීවන වියදම් කමිටුවක් පත් කර තිබෙනවා. යම් යම් කාල සීමාවන් තුළ දී බඩු මිල වැඩි වීම් තාවකාලිකව සිදු වී ඇති බව පිළිගන්නවා. ඒවාට දැන් පිළියම් යොදමින් පවතිනවා.

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ සිරකරුවන්ගේ පුනරුත්ථාපන වැඩසටහන කඩිනම් කරන්න

රාජ්‍ය අමාත්‍යවරියගෙන් උපදෙස්

බුද්ධිකා ඉඹුලාන

මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්ව රක්ෂිත බන්ධනාගාරගත වී සිටින සිරකරුවන්ගේ රස පරීක්ෂක වාර්තා කඩිනම් කර, පුනරුත්ථාපනයට යොදාගත හැකි සිරකරුවන් විශේෂ පුනරුත්ථාපන වැඩසටහනට එක්කර ගන්නා ලෙස බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය ඇමැතිනී, විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය මත් ලෝලීන් පුනරුත්ථාපනයට පත් කළ ජාතික කමිටුවට දැනුම් දී තිබේ.

ඊට ප්‍රමුඛතාව ලබා දී ඒ සඳහා හඳුනාගෙන ඇති 400ක පමණ පිරිසක් යොදා ගැනීමට අවශ්‍ය කටයුතු ඔක්තෝබර් 15ට පෙර වහා ආරම්භ කළ යුතු යැයිද කමිටුව හමුවේ රාජ්‍ය ඇමැතිනිය සඳහන් කර ඇත. මත් ලෝලීන් පුනරුත්ථාපනයට පත් කළ ජාතික කමිටුවේ සැලසුම්, ප්‍රගතිය පිළිබඳ විමසා බැලීම සඳහා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පසුගියදා පැවැති සාකච්ඡාවකදී රාජ්‍ය ඇමැතිනිය මේ බව සඳහන් කර තිබේ.

මත්ලෝලීන් පුනරුත්ථාපනය සඳහා මූලෝපායික සැලසුම් සකස් කිරීමට පත් කළ ජාතික කමිටුවේ නියමු ව්‍යාපෘතියක් ලෙස මූලික වශයෙන් 400ක පිරිසක් විශේෂ පුනරුත්ථාපනයට යොදා ගැනීම සඳහා හඳුනාගෙන තිබේ. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගතව සිටින එම රැඳවුවන්ගේ රස පරීක්ෂක වාර්තා ඔක්තෝබර් 12 වන දිනට පෙර අවසන් කරන ලෙස රජයේ රස පරීක්ෂකවරියට දන්වා ඇති අමාත්‍යවරිය, දැනට ඉඩ පහසුකම් පවතින පල්ලන්සේන, පල්ලෙකැලේ සහ බදුල්ල බන්ධනාගාරවල එම රැඳවුවන්ගේ විශේෂ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දී තිබේ.

රස පරීක්ෂක වාර්තා නොමැතිව 8000ක පමණ පිරිසක් රක්ෂිත බන්ධනාගාරගතව සිටින අතර මෙම වැඩපිළිවෙළ අනුව රස පරීක්ෂක වාර්තා කඩිනම් කර ඔවුන් ද මේ සඳහා යොදා ගැනීමට යෝජිතය. එමගින් බන්ධනාගාර තදබදය යම් පමණකට අඩුකරගත හැකි වනු ඇති බව රාජ්‍ය අමාත්‍යවරිය මෙහිදී විශ්වාසය පළ කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීමට ඉඩ ඇති පාසල් ළමයින්, තරුණ පරපුර ඉන් වළක්වා ගැනීම සඳහා මෙම කමිටුවෙන් විශේෂ වැඩපිළිවෙළක් සකස් කරමින් සිටී.

මෙම කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා අවශ්‍ය වන ඇතැම් නීති සංශෝධන සිදුකිරීමට යෝජනා ඉදිරිපත් කිරීමද කමිටුව මගින් සිදුකෙරෙන අතර ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා විහිදුනු විශේෂ වැඩපිළිවෙළක් මත්ලෝලීන් පුනරුත්ථාපනයට සකස්කර ඇත. අමාත්‍යවරිය මෙහිදී වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ සැලසුම් සාකච්ඡා ඉතා වැදගත් වුත් එය වඩාත් වැදගත් වන්නේ ඒවා ප්‍රායෝගික වූ විට පමණක් බවයි.

දිනමිණ The Dinamina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන අයිතම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් අංකය	ටෙන්ඩරයේ නම	ලංසු ඇපකරයේ වටිනාකම (රු.)	ලිපිලේඛන ගාස්තුව (වැට් බදු ඇතුළුව)	ලංසු භාරගැනීමේ අවසාන දිනය හා වේලාව
CMS/LP/20/PT/09/052	2021 වර්ෂය සඳහා සටහන් පොත්, සිහින් (Slim) දින පොත්, දින දර්ශන හා සුභපැතුම් පත් සැලසුම් නිර්මාණය සහ මුද්‍රණය සඳහා වන ප්‍රසම්පාදනය	112,200.00	3,500.00	2020-10-16 වෙනි දින 13.30 පැය පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව 2020-10-12 වෙනි දින 10.00 පැය

02. රු. මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ වන විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ මුළු කාලය පුරාම එකී පනත අනුවම බැඳී කටයුතු කරන ලෙස ඉහත සඳහන් ටෙන්ඩරය හා සම්බන්ධව සියලු පාර්ශ්වයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, ඕනෑම විදේශීය නිෂ්පාදකවරයෙකුගේ හෝ සැපයුම්කරුවෙකු සඳහා හෝ වෙනුවෙන් ඒජන්තවරයෙකු, උප-ඒජන්තවරයෙකු, නියෝජිතයෙකු හෝ නම් කරන ලද අයකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ලංසුකරුවෙකු පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි වී ස්වකීය ලංසු ලිපිලේඛන සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

03. ලංසුකරුවන් අවම වශයෙන් පසුගිය වසර තුන (3) ක කාලය තුළ සමාන ස්වභාවයේ භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක නිරත වී සිටිය යුතුය.

04. අභිලාෂී ලංසුකරුවන් හට, වැඩිදුර විස්තර තොරතුරු ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන කාර්යාල වේලාවන් තුළ පහත දැක්වෙන ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

05. අභිලාෂී ලංසුකරුවන් හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා 04 වන නිරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2020 **ඔක්තෝබර්** 06 **වෙනි දින** සිට ලංසු භාරගන්නා අවසාන දිනට පෙර දින දක්වා රාජකාරී දිනවලදී **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා** මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.

06. ලංසුව, එම ලංසු භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලු ලංසු සමග ඉහත සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),
සැපයුම් අංශය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 45, ලේඩ්න් බැස්ටියන් පාර, කොළඹ 01.
දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482652, 2482832, 2482409, 2482638,
ෆැක්ස් අංක : 2381652, 2470443

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

ලංසු සඳහා ආරාධනය

ආහාර සැපයීම සඳහා ලංසු කැඳවීම

ප්‍රධාන කාර්යාලය සහ මධ්‍යස්ථාන

01. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බස්නාහිර පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, නවදිගන්න නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, මධ්‍යම පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, දකුණු පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය සඳහා රසවත් භාවයෙන් සහ ගුණාත්මක භාවයෙන් යුත් පිසින ලද ආහාර හා කෙටි ආහාර සැපයීමට පළපුරුදු ආහාර සැපයුම්කරුවන්ගෙන් මිලගණන් කැඳවනු ලැබේ. සැපයුම්කරුවන් විසින් රු. 30,000/- ක තැන්පතුවක් තැබිය යුතුවේ.

01.1 එසේම රාජගිරියේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන පුහුණු වැඩසටහන් සඳහා පැකට් කරන ලද දහවල් ආහාර සහ කෙටි ආහාර සැපයීමට මිල ගණන්ද කැඳවනු ලැබේ. සැපයුම්කරුවන් විසින් රු. 20,000/- ක තැන්පතුවක් තැබිය යුතුවේ.

02. සම්පූර්ණ කරන ලද ලංසු කැඳවුම්පත් කට්ටලයක් පහත ස්ථානයන් මගින් 2020.10.05 දින සිට 2020.10.26 දින දක්වා සතියේ (වැඩකරන) දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළදී ආපසු නොගෙවනු ලබන රුපියල් 1,000.00 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් මිලදී ගත හැක.

01. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, නො. 383, කෝට්ටේ පාර, රාජගිරිය.

02. දකුණු පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, උණවටුන.

03. බස්නාහිර පළාත් නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 173/2, ශාන්ති මාවත, කොස්වත්ත, තලංගම.

04. නවදිගන්තය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මාගේනවත්ත, ඌරාපොළ, තිට්ටඹුව.

05. මධ්‍යම පළාත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මාම්පිටිය වත්ත, හත්දෙස්ස, මහනුවර.

03. නිසිපරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත **2020.10.27 වන දින මධ්‍යහ්න12.00 ට හෝ ඊට පෙර** ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු අතර, ලංසුපත් මුල්පිටපත හා අනුපිටපත යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා ලිපි කවර තුනෙහිම ඉහළ වම් කෙළවරේ ප්‍රධාන කාර්යාලය / බස්නාහිර පළාත් ප්‍ර. හා පු. මධ්‍යස්ථානය / නවදිගන්තය ප්‍ර. හා පු. මධ්‍යස්ථානය / දකුණු පළාත් ප්‍ර. හා පු. මධ්‍යස්ථානය / මධ්‍යම පළාත් ප්‍ර. හා පු. මධ්‍යස්ථානය සඳහා ආහාර සැපයුම යනුවෙන් සඳහන් කර මුදු, තබා ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ ලියාපදිංචි තැපෑලෙන් **අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, අංක 383, කෝට්ටේ පාර, රාජගිරිය** යන ලිපිනයට යොමු කිරීම සිදුකළ යුතුය. මුදල් ගෙවන ලද රිසිට් පත හෝ එහි ඡායාපිටපතක් අයදුම්පත සමග අමුණා එවන ලෙස දන්වා සිටිමි.

04. අනුපිටපත මුල්පිටපතෙහි සහතික කරන ලද ඡායාපිටපතක් විය යුතුය.

05. 2020.10.27 වන දින මධ්‍යහ්න 12.00 ට ආහාර සැපයීමේ ටෙන්ඩර්පත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ රැස්වීම් ශාලාවේදී විවෘත කරනු ලබන අතර, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි විය හැක.

06. අසම්පූර්ණ සහ ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

සභාපති,
ප්‍රසම්පාදන මණ්ඩලය,
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
383, කෝට්ටේ පාර, රාජගිරිය.

SriLankan Airlines oneworld

ශ්‍රීලංකන් ගුවන් සේවා අලෙවි අංශයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් හි තම සමාගම් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන දේශීය හා විදේශීය කීර්තිමත් සැපයුම්කරුවන්, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්ගේ අයදුම්පත් සඳහා මෙයින් ආරාධනා කෙරේ.

Procurement Category	Broad Listing of Items
Advertising	Creative agencies, media buying agencies (local / international), hoarding suppliers, media houses, publishing houses.
Promotions	Event management companies, suppliers of giveaway items / merchandising, production agencies, designers and interior design agencies / suppliers, fabrication agencies, printing suppliers, outdoor branding, hiring of furniture and other event management material, hiring of sounds and lights, vehicle hiring companies / suppliers, photographers, entertainment groups and comperes, hotels - for promotional and corporate events.
Brand Management	Production agencies, designers and interior design agencies.
PR Activities	PR agencies, media monitoring agencies, social media agencies, hotels, tour operators.
Digital and Social Media	Photographers, videographers, audio/video production agencies, event strategist companies, courier services, tour operators, hotels, content writers, digital research companies, web developers, social media listening and solutions services, translators, digital and social media buying and planning / seo/sem, digital marketing agencies.
Media Development	Photographers, Sinhala and Tamil writers.
Editorial and Publications	Translators - Sinhala, Tamil, Chinese, Japanese, Arabic, French and German, publishing houses.

ලියකියවිලි (සැපයුම්කරුවන්ට පොදු උපදෙස්, එක් එක් ප්‍රසම්පාදන කාණ්ඩයේ විස්තර සහ සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි කිරීම්) සෘජුවම පහත වෙබ් ලිපිනයෙන් බාගත කළ හැකිය.

https://www.srilankan.com/en_uk/coporate/tender-notices.

2020 ඔක්තෝබර් මස 04 වන දින පැය 1100 සිට බලපැවැත්වේ. (ශ්‍රී ලංකා වේලාව GMT + 5:30)

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අවශ්‍ය සියලු ලියකියවිලි "ශ්‍රීලංකන් ගුවන් සේවා අලෙවි අංශයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් සලකුණු කරන ලද මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා 2020.10.25 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු අලෙවි,
ශ්‍රීලංකන් ගුවන් සේවය, අලෙවි අංශය, ගුවන් සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.

ඕනෑම අයදුම්පතක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය වාර්ෂිකව සිදු කිරීමට ශ්‍රීලංකන් ගුවන් සමාගමට අයිතියක් ඇත.

මහජන බැංකුව - උකස් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ, මාතර ප්‍රාදේශීකයට අයත් පහත සඳහන් ශාඛාවන් සහ සේවා මධ්‍යස්ථානවල 2019.01.31 වන දින දක්වා උකස් තබන ලදුව පහත උපලේඛනයේ සඳහන් දිනයන් දක්වා බේරානොගත් උකස් භාණ්ඩ මෙහි සඳහන් කර ඇති දිනයන් සහ ස්ථානයන්හිදී පෙ.ව. 9.00 සිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ශාඛාව	පහත දින දක්වා බේරාගනු නොලබන උකස් භාණ්ඩ	වෙන්දේසි දිනය	වෙන්දේසි ස්ථානය
මාතර ධර්මපාල මාවත ශාඛාව	2020.10.23	2020.10.24	දෙවිනුවර ශාඛාව
වල්ගම සේවා මධ්‍යස්ථානය			
මාතර උයන්වත්ත ශාඛාව			
කොටුවේගොඩ සේවා මධ්‍යස්ථානය			
යටියන සේවා මධ්‍යස්ථානය			
රුහුණ විශ්වවිද්‍යාල සේවා මධ්‍යස්ථානය			
වැලිගම ශාඛාව			
මිරිස්ස සේවා මධ්‍යස්ථානය			
හක්මණ ශාඛාව			
දෙයියන්දර සේවා මධ්‍යස්ථානය			
කිරින්ද පුහුල්වැල්ල සේවා මධ්‍යස්ථානය			
මෝරවක ශාඛාව			
ඕපාත සේවා මධ්‍යස්ථානය			
පිටබැද්දර සේවා මධ්‍යස්ථානය			
ඌරුබොක්ක ශාඛාව			
මාවරල සේවා මධ්‍යස්ථානය			
දෙණියාය ශාඛාව			
පල්ලේගම සේවා මධ්‍යස්ථානය			
කඹුරුපිටිය ශාඛාව			
මාකඳුර සේවා මධ්‍යස්ථානය			
දෙවිනුවර ශාඛාව			
ගන්දර ශාඛාව			
කැකණදුර සේවා මධ්‍යස්ථානය			
කෝට්ටගොඩ සේවා මධ්‍යස්ථානය			
වලස්ගල ශාඛාව			
දික්වැල්ල ශාඛාව			
අකුරැස්ස ශාඛාව			
තෙලිජ්ජවිල සේවා මධ්‍යස්ථානය			
වෙන්දේසියේදී නොවිකිණී ඉතිරි වූ භාණ්ඩ	-	2020.10.25	ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, මාතර

වෙන්දේසියට සහභාගිවන්නන් තම පුද්ගල හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසිය නැවත දැන්වීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම හෝ කල් දැමීම හෝ ඒකාබද්ධ කර පැවැත්වීම යන මෙයින් ඕනෑම කටයුත්තක් සිදුකිරීමේ අයිතිය බැංකුව සතුව ඇත.

ප්‍රාදේශීය කළමනාකරු,
මහජන බැංකුව,
අංක 215, අනගාරික ධර්මපාල මාවත, මාතර.

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ටෙන්ඩර් කැඳවීම

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සේවාවන් සඳහා යෝග්‍ය හා සුදුසුකම් සහිත සේවා සැපයුම්කරුවන්ගෙන් මුදු, තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

	කොන්ත්‍රාත්තුවේ නම	කොන්ත්‍රාත් අංකය	ආපසු නොගෙවන ටෙන්ඩර් මුදල
01	ඉංජිනේරු පීඨයේ උද්‍යාන නඩත්තු හා උද්‍යාන අලංකරණ සේවාව	USJP/EIS/LS/FOE/2020/2021	රු. 1,000.00
02	තාක්ෂණ පීඨයේ උද්‍යාන නඩත්තු හා උද්‍යාන අලංකරණ සේවාව	USJP/EIS/LS/FOT/2020/2021	රු. 2,500.00

02. ඉහත සේවාව දින 365 ක කාලයකට අදාළ වේ.

03. මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය ජාතික තරගකාරී මිල ගණන් කැඳවීමේ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ.

04. සෑම සේවා සැපයුම්කරුවෙකු විසින්ම රජය විසින් අනුමත 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතන පනත, 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත, සේවක අර්ථසාධක අරමුදල් පනත, සේවක භාරකාර අරමුදල් පනත, පාරිතෝෂිත ගෙවීම් පනත, පඩිපාලක සභා ආඥා පනත, සාප්පු හා කාර්යාල සේවක පනත, කම්කරු වන්දි ආඥා පනත, ආදී පනත් වලට අනුකූලව වැටුප් හා දීමනා ගෙවිය යුතු වේ.

05. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට දුරකථන අංක 011-2802856 ඔස්සේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා) ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර, 2020.10.05 දින සිට 2020.10.26 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා සතියේ දිනවල පහත ලිපිනයේදී ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කර බැලිය හැකිය.

06. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍ය සේවා සැපයුම්කරුවන්ට 2020 ඔක්තෝබර් 05 වන දින සිට 2020 ඔක්තෝබර් 26 වන දින දක්වා කාලය තුළ දී පහත ලිපිනයට ලිඛිතව අයදුම් කිරීමෙන් ආපසු නොගෙවන මුදලක් ගෙවීමෙන් අදාළ ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකිය. මෙම මුදල ගෙවිය යුත්තේ සතියේ රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත මුදලින් පමණි.

07. පූර්ව ප්‍රසම්පාදන පැහැදිලි කිරීම් රැස්වීමක් 2020.10.15 වනදින පෙ.ව. 10.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර, ඒ සඳහා සහභාගි වීම අනිවාර්ය වන අතර, මෙයට අයදුම් කළ හැක්කේ මෙම රැස්වීමට සහභාගි වන අයදුම්කරුවන්ට පමණි.

08. 2020 ඔක්තෝබර් 27 වන දින පෙ.ව. 10.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී මිල ගණන් වසා තබනු ලැබේ.

09. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ටෙන්ඩරයේ නම හා ටෙන්ඩරය විවෘත කරන දිනය සඳහන් කළ යුතුය. මුදු, තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 2020.10.27 දින පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි නුගේගොඩ, ගංගොඩවිල පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී / ආයතන (තොරතුරු හා සේවා) වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම හෝ නැතහොත් ඉහත කී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදුකළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කර ඒවා විවෘත නොකරම ආපසු ලංසුකරුවන් වෙත යවනු ලැබේ. ප්‍රමාදයන් සම්බන්ධයෙන් තැපැල් කිරීම සනාථ කිරීමේ සාක්ෂි නොපිළිගනු ඇත. මුදු, තබන ලද මිල ගණන් භාර ගැනීම සඳහා නියමිත වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයන්ට (එක් ලංසුකරුවෙකුට එක් නියෝජිතයෙකු බැගින්) මුදු, තබන ලද මිල ගණන් විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට හැකියාව ඇත.

10. මේ සම්බන්ධව ගනු ලබන තීරණ ප්‍රසම්පාදන අස්ථිතය සතුවේ.

11. ටෙන්ඩර් පත්‍රිකා භාර ගන්නා අවසන් දින සිට 2021 පෙබරවාරි 17 දින දක්වා මෙම ටෙන්ඩරය වලංගු වේ.

12. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක්ම ලංසු සුරක්ෂණයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද කරුණු සඳහා අදාළ ලිපිනයන් පහත දැක්වේ.

ටෙන්ඩර් පත්‍රිකා පරීක්ෂා කිරීම අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම, සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා භාර දීම

සහකාර ලේඛකාධිකාරී,
ආයතන (තොරතුරු හා සේවා),
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

ටෙන්ඩර් පත්‍රිකා විවෘත කිරීම

පරිපාලන ගොඩනැගිල්ලේ මාණ්ඩලික රැස්වීම් ශාලාව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

සභාපති / ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2020.09.30

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ සැපයුම් හා සේවාවන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට සැපයීම සඳහා ලියාපදිංචි වීමට කැමති දේශීය නිෂ්පාදකයින්, සැපයුම්කරුවන් හා ආයතන මගින් 2020.11.30 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආපසු නොගෙවනු ලබන ලියාපදිංචි කිරීමේ ගාස්තු සමග **ලේකම්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව, බෙලිඅත්ත** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය හැකිය. වෙක්පත් ලේකම්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව නමින් එවන්න.

අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2021** වශයෙන් සඳහන් කළ යුතු අතර, අයදුම්පත සමග ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයද ඉදිරිපත් කළ යුතුය.

අනු අංකය	සැපයුම	ලියාපදිංචි කිරීමේ ගාස්තු (රු.)
01.	ලිපි ද්‍රව්‍ය	500.00
02.	කාර්යාල උපකරණ, කාර්යාලීය ලී බඩු	500.00
03.	මුද්‍රණ සේවා	500.00
04.	සෞඛ්‍ය අංශය සඳහා පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ	500.00
05.	විදුලි උපකරණ	500.00
06.	මෝටර් රථ අමතර කොටස් අලුත්වැඩියාව හා සේවා කිරීම්	500.00
07.	පරිගණක යන්ත්‍ර අලුත්වැඩියාව	500.00
08.	ඉලෙක්ට්‍රොනික් උපකරණ සැපයීම හා අලුත්වැඩියාව	500.00
09.	වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව	500.00
10.	නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම	500.00
11.	ගොඩනැගිලි ද්‍රව්‍ය හා පෙර නිමි සිමෙන්ති භාණ්ඩ	500.00
12.	දුරකථන පද්ධති නඩත්තු කිරීම් හා එම උපකරණ සැපයීම	500.00
13.	නීති හා මිතිත්දේරු සේවා	500.00

(බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර, දෙවනුව හම්බන්තොට දිස්ත්‍රික්කයටත් තෙවනුව දකුණු පළාත තුළ සැපයුම්කරුවන් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ)

2020.09.28 දින
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

සිරිල් මුණසිංහ
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන අයිතම සඳහා යෝග්‍යතාපූර්ණ, සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

Tender No.	Name of Tender	Bid Security Amount (Rs.)	Document fee (Inclusive of VAT)	Closing Date & Time)
CES/FP/02/PT/5881(MP)	Spares for Caterpillar V900 Top Lift Trucks	50,000.00	1,000.00	03/11/2020 10.00 hrs
CES/FP/02/PT/6084 (EL)	100 Nos. Layer - 2 Access Switches for Data Wired Network of SLPA	500,000.00	12,500.00	03/11/2020 13.30 hrs
CES/FP/06/PT/6108 (MP)	16 Nos. Head Block Twist Lock for ZPMC STS Cranes at JCT	28,000.00	1,000.00	03/11/2020 13.30 hrs
CMS/LP/20/PT/09/029	Access Point	50,000.00	1,000.00	22/10/2020 13.30 hrs
CMS/LP/20/PT/08/008B	36 Nos. Dot Matrix Printer 80 - Coloumn	70,750.00	1,000.00	22/10/2020 13.30 hrs
CMS/LP/20/PT/09/019	Supply, Installation and Commissioning of Protection, Control and Monitoring System for Harbour Generator of TSHD Hansakawa	35,000.00	1,000.00	23/10/2020 13.30 hrs
CMS/LP/20/PT/10/052	1044 Nos. Filters for Cummins Engines fitted to RTGC'S at JCT UCT	60,000.00	1,000.00	28/10/2020 13.30 hrs

02. රු. මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ වන විධිවිධාන අදාළ වන බව ලංසුකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ මුළු කාලය පුරාම, එකී පනත අනුවම බැඳී කටයුතු කරන ලෙස ඉහත සඳහන් ටෙන්ඩරය හා සම්බන්ධව සියලු පාර්ශ්වයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, ඕනෑම විදේශීය නිෂ්පාදකවරයෙකුගේ හෝ සැපයුම්කරුවෙකු සඳහා හෝ වෙනුවෙන්, ඒජන්තවරයෙකු, උප-ඒජන්තවරයෙකු, නියෝජිතයෙකු හෝ නම් කරන ලද අයෙකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ලංසුකරුවෙකු පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි වී ස්වකීය ලංසු ලිපිලේඛන සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

03. ලංසුකරුවන් අවම වශයෙන් පසුගිය වසර තුන (3) ක කාලය තුළ සමාන ස්වභාවයේ භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක නිරත වී සිටිය යුතුය.

04. අභිලාෂී ලංසුකරුවන්හට, වැඩිදුර විස්තර තොරතුරු ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන කාර්යාල වේලාවන් තුළ පහත දැක්වෙන ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

05. අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා 04 වන තීරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, 2020 ඔක්තෝබර් මස 05 වන දින සිට ලංසු භාරගන්නා අවසාන දිනට පෙර දින දක්වා, රාජකාරී දිනවලදී, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.

06. ලංසුව, එම ලංසු භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ඉහත සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),
සැපයුම් අංශය - ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 45, ලේඩීන් බැස්ටියන් පාර, කොළඹ 01.

දුරකථන අංක : 2482231, 2483338, 2482499, 2482638, 2482832, 2482409,2482652
ෆැක්ස් අංක : 2381652, 2470443

සුභසෙන
සත වෙත සිරිසෙත සලසන සත්පත
පලාඵල හස්තරේඛා වාස්තුවිද්‍යා යෝගවිද්‍යාව ආයුර්වේද
වෙදකමටද හෙදකමටද - ගුරු කමටද හුරුකමටද
ජ්‍යෝතිෂායුර්වේද පන්හිඳ

ලුහුඬු දැන්වීම්

රථවාහන

109

මිට්සුබිෂි කාර් රථ

විකිණීම

64 - 2679 Mitsubishi Lancer Car ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216. සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 060553

117



වෑන් රථ

විකිණීම

53-5197 **Nissan** Vanette Van ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216. සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 060549

119

බස් හා ලොරි රථ

විකිණීම

WP PR - 6361 Manindra Maxximo Truck ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස්, පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216. සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 060562

WP PX - 0422 Mahindra Maxximo Truck ඉහළම ඉල්ලුමට විකිණීමට ඇත. සෙන්කඩගල ෆිනෑන්ස්, පීඑල්සී, මහනුවර. 0770107270, 0774789216. සඳුදා සිට සිකුරාදා දක්වා පමණක් අමතන්න. 060557

122

යතුරු පැදි හා ත්‍රීරෝද රථ

විකිණීම

ගාල්ල නගරයෙන් හීරෝ හොණ්ඩා සුපර් ස්පෙන්ඩර් මෝටර් සයිකලය තනි අයිතිකරු MI හාරදාස් කාණ්ඩය රක්ෂණය හා ආදායම් බලපත්‍රය ඇත. රුපියල් 45000/ - යි. දු. අංකය. 0774220406. 061142

රැකී රක්ෂා

313

ඇබෑර්තු

මුද්‍රණ

මැෂින් මයින්ඩර් අවශ්‍යයි. වර්ණ සංයෝජනය පිළිබඳ දැනුම සහිත හයිඩල්බර්ග් GTO ඕෆ්සෙට් මැෂින් ක්‍රියාකරවීමේ මනා පළපුරුදු මැෂින් මයින්ඩර් වරයෙකු අවශ්‍යයි. පෝලාර් ගිලටිනයක් ක්‍රියාකරවීමටද හැකි විය යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා සහතික පත්‍ර ද සමග පැමිණෙන්න. කරුණාකර අමතන්න. 0777-855107. 060991

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

මූලික පිරිවෙන් අවසාන විභාගය (නව/පැරණි) - 2020

2021 ජනවාරි හා පෙබරවාරි මාසවල දී පැවැත්වීමට නියමිත **"මූලික පිරිවෙන් අවසාන විභාගය (නව / පැරණි) - 2020"** සඳහා අයදුම්පත් භාරගනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව උක්ත විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මූලික පිරිවෙන් හා මහ පිරිවෙන් වලින් පමණක් බැවින් පසුගිය වර විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ සෑම ලියාපදිංචි මූලික පිරිවෙනකට හා මහ පිරිවෙනකටම අදාළ අයදුම්පත් මේ වනවිට තැපැල් මගින් එවා ඇත.

02. 2020 ඔක්තෝබර් මස 12 දින වන විටත් අයදුම්පත් නොලත් ලියාපදිංචි මූලික පිරිවෙනක් හෝ මහ පිරිවෙනක් හෝ වේ නම්, තම ආයතනයෙන් ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කර, අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාවෙන් ඉල්ලුම් කළ යුතුය.

03. මෙම විභාගයට ඉදිරිපත් වන බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය අයදුම්පත් සතියේ දිනවල කාර්යාල වේලාවන් හිදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණ ලබාගත හැකි අතර, තැපෑලෙන් ලබා ගැනීම සඳහා තම නම හා ලිපිනය ලියූ රු. 15.00 වටිනාකමකින් යුත් මුද්දර ඇලවූ 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග 2020 ඔක්තෝබර් මස 12 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතුය. එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මූලික පිරිවෙන් අවසාන විභාගය (නව / පැරණි) - 2020"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් (www.doenets.lk) බාගත කිරීමටද පහසුකම් සලසා ඇත. කිසියම් අයදුම්කරුවකුට යම් සම්බන්ධ ගැටලුවක් ඇතොත් දුරකථන අංක 011-2785230 හෝ 011-2786150 මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා උපදෙස් ලබාගත හැකිය,

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020 නොවැම්බර් මස 20 දින වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **" විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ."** යන ලිපිනයට යොමු කළ යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මූලික පිරිවෙන් අවසාන විභාගය (නව / පැරණි) - 2020"** යනුවෙන් සඳහන් කළ යුතුය.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්

5/5/4/4/2020
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2020 සැප්තැම්බර් මස 28 වන දින.

සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය

ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම

මිල කැඳවුම් අංක : අයිටීඑන්/ක්‍යු/48/2020

බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ ආපනශාලාව වසර දෙකක කොන්ත්‍රාත් කාලයකට පවත්වාගෙන යාම සඳහා පහත සුදුසුකම් සපුරාලන, 400 කට නොඅඩු සේවක සංඛ්‍යාවක් ඇති ආයතනවල ආපනශාලා පවත්වාගෙන යාමේ පළපුරුද්ද ඇති, පුද්ගලයන්ගෙන් හෝ ආයතනයන්ගෙන් මුදු, තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. මූලිකව වසර එකක කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනමනු ලබන අතර, සේවා ඇගයීමකින් අනතුරුව දෙවන වසර සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සලකා බලනු ලැබේ.

01. පසුගිය වසර 3 ක කාලයක සිට අඛණ්ඩව මේ දක්වා ආපනශාලා පවත්වාගෙන යනු ලබන ආයතනයක් හෝ පුද්ගලයෙකු විය යුතුය.

02. ආයතනය හෝ පුද්ගලයා තමින් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා තිබිය යුතුය.

අදාළ මිල කැඳවුම්පත් රු. 1,080.00 (8% වැට් බදු සමග) ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් හා රු. 5,000.00 ක ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතුවක් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ කළමනාකරු (සැපයුම්) වෙතට මුදලින් ගෙවීමෙන් 2020 ඔක්තෝම්බර් මස 26 වෙනි දින දක්වා සතියේ සාමාන්‍ය වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැක.

මිල ගණන් භාර ගැනීම 2020 ඔක්තෝම්බර් මස 27 වෙනි දින ප.ව. 2.00 ට අවසන් වන අතර, මුදු, තබන ලද මිල ගණන් එදින එම වෙලාවට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, **සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම ලිපිනයෙහි පිහිටි ඉදිරි ආරක්ෂක අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම කළ යුතු අතර, ලංසු බහා එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරෙහි **"මිල කැඳවුම් අංක : අයිටීඑන්/ක්‍යු/48/2020"** යනුවෙන් සඳහන් කළ යුතුය.

2020 ඔක්තෝම්බර් මස 27 වෙනි දින ප.ව. 2.30 ට ඉහත ලිපිනයෙහි පිහිටි ඉංජිනේරු අංශ කාර්යාලයේදී මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක. එදින එම වේලාවෙන් පසු යොමු කරනු ලබන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පූර්ව ලංසු රැස්වීම 2020 ඔක්තෝම්බර් මස 19 වෙනි දින පෙ.ව. 10.00 ට බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි සී/ස. ස්වාධීන රූපවාහිනී සේවයේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ. මේ සඳහා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු සහභාගි විය යුතුය.

මේ පිළිබඳ වැඩි විස්තර දුරකථන අංක : 0112774594 මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) ගෙන් හෝ දුරකථන අංක : 0112775493 මගින් කළමනාකරු (සැපයුම්) වෙතින් ලබාගත හැක.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සී/ස. ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

2021 වර්ෂයට සැපයුම්, සේවාවන් සහ කොන්ත්‍රාත් වැඩ සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ සැපයුම් හා සේවා ලබාගැනීම පිණිස 2021 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන්/දේශීය ඒජන්තවරුන්ගෙන් / සැපයුම්කරුවන්ගෙන් / සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කොන්දේසි :

1. පහත සඳහන් ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2020.11.15 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2021 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබේ.
2. පහත සඳහන් අයිතම **අංක 01, 02, 03,** සඳහා කළුතර දිස්ත්‍රික්කයේ පිහිටුවාගෙන ඇති ආයතන සහ කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලබන අතර, ඒ සඳහා අයදුම්කරන අයදුම්කරුවන් **තමන් ආයතනය පවත්වාගෙන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු අතර, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අමතරව වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ද ලියාපදිංචි වීමට අපේක්ෂා කරන ආයතන / කොන්ත්‍රාත්කරුවන් අදළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේද ලියාපදිංචි විය යුතුය.**
3. සෑම අයදුම්කරුවෙක්ම ලියාපදිංචි වීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා රු. 500/= ක මුදලක් ගෙවිය යුතුය. එම මුදල සඳහා ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුව, කළුතර ශාඛාවේ දිස්ත්‍රික් ලේකම්ගේ අංක 7041751 දරන ගිණුමට බැර කර ලබාගත් බැංකු ලදුපත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු අතර, ලියාපදිංචි වීමේ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
4. ලියාපදිංචි වීමට කැමති එක් එක් අයිතමයන් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළයුතු අතර, එම සියලුම ඉල්ලුම්පත් එකම කවරයක බහා එවිය හැක.
5. ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කිරීමේ හෝ නොකිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.
6. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්, සේවා සැපයුම් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා භාණ්ඩ හා සේවා ලබාගැනීමට සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ක්‍රියාකරන අතර, ප්‍රමාණවත් ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති විට ඉන් පරිබාහිර ආයතනවලින් මිල ගණන් කැඳවා මිලදී ගැනීමේ සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.
7. මිල ගණන් ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් නොකරන්නාවූද, ඇණවුම් සඳහා නියමිත වේලාවට භාණ්ඩ නොසපයන්නා වූද, ඉදිරිපත් කළ සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නා වූද, සැපයුම්කරුවන්ගේ නම් දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.
8. හදිසි අවශ්‍යතාවය සඳහා ණය පදනම මත භාණ්ඩ සැපයිය යුතු අතර, භාණ්ඩ සපයා මාසයක කාලයක් තුළ බිල්පත් තිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
9. බස්නාහිර පළාත තුළ ව්‍යාපාර පවත්වාගෙන යන තැනැත්තන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

අයිතම් අංකය	විස්තරය
1.	ගොඩනැගිලි ඉදිකිරීම සහ අලුත්වැඩියාව
2.	මහාමාර්ග, පාලම්, බෝක්තු ඉදිකිරීම සහ අලුත්වැඩියාව
3.	වැව්, ඇළවේලි, කෘෂි ළිං ඉදිකිරීම සහ අලුත්වැඩියාව
4.	සියලුම වෙල්ඩින් වැඩ හා ඇලුමිනියම් වැඩ
5.	වෙනත් (විදුලිය ලබාදීම හා අලුත්වැඩියාව)
6.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුළු නඩත්තු කටයුතු
7.	සියලුම වර්ගවල ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා
8.	පරිගණක ලිපිද්‍රව්‍ය (පරිගණක කඩදාසි, රිබන්, ඩිස්කට්, කාට්රිජ්, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර)
9.	සියලුම වර්ගයේ කාර්යාලයීය නිල නිවාස, සංචාරක නිවාස උපකරණ
10.	රබර් මුද්‍ර, දින මුද්‍ර, සහ බ්ලොක්
11.	පරිගණක යන්ත්‍ර, යතුරු ලියන, රෝණියෝ යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, එකතු කිරීමේ යන්ත්‍ර සහ එම අමතර කොටස්
12.	අභ්‍යන්තර දුරකථන පද්ධති , අන්තර්ජාල පහසුකම් සැපයීම
13.	ලෝහ, ලී සහ ප්ලාස්ටික් නාමපුවරු.
14.	සියලුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සහ උපාංග
15.	ටයර්, ටියුබ් සහ බැටරි
16.	සියලුම වර්ගයේ ගොඩනැගිලි ද්‍රව්‍ය
17.	ජලනළ සහ ජලාපවහන උපකරණ
18.	සියලුම වර්ගයේ විදුලි උපකරණ / බල්බ
19.	වායුසමීකරණ යන්ත්‍ර සහ එම අමතර කොටස්
20.	තීත්ත වර්ග සහ ඊට අදළ ද්‍රව්‍ය සැපයීම
21.	ක්‍රීඩා භාණ්ඩ සහ සුබසාධන භාණ්ඩ
22.	පිඟන්, කෝප්ප, හැඳි, ගැරුප්පු සහ විදුරු වැනි භාණ්ඩ
23.	නිල ඇඳුම්, වැහි කබා, සම්භාණ්ඩ සහ කාර්යාල බෑග්
24.	සංගීත උපකරණ පෙරදිග හා අපරදිග
25.	පිසූ ආහාර සහ තේ පැන් ආදිය සැපයීම
26.	මහන මැෂින් හා ගොවි උපකරණ
27.	පරිගණක යන්ත්‍ර, යතුරු ලියන, රෝණියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සහ ගණක යන්ත්‍ර වැනි භාණ්ඩ අලුත්වැඩියාව
28.	කාර්යාල ලී බඩු අලුත්වැඩියාව (පුටු විවීම, පොලිෂ් වැඩ ඇතුළුව)
29.	කාර්යාලයීය වැඩ, වානේ උපකරණ අලුත්වැඩියාව
30.	පවිත්‍රතා සේවා සැපයීම
31.	ආරක්ෂක සේවා සැපයීම
32.	ස්ථිර ජංගම දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැපයීම
33.	සියලුම වර්ගවල වාහන අලුත්වැඩියාව
34.	වාහන සේවා කිරීම
35.	වාහන වායුසමීකරණය කිරීම
36.	වාහන කුෂන් වැඩ
37.	ශීතකරණ යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර ඇතුළු විදුලි උපකරණ අලුත්වැඩියාව
38.	රෙදි සේදීම, පිරිසිදු කිරීම ආදිය (සංචාරක බංගලාව)
39.	ඩිජිටල් මුද්‍රණ කටයුතු සහ බැනර් සකස් කිරීම
40.	කාර්යාල උපකරණ වානේ හා ලී බඩු සැපයීම
41.	බහු ප්‍රක්ෂේපණ යන්ත්‍ර, ශබ්ද පරිපාලන යන්ත්‍ර හා ඒ ආශ්‍රිත සියලුම විද්‍යුත් උපකරණ
42.	වාහන කුලියට ලබාගැනීම (සැහැල්ලු සහ බර වාහන)

තිලංකා වෙත්තසිංහ,
දිස්ත්‍රික් ලේකම් (රා.ආ.)
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය,

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ආදර්ශ අයදුම්පත්‍රය

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

1. සැපයුම්කරුවන්ගේ / කොන්ත්‍රාත්කරුවන්ගේ නම : .....
2. ලිපිනය : .....
3. දුරකථන / ෆැක්ස්/ ඊමේල් : .....
4. ව්‍යාපාරයේ වෙළඳ නාමය : .....
5. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය : .....
   (ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
6. ලියාපදිංචි වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
   (අයිතම අංක 01, 02, 03 සඳහා)
   .....
7. සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් : .....
8. ව්‍යාපාරයේ ස්වභාවය : .....
   (නිෂ්පාදක/ ප්‍රධාන වෙළඳ නියෝජිත/ තොග වෙළඳ නියෝජිත යන්න සඳහන් කරන්න)
9. ණය පදනම මත සැපයීම පිළිබඳ විස්තර : .....
   (ණය වටිනාකම සහ කාල සීමාව)
10. වැට් ලියාපදිංචි අංකය.....
    (වැට් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
11. බැංකුකරුගේ නම සහ ලිපිනය : .....
12. කොන්ත්‍රාත්කරුවකු නම්, CIDA / ICTAD ආයතනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ලියාපදිංචි ශ්‍රේණිය .....
    (ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ පසුගිය වසර 03 තුළ සිදුකළ ඉදිකිරීම් / අලුත්වැඩියාවන් පිළිබඳ වාර්තා ඇමිණිය යුතුය)
13. i. එක් එක් අයිතමයන් සඳහා ගෙවන මුදල : .....
    ii. (ලදුපත ඇමිණිය යුතුය)
14. වෙනත් වැදගත් විස්තර : .....

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර, කිසියම් සාවද්‍ය තොරතුරක් සපයන ලද බවට හෙළි වුවහොත් ලියාපදිංචිය අවලංගු කිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය .....

.....
අයදුම්කරුගේ අත්සන

පිස්කල් වෙන්දේසියේ විකිණීම

මාතර දිසා අධිකරණයේදීය

ප්‍රමෝද ශෂී ට්‍රස්ට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සමාගම, අංක 02, වෙලවත්ත, වැලිපිටිය, වැලිගම.

පැමිණිලිකරු

නඩු අංකය : MB/3054
පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : 6,265,681/-

එදිරිව

කෝපරගේ අරුණ සුජීව,
නො. 08, කම්බි කොරටුව, දෙනිපිටිය, වැලිගම.

විත්තිකරු

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2019 ක්වූ පෙබරවාරි මස 20 වන දිනැති සමථ තීන්දුව ප්‍රකාරව එකී නඩුවේ විත්තිකරු විසින් පැමිණිලිකාර සමාගම වෙත ගෙවිය යුතුව ඇති රු. 6500000/- ක මුදල අය කරගන්නා ලෙස අණකර තීන්දු ප්‍රකාශ කර ඇත. ඒ අනුව එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ.

වර්ෂ 2020 ක්වූ නොවැම්බර් මස 12 වන දින පෙරවරු 11.00 ට

පිහිටි ස්ථානයේදී මා විසින් වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළයේ, වැලිගම නගර සභා සීමාව තුළ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. පැලෑන බටහිර ග්‍රාම නිලධාරී වසමේ, පැලෑනේ පිහිටි පළමුවන හරස් පාරේ අංක 210 දරන කිරීමදින්ගේ ජන්කුලපුවත්ත තමැති ඉඩම වන

උතුරට : ගාලු - මාතර මහ පාර ද,
නැගෙනහිරට : බෝගහවත්ත සහ මුදියන්සෙගේ වත්ත ද,
දකුණට : මුහුදු වෙරළ ද
බස්නාහිරට : ජන්කලපුවත්ත ද,

යන මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහ හතයි දශම පහ (අ. 01 රූ. 02 පර්. 17.5) ක් විශාල ඉඩමෙන් නොබෙදූ පර්චස් හය (අ. 00, රූ. 00 පර්. 6) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ පළතුරු සමග බිම සහ ඊට අයත් සියලු දේද වේ.

(මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P 54/130 දරන පත්‍රිකාවේ ලියාපදිංචි වී ඇත)

දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය :

ගාලු පාරේ වැලිගම වට රවුමේ වමෙන් ගොසින් 1/4 කිලෝ මීටර් ගොස් මාලු රේන්ද පොල වම් පැත්තේ ඉදිරිපස පිහිටි ගොඩනැගිල්ල.

ගෙවීමේ ක්‍රමය

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට 25% ක මුදලක්ද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 ප්‍රකාර පිස්කල් විසින් අයකරනු ලබන රජයේ ගාස්තුද, පළාත් පාලන ආයතන ගාස්තු ලෙස සියයට 1% ක මුදලක්ද, වෙන්දේසිය සඳහා වූ සියලුම වියදම්ද, එවෙලේම ගෙවිය යුතුය. තවද, ගැණුම්කරු විසින් ඉතිරි සියයට හැත්තෑ පහ 75% ක් වූ මුදල දින 30 ක් ඇතුළත එකී නඩුවේ බැරට එකී අධිකරණයේ තැන්පත් කළයුතු වන අතර, ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු එම අවස්ථාවේදීම ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතුය.

සමන්තිකා විතානගේ
අධිකරණ රෙජිස්ට්‍රාර්
නියෝජ්‍ය ඔස්කල් / සාම විනිසුරු
දිසාඅධිකරණය - මාතර.

ටොන් 5, 10 ප්‍රමාණයේ
ආවරණය සහිත ලොරි ඉන්ධන රියැදුරු සමග
රජයේ ව්‍යාපෘතියකට අවශ්‍යයි.
0740111414, 0117208383

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
නැගෙනහිර පළාත් සභාව

භාවිතා නොකරන මෝටර් වාහන - 2021

2021 වර්ෂයේ නැගෙනහිර පළාතට අයත් ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල සිටින රථ වාහන හිමියන් කවරෙකු හෝ තම වාහනය භාවිතා නොකොට තබාගැනීමට අපේක්ෂා කරන්නේ නම්, තම වාහනයේ ආදායම් බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවීමට පෙර ඒ පිළිබඳව දැනුම් දෙනු ලබන මෝ. ප්‍ර. කො. 107 ආකෘති පත්‍රය නිසියාකාරව සම්පූර්ණ කර ඊට අදාළ වන ගාස්තුව සඳහා කොමසාරිස්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත ලෙසින් ලබාගත් මුදල් ඇණවුමක් සමග කොමසාරිස්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශාන්ත අන්තෝනි වීදිය, ත්‍රිකුණාමලය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් හෝ මෙම දෙපාර්තමේන්තුවෙන් ඉහත කී ආකෘති පත්‍රය සම්පූර්ණ කර නියමිත ගාස්තුව ගෙවීමෙන් මෙම දැනුම් දීම සිදු කළ හැක.

ගාස්තු සටහන

- **මාස 06 ක කාලයක් සඳහා**
  - i. යතුරු පැදියක් හෝ ත්‍රිරෝද රථයක් — රු. 50.00
  - ii. මෝටර් ලොරි රථ හෝ මෝටර් බස් රථ — රු. 200.00
  - iii. අනිකුත් වාහන — රු. 100.00
- **වසරක කාලයක් සඳහා**
  - i. යතුරු පැදියක් හෝ ත්‍රිරෝද රථයක් — රු. 100.00
  - ii. මෝටර් ලොරි රථ හෝ මෝටර් බස් රථ — රු. 400.00
  - iii. අනිකුත් වාහන — රු. 200.00

මෙම භාවිතා නොකරන කාලසීමාව වෙනුවෙන් වාහන ආදායම් බලපත්‍ර ලබාගැනීම අවශ්‍ය නොවේ.

කොමසාරිස්,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
නැගෙනහිර පළාත් සභාව.

සංචාරක අමාත්‍යාංශය
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

2021 වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ කර්මාන්ත / වැඩ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සඳහා පහත සඳහන් භාණ්ඩ, සේවා, කර්මාන්ත, වැඩ සැපයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ලියාපදිංචි වීමට කැමති පිළිගත්, නිෂ්පාදකයින් / බෙදාහරින්නන් / සමාගම් / දේශීය ඒජන්තවරුන් / නියෝජිතයින් / කොන්ත්‍රාත්කරුවන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. **අනුරාධපුර, කතරගම, බණ්ඩාරවෙල. නුවරඑළිය, බෙන්තොට හි පිහිටි ජාතික නිවාඩු නිකේතන සඳහා බස්නාහිර පළාත. උතුරු මැද පළාත. මධ්‍යම පළාත, ඌව පළාත, දකුණු පළාත,** වගයෙන් පළාත්වලට අයදුම්පත් කැඳවනු ලැබේ.

අයිතම කේතය :		අයිතම
(01)		**ලිපිද්‍රව්‍ය.**
	1.1	සියලුම වර්ගයේ ලිපිද්‍රව්‍ය.
	1.2	ප්‍රකාශන, (පොත්පත්, පුවත්පත්, සඟරා යනාදිය).
(02)		**මුද්‍රණය හා සමතල මුද්‍රණය.**
	2.1	ඝන කවරයේ (බැඳීම) සහිතව පොත්පත් මුද්‍රණය කිරීම.
	2.2	හමුවීම් පත් / ව්‍යාපාරික පත්, හැඳුනුම්පත්.
	2.3	ධජ පතාක, කොඩි, පසුතල, තාම පුවරු, බැනර්.
	2.4	ලිපි ශීර්ෂ, ලිපි කවර, ලිපි ගොනු.
	2.5	පොත් පිංච, අත් පත්‍රිකා.
	2.6	T-ෂර්ට් හා තොප්පි, පැන් හා පැන්සල්, සමරු තිළිණ, ඵලක යනාදිය, මුද්‍රණය කිරීම හා සැපයීම.
(03)		**වාර්තා, රචක සේවය, සංකල්ප රචකය, (පුවත්පත් නිවේදන / මාධ්‍ය නිවේදන සඳහා), භාෂා පරිවර්ථක සේවය (ඉංග්‍රීසි / දෙමළ / සිංහල), ඉද්ධිපත්‍ර (සොදුපත්) බලන්නන් / කියවන්නන්.**
(04)		**ටෝනර් (සියලුම ආකාරයේ ටෝනර්)**
	4.1	මුදර්
	4.2	ලෙක්ස්මාර්ක්
	4.3	කැනන්
	4.4	සැම්සුන්
	4.5	ටොෂිබා
	4.6	HP
	4.7	රිකෝ
	4.8	වෙනත්
(05)		**රෙදිපිළි (ප්‍රේෂ කර්ම) නිපැවුම්**
	5.1	නිල ඇඳුම් ද්‍රව්‍ය හා නිල ඇඳුම් කරපටි
	5.2	තේමා කාර්යාල කාර්ය මණ්ඩල ඇඟළුම් / ඇඳුම් (සාරි, T-ෂර්ට්, කලිසම්, ටයිපටි, සරම්, ලුංජි යනාදිය)
	5.3	කාර්යාල තිර යෙදීම්, හෝටල් තිර යෙදීම්.
	5.4	පාවහන්
	5.5	සම් (ලෙදර්) බැග් මලු
(06)		**ICT (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) උපකරණ / ICT උපාංග / ICT උපකරණ අලුත්වැඩියාව / දත්ත නැවත / ආපසු සපයාගැනීම්.**
	6.1	ICT උපකරණ (සියලුම වර්ගවල පරිගණක, ලැප්ටොප්, පරිලෝකන / ස්කෑන් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ප්‍රින්ටර්, ෆැක්ස් යන්ත්‍ර, UPS, ප්‍රොජෙක්ටර්, USB, ෆ්ලෑෂ් ඩ්‍රයිව් යනාදිය)
	6.2	ICT උපාංග (UPS, පෙන් ඩ්‍රයිව්, හාඩ් ඩිස්ක්, ෆැක්ස් යන්ත්‍ර)
	6.3	ICT උපකරණ අලුත්වැඩියාව (ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප් පරිගණක, ප්‍රින්ටර්, ෆැක්ස් යන්ත්‍ර, UPS, ඡායා පිටපත් යන්ත්‍ර යනාදිය, අලුත්වැඩියාව)
	6.4	ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
	6.5	දත්ත ආපසු ලබා ගැනීම (ප්‍රතිප්‍රාප්තිය)
(07)		**පරිගණක මෘදුකාංග**
	7.1	ව්‍යවසාය ශ්‍රේණි යෙදවුම් මෘදුකාංග
	7.2	වෙබ් අඩවි සංවර්ධන හා අදාළ මෘදුකාංග
	7.3	මෘදුකාංග බලපත්‍ර (මෙහෙයුම් පද්ධති, වයිරස් ආරක්ෂණ, MS Office, යනාදිය)
	7.4	ජාල පද්ධති ආරක්ෂණ උපකරණ සහ මෘදුකාංග. Fire Wall (ගිනිබැම්), Land Balancer (භාර සමතුලන,) යනාදිය.
	7.5	ජංගම (මොබයිල්) සංවර්ධන හා අදාළ මෘදුකාංග
	7.6	වෙනත් මෘදුකාංග
	7.7	පරිගණක දෘඪාංග
	7.8	සර්වර් දෘඪාංග
	7.9	සර්වර් අදාළ මෘදුකාංග
(08)		**කාර්යාල / හෝටල් ගෘහ භාණ්ඩ**
	8.1	කාර්යාල ගෘහ භාණ්ඩ
	8.2	හෝටල් ගෘහ භාණ්ඩ
(09)		**හෝටල් ලිනන් හා මෙට්ට**
	9.1	හෝටල් ලිනන් (ඇඳ ඇතිරිලි, පොරවන, බිලැන්කට්, කොට්ට උර, මදුරු දැල්, මේස රෙදි, නැප්කින් යනාදිය)
	9.2	හෝටල් මෙට්ට
(10)		**පිඟන් කෝප්ප, හැඳි, ගෑරුප්පු, වීදුරු භාණ්ඩ හා මුළුතැන්ගෙයි උපකරණ**
(11)		**හාඩ්වෙයාර් (ලෝහ භාණ්ඩ) හා ගොඩනැගිලි උපකරණ**
	11.1	සියලුම මාදිලියේ හාඩ්වෙයා ද්‍රව්‍ය
	11.2	නාන කාමර උපාංග හා සනීපාරක්ෂක භාණ්ඩ
	11.3	විදුලි උපාංග හා ආලෝක එළි
	11.4	ආයුධ මෙවලම් හා නඩත්තු අයිතම.
(12)		**ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු**
	12.1	ඇළුම්නියම් වැඩ, ගලපා සකස් කිරීම් හා පාටිෂන් කිරීම්
	12.2	සිවිල් ඉංජිනේරු වැඩ, ගොඩනැගිලි නඩත්තුව, වර්ණාලේප කටයුතු
	12.3	නඩත්තු වැඩ / ජලතල කාර්මික / රැහැන් / තත් ඇදීම / වඩු වැඩ / මේසන් / පෙදරේරු වැඩ
(13)		**ආහාරපාන සැපයීම**
	13.1	සංග්‍රහ / ප්‍රාණවත් කිරීම් / ස්නැක් වර්ග.
	13.2	එළිමහන්, (බාහිර) හා අභ්‍යන්තර / ගෘහස්ථ කේටරින් සේවා
	13.3	පානීය ජල බෝතල් / ජල ඩිස්පෙන්සර් සැපයීම
(14)		**උත්සව අවස්ථා කළමනාකරණ සමාගම්**
(15)		**සැලසුම්කර නිර්මාණය කිරීම, කලා වැඩ.**
		දැන්වීම් / ප්‍රචාරනය, අත් පත්‍රිකා, බැනර්, Logos (ලාංඡන), ලිපි ශීර්ෂ
(16)		**ඡායාරූප ගැනීම හා වීඩියෝ ගත කිරීම**
(17)		**සැලසුම් නිර්මාණ ශිල්පීන්**
	17.1	අභ්‍යන්තර සැලසුම්කරණ ශිල්පීන්
	17.2	බාහිර සැලසුම් නිර්මාණ ශිල්පීන්
(18)		**පහසුකම්**
	18.1	කාමර පහසුකම්
	18.2	මුළුතැන්ගේ පහසුකම්
(19)		**වාහන අලුත්වැඩියාව, කුෂන් වැඩ, හා බුමුතුරුණු යෙදීම, වාහන පූර්ණ සේවා කිරීම්, තහඩු වැඩ, පින්තාරු වැඩ, එන්ජින් අලුත්වැඩියාව.**
	19.1	ටයර් හා ටියුබ්
	19.2	රථවාහන අලුත්වැඩියාව
	19.3	විත්කරින්, පේන්ටින්
	19.4	කුෂන් වැඩ හා කාපට් (බුමු තුරුණු)
(20)		**වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව**
(21)		**ජෙනරේටර් සේවා කිරීම හා නඩත්තුව**
(22)		**කෘමීන් / කෘන්තක හා පලිබෝධ නාශක පාලන සේවා**
(23)		**මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය සඳහා රථවාහන කුලියට ගැනීම / සැපයීම.**
	23.1	කාර් රථ
	23.2	බස් රථ
	23.4	වෑන් රථ
	23.4	ලොරි රථ

පොදු කොන්දේසි :

- අයදුම්පත්, 2020 ඔක්තෝබර් මස 05 වන දින සිට 2020 නොවැම්බර් මස 02 වන දින දක්වා SLTDA හි, (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ), 4 වන මහල, ප්‍රසම්පාදන අංශය, අංක 80, ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ හි වෙබ් අඩවිය වන (sltda.gov.lk) මගින් හා SLTDA හි ඕනෑම ජාතික නිවාඩු නිකේතනයකින් ලබාගත හැකිය.
- ආපසු ගෙවනු නොලබන රු. 500.00 ක ගාස්තුවක්
  - a. බැංකුවේ තැන්පත් කළ යුතුය.
    (ගිණුම් අංක , 7119413, ලංකා බැංකුව, ආයතනික ශාඛාව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය නමින්)
    (සැ.යු. බැංකුවේ මුදල් තැන්පතු පතේ හි තැන්පතුවේ අරමුණ හා තැන්පත්කරුවන්ගේ විස්තර පැහැදිළිව පුරවා සටහන් කරන්න)
  - b. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේහි සරප වෙත මුදලින් ඕනෑම රාජකාරි දිනයක පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා සහ ප.ව. 1.00 සිට ප.ව. 2.30 දක්වා (SLTDA) හිදී ගෙවීම (මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරනොගත්තා බව කරුණාවන් සලකන්න)
- අයදුම්කරුවන් විසින් **CIDA** හි ලියාපදිංචි සහතිකය (මෙය රුපියල් 500,000.00 වැඩි වටිනාකමක් සහිත වැඩ සඳහා පමණක් අදාළවේ.) සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හා සමාගමේ පැතිකඩ විස්තර සහ මුදල් ගෙවීම් පත්‍ර අයදුම්පත සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. එලෙස අවශ්‍ය ලේඛන රහිතව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් (අමුණා නොමැති අයදුම්පත්) ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- එක් එක් අදාළ කාණ්ඩය (ප්‍රවර්ගය) සඳහා භාණ්ඩ, සේවා හා වැඩ (කාර්ය) සැපයීම පිළිබඳව අයදුම්කරුවන්හට වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය (ලේඛනගත සාක්ෂි සාධක අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය)
- නිෂ්පාදකයින්ගේ / එකම ඒජන්තවරුන් හෝ බලයලත් බෙදාහරින්න්ගේ (ඇත්නම්) බලය පවරාදීමේ ලිපියක්ද ඉදිරිපත් කළ යුතුය.
- අවශ්‍යතාවය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලගණන් / ලංසු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. අවස්ථාවන් තුනකට වඩා එසේ මිලගණන් / ලංසු ඉදිරිපත් කිරීමට අපොහොසත්වන සැපයුම්කරුවන් පිළිබඳව. අනාගත අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර නොදක්වන සැපයුම්කරුවන් ලෙස සලකනු ලැබේ.
- සියලු ලියාපදිංචි සැපයුම්කරුවන්, අවම වශයෙන් එක් මාසයක අවම ණය සහන කාලසීමාවක් ලබාදීමට එකඟ විය යුතුය.
- එකඟවන ලද පරිදි භාණ්ඩ හෝ සේවා අවශ්‍යතාව පරිදි සැපයීමට සැපයුම්කරු අපොහොසත් වන්නේ නම් අදාළ සැපයුම්කරුවන්, අනාගත අවශ්‍යතාවයන් සැපයීම පිණිස සලකා බලනු නොලැබේ.
- සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන නමුදු, වෙනත් සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද මිලගණන් කැඳවීමේ අයිතිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සතුය.
- නිසි පරිදි පුරවා සම්පූර්ණ කරන ලද අයදුම්පත්, 2020 නොවැම්බර් මස 07 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 03, ගාලු පාරේ, අංක 80 හි, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි, 4 වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලේඛනගතව (ලියාපදිංචි) කළ තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුවන අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය) යනුවෙන් පැහැදිළිව සටහන් කළ යුතුය.

සභාපති -
ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අංක 80, ගාලු පාර, කොළඹ 03.

සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

1) සමාගමේ කලින් නම :
කැලිස්ටෝ කළමිබු (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 00201441
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : විජේරාම හවුස්, නො. 133/1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.
සමාගමේ නව නම :
ටු එස් ආර් ජේ ලංකා ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

2) සමාගමේ කලින් නම :
එලිගන්ට් නිට්න්ග් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම අංකය : PV 8900
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 202, කැනල් රෝඩ්, ඇලකන්ද, වත්තල.
සමාගමේ නව නම :
ආර්ටිසන්ස් එච්කේ (ප්‍රයිවට්) ලිමිටඩ්

ලේකම්



දැන්වීමයි

ඇමෙරිකා එක්සත් ජනපදයේ, නිව් ජර්සි 07620 හි ඇල්පයින්, හයිවුඩ් පෙදෙස, අංක 8 දරන තැන පදිංචි USA ගමන්බලපත්‍ර අංක 554488616 හිමි (කලින් ගමන් බලපත්‍ර අංක 221116729 හිමිව සිටි) **චන්ද්‍ර යෝගනාදන්** (විවාහයට පෙර ආරුමුගම්) නැමැති මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කොළඹ 05, කිරුළ පාරේ, අංක 165 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 560271581 දරන **මදුරප්පෙරුමගේ චන්ද්‍රසිරි ජයරත්න** යන අයට ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් K.V.N.N. සෙනෙවිරත්න විසින් ලියා සහතික කරන ලද, 2016 සැප්තැම්බර් 03 දිනම හා අංක 105 දරන විශේෂ ඇටර්නි බලපත්‍ර, 2020 සැප්තැම්බර් මස 4 වන දින සිට බලපවත්වන පරිදි එහි අඩංගු කවර හෝ සියලු බලතල හා අධිකාරීන්වයන්ද සමග මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කොට ශූන්‍ය කොට අවලංගු කරන ලද බව පොදු මහජනතාවට මෙයින් දන්වා සිටිමි.
2020 සැප්තැම්බර් මස 18 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ, නිව් ජර්සිහිදී මා විසින් අත්සන් තබන්නට යෙදුනි.

අ/කළේ : C යෝගනාදන්

1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදය)

7 වන වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය :**WEG/LAN/L9/ACQ/48-18**

මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 2187/18 දරන 2020.08.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

උපලේඛනය

දිස්ත්‍රික්කය	:	මාතර
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	:	වැලිගම
ග්‍රාම නිලධාරි කොට්ඨාසය	:	පැලෑණ දකුණ
ගමේ නම	:	පැලෑණ
ඉඩමේ නම	:	විජේකෝන්වත්ත නොහොත් සෙනවිරත්නවත්ත
මූලික පිඹුර	:	2644
කැබලි අංකය	:	18

කේ. පී. ජී. සුමිත් ශාන්ත
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දීය.
2020.09.25 වන දින.

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491
LAKE HOUSE

දිනමිණ වටපිට | Sunday Observer ADZ | ත්‍රිකරණ

ඔබගේ ලුහුඬු දැන්වීම් ලඟම සිටින අපගේ පුවත්පත් නියෝජිත මහත්වරුන් වෙත භාරදෙන්න

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු...

සිංහල එක් පුවත්පතක් සඳහා	සිංහල පුවත්පත් දෙකක් සඳහා	පුවත්පත් තුනම සඳහා
රු. 300/-	රු. 500/-	රු. 650/-
• සිතාසරන් වාරමින්පරි හරෙ	• සිතාසරන් වාරමින්පරි හරෙ	

කොළඹ දිස්ත්‍රික්කය

පුංචිබොරැල්ල.....011 2 268 251
ගුණසිරි ඉන්ඩස්ට්‍රීස් (පොත් සාප්පුව)- නො.865,මිරදාන පාර, පුන්චිබොරැල්ල, කොළඹ 10.

කොළඹ 071 0 748 900
ආර්.එන්.එම්. ඇඩ්වර්ටයිසින් (පුද්) සමාගම, රිගල් සිනමා ශාලාව ඉදිරිපිට කොළඹ 02.

කිරුළපන.....071 5 439 396
රමණී පොත් සාප්පුව - 27- ඒ, හයිලෙවල් පාර, කිරුළපන.

මාකොල.....078 5 200 648
ආර්.එන්.එම්. ඇඩ්වර්ටයිසින් (පුද්) සමාගම, නො. 74/1, මාකොල දකුණ, මාකොල.

ග්‍රෑන්ඩ්පාස් 071 2 321 968
නො.331, ලෙයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14.

වැල්ලවත්ත.....071 7 182 900
ව්ජය එන්ටර්ප්‍රයිසස් - නො.288, (සැප්හයර් හෝටලය ඉදිරිපිට), වැල්ලවත්ත, කොළඹ 06.

කොල්ලුපිටිය.....011 2 341 502
නො.77, ස්වේවිආර්ට් පෙදෙස, කොල්ලුපිටිය, කොළඹ 03.

මට්ටක්කුලිය.....011 2 520 602
නො.45, එළි හවුස් පාර, මුතුවල්, කොළඹ 15.

බොරැල්ල 011 2 679 032
නො.155, කොටා පාර, බොරැල්ල.

නාවින්න.....071 4 252 138
උයන්ගොඩ හොටෙල්- නො.452, හයිලෙවල් පාර, නාවින්න, මහරගම.

මහරගම.....011 2 896 373
අනුදි එන්ටර්ප්‍රයිසස්, නො.88, සුපර් මාර්කට් ගොඩනැගිල්ල, මහරගම.

කෝට්ටේ.....077 9 878 933
යළිනා ස්ටෝර්ස් - නො.962, ඇතුල්කෝට්ටේ, කෝට්ටේ.

කහතුඩුව.....011 2 753 836
කොස්හේන, කහතුඩුව.

WATAPITA HOT LINE - 011 2 429 342

CLASSIFIEDS HOTLINE 011 2 445 445

ලංසු තැබීම සඳහා ආරාධනයයි

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර

පවිත්‍රතා සේවා හා ආරක්ෂක සේවාවන් පවත්වාගෙන යෑම - 2021

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සේවාවන් පවත්වාගෙන යාම සඳහා 2020-11-05 දින ප.ව. 02.30 දක්වා පිළිගත් සේවා සැපයුම් ආයතනවලින් මුදු, තබන ලද ලංසු භාරගනු ලැබේ. එදින ප.ව. 02.35 ට ලංසු විවෘත කරනු ලබන අතර, ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක.

අනු අංකය	සේවාව	විස්තරය	ලංසු ගාස්තුව රු.	
			ආපසු නොගෙවන	ආපසු ගෙවන
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	මහල් 05 කින් සමන්විත කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පූර්ණ කාර්යාල පරිශ්‍රය නව සම්මන්ත්‍රණ ශාලාව පැරණි රැස්වීම් ශාලාව පොදු වැසිකිළිය හා පරිශ්‍රභූමියේ පවිත්‍රතා සේවා පවත්වාගෙන යාම හා ආරක්ෂක සේවා පවත්වාගෙන යාම. මේ සඳහා පවිත්‍රතා කටයුතු වෙනුවෙන් සුපර්වයිසර් ඇතුළුව 09 දෙනෙකු හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් ප්‍රධාන ආරක්ෂකයන් 02, නියාමකයන් 13 ක් යෙදිය යුතු වේ.	1,000.00	2,000.00
02	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	පානදුර, බණ්ඩාරගම, හොරණ, මතුගම, වලල්ලාවිට, පාලින්දනුවර, අගලවත්ත, ඉංගිරිය, මදුරාවල, බුලත්සිංහල, දෙඩන්ගොඩ, මිල්ලනිය, බේරුවල, කළුතර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයන්හි පවිත්‍රතා සේවාවන් හා ආරක්ෂක සේවා පවත්වාගෙන යාම, පවිත්‍රතා කටයුතු සඳහා එක් ප්‍රා.ලේ කාර්යාලයකට සේවකයන් දෙදෙනෙකු ද ආරක්ෂක සේවාව සඳහා රාත්‍රී කාලයට එක් නියාමකයෙකුද යොදවා ගනු ලැබේ.	1,000.00	2,000.00

02. ලංසු පෝරම ඉහත සඳහන් ගාස්තු ගෙවීමෙන් පසු 2020-11-05 දින පෙ.ව. 10.30 දක්වා පාලන අංශයෙන් ලබාගත හැක.
03. ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා සේවකයන් හට ගෙවනු ලබන වැටුප පඩි පාලක සභා මිල ගණන්වලට යටත්ව ඉදිරිපත් කළ යුතුය.
04. ඉදිරිපත් කරන ලංසු ආරක්ෂක සේවා හා පවිත්‍රතා සේවා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
05. ආරක්ෂක සේවය සැපයීම සඳහා පෝරම නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ආරක්ෂක සේවා සපයන ආයතනවලට පමණක් වන අතර, පවිත්‍රතා සේවා සැපයීම සඳහා වූ පෝරම රජයේ ලියාපදිංචි පවිත්‍රතා සේවා සැපයුම් ආයතනවලට පමණක් නිකුත් කරනු ලැබේ.
06. ලංසු සම්බන්ධ වැඩි විස්තර සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයේ පාලන අංශයෙන් ලබාගත හැක. (034-2222508)
07. එක් වසරක් සඳහා පමණක් මිල ගණන් කැඳවන අතර, සේවාවන්වල කාර්යක්ෂමතාවය හා සතුටුදායක තත්ත්වයන් සැලකිල්ලට ගෙන සේවා අවශ්‍යතාවය අනුව කාලය දීර්ඝ කිරීමට දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටු සභාපතිත්වයට බලතල ඇත. තවද, ආරක්ෂක සේවය හෝ පවිත්‍රතා සේවය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලටම හෝ කාර්යාල කිහිපයක පමණක් ලබා ගැනීම සඳහා තීරණය කිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.
08. සම්පූර්ණ කරන ලද ලංසු ලියකියවිලි **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර** යන ලිපිනයට නියමිත දින නියමිත වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තබා ඇති ලංසු කැඳවීමේ පෙට්ටියට බහාලිය හැක. ඉදිරිපත් කරන ලංසු ලිපි කවරවල වම්පස උඩු කෙළවරේ **සපයන සේවාවේ නම** සඳහන් කළ යුතුවේ.
09. අසම්පූර්ණ හෝ නියමිත දින නියමිත වේලාවට ඉදිරිපත් නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
10. ඕනෑම ලංසුපතක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුව ඇති අතර, ඔහුගේ තීරණය අවසන් තීරණය වේ.

තිලංකා වෙත්තසිංහ,
දිස්ත්‍රික් ලේකම් (රා.ආ),
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය.

2020-09-29 දින,
කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දීය.

ලංසු සඳහා ආරාධනයයි (IFB)

මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව, මුලතිව් දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය සංවර්ධන ආධාරක ව්‍යාපෘතිය (LDSP)

ව්‍යාපෘති හැඳුනුම් අංකය : P 163305

(1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් ප්‍රාදේශීය සංවර්ධන ආධාරක ව්‍යාපෘතියේ (LDSP) පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇත. එම ණය මුදලින් කොටසක් පහත නම් කර ඇති කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සිදුකිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

(2) මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පළාත් පාලන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ ලයිස්තුගත කොට ඇති කර්මාන්තය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	කොන්ත්‍රාත් අංකය	කොන්ත්‍රාත්තුවේ නම	ඇස්තමේන්තුගත සිවිල් පිරිවැය (රු. මිලියන)	අවශ්‍ය අවම ICTAD ශ්‍රේණිය හා විශේෂතාවය	අවශ්‍ය ලංසු ඇපකරය		කොන්ත්‍රාත් කාලය
					බැඳුම්කරයේ වටිනාකම (රු.)	වලංගු කාලය	
01	MU/PSMP/ LDSP/2020/01	කොඩ්ඩයිකර්නි පුල්ලෙයාර් කෝවිල - තෙත්තමැරවාඩි සම්බන්ධක පාර. (කි.මී. 0.00 - 0.474) වැඩිදියුණු කිරීම	7.6	සී 7 හෝ ඉහළ මහාමාර්ග	80,000.00	2021-02-02	දින 105 යි

(3) ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

(4) කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉහත වගුවේ සඳහන් ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා මහාමාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වලංගු CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, වලංගු ව්‍යාපාර ලියාපදිංචිය හෝ සමාගම් ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

(5) කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපිලේඛනයේ 5 වන කොටසේ උපලේඛනයේ ලබා දී ඇත.

(6) මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු මුලතිව්, මුහුදුබඩපත්තුව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති වෙතින් **(දුරකථන අංක : 024-3243542, ෆැක්ස් : 021-2290001)** ලබාගත හැකි අතර, රාජකාරී දිනයන්හි 09.00 පැය හා 15.00 පැය අතර මුලතිව්, මුහුදුබඩපත්තුව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

(7) ආපසු ගෙවනු නොලබන රුපියල් දෙදහසක (රු. 2,000.00) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020-10-05 වෙනි දින සිට 2020-10-19 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි 09.00 පැය හා 15.00 පැය අතර මුලතිව්, මුහුදුබඩපත්තුව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.

(8) පිටපත් දෙකකින් යුත් ලංසු **2020-10-20 වෙනි දින 10.30 පැයට හෝ ඊට පෙර** ලැබෙන පරිදි මුලතිව්, මුහුදුබඩපත්තුව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඉහත සඳහන් ස්ථානයේදී එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

(9) ලංසු, 2021-01-05 වෙනි දින දක්වා වලංගු විය යුතුය.

(10) සියලුම ලංසු සමග ඉහත වගුවේ සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය. ලංසු ඇපකරය ඉහත වගුවේ සඳහන් දිනය දක්වා වලංගු විය යුතු අතර, උපලේඛනයේ 16 වගන්තියට සමාන විය යුතුය.

(11) පූර්ව ලංසු රැස්වීමක් 2020-10-13 වෙනි දින 9.30 පැයේදී මුලතිව්, මුහුදුබඩපත්තුව, මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවේදී පැවැත්වේ.

ඉහත සඳහන් කරන ලද ලිපිනය නම්;

සභාපති,
පළාත් පාලන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,
මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව,
මුහුදුබඩපත්තුව, මුලතිව්.

මහජන බැංකුව

කළුතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය

බේරා නොගත් උකස් රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මහජන බැංකුව, කළුතර ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛා සහ සේවා මධ්‍යස්ථානයන් වෙත 2019-08-31 දින දක්වා උකස් කරන ලද පහත උපලේඛනයේ සඳහන් දින දක්වා බේරා නොගත් උකස් රන් භාණ්ඩ පහත දක්වා ඇති දිනයන්හි දී හා ස්ථානයන්හි දී පෙ.ව. 9.00 සිට වෙන්දේසි කරනු ලැබේ.

ඉහත පරිදි පැවැත්වීමට නියමිත මෙම වෙන්දේසි නැවත දැනුම් දීමකින් තොරව බැංකුවේ අභිමතය පරිදි අවලංගු කිරීම, කල් දැමීම හෝ ඒකාබද්ධව පැවැත්වීම, වෙන්දේසි පවත්වන ස්ථාන සංශෝධනය කිරීම ආදී කවර කටයුත්තක් වුවද සිදු කිරීමේ අයිතිය බැංකුව සතුව පවතී.

අංකය	ශාඛාව සහ සේවා මධ්‍යස්ථාන	පහත දැක්වෙන දින දක්වා බේරා නොගත්	වෙන්දේසි පැවැත්වෙන දිනය සහ ස්ථාන
01	**කළුතර ශාඛාව** කළුතර උතුර සේවා මධ්‍යස්ථානය සෙන්ට්‍රල් හංදිය සේවා මධ්‍යස්ථානය බෝම්බුවල සේවා මධ්‍යස්ථානය කටුකුරුන්ද සේවා මධ්‍යස්ථානය නාගොඩ රෝහල හංදිය සේවා මධ්‍යස්ථානය	2020-11-06	2020-11-07 2020-11-08 කළුතර ශාඛාව
02	**අළුත්ගම ශාඛාව** දර්ගානගරය සේවා මධ්‍යස්ථානය **නැබොඩ ශාඛාව**	2020-11-13	2020-11-14 2020-11-15 අළුත්ගම ශාඛාව
03	**හොරණ ශාඛාව** මිල්ලනිය සේවා මධ්‍යස්ථානය මොරගහහේන සේවා මධ්‍යස්ථානය ගෝනපල සේවා මධ්‍යස්ථානය පොකුණුවිට සේවා මධ්‍යස්ථානය **ඉංගිරිය ශාඛාව** හඳපාන්ගොඩ සේවා මධ්‍යස්ථානය	2020-11-13	2020-11-14 2020-11-15 හොරණ ශාඛාව
04	**මතුගම ශාඛාව** **බදුරලිය ශාඛාව** **පැලවත්ත ශාඛාව** අගලවත්ත සේවා මධ්‍යස්ථානය දෙඩංගොඩ සේවා මධ්‍යස්ථානය මීගහතැන්න සේවා මධ්‍යස්ථානය	2020-11-20	2020-11-21 2020-11-22 මතුගම ශාඛාව
05	**පානදුර නගර ශාඛාව** මෝදරවිල සේවා මධ්‍යස්ථානය	2020-11-20	2020-11-21 2020-11-22 පානදුර නගර ශාඛාව
06	**වාද්දුව ශාඛාව** මොරොන්තුඩුව සේවා මධ්‍යස්ථානය	2020-11-27	2020-11-28 වාද්දුව ශාඛාව
07	**මග්ගොන ශාඛාව** **බේරුවල ශාඛාව**	2020-12-04	2020-12-05 2020-12-06 මග්ගොන ශාඛාව
11	**පානදුර ශාඛාව** කෙසෙල්වත්ත සේවා මධ්‍යස්ථානය එළුවිල සේවා මධ්‍යස්ථානය	2020-12-04	2020-12-05 2020-12-06 පානදුර ශාඛාව
09	**බණ්ඩාරගම ශාඛාව** අළුබෝමුල්ල සේවා මධ්‍යස්ථානය **බුලත්සිංහල ශාඛාව**	2020-12-11	2020-12-12 2020-12-13 බණ්ඩාරගම ශාඛාව

මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,අංක 341, ගාලු පාර, පානදුර.
දුරකථන අංක : 038-2232438/ 2241596/ 4283182
FAX. : 038-2232727

ප්‍රාදේශීය කළමනාකාර,
